# පහන් කණුව ධර්ම දේශනා

## 11 - වෙළුම



කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

# පහන් කණුව
# ධර්ම දේශනා

එකොළොස් වන වෙළුම

කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

ප්‍රකාශනය
කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය

2017

# ධර්ම දානයකි

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

ප්‍රථම මුද්‍රණය - 2016 සැප්තැම්බර්
දෙවන මුද්‍රණය - 2017 ජනවාරි

## සියලුම හිමිකම් ඇවිරිණි

මුදලට විකිණීම සඳහා හෝ ලාභ ලැබීම පිණිස වන සියලු ආකාරයේ උපුටා ගැනීම්, නැවත පළ කිරීම් සපුරා තහනම්ය. මෙම දහම් පොත ධර්ම දානයක් ලෙස නැවත පළ කිරීමට කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය වෙත විමසීම් යොමු කරන්න. ධර්ම ග්‍රන්ථ සහ දේශනා සඳහා පිවිසෙන්න

www.seeingthroughthenet.net

ISBN 978-955-3962-46-1

විමසීම්

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය
කිරිල්ලවලවත්ත, දම්මුල්ල, කරඳන.
දුරකථනය: 0777127454
knssb@seeingthroughthenet.net

මුද්‍රණය

කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල, නුගේගොඩ.
දුරකථනය: 0114870333

# ධර්ම දානයකි

මුදලට විකිණීම සපුරා තහනම් වෙයි.

කතු හිමියන්ගේ දහම් පොත් ලබාගත හැකි ස්ථාන:

1. සුනිල් විජේසිංහ මහතා – 39/10, ශාන්ත රීටා පාර, ගල්කිස්ස.
2. හේමමාලා ජයසිංහ මහත්මිය
   29/8, පැඟිරිවත්ත මාවත, මිරිහාන, නුගේගොඩ.
3. චන්දන විජේරත්න මහතා
   23/79A, 1 වන පටුමග, ධර්මපාල පෙදෙස, තලවතුගොඩ.
4. ස්ටැන්ලි සූරියාරච්චි මහතා – 25, කඩ වීදිය, දේවාලේගම.
5. එස්. ඒ. ලයනල් මහතා
   140/19, රුහුණුසිරි උද්‍යානය, හක්මන පාර, මාතර.
6. සිරිමා විජේරත්න මහත්මිය – 15, ඇලපාත, රත්නපුර.
7. ඒ. ජී. සරත් චන්ද්‍රරත්න මහතා
   'සමන්', ඇරැවුල හංදිය, කන්ඩලම පාර, දඹුල්ල.
8. ජේ. ඒ. ඩී. ජයමාන්න මහතා
   ජයමාන්න වත්ත, ලබුයාය, කුරුණෑගල පාර, කුලියාපිටිය.
9. මහාචාර්ය කේ. එම්. විජේරත්න, දන්ත විද්‍යා පීඨය,
   පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.
10. වෛද්‍ය පී. වීරසිංහ මහතා
    බණ්ඩාර බුලංකුලම, ලංකාරාම පාර, අනුරාධපුර.
11. ආර්. ඒ. චන්දි රණසිංහ මහත්මිය
    ස්ටුඩියෝ 'චායා', රෝහල හන්දිය, පොළොන්නරුව.
12. නේරා විජේසුන්දර මහත්මිය
    ඉළුක්පිටිය බෙහෙත් ශාලාව, ඉළුක්පිටිය, ගැටහැත්ත.
13. ඩී. සී. ඒ. නිශ්ශංක මහතා – 91A, වුඩ්වර්ඩ් පාර, ගාල්ල.
14. පියදස සමරකෝන් මහතා
    සුදුවැලි පැලැස්ස, කිරින්ද, තිස්සමහාරාමය.

www.seeingthroughthenet.net
www.facebook.com/seeingthrough

සබබ පාපසස අකරණං
කුසලසස උපසමපද
සචිතත පරියොදපනං
එතං බුදධානසාසනං

- බුදධ වගග, ධමම පදය

හැම පවින් වැළැකුම
කුසල් වෙතටම එළැඹුම
සිත පිරිසිදු කැරුම
සස්න මෙයමැයි හැම බුදුන්ගෙම

# පටුන


| | |
|---|---|
| හැඳින්වීම | vi |
| ප්‍රකාශක නිවේදනය | viii |
| අමා ගඟ | ix |
| 51. 'බහුං වෙ සරණං යන්ති' (පහන් කණුව 49) | 1 |
| 52. 'සබ්බිරෙව සමාසෙථ' (පහන් කණුව 160) | 27 |
| 53. 'මම සඞ්කප්ප මඤ්ඤඤ්ඤය' (පහන් කණුව 162) | 49 |
| 54. 'අහො බුද්ධා අහො ධම්මා' (පහන් කණුව 203) | 73 |
| 55. 'කෙනස්සු නිවුතො ලොකො' (පහන් කණුව 208) | 97 |

# හැඳින්වීම

දහම් දන හැමදන්ම පරදයි
දහම්රස හැම රසම පරදයි
දම් ඇලුම හැම ඇලුම් පරදයි
නිවන් සුව හැමදුක්ම පරදයි

අනුත්තර ධර්මරාජයාණන් වහන්සේගේ ධර්මවිජයට අරමුණුවූයේ දෙව් මිනිසුන්ගේ චිත්ත සන්තානයයි. අනාදිමත් කාලයක් තුළ මෝහයෙන් මුළාවී සසර දුක් ගින්නෙන් දැවෙමින් සිටින ලෝ සතුන්ගේ සිත් සතන් දහම් අමා දහරින් සිසිල් කර අමා මහ නිවනින් නිවා සුවපත් කිරීම ඒ මහා කාරුණිකයාණන් වහන්සේගේ ධර්මවිජය පරමාර්ථය විය. දුක් ගිනි වඩන දිග්විජය වෙනුවට දුක් ගිනි නිවන ධර්මවිජයක් බුදුපියාණන් වහන්සේ ලෝකයාට හඳුන්වා දුන්හ.

ධර්මදානය අන් හැම දානයකටම වඩා උතුම් වන්නේ සිතකට වැටෙන දහම් පදයකින් පූර්ණ ජීවිත පරිවර්තනයක් පවා සිදුවිය හැකි බැවිනි. බාහිර වස්තු දානයෙන් සැළසෙන තාවකාලික සහනය මෙන් නොව, එය සනාතන සැනසුමකට මග හෙළිකරයි. මොහොතකට දිවගට දැනී-නොදැනී යන ආමිස රසය මෙන් නොව, නිරාමිස දහම් රසය අසහනය දුරුකොට සිත් සනහන ගැඹුරු අර්ථ රසයකි. සසර වඩන ගේහසිත ඇලුම් මෙන් නොව, ලොවුතුරු දහමට ඇති ඇල්ම සසර ගමන කෙටිකරයි. තණ්හා පිපාසය සන්හිඳුවන අමා මහ නිවන සියලු සසර දුක් නිවාරණය කරයි. 'නිවනේ නිවීම' පොත් පෙළෙන් අප දියත් කළ ධර්මදාන වැඩ පිළිවෙළෙහි දෙවැනි අදියර වශයෙන් මේ 'පහන් කණුව ධර්ම දේශනා' පොත් පෙළ එළි දකී. මීතිරිගල නිස්සරණ වන සෙනසුනෙහි යෝගාවචර සඟපිරිස හමුවේ අප විසින් දේශනා කරන්නට යෙදුන දෙසුම් 33 ක් රැගත් යටකී පොත් පෙළට වඩා සරල අන්දමින්. ජන ජීවිතයේ එදිනෙදා ගැටළුවලට එල්ල කොට දෙසන ලද බැවින් මෙම ධර්මදේශනා මාලාව බොහෝ දෙනෙකුට වැඩදායක වනු ඇතැයි සිතමු. සසරදුක් ලියලවන විවිධ විෂම දෘෂ්ටි මතවාදයන්ගෙන් ගැවසීගත් පොත් පත් සඟරා 'සහරාවක' අතරමංව සිටින වත්මන් පාඨක සමාජයට මේ තුළින් ලොවුතුරු මඟට යම් 'තරු සළකුණක්' හෝ ලැබෙතොත් අප දැරූ උත්සාහය සඵල වූ ලෙස සළකමු.

'ආනුපුබ්බී කථා' නම් වූ අනුපිළිවෙළ කථාමාර්ගයක් අනුගමනය කරමින් දහම් දෙසූ බුදු පියාණෝ එවැනිම 'අනුපිළිවෙළ කථාවක්' ධර්මදේශකයින්ට අනුදැන වදාළහ. දාන කථාව, සීල කථාව, සග්ග කථාව, කාමයන්ගේ ආදීනව හා නෙක්ඛම්මයෙහි ආනිසංස ඒ අනුපිළිවෙළ කථාවට අයත්වේ. ඒ සියල්ල තුළින් සකස් වූ, මෘදුවූ, පුබුදුවූ. පහන්වූ

සිතට චතුරාර්‍යසත්‍ය දේශනාව මැනවින් විෂය වේ. දේශනා විලාස වශයෙන් සළකන කල, බුද්ධ දේශනාවෙහි ඉස්මතුව පෙනෙන ආදර්ශවත් අංග සතරක්ද ඇත. එනම්, උපමා, නිදර්ශන, ආදියෙන් ධර්ම කරුණු සන්දර්ශනය කිරීම (සන්දස්සෙති) සිත් කාවදින අන්දමින් එත්තු ගන්වාලීම (සමාදපෙති) ඒවා ප්‍රතිපත්තියට නැංවීමෙහිලා උත්සාහවත් කිරීම (සමුත්තෙජෙති) සහ අසන්නන්ගේ සිත්සතන් ප්‍රසාදයට පත්කිරීමයි (සම්පහංසෙති).

ධර්මපදයෙන් තෝරාගත් ගාථා මාතෘකා කොටගෙන පැවැත්වෙන මෙම දෙසුම් පෙළෙහිදීද හැකිතාක් දුරට ඉහත සඳහන් මූලධර්ම අනුගමනය කිරීමට තැත් දැරුවෙමු. බුද්ධෝත්පාද කාලයක ලැබිය හැකි අග්‍රඵලය වන අර්හත් ඵලයෙන්ම දේශනාවක් කුළුගැන්වීමට උනන්දු වීමු. වෙනත් සුලභ ලෞකික පරමාර්ථ තුළ අසන්නන් සිරකොට නොතබා, බුදුපියාණන් වහන්සේ වදාළ අප්‍රමාද පදය සිහිගන්වමින් සංසාර විමුක්තිය දෙසටම ඔවුන් යොමු කරවීම අපගේ පරම අධ්‍යාශය විය. 'පහන් කණුවෙන්' විහිදෙන මෙම ධර්මාලෝකයෙන් ලෝකයාට නිවන් මඟ හෙළි පෙහෙළි වේවා!

දෙස් විදෙස් වැසි සැදැහැවත් පරිත්‍යාගශීලී විශාල පිරිසකගේ නොමසුරු ආධාරයෙන් 'අමා ගඟ' දිනෙන් දින පුළුල් වෙමින් ගලායයි. එයින් ජනිත පුණ්‍ය ශක්තිය ඔවුන්හට පරම ශාන්ත නිර්වාණාවබෝධය පිණිස උපනිශ්‍රය සම්පතක්ම වේවා! පටිගත කළ 'පහන් කණුව' දෙසුම් පිටපත් කරදීමේ සහ සෝදුපත් බැලීමේ කාර්‍යයන්ට සහාය වන පින්වත් සිරිමා විජේරත්න, කුසුමා විලේගොඩ, ගීතාංජලී සමන් දෙලගේ සහ ලිලියන් රත්නායක යන මහත්මීන්ටත්, අපගේ පොතපත ශෝභන ලෙස මුද්‍රණය කරදෙන කොලිටි ප්‍රින්ටර්ස් සමාගමේ සී. ජයසෝම මහතා ඇතුළු සැමටද අපගේ පුණ්‍යානුමෝදනාව හිමිවේ.

'චිරං තිට්ඨතු ලොකස්මිං - සම්මාසම්බුද්ධ සාසනං'

මෙයට,
සසුන් ලැදි
කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන
කිරිල්ලවල වත්ත, දම්මුල්ල
කරඳන
(2560) 2016 ජූනි

# කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය
# ප්‍රකාශක නිවේදනය

'කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය' පූජ්‍ය කටුකුරුන්දේ ඤාණනන්ද ස්වාමීන් වහන්සේ විසින් සම්පාදිත සියලුම ධර්ම ග්‍රන්ථ හා දේශිත ධර්ම දේශනා පිරිසිදු ධර්ම දානයක් වශයෙන්ම ධර්ම පිපාසිත ලෝකයාහට ප්‍රදානය කිරීමේ උන්වහන්සේගේ අභිමතාර්ථය ඉටු කිරීමට ඇප කැප වී සිටියි. මේ අනුව ධර්ම ග්‍රන්ථ මුද්‍රණය සහ බෙදාහැරීම පිළිබඳ කාර්යභාරයත්, ධර්ම දේශනා සංයුක්ත තැටිගත කිරීම සහ www.seeingthroughthenet.net වෙබ් අඩවිය, www.facebook.com/seeingthrough සමාජ ජාල අඩවිය පවත්වා ගෙන යාමත් කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරයේ වගකීම වනු ඇත.

දෙස් විදෙස් වැසි ධර්මකාමී පාඨක ශ්‍රාවක විශාල පිරිසක් වෙනුවෙන් ක්‍රියාත්මක වන මෙම පුළුල් ධර්ම දාන වැඩ පිළිවෙලට දායකවීමට කැමති පින්වතුන් හට පහත සඳහන් බැංකු ගිණුමට තම ආධාර මුදල් යොමුකිරීමට අවස්ථාව ඇත.

මෙම ධර්ම දාන වැඩපිළිවෙලට ආධාර එවීම පිළිබඳ සියලු විමසීම්:


කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය<br>
කිරිල්ලවල වත්ත, දම්මුල්ල, කරඳන.<br>
දුරකථන අංක: 0777127454<br>
ඊමේල් ලිපිනය: knssb@seeingthroughthenet.net


ආධාර මුදල් යොමු කිරීම:

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය (K.N.S.S.B)<br>
ගිණුම් අංක: 007060000241<br>
සම්පත් බැංකුව, SWIFT: BSAMLKLX<br>
ශාඛා අංකය: 070<br>
ශාඛාව: ආර්. ජී. සේනානායක මාවත, කොළඹ - 07.

# අමා ගඟ

මහවැලි ගඟ උතුරට හැරවීමෙන් පසු එතෙක් නිසරු මුඩු බිම් ලෙස පැවති පෙදෙස්වල සිදුවූයේ ඉමහත් වෙනසෙකි. පිපාසයට පැන් බිඳක් නොලබා සිටි ගොවීහු පෙදෙස පුරා නිහඬව ගලා යන සිසිල් දිය දහරින් පිනා ගියහ. මැලවුනු ගොයම සරුව නිල්වන්ව කරලින් බර විය. මල් පලින් ගැවසීගත් තුරු-ලිය බලා සැනසෙන පෙදෙස් වැසියෝ තුටු කඳුළු වගුළහ.

දහම් අමා ගඟ 'උතුරට' හැරවීමේ වැඩ පිළිවෙළක් මෙයට තෙවසරකට පෙර ඇරඹුණි. දහම් පත-පොත තබා 'එද-වේල' සඳහා වත් වියපැහැදම් කිරීමට වත්-කමක් නැත්තෝ, නිහඬව නොමිලයේ ගලායන අමිල දහම් අමා දිය දහරින් සදහම් පිපාසය සන්සිඳුවා ගත්හ. අරිටු මිසදිටු හැර, සැදැහැයෙන් සරුව, ගුණ නුවණින් බරව පිළිවෙත් මගට නැමී ගත්හ. ලොවී-ලොවුතුරු මල් පල නෙළා ගනිමින් හද පුරා පිරි බැතියෙන් නන් අයුරින් සොම්නස පළකළහ.

'ධර්ම ග්‍රන්ථ මුද්‍රණ භාරය' නමින් දියත් කළ මෙම ධර්මදාන වැඩපිළිවෙළ සඳහා අපගෙන් වැයවුනේ පිරිසිදු ධර්මදාන සංකල්පය පමණි. අමාගඟ 'උතුරට' හැරවූවෝ සසුන් ගුණ හඳුනන පරිත්‍යාගශීලී සැදැහැවත්හුමය. 'නිවනේ නිවීම' පොත් පෙළ එළි දැක්වීමෙන් නොනැවතී 'පහන් කණුව ධර්මදේශනා' පොත් පෙළෙහි 'බර පැන' දැරීමටත්, දෙස්-විදෙස්වල දහම් පිපාසිතයින් උදෙසා අප අතින් ලියැවෙන අනිකුත් පොත-පත ඒ අයුරින්ම එළි දැක්වීමටත් ඔවුහු උත්සුක වූහ. 'දෙන දේ පිරිසිදුවම දීමේ' අදහසින් අමිල වූ දහම ඊට නිසි ශෝභන මුද්‍රණයකින්ම ධර්මකාමීන් අතට පත් කිරීමට පියවර ගත්හ. මුද්‍රිත පිටපත් සංඛ්‍යාව අවසන්වනු හා සමගම 'නැවත මුද්‍රණ' පළකිරීමෙන් දහම් අමා ගඟ වියළී යා නොදීමට දැඩි අදිටනකින් ඇප කැපවූහ.

'පොත් අලෙවිය' පිළිබඳව මෙකල බහුලව දක්නට ලැබෙන වාණිජ සංකල්පයට පිටුපා, තහංචිවලින් තොරව, තමන් අතට නොමිලයේම පත් කැරෙන 'දහම් පඬුර' තුළින් ධර්මදාන සංකල්පයෙහි අගය වටහාගත් බොහෝ පාඨක පින්වත්හු තමන් ලද රස අහරක්, නෑ-හිතවතුන් සමග බෙද-හද ගන්නාක් මෙන් නොමසුරුව අන් දහම් ලැදියනටද දී ධර්ම දානයට සහභාගී වූහ. ඉනුදු නොනැවතී, ශක්ති පමණින් 'ධර්ම ග්‍රන්ථ මුද්‍රණභාරයට' උරදීමටද ඉදිරිපත්වූහ, ඇතැමෙක් ලොකු කුඩා දහම් පොත් මුද්‍රණය කරවීමේ හා නැවත-නැවත මුද්‍රණය කරවීමේ බරපැන ඉසිලීමට පවා පසුබට නොවූහ.

සම්බුදු සසුන මේ ලක් පොළොවෙහි පවතින තාක් මේ දහම් අමාගඟ ලෝ සතුන් සිත් සනහමින් නොසිඳී ගලා යේවා යනු අපගේ පැතුමයි.

"සබ්බදානං ධම්මදානං ජිනාති"

මෙයට,
සසුන් ලැදි
කටුකුරුන්දේ ඤාණනන්ද භික්ෂු

පොත්ගුල්ගල ආරණ්‍ය සේනාසනය
'පහන් කණුව'
කන්දේගෙදර, දේවාලේගම.
2000 ජුනි 05 (2544 පොසොන්)

**පහන් කණුව ධර්ම දේශනා**

**11 – වෙළුම**

දෙවන මුද්‍රණය

පිටපත් 1000 කින් යුත් මෙම දෙවන මුද්‍රණය, ධර්ම දානයට ලැදි දෙස් විදෙස් පින්වතුන්ගේ සැදැහැති දායකත්වයෙන්, කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන් භාරය මගින් එළිදැක්වේ.

# 51 වන දේශනය

## 51 වන දේශනය

(පහන් කණුව ධර්ම දේශනා අංක 49)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

බහුං වෙ සරණං යන්ති
පබ්බතානි වනානි ච
ආරාම රුක්ඛ චෙත්‍යානි
මනුස්සා භය තජ්ජිතා

නෙතං ඛො සරණං ඛෙමං
නෙතං සරණ මුත්තමං
නෙතං සරණ මාගම්ම
සබ්බ දුක්ඛා පමුච්චති

යො ච බුද්ධං ච ධම්මං ච
සංඝං ච සරණං ගතො
චත්තාරි අරිය සච්චානි
සම්මප්පඤ්ඤාය පස්සති

දුක්ඛං දුක්ඛ සමුප්පාදං
දුක්ඛස්සච අතික්කමං
අරියං චට්ඨංගිකං මග්ගං
දුක්ඛූපසම ගාමිනං

එතං ඛො සරණං ඛෙමං
එතං සරණ මුත්තමං
එතං සරණ මාගම්ම
සබ්බ දුක්ඛා පමුච්චති

සැදැහැවත් පින්වතුනි,

අද ඇසළ පුර පසළොස්වක පොහොය දවසයි. ඇත්ත වශයෙන්ම සසර දුකට පිළිසරණය වන ත්‍රිවිධ රත්නය හරි හැටියටම පහළ උනේ මේ වාගේ ඇසළ පුර පසළොස්වක පොහොය දවසකයි. මොකද අපි එහෙම කියන්නේ, අපි කවුරුත් දන්නවා බුදු පියාණන් වහන්සේ සම්බෝධි ඥානය බෝධි මූලයේ දී ප්‍රත්‍යක්ෂ කර ගත්තේ, වෙසක් පුර පසළොස්වක පෝය දවසකයි. නමුත් ඒ ලබා ගත්තු

ලෝකෝත්තර අවබෝධය, දෙව් මිනිසුන් සහිත ලෝකයාට තේරුම් ගත හැකි මට්ටමින් මංගල ධර්ම දේශනාවක් වශයෙන්, ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙන් දේශනාකොට වදාළේ ඒ ඇසළ පුර පසළොස්වක පොහොය දවසකයි. ඒ වගේම ඒ දේශනාවට අරමුණු වුන පස්වග මහණුන් වහන්සේලාගෙන් ඒ අතුරින් අඤ්ඤාකොණ්ඩඤ්ඤ සවාමීන් වහන්සේ දේශනාව අවසානයේ දී සෝවාන් මාර්ග ඥානයෙන් නිර්වාණය අවබෝධ කර ගත්තා. එය අපට තේරුම් ගන්ට තිබෙන්නේ දැන් එතකොට, ධර්ම රත්නය පහළ උනා ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනාවෙන්. ඊළඟට ආර්ය සංඝරත්නයේ පහළ වීමේ ආරම්භය හැටියටත් ඒක සලකන්න පුළුවන්. අන්න ඒක නිසා තමයි අපි කියන්නේ ඇසළ පුර පසළොස්වක පොහොය දවස, මේ සංසාර දුක්ඛයට එකම පිළිසරණ වන ත්‍රිවිධ රත්නය පහළ වුණු දවස හැටියට.

ඉතින් එහෙම කල්පනා කරල බලනකොට මේ අපි අද මාතෘකා කර ගත්ත දේශනාවේ මේ ගාථා පෙළින් කියවෙන්නේ, අවධාරණය කරල කියවෙන්නේත්, ලෝක සත්ත්වයාගේ සංසාර දුක්ඛයට ඇති එකම පිළිසරණය තුන් සරණයම බවත්, ත්‍රිවිධ රත්නයම බවත්, මේ සංසාර දුකෙන් ගැලවීමේ මාර්ගය ඒ ලෝකෝත්තර විමුක්ති මාර්ගයම බවත්, ඒක තමයි ප්‍රකාශ වෙන්නේ. මේ ගාථා කීපය බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළේ අග්ගිදත්ත කියන බ්‍රාහමණයෙකුටයි. ඒ පිළිබඳ කථා පුවත නිදන කථාව මේ විදියටයි සඳහන් වෙන්නේ.

සැවැත් නුවර මහා කෝසල රජ්ජුරුවෝ - ඒ කියන්නේ පසේනදී කෝසල රජ්ජුරුවන්ගේ පියා - ඒ මහා කෝසල රජ්ජුරුවන්ගේ පුරෝහිත බ්‍රාහමණයා තමයි ඒ කියාපු අග්ගිදත්ත බ්‍රාහමණයා. මහා කෝසල රජ්ජුරුවන් මිය ගියාට පස්සේ රජකමට පත්වුණ පසේනදී කෝසල රජ්ජුරුවොත් ඒ අවසථාව වන විට මහළු වයසට පත්ව සිටි අග්ගිදත්ත බ්‍රාහමණයාම බොහොම ගෞරවයෙන් පුරෝහිත තනතුරේම තැබුවා. කොයි තරම් ගෞරවයක් දැක්වූවාද කියතොත් රාජ උපසථානයට එනකොට රජ්ජුරුවෝම පෙර ගමන් කරනවා. ඒ වගේම තමන්ට සමාන ආසනයක් දෙනවා ගුරු ගෞරවය ඇතිව. ඒ තරම් හොඳට සැලකුවා අග්ගිදත්ත පුරෝහිත බ්‍රාහමණයාට.

නමුත් මේ බ්‍රාහමණයා ඥානවන්තව කල්පනා කළා. තරුණ රජවරු කැමතියි තරුණ පුරෝහිතයන්ට. මම මහළු වැඩියි. මට මේ

විදියට හැමදම රජ්ජුරුවන්ගේ ප්‍රසාදය ලබාගන්ට පුළුවන් වෙන්නේ නැහැ. මම යන්න ඕන මහණ වෙන්ට. මම පැවිදි වෙන්ට ඕන කියල හිතාගෙන රජ්ජුරුවන්ගෙන් ඊට අවසර ලබාගෙන, පැවිද්ද කියන එක නිකම්ම අර බාහිර වේශය පිළිබඳ වෙනසක් නොවෙයි. නෙක්ඛම්මය ඊට අවශ්‍ය බව තේරුම් ගත්තා. ඒක නිසා තමන්ගේ මහා වස්තුව, මහා වස්තු සම්භාරය - එයින් නිදහස් උනේ කොහොමද? නගරයේ අණ බෙර යවලා දෙර දන් දුන්නා. ඒ ඔක්කොම සත් දිනක් තුළ මුලු මහත් වස්තුව ඕනම කෙනෙකුට ගන්න කියලා, දෙරවල් ඇරලා, ඒ ධනයෙන් නිදහස් වෙලා ගියා. ඒ යනවත් එක්කම නගර වැසි විශාල පිරිසක්, දස දහසක් පමණ පිරිසක් කියල කියනවා. මේ පුරෝහිත බ්‍රාහමණයත් එක්කම තවුස් දම් රැකීමට ඍෂි ප්‍රව්‍රජ්‍යාව සඳහා පිටත්වෙලා ගියා. ඒ පිරිස ගිහිල්ලා අඟු මගධ දෙ රටටත් කුරු රටටත් අතර එක්තරා වාස භූමියක ආරාමයක් සකස් කරගෙන තවුස් දම් රකිනවා.

ඉතින් මේ පිරිසට අගගිදත්ත බ්‍රාහමණයා නායකයා හැටියට දෙන අවවාදය මොකක්ද? 'නුඹලාට කාම විතර්ක ආදී කෙලෙස් විතර්කයක් ඇති උනහම ඒ ඇති උන මොහොතේම ගිහිල්ලා වැලි මල්ලක් ගෙනල්ලා මෙන්න මේ ස්ථානයේ හලන්න' කියල ඒ විදියට භාවනා උපදේශයක් දුන්නා. එහි ප්‍රතිඵලයක් හැටියට ටික කාලයක් යනකොට එතන මහා වැලි ගොඩක් ඇති උනාලු. එයින් පේනවා ඒක අනුව කීකරුව ඒ අය තමන්ට ඇතිවන කෙලෙස් සිතිවිල්ලක් පාසාම වැලි මලු ගෙනත් දැම්ම බව. ඒ විදියට විශාල වැලි ගොඩක් හැදුනට පස්සේ අහිච්ඡත්තක කියල නාග රාජයෙක් ඒ වැලි ගොඩට අරක් ගත්තා, කියල කියනවා. දැන් අපට දක්නට ලැබෙන නාගයන් වගේ නොවෙයි. මෙතන කියන්නේ යම්කිසි භූත කොට්ඨාශයක්. අර මුචලින්ද නාග රාජයා ගැන හෙම කියවෙන්නේ, අන්න ඒ විදියෙ යම් කිසි ඍද්ධි බල ආදී විශේෂ ශක්තියක් ඇති ශරීර වේශය මාරු කරන්න පුළුවන් විදියේ බලසම්පන්න නාග රාජයෙක්. ඒ අහිච්ඡත්තක කියන නාග රාජයා, එතන පදිංචි වුණා.

ඉතින් ඒ වගේම මේ බ්‍රාහමණයාට, ඒ පිරිසට දන මාන ආදිය දෙන්න, අඟු මගධ රටින් නිතිපතාම විශාල පිරිස් එනවා. ඒ අයට මේ බ්‍රාහමණයා, ඍෂිවරයා දෙන උපදේශය මොකක්ද? පර්වත, ආරාම, වෘක්ෂ, වන ආදියෙහි සරණ යන්න. ඒවා සරණ යාමෙන් තමයි කෙනෙකුට මේ සංසාර දුකෙන් සියලු දුකෙන් මිදෙන්න පුළුවන්. ඒ විදියට අවවාද කරනවා. ඒවායේ සරණ යන්න කියලා. ඊළඟට ඒ වගේම තමන්ගේ ගෝලයින්ටත් ඒ විදියෙ අවවාදයක් දෙනවා.

ඉතින් ඔහොම කරගෙන යන අතරේ, කල් යාමේ දී බුදු පියාණන් වහන්සේ ලෝකයේ පහළ වී වදළා. උන්වහන්සේත් එක් අවස්ථාවක සැවැත් නුවර ජේතවනාරාමයේම වැඩ වාසය කරන අවස්ථාවේම උදෑසන මහා කරුණා සමාපත්තියෙන් ලෝකය බලා වදාරණකොට පෙනී ගියා, මෙන්න මේ අග්ගිදත්ත බ්‍රාහ්මණයාටත් ඒ පිරිසටත් රහත් වෙන්න හේතු සම්පත්තිය තියෙන බව. එහෙම දැකලා උපාය මාර්ගයක් උපක්‍රමයක් දැකලා වෙන්ට ඕනෙ, මුගලන් මහ රහතන් වහන්සේට ආරාධනා කළා, 'මොග්ගල්ලාන, පේන්නේ නැද්ද? මේ අග්ගිදත්ත බ්‍රාහ්මණයා විශාල පිරිසක් නොමඟ යවනවා. මේ පර්වත, වන, වෘක්ෂ ආදියෙහි සරණ යාමෙන්, දුක් කෙළවර කරන්න පුළුවන් කියලා ඒ විදියට දේශනාවක් කරමින්. ගිහිල්ලා, මේ බ්‍රාහ්මණයා ධර්මය පැත්තට හරවන්න.' කියා. මුගලන් මහ රහතන් වහන්සේ කියනවා, 'භාග්‍යවතුන් වහන්ස, මෙතන විශාල පිරිසක් ඉන්නව. මට තනියම ඒක කරන්න බැහැ. භාග්‍යවතුන් වහන්සේත් වැඩියොත් සමහර විට පුළුවන් වේවි කියල.' ඉතින් එවිට බුදු පියාණන් වහන්සේ. 'මොග්ගල්ලාන කලින් යන්න' කියලා එද හැන්දෑවේ මුගලන් මහ රහතන් වහන්සේ පිටත් කර වදළා.

මුගලන් මහ රහතන් වහන්සේත් ඒ ස්ථානයට යන්න කලින් කල්පනා කළා. මේ විශාල පිරිස ඉදිරියට ගිහිල්ලා මම යමක් කිව්වොත් ඒ අය කොටස කොටස නැගිටල ගියොත් හෙම මා බලාපොරොත්තු වන ඒ කාරණය කරන්න ලැබෙන්නේ නැහැ කියල, තමන්ගේ ඍද්ධි බලයෙන් ලොකු පොද ඇති වැස්සක් මැව්වා කියලා කියවෙනවා. ඒ වැස්ස නිසා ඒ තවුසන් තම තමන්ගේ පන්සල්වලට ඒ කියන්නේ කුටිවලට ඇතුල් උනා.

ඊළඟට මුගලන් මහ රහතන් වහන්සේ අග්ගිදත්ත බ්‍රාහ්මණයාගේ කුටිය ළඟට ගිහිල්ලා, 'අග්ගිදත්ත, අග්ගිදත්ත' කියලා නමින් කථා කළා. එතකොට අග්ගිදත්තට ඒ ගැන මානය නිසා යම්කිසි තරහක් ඇති උනා. කවුද මට ලෝකයේ මගේ නම කියලා කථා කරන්නේ කියලා, 'කවුද ඔය' කියලා ඇහුවා. 'මම පැවිද්දෙක්. අද රෑ නවතින්න මට ස්ථානයක් දෙන්න' කියලා. එතකොට 'එක එක්කෙනාට වෙන වෙනම කුටි තියෙන්නේ, අපට ඉඩ නැහැ' කියලා කිව්වා. 'එහෙම කියන්න එපා. මනුෂ්‍යයින් මනුෂ්‍යයින් ළඟටත්, ගවයින් ගවයින් ළඟටත්, පැවිද්දන් පැවිද්දන් ළඟටත් යන සිරිතක් තියෙනවා. ඒ නිසා මට අද රෑ නවතින්න තැනක් දෙන්න.' කියලා කිව්වා. එහෙම කියලා 'වෙන තැනක් නැති නිසා මට අර වැලි ගොඩේ ඉන්න පුළුවන්'

කිව්වා. 'එතන මහා නාග රාජයෙක් ඉන්නවා. භයානකයි. එතනට නම් යන්න එපා' කියල අවවාද කළා. නමුත් ඒකට කමක් නැහැ කියලා මුගලන් මහ රහතන් වහන්සේ ඒ රාත්‍රියේ වැලි ගොඩේ ගත කරන්න වඩිනවාත් එක්කම අර නාග රාජයාට විශාල කෝපයක් ඇතිවෙලා - ඊළඟට එතන සඳහන් වෙන්නේ ඒ සෘද්ධි බලයෙන්, නාග රාජයාගේ ශක්තියෙන් යම් කිසි ධූම වේගයක්, දුම් පිට කරන්න පටන් ගත්තා. මුගලන් මහ රහතන් වහන්සේත් තමන්ගේ සෘද්ධි බල ශක්තිය තුළින් දුම් පිට කළා. ඒවායින් අර නාග රාජයාට බාධා වෙනවා. මුගලන් මහ රහතන් වහන්සේට කිසි කරදරයක් වෙන්නේ නැහැ.

ඊළඟට අර නාග රාජයා ගිනි පිට කරන්න පටන් ගත්තා. මුගලන් මහ රහතන් වහන්සේත් තේජෝ ධාතු සමාපත්තියට සමවැදිලා ඒ විදියට ගිනි පිට කළා. අන්තිමේ දී කොහොම හරි නාග රාජයා දමනය උනා. දමනයවෙලා අන්තිමට මුගලන් මහ රහතන් වහන්සේට ආවරණ වශයෙන් පෙන ගොබය වටේ තියලා, උන්වහන්සේට ඒ රාත්‍රිය එතන ගත කරන හැටියට සකස් උනා කියලා එතන කියවෙනවා. නමුත් අර බ්‍රාහමණයින් අර ගිනි පිටවෙනවා දුම් පිටවෙනවා දැකලා හිතුවා, දැන් ඉතින් මේ ශ්‍රමණයාගේ මේ පැවිද්දාගේ ජීවිතය විනාශ වෙන්න ඇති කියලා. උදෑසන බලන විට මුගලන් මහ රහතන් වහන්සේ කදිමට ඉන්නවා. එතකොට ඒක ගැන විස්තරය ඇහුවහම මේ අය සියල්ලෝම පුදුම උනා. මේ තරම් බලසම්පන්න පැවිද්දෙක්ය මේ කියලා.

එහෙම සතුට ප්‍රකාශ කරන අවසථාවේම බුදු පියාණන් වහන්සේ එතනට වැඩම කළා. එතකොට මුගලන් මහ රහතන් වහන්සේ නැගිටලා බුදු පියාණන් වහන්සේට වන්දනා කරනකොට මේ අය වඩාත් පුදුම උනා. ඔබ වහන්සේටත් වඩා බලසම්පන්න කෙනෙක්ද කියලා ඇහුවහම මේ මගේ ශාස්තෲන් වහන්සේ කියලා කිව්වා. අන්න ඒ අවසථාවේ දී බුදු පියාණන් වහන්සේ මේ අගගිදතත බ්‍රාහමණයාගෙන් ඇසුවා, 'බමුණ ඔබ කොයි විදියටද මේ පිරිසට ධර්මය දේශනා කරන්නේ?' කියලා. අන්න ඒ අවසථාවේ අගගිදතත බ්‍රාහමණයා ප්‍රකාශ කළා, 'මම කියන්නේ පර්වත, වන, ආරාම, වෘක්ෂ ආදියෙහි සරණ යාමෙන් මේ දුකින් මිදෙන්න පුළුවන් කියන එක.' අන්න එතකොට බුදු පියාණන් වහන්සේ අපි අර සඳහන් කළ ගාථා පෙළ වදළා කියලයි - ඒ විදියටයි පොත්වල දැක්වෙන්නේ.

දැන් ඒ ගාථාවල සාමාන්‍ය අර්ථය අපි බලමු.

බහුං වෙ සරණං යන්ති - පබ්බතානි වනානි ච
ආරාම රුක්ඛ චෙත්‍යානි - මනුස්සා භය තජ්ජිතා

බියෙන් තැති ගත් බොහෝ මනුෂ්‍යයෝ පර්වත, වන, ආරාම, වෘක්ෂ ආදියෙහි සරණ යනවාය. ඒවායේ පිහිට සොයා යනවාය.

නෙතං ඛො සරණං ඛෙමං - නෙතං සරණ මුත්තමං
නෙතං සරණ මාගම්ම - සබ්බ දුක්ඛා පමුච්චති

නමුත් මෙන්න මේ කියන දේවල් නියම ආරක්ෂා සහිත පිහිට සරණ නොවේ. 'නෙතං ඛො සරණං ඛෙමං - නෙතං සරණ මුත්තමං' මේක නියම උතුම්ම සරණක් නොවේ. මේ විදියේ පිහිට සොයා යාමකින් සියලු දුකෙන් මිදෙන්න බැරිය කියල ඒ විදියට බුදු පියාණන් වහන්සේ විස්තර වශයෙන් ප්‍රකාශ කරනවා. ඊළඟට ප්‍රකාශ කරනවා කොහොමද දුකෙන් මිදෙන්නේ කියලා.

යො ච බුද්ධං ච ධම්මං ච - සංඝං ච සරණං ගතො
චත්තාරි අරිය සච්චානි - සම්මප්පඤ්ඤාය පස්සති
දුක්ඛං දුක්ඛ සමුප්පාදං - දුක්ඛස්සච අතික්කමං
අරියං චට්ඨංගිකං මග්ගං - දුක්ඛූපසම ගාමිනං

නමුත් යම් කිසි කෙනෙක් බුදුන් දහම් සඟුන් කියන ඒ තුණුරුවනගේ සරණ යයිද. ඒ වගේම දුකත්, දුකේ හට ගැනීමත්, දුක ඉක්මවා යාමත්, ඒ දුක සමනය කිරීමේ සංසිඳවීමේ මාර්ගයත් කියන ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයත් කියල කියන මෙන්න මේ චතුරාර්‍ය්‍ය සත්‍යය සම්‍යක් ප්‍රඥාවෙන්, මහා ප්‍රඥාවෙන් දකී ද,

එතං ඛො සරණං ඛෙමං - එතං සරණ මුත්තමං
එතං සරණ මාගම්ම - සබ්බ දුක්ඛා පමුච්චති

මෙන්න මේකයි නියම ආරක්ෂා සහිත පිහිට යාම, සරණය. 'එතං සරණ මුත්තමං' මේකයි නියම උතුම්ම සරණය.

'එතං සරණ මාගම්ම - සබ්බ දුක්ඛා පමුච්චති'

මෙන්න මේ පිහිට මේ සරණ යාමෙන් තමයි සියලුම සංසාර දුක්ඛයෙන් මිදෙන්න පුළුවන් කියලා ඒ විදියට බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කොට වදාළා.

එතකොට මේ ගාථා ආශ්‍රයෙන් මේ කථාව ආශ්‍රයෙන් අපට ධර්ම කාරණා රාශියක් මතු කර ගන්න පුළුවන්. කථාව ගැන කල්පනා කරලා බැලුවත් දැන් මේ කාලයේ හැටියට නම් මේවායේ අද්භූත වශයෙන් තිබෙන දේවල් පෙනෙනවා. විශේෂයෙන්ම ඍද්ධි ප්‍රාතිහාර්ය පිළිබඳව. දැන් මේ කාලයේ නම් මේ අයට සැක කරන්න පුළුවන් තරම් දේවල්. නමුත් බුද්ධ කාලයේ මුගලන් මහ රහතන් වහන්සේ මහා ඍද්ධිමතුන් ගෙන් අග්‍රය කිව්වහම මහ පුදුම දේවල් මේ ධර්මයේ සඳහන් වෙනවා. දැන් මෙතන වැදගත්ම කාරණය තමයි අග්ගිදත්ත බ්‍රාහ්මණයාගේ පැවිදි වීම ගැන.

පැවිදි වීම කියන එක දැන් මේ කාලයේත් බොහොම පහසුවෙන්ම කරන දෙයක්. නමුත් ඍෂි ප්‍රව්‍රජ්‍යාව, නමුත් මේ අග්ගිදත්ත බ්‍රාහ්මණයා පැවිදි උනේ කොහොමද? කන්න, බොන්න, අඳින්න, පළඳින්න, සමාජ තත්ත්වයක්, ඒවා නැති නිසා නොවේ. ලෙඩ දුක් නිසා නොවේ. රාජ ගෞරවය ඉහළම මට්ටමින් ලැබිලා තිබෙද්දිත්, රජු හා සමාන ආසනයක ඉඳගන්න තරම් ශක්තියක් ලැබිලා තියෙද්දිත් ඕනම දෙයක් 'කියලා කරවා ගන්න' පුළුවන් තරම් තත්ත්වයක් තිබෙද්දිත්, ඒ තරම් රටෙත් රජුගේත් ප්‍රසාදය තිබෙද්දී අර දුර දක්නා නුවණින් කල්පනා කළා. මේ තත්ත්වය හැමදම තියෙන්නේ නැහැ. මම දැන් මහළුයි. මම දැන් ඉතින් විශ්‍රාම යන්න ඕන, විශ්‍රාම යන්න ඕන සම්පූර්ණයෙන්ම.

විශ්‍රාම යන්න ඕන කිව්වහම මේ කාලේ විශ්‍රාම ගිහිල්ලා කරන දේවල් නොවේ ඒ බමුණා කළේ. දැන් ඉතින් ඊළඟට විශ්‍රාම යනව කිව්වහම විශ්‍රාම යන්නෙත් තවත් ටිකක් ඉතුරු කරගෙන. ඔක්කොම දෙර දන් දුන්නා. ඒ සියලු ධන සම්පත්තිය අණ බෙර ලවා දෙරවල් ඇරලා, භාණ්ඩාගාරය ඇරලා, ඔක්කොම දීලා ඒවායින් නිදහස් වෙලා තමයි පැවිද්දට ගියේ. අන්න ඒක අපට පාඩමක්. ඒ බාහිර තවුසන් කියල කියනකොට අපි මිථ්‍යා දිට්ඨික කියල කිව්වට මොකද, වටිනා පාඩමක් එතන දීල තියෙන්නේ, දැන් කාලේ පැවිද්ද ගැන හිතල බලනකොට. ඒ නෙක්ඛම්මය තුළ එන ශක්තියම තමයි පැවිද්ද ඉදිරියට ගෙන යන්න උපකාර වෙන්නෙ. නෙක්ඛම්මය නැති තැන ඒක නිකම්ම පැවිද්දක්. නිකම්ම හිස් පැවිද්දක්. ඒක තුළ ශක්තියක් නැහැ. ඉදිරියට යන්න බැහැ. ආපස්සට කරකැවිල එනවා. නමුත් ඒවා අර අතීතයේ ඍෂි ප්‍රව්‍රජ්‍යාව ගැන ඒ අබුද්ධෝත්පාද කාලවල පවා මහරජ දරුවන් පවා 'රාජ ඍෂි' කියල කියනවා. රජකම අතහැරල ගිහිල්ල හිමාලය

වනයේ තවුස් දම් රැක්කේ අර සියලුම සැප සම්පත් අතහැරලා අළුයම ලූ කෙළ පිඩක් හැටියට, නිකන්ම නොවේ.

අන්න ඒ විදියටයි සඳහන් වෙන්නේ. ඉතින් මෙතනත් ඍෂි ප්‍රව්‍රජ්‍යාව අනුව ඒ චාරිත්‍රය - කියන්නේ සනාතන චාරිත්‍රයක් නෙක්ඛම්මය පිළිබඳව - ඒ චාරිත්‍රයට ගරු කරමින් අග්ගිදත්ත බ්‍රාහ්මණයා ගිය ඒ නික්මීමම අපට පාඩමක්, දැන් කාලේ කල්පනා කරල බලනකොට. ඉතින් එතන ඉඳල කියන ටිකත් බලමු.

ඊළඟට ඇත්ත වශයෙන්ම අර කාම විතර්ක ආදී කෙලෙස් විතර්ක නැති කිරීම සඳහා එක්තරා උපාය මාර්ගයක් ඒ බමුණා තමන්ගේ ශ්‍රාවකයන්ට කිව්වා. ඒ වගේම ශ්‍රාවකයනුත් ඒක අනුව කීකරුව ක්‍රියා කළ බව පේනවා. කෙලෙස් සිතිවිලි එනවාත් එක්කම, කාම සිතිවිලි ද්වේශ සිතිවිලි ආදී ඒ සිතිවිලි එනකොට කළේ මොකක්ද, දුවලා ගිහිල්ලා ඒ වෙලේම වැලි මල්ලක් ගෙනාවා. එතනත් තියෙන ධර්මතාව අපි කල්පනා කරල බැලුවොත් අර කෙලෙස් විතර්කයට ඉඩ නොදී වෙන වැඩකට හිත යොමු කිරීමෙන් අර කෙලෙස් විතර්කය කැපුවා. අන්න ඒ විදියේ වැඩක් එතනත් තිබෙනවා, එක්තරා උපක්‍රමයක්. ඒ තුළින් තමයි අර බමුණන් විශාල ශක්තියක් ඇති කර ගත්තේ. කොයි තරම් ද කියතොත් අර දේශනාව අවසානයේ දී අර සියලුම තවුසන් පටිසම්භිදා සහිත අර්හත්වයට පත්වෙලා බුදු පියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් බවට පත්වුණා, කියලා කියනවා ඒහි භික්ෂුභාවයෙන්.

එතකොට අන්න ඒ තරම් ශක්තියක් ඇති කර ගන්ට උපකාර වුණේ මේ කෙලෙස් මර්දනය කිරීමේ කාර්යය ඒ අවස්ථාවේ ඉඳලම ඇරඹුණු නිසයි. ඉතින් ඔය විදියට ඒක නිසාම තමයි අර විශාල පිරිසක් ඒ අයගේ දායකයින් හැටියට අනුග්‍රහය කළේ. අන්තිමේ දී බුදු පියාණන් වහන්සේගේ ඒ ධර්ම දේශනාව අහලා ඒ අය තේරුම් ගත්තා නියම ආකාරයේ සරණ යාම පිහිට යාම මේක නොවේ. පර්වත වන ආදියේ සරණ යාම නොවෙයි. මෙන්න මේ ත්‍රිවිධ රත්නය සරණ යාමයි කියලා. ඒක තේරුම් අර ගැනීම නිසා තමයි අර ගාථා සහිත බුද්ධ දේශනාව අහලා ඒ බමුණන් තුළ ඇතිවුණු චිත්ත විප්ලවය, පරිවර්තනය කොයි තරම්ද කියතොත් අර්හත්වයට පත්වුණා කියල කියනවා. ඊළඟට ඒහි භික්ෂුභාවයෙන් බුදු පියාණන් වහන්සේ ඒ අයට පැවිද්ද ලබා දුන්නා.

අන්න ඒ විදියටයි ඒ ධර්මයේ සඳහන් වෙන්නේ. විශාල පිරිසක් තුළ ත්‍රිවිධ රත්නය කෙරෙහි භක්තිය ඇතිවුණා වගේම චතුරාර්‍ය සත්‍යය අපි සරණ යාම කියන එක සාමාන්‍යයෙන් තේරුම් ගන්නේ බුදුන් සරණ යාම, දහම් සරණ යාම, සඟුන් සරණ යාම කියලයි. නමුත් මෙතන මේ ගාථාවේ කියවෙනවා එපමණක් නොවෙයි ඒ සරණ යාම එතනින් ආරම්භ වෙනවා. කෙළවර වන්නේ චතුරාර්‍ය සත්‍යය අවබෝධ කර ගැනීමෙන්. මේ සංසාර පැවැත්ම දුකක්ය. එයට හේතුව තණ්හාවය, ඒ තණ්හාව නිවීමය නිවන කියන්නේ, එයට මාර්ගය ආර්‍ය අෂ්ටාංගික මාර්ගයයි කියල කියනවා. ඒ ගාථාවල අර්ථය හරියාකාරව තේරුම් ගැනීමෙන් අර විශාල පිරිස අන්තිමට බුද්ධ ශ්‍රාවක තත්ත්වයට පත් වුණා. ඒ අවස්ථාවේම අඟු, මගධ දෙරටින් විශාල පිරිසක් තව දායක පිරිසක් පැමිණියා. ඒ පැමිණි අයත් මේ ඇතිවුණු පරිවර්තනය දැකල මුලදී කල්පනා කළා බුදු පියාණන් වහන්සේ මේ අග්ගිදත්ත බ්‍රාහ්මණයාගේ ගෝලයෙක් කියලා. ඒක නැති කරන්න බුදු පියාණන් වහන්සේ අග්ගිදත්ත බ්‍රාහ්මණයාට ඒ අවස්ථාවේ ප්‍රකාශ කළා කියලා සඳහන් වෙනවා, මේ පිරිසගේ සැක සංසිඳවන්න කියලා. එතකොට අග්ගිදත්ත බ්‍රාහ්මණයා තමන් ලබාගෙන තිබුණු ඍද්ධි ශක්තියෙන් අහසට පැන නැඟිලා හත් සැරයක්ම බුදු පියාණන් වහන්සේට වන්දනා කරලා, 'භාග්‍යවතුන් වහන්සේ ශාස්තෘන් වහන්සේ, මම ගෝලයා.' මම ශ්‍රාවකයා කියලා පැමිණි දායක පිරිසගේ සැකය දුරු කළ බව කථාන්තරයේ තව දුරටත් සඳහන් වෙනවා.

එතකොට මෙන්න මේ කථාව තුළින් අර මුලින් පැවිද්ද පිළිබඳ ආදර්ශය වගේම ඊළඟට පැවිදි පිරිස තුළ මේ දේශනාව නිසා ඇතිවුණු චිත්ත විප්ලවය පරිවර්තනය ඒක ගැනත් අපි කල්පනා කර බැලිය යුතුව තිබෙනවා. දැන් මේ කාලේ බොහෝ දෙනා තමන්ගේ මේ සංසාර දුක ඒ වගේම ජීවිතයේ ඇතිවන නොයෙක් දුක් සහිත අවස්ථාවල් නිසා ඒවායේ පිහිට සොයා යනවා, සරණ සොයා යනවා. ඉතින් මෙන්න මේ පිහිට සොයා යාම සරණ සොයා යාම නියම ආකාරයෙන් ඵලවත් වෙන්නේ සාර්ථක වෙන්නේ කොහොමද කියන එකයි මේ දේශනාවේ කියවෙන්නේ. බුදුන් දහම් සඟුන් සරණ යාම. සාමාන්‍ය ලෝකයා හිතන්නේ ගස් ගල්වල, පර්වතවල, යම් කිසි ගුප්ත බලවේගයක් තියෙනවා. ඒවා තුළින් ඒ බලවේග වලින් ආරක්ෂාව බලාපොරොත්තු වීමයි සාමාන්‍ය ලෝකයා කල්පනා කරන්නේ.

නමුත් බුදු පියාණන් වහන්සේ දක්වා වදාළා ලෝකයාට නියම පිළිසරණය සසර දුක කොටින්ම ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදී සියලු

සංසාර දුකින් මිදීමට නම් මෙන්න මේ බුද්ධ රත්නය, ධර්ම රත්නය, සංඝ රත්නය කියන ත්‍රිවිධ රත්නයේ පිහිට සොයා යා යුතු බව. ඒක නිසාම තමයි මේ පින්වතුන් දන්නවා ධර්මයේ සඳහන් වෙනවා, කෙනෙක් උපාසකයෙක් වෙන්නේ, අවම මට්ටමින් දක්වන්නේ, අවශ්‍යතාව 'බුද්ධං සරණං ගතො හොති, ධම්මං සරණං ගතො හොති, සංඝං සරණං ගතො හොති' කියලා. යම් කෙනෙක් බුදුන්, දහම්, සඟුන් සරණ යේද, එපමණකින්ම උපාසකයෙක් වෙනවා කියලා. ඉතින් ඒ උපාසක උන්නැහේ - උපාසක තැනැත්තා - ශීලවන්තයෙක් වීමටයි අර යම් කිසි පඤ්ච ශීලාදී ශීලයක් සමාදන් වෙන්නේ. ඉතින් අවම මට්ටමින් එහෙම කිව්ව පමණින් කෙනෙක් හිතන්න නරකයි අපි මේ තුන් සැරයක් 'බුද්ධං සරණං ගච්ඡාමි' කිව්වාම ඔක්කොම සම්පූර්ණයි කියල. ඒක නිසාම තමයි අර ගාථාවේ කියන්නෙ සරණ යාමට අනතුරුවම ඊළඟට දුකත්, දුකේ හට ගැනීමත්, දුක ඉක්මවීමත්, දුක්ඛ නිරෝධය කියන එක - නිවන. ඊළඟට ඊට උපකාර වන ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයත් කියන ඒ චතුරාර්‍ය්‍ය සත්‍යය සම්‍යක් ප්‍රඥාවෙන්, මහා ප්‍රඥාවෙන් දකින්න ඕන. අන්න එහෙම දැකීමෙන් තමයි ඇත්ත වශයෙන්ම සංසාර දුකින් මිදීම කියල කියන්නේ. එතකොට සරණ ගමනය සම්පූර්ණ වීමට නම් මේ මාර්ගයේ යා යුතුව තිබෙනවා.

ඊළඟට අපි මේ සරණ ගමනය ගැන පමණක් හිතල බැලුවත් මේ පින්වතුන් අහල තියෙනවා මේ 'ධජග්ග' කියලා පිරිතක් තියෙනවා, 'ධජග්ග සූත්‍රයේ'. එතනදී බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. ආරණ්‍ය ගතව, වෘක්ෂ මූල ගතව, සුඤ්ඤාගාර ගතව භාවනා කරන සංඝයා වහන්සේලාට පවා යම් කිසි භයක්, තැති ගැනීමක්, ලොමු දැහැ ගැනීමක් ඇති උනහම තමන් වහන්සේ සිහි කරන්න කියලා බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරනවා. කොහොමද සිහි කරන්නේ. මේ පින්වතුන් කවුරුත් දන්නවා අර 'ඉතිපි සො' පාඨයෙන්. 'ඉතිපි සො භගවා' ආදී ඒ බුදු පියාණන් වහන්සේ සිහි කිරීම සඳහා තිබෙන නව ගුණ පාඨය සිහිපත් කරන්න. මා පිළිබඳව සිහිපත් කරන්නේ නැත්නම් ධර්මය හෝ සිහිපත් කරන්න. ධර්මයේ ගුණ හය ස්වාක්ඛාතාදී ගුණ හය. ඒක සිහිපත් කරන්නේ නැත්නම් සංඝයා වහන්සේලාගේ ගුණ නවය සුපටිපන්නාදී ගුණ නවය සිහිපත් කරන්න. එහෙම සිහිපත් කරද්දී අර ඇතිවන බිය තැති ගැන්ම ලොමු දැහැ ගැන්ම නැතිව යනවා කියලා ධජග්ග සූත්‍රයේ ආරක්ෂක මන්ත්‍රයක් හැටියට දක්වලා තියෙනවා, මේ සූවිසි මහා ගුණය. එතකොට ලෝකයාට එකම පිළිසරණය මෙන්න මේ සූවිසි මහා ගුණය බව මතක තබා ගත යුතුව තිබෙනවා. ඒ නිසාම

තමයි ඔය රතන සූත්‍රයේ දක්වා තිබෙන්නේ, එතන සත්‍ය ක්‍රියාවකට පවා පදනම් කර ගන්න පුළුවන් බුදු ගුණ ආදී තුණුරුවන්ගේ ගුණ.

රතන සූත්‍රයේ නිදාන කථාවේ එහෙමත් සඳහන් වෙන්නේ විශාලා මහ නුවර අර තුන් බිය - අමනුෂ්‍ය බිය, රෝග බිය, ඊළඟට දුර්භික්ෂ බිය නිසා ඇතිවුණ මහා විනාශය අවස්ථාවේදී බුදු පියාණන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේට පැවරුවා මේ රතන සූත්‍රයේ තිබෙන ගාථාවලින් 'එතෙන සච්චෙන සුවත්ථි හොතු' කියලා මේ සත්‍යයෙන්, සත්‍ය ක්‍රියා බලයෙන් ඒ ප්‍රදේශයට සැප පැතුවා. ඉනුත් අපට පේනවා හොඳ නිදර්ශනයක්, ඒක තුණුරුවන් තුළ ඇති ශක්තිය. මේ තුණුරුවන් තුළ ඇති ශක්තිය සත්‍යයේ ශක්තියයි. ලෝකයේ නිත්‍ය වශයෙන්ම පවතින ධර්මතාවක් ඒක. සත්‍යය තුළ විශාල ශක්තියක් තිබෙනවා, සත්‍යක්‍රියා තුළ. ඔය ජාතක කථා ආදියේ බොහෝ විට දකින්න ලැබෙනවා කියවෙනවා බෝධිසත්ත්වයන් වහන්සේ තුළ තිබෙන දුර්වලතාවන් අනුව නොයෙකුත් අවස්ථාවන් වල අනෙකුත් ශික්ෂාපද හෙම කැඩුවා. නමුත් සත්‍යය පිළිබඳව ඒ කියන්නේ මුසාවාදය පිළිබඳව දැඩිවම ඒ ශික්ෂාපදය රැක්ක බව, සත්‍යය රැක්ක බව. ඒක නිසාම බුදු පියාණන් වහන්සේගේ චරිතයේ දැක්වෙනවා සත්‍යයේ ප්‍රාතිහාර්යය.

ඉතින් ඒකම තමයි මෙතන තියෙන්නේ. තුණුරුවන්ගේ ගුණ. ඒ සූවිසි මහා ගුණ සත්‍යයක්. ඒ සත්‍යයේ බලයෙනුයි අර විදියට 'එතෙන සච්චෙන සුවත්ථි හොතු' ඔය විදියට නොයෙකුත් ආකාරයෙන් ආශීර්වාදත්මක ගාථාවල ත්‍රිවිධ රත්නය අරමුණු කරගෙන ත්‍රිවිධ රත්නය පිහිට කරගෙන ලෝකයාට ශුභ පතල තියෙනවා. එදිනෙදා ජීවිතයේ එන ගැටළු වලදී ආපදා වලදී පවා තුණුරුවන්ම පිහිට ලෙස සලකන්න වටිනවා. ඒ වගේම විශේෂයෙන්ම මෙතන සසර දුක් කියල කියන ඒ භයානක දුක, ඒ විපත, ඒකෙන් එසේ මෙසේ මිදෙන්න බැහැ. වචන මාත්‍රයෙන් තුණුරුවන් සරණ ගිහිල්ල මිදෙන්න බැහැ. තුණුරුවන් සරණ සම්පූර්ණ වෙන්න නම් බුදු පියාණන් වහන්සේ දකින්න ඕන. ධර්මය දකින්න ඕන. සංඝ රත්නය දුටු ඒ ප්‍රත්‍යක්ෂය තමන් දකින්ට ඕන. අෂ්ටාර්යපුද්ගල මහා සංඝ රත්නය ගිය මාර්ගයේ ගමන් කරලා එහි ප්‍රතිඵලය දකින්ට ඕන. අන්න ඒකයි මෙතන කියවෙන්නේ. අර චතුරාර්යසත්‍යය අවබෝධ කර ගන්නයි කියල සම්‍යක් ප්‍රඥාවෙන්.

ඉතින් ඒ අතින් කල්පනා කරල බලනකොටත් මේ චතුරාර්ය සත්‍යය පිළිබඳව අපි හිත යෙදිය යුතුව තිබෙනවා. මුළු මහත් ධර්මයම කෙටියෙන් හැඳින්වුවොත් මොකක්ද මේ බුදු පියාණන් වහන්සේ

දේශනා කළ ධර්මය කියලා ඔන්න ඔය චතුරාර්ය සත්‍ය දේශනාවයි. ඒකම තමයි ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ බුදු පියාණන් වහන්සේ සවිස්තරව ඉදිරිපත් කරල තියෙන්නේ. මේ ජාති ජරා ව්‍යාධි ආදී ඒ සියලු සංසාරික දුක්ඛ සමූහයම තමයි බුදු පියාණන් වහන්සේ එතන දුක්ඛ සත්‍යය හැටියට දක්වා වදාළේ. ඊට හේතුවයි තණ්හාව හැටියට බුදු පියාණන් වහන්සේ දක්වා වදාළේ. ලෝක සත්ත්වයා තුළ තිබෙන කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා ආදී වශයෙන් දක්වන ඒ තණ්හාව නිසා මේ සංසාරයේ අනන්ත කාලයක් ජාති ජරා ආදී දුක් විඳිනවය, ලෝක සත්ත්වයා. තණ්හාව නැති කරල මේ තණ්හාව සංසිඳවාගත් තත්ත්වයටම තමයි මේ නිවන කියලා කියන්නේ. ඒ නිවීමයි ඒකට යන මාර්ගයයි අර සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි කියල කියන ආර්ය අෂ්ටාංගික මාර්ගය. එතකොට මෙන්න මේ මාර්ගය සම්පූර්ණ කිරීමෙන්, ලෝකෝත්තර වශයෙන් සම්පූර්ණ කිරීමෙන් තමයි, මුළු මහත් සංසාර දුකින් මිදෙන්ට පුළුවන් වන්නේ. ඒ විදියට දක්වලා තිබෙනවා.

එතකොට මේක තවත් ටිකක් කල්පනාකාරීව බලනකොට මෙතන මේ සම්‍යක් ප්‍රඥාව කියන්නේ මේ අප කා තුළත් යමක් වටහා ගැනීමේ, අවබෝධ කර ගැනීමේ ශක්තියක් තියෙනවා. නමුත් මේ කියන ප්‍රඥාව ඒ විධියට තර්ක ආශ්‍රයෙන් ලබා ගන්න එකක් නොවෙයි. භාවනාමය වශයෙන් දියුණු කර ගත යුතු එකක් ඒක. ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩනවා කියලා මේ හැම කෙනෙක්ම එක්තරා උත්සාහයක් කරනවා. ඒක නිකම් සිල්ලර වශයෙන් කරන උත්සාහයක්. ටික ටික ආර්ය අෂ්ටාංගික මාර්ගය පුළු පුළුවන් මට්ටමින් වැඩීමට උත්සාහ කරනවා. නමුත් ඒකෙ යම් යම් ඇද කුද තියෙනවා. ඒක නිසා තමයි අර වෙනමම කුසල කර්මයක් හැටියට දක්වලා තියෙන්නේ 'දිට්ඨිජ්ජු' කර්ම කියලා. දෘෂ්ටිය ඍජු කරගන්න උත්සාහයක් කරන්නේ සාමාන්‍ය පෘථග්ජන පුද්ගලයා.

ආර්ය අෂ්ටාංගික මාර්ගය පෘථග්ජනයාට සම්පූර්ණව නැහැ. ඒකෙ ඇද කුද තිබෙනවා. ඒක පෙළ ගැස්වීමට ඍජු කර ගැනීමට කරන උත්සාහයක් තමයි කරන්නේ. එහෙම පෙළ ගැස්වීමට කරන උත්සාහය සාර්ථක වන්නේ භාවනාවක් මුදුන් පත් වෙන අවස්ථාවෙයි. ඵලවත් වන අවස්ථාවෙයි. ශීලය මත පිහිටලා සමාධිය වඩලා යම් අවස්ථාවක විදර්ශනාවෙන් චතුරාර්ය සත්‍යය අවබෝධ කරනවා නම් අන්න ඒ අවස්ථාවේදී තමයි ආර්ය අෂ්ටාංගික මාර්ගය, එතන සඳහන් වෙනවා

ධර්මයේ දක්වෙන්නේ ඒ ලෝකෝත්තර මාර්ගය. ඇත්ත වශයෙන් අර ලෞකික වශයෙන්, සිල්ලර වශයෙන් වගේ වඩනවා. නමුත් ලෝකෝත්තර මාර්ගයේදී අර අංග අටම එක සිතක පහළ වෙනවා කියනවා. අංග අටම එක සිතක ඉතාම ක්ෂණිකයි. ඒ ක්ෂණික සමාධියක් වශයෙන් මාර්ග සමාධිය පහළ වෙන බව සඳහන් වෙනවා. ඒක ඉතාම ගැඹුරු කාරණයක්. යම්තමින් සිතා ගන්න පුළුවන් සම්මා දිට්ඨිය පෙරටු කරගෙනයි මේ අංග අට තිබෙන්නේ. මේ සම්මා දිට්ඨිය පෙරටු කරගෙන තිබුණාට මොකද අනික් අංග එක එක අතටයි තියෙන්නේ. ඒවායේ හරියට ඇද කුද තියෙනවා. මේවා කෙලින් කරල ගත්තහම මේ සම්මා දිට්ඨිය අන්තිමට දියුණුවෙලා සම්‍යක් දර්ශනය බවට පත් වෙනවා.

අන්න ඒක තමයි ඒ මාර්ග ඥාන අවස්ථාවේදී සිදුවන්නේ. ඒකයි බුදු පියාණන් වහන්සේ මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය ඍජු මාර්ගයක් කියල වදාළේ. මේක ඍජු කරගන්න වෙනවා. ඍජු හැටියටම පහළ වෙන්නෙ අන්න අර ලෝකෝත්තර තත්ත්වයේදී. සෝවාන් තත්ත්වයේදී පළවෙනි වරට, ඒ ඍජු කරගැනීම මොකටද? මේ සංසාරයේ බලගතු කෙලෙස් සමූහයක් කෙලෙස් කන්දරාවක් මේ චිත්ත සන්තානයේ තැන්පත් වෙලා තිබෙනවා. මේක එහෙම පිටින්ම වසාගෙන තිබෙනවා මලකඩ රාශියක් වගේ. මේක එසේ මෙසේ චින්තන ශක්තියකින් කපන්න බැහැ. කපන්න පුළුවන් වෙන්නේ මාර්ග චිත්ත සමාධියෙන්. මහා බලසම්පන්න සමාධියක් ලෝකෝත්තර සිත කියන එක. මේ භාවනාමය වශයෙන් ධ්‍යාන ආදියත් බොහොම බලසම්පන්න සිත්, පළවෙනි ධ්‍යාන දෙවෙනි ධ්‍යාන වශයෙන් දක්වෙනවා. නමුත් ඒ සාමාන්‍ය ධ්‍යාන චිත්තයටත් වඩා බලගතුයි ලෝකෝත්තර මාර්ග සමාධියක්. ඒක තුළින් තමයි මේ කෙලෙස් කපන්න පුළුවන් වන්නේ. අන්න ඒක නිසා තමයි ඔය

'යං බුද්ධසෙට්ඨො පරිවණ්ණයී සුචිං
සමාධි මානන්තරිකඤ්ඤ මාහු
සමාධිනා තෙන සමො න විජ්ජති'

ඒ විදියට දක්වනවා. ඒ ලෝකෝත්තර සමාධිය වෙන කිසිම සමාධියකට සම කරන්න බැරි තරම් බලසම්පන්න බලගතු සමාධියක් කියල. ඒ බලගතු බව ලැබෙන්නෙ අන්න අර අංග අටම එකතුවෙලා එක ක්ෂණයකම සම්මා දිට්ඨිය සම්‍යක් දර්ශනයක් හැටියට වගේ පහළ වෙනවා. ඒක තුළින් තමයි සෝවාන් මාර්ගයේ එක මට්ටමකින් ඒ

බලගතු කෙලෙස් කඩලා ජීවිත හතකට පමණක් ඉතුරු කරනවා. සකදාගාමි තත්ත්වයේදී, දෙවෙනි තත්ත්වයේදී තවත් දුරට ඒක අඩු කරලා නැවත එක වරක් පමණක් මෙලොවට එන හැටියට. අනාගාමි තත්ත්වයේදී බ්‍රහ්ම ලෝකයට ගිහිල්ලා කෙළවර කරන හැටියට. ඊළඟට අරහත් තත්ත්වයේදී සම්පූර්ණයෙන්ම ජාති, ජරා, ව්‍යාධි, මරණ ආදී සියලු සංසාර දුකින් මිදිලා, ඒ කර්ම ශක්තියත් බිඳලා, නැවත නූපදින තත්ත්වයකට පත් කරනවා. අන්න ඒක තමයි එතකොට සියලු සංසාර දුකින් මිදීම කියලා කියන්නේ. ඉතින් ගැඹුරු කොටසකුත් මෙන්න මේ සරණ යාමේ ඇති බව මේ පින්වත් පිරිස් කල්පනා කරන්න ඕන. එහෙම නැත්නම් සාමාන්‍යයෙන් හිතෙන්න පුළුවන් අපි 'බුද්ධං සරණං ගච්ඡාමි, ධම්මං සරණං ගච්ඡාමි, සංඝං සරණං ගච්ඡාමි,' කිව්ව පමණින් අපි ඔක්කොම බෞද්ධයෝ මේ ඔක්කොම වැඩ සම්පූර්ණයි කියල. නමුත් මෙතන සාමාන්‍යයෙන් පාවිච්චි කරන්නේ '<u>සරණගමනය</u>' කියලා. සරණගමනය කියන එක භාෂාවේ ව්‍යාකරණය අනුව හිතුවොත් සරණයකට <u>පැමිණීම</u>, පිහිටකට <u>පැමිණීම</u> කියන එකයි. නමුත් ඇත්ත වශයෙන්ම '<u>සරණගමනයම</u>' එතන තියෙන්නෙ - 'පිහිට සොයා යාම'

ඉතින් මේ පිහිට සොයා යන ගමන සම්පූර්ණ වන්නේ චතුරාර්‍ය සත්‍යය අවබෝධයෙන්. නියම වචනය තුන් සරණ ගමනය කියලයි කියන්න තියෙන්නෙ. තුණුරුවන් සරණ යාම. මේ සරණ යාමේ ඉලක්කය කෙළවර වන්නේ නිවනින්. එතෙක් යන ගමනයි, ඇත්ත වශයෙන් සද්ධාවෙන් ආරම්භ කළ යුතු දෙයක්. ඔන්න ඊළඟට අපි කල්පනා කරල බලමු දැන් මේ සද්ධාව ගැන. දැන් මෙතනත් අපි දන්නවා බුද්ධානුස්සතිය, ධම්මානුස්සතිය, සංඝානුස්සතිය වඩන්න අප තුළ යම්කිසි සද්ධාවක් ඇතිවෙන්න ඕන. එහෙම නැති කෙනාට - තර්කය විතරක් ගත්තු කෙනාට - මේකෙ අර්ථයක් පේන්නෙ නැහැ හදවතට දැනෙන තරමට අර ගුණ සම්පත්තිය බුදු ගුණ සම්පත්තිය, දහම් ගුණ සම්පත්තිය, සඟ ගුණ සම්පත්තිය - හිතට කා වදින්න ඕන.

එහෙම කෙනාට තමයි ඔන්න ඊළඟට බුද්ධානුස්සති වශයෙන් - බුද්ධානුස්සති කියල කියන්නේ බුදු ගුණ නැවත මෙනෙහි කිරීම, සිහිපත් කිරීම. ධම්මානුස්සති කියන්නේ දහම් ගුණය නැවත නැවත මෙනෙහි කිරීම, සිහියට නඟා ගැනීම. සංඝානුස්සති සඟ ගුණ නැවත නැවත සිහියට නඟා ගැනීම. එහෙම සිහියට නඟා ගැනීම තුළින් මේ පුද්ගලයාගේ පෞරුෂය තුළ යම්කිසි අභිවර්ධනයක් සිදු වෙනවා. නිතරම ගුණයම මෙනෙහි කරන කෙනා ගුණ සාගරයක් වගේ.

කොටින්ම දූන් බුද්ධානුස්සතිය නිතර වඩන කෙනා පිළිබඳව පොතපතේ සඳහන් වෙන්නේ හරියට බුදු පියාණන් වහන්සේගේ ගන්ධ කුටියක් වගේ කියලා. බුදු පියාණන් වහන්සේ වැඩ වාසය කරන ගඳකිළිය ගන්ධ කුටිය වගේ වෙනවයි කියල බුදුගුණ නිතර මෙනෙහි කරන තැනැත්තා. මොකද ඒ ගුණ සම්භාරය නිතර වඩනකොට අකුසල්වලට ඉඩක් නැහැ. අකුසල්වලට එන්න ඉඩක් නැහැ. නිතරම ගුණයේමයි ජීවත් වෙන්නේ. බුදු ගුණ, දහම් ගුණ, සඟ ගුණ. ඒකෙන් ලැබෙන ආරක්ෂාවමයි අර අතන ධජග්ග ආදී සූත්‍රවල සඳහන් වන්නේ.

බුදු ගුණ මෙනෙහි කරනකොට යම් යම් කර්ම වේග තිබෙනවා නම් විපාක දෙන්ට ඒවායේ විපාක ශක්තියත් මග හැරෙනවා. ඒ වගේම ලෝකයේ තිබෙන බලගතුම ධර්මතාව සත්‍යයේ ධර්මතාව නිසා, සත්‍යයේ ශක්තිය නිසා විශ්වයෙනුත් ඒකට යම් කිසි බලයක් එකතු වෙනවා. අදෘශ්‍යමාන කියල කියන්න පුළුවන්. නමුත් අර සාමාන්‍ය ලෝකයා හිතන විදියේ ගුප්ත බලවේගයක් නොවේ. අතීතයේ අර කියාපු අග්ගිදත්ත බ්‍රාහමණයා හෙම කිව්වේ ගස් ගල්වල පර්වතවල ඒ කාලෙ චෛත්‍ය හැටියට සැලකූ තැන් වල යම්කිසි ගුප්ත බලවේගයක් තිබෙනවය. ඒකෙන් දුක් කෙලවර කරන්න පුළුවන් කියල. නමුත් මෙතන කියන්නේ එහෙම එකක් නොවෙයි. ඒ බුදු ගුණ, දහම් ගුණ, සඟ ගුණ මෙනෙහි කිරීමෙන්, ඒවා සිහියට නඟා ගැනීමෙන් ඒවායේ ශක්තිය තමනුත් ඇති කර ගන්නවා. ඒ ශක්තිය තුළින් අර කර්ම වේග ගෙවී ගිහිල්ලා යම්කිසි සහනයක් එදිනෙදා ජීවිතයේ පවා, සීමාසහිත සහනයක් ලැබෙනවා. ඒකයි බුදු පියාණන් වහන්සේ සාමාන්‍ය ලෝකයා 'මනුස්සා භය තජ්ජිතා' සාමාන්‍ය සත්ත්වයාගේ සවභාවයයි, එදිනෙදා ජීවිතයේ පැමිණෙන උපද්‍රව හමුවේ - ආපද හමුවේ - බියෙන් තැති ගෙනයි ජීවත් වන්නේ. ඒ අවස්ථාවේදී බුදු ගුණ මෙනෙහි කරනවා නම්, දහම් ගුණ මෙනෙහි කරනවා නම්, සඟ ගුණ මෙනෙහි කරනවා නම් සැහෙන ධර්මය සැනසුමක් ඒ තැනැත්තාට ලබාගන්න පුළුවන් ධර්ම ශක්තිය තුළින්. ඒ වගේම ඒ එන උපද්‍රව වලට ඔරොත්තු දීමේ ශක්තියකුත් ඇති වෙනවා.

අපි බොහෝ විට අපට එන ආපද සම්බන්ධයෙන් අපි කැළඹෙන්නේ කරදර වන්නේ අපේ සිත් ඒවා පිළිගන්ට සූදනම් නැති නිසයි. නමුත් බුද්ධ රත්නය, ධර්ම රත්නය, සංඝ රත්නය පිළිබඳව ඒ ගුණ සම්භාරය සිතේ ධාරණය කරගෙන ඉන්නකොට අරවාට ඔරොත්තු දෙන ශක්තියකුත් හිතේ ඇති වෙනවා. එයිනුත් අර බලය බිඳෙනවා. එපමණක් නොවෙයි අර තුළින්, ඒ ධර්ම ශක්තිය තුළින්ම අර

කර්ම වේග ගෙවෙනවා. ඔන්න ඔය විදියේ ධර්මතාවක් මෙතන තියෙන්නේ. ඒක නිසා කෙනෙක් කල්පනා කරන්න නරකයි, දැන් මුලදි කියවුනා බියෙන් තැතිගත් මනුෂ්‍යයින් පර්වත, වන, වෘක්ෂ, චෛත්‍ය ආදියෙහි පිහිට සොයා යනවයි, මේක පිහිට නොවෙයි, සරණ නොවෙයි. නමුත් මේ ගාථා දිහා බලලා කෙනෙකුට කියන්න පුළුවන් එහෙම නම් මේ ඇතැම් බෞද්ධයින් කරන මේ බෝධි වන්දනා, චෛත්‍ය වන්දනා, මේවත් අර වගේම මිථ්‍යා දෘෂ්ටික දේවල් නේද කියලා. අන්න එතන පැහැදිලි කර ගත යුතු කාරණාවක් තියෙනවා.

ඒක ඔය තර්කය අනුව ගිය ඇතැම් කෙනෙක් මේ කාලයේ කියනවත් ඇහෙනවා 'ඒවා හිස් දේවල්ය' කියලා. ඒවා නොදියුණු මනසක් ඇති අයගේ වැඩය කියලා. නමුත් මෙතනදී හිතාගන්න තියෙන්නේ - මේ නිවන් ගමනේ ආරම්භය සැදැහැවෙනුයි. සැදැහැව කියන වචනයේ තිබෙන්නේ 'හදවත පිහිටුවීම' කියන එක. එතකොට හදවතක් කෙනෙකුට තියෙනවා නම් ඒක පිළිබඳවත් යම්කිසි වර්ධනයක් සිදුවෙන්ට ඕන. බුද්ධිය පමණක් වර්ධනය කළොත් එතන ඒ තැනැත්තා තුළ අඩාල වර්ධනයක් ඇති වෙන්නේ. <u>අපි දන්නවා දැන් ගෙඩියක් උනත් ඉදෙනකොට ඒක හොඳට ඉදෙනවද කුරෝළු වෙනවද කියන එක ගැන, එතන තත්ත්ව දෙකක් තියෙනවා. හොඳට ඉදෙන්නේ නැත්නම් මොන, මොනවා හරි අඩු පාඩු තියෙනවා නම් කුරෝළු වෙනවා</u>. අන්න ඒ වගේ බුද්ධිය විතරක් ගත්තු අය හැඟීම ගැන නොතකා, හැඟීම නැතුව නොවෙයි. ඒ අයට හදවතක් නැතුවා නොවෙයි. නමුත් ඒ අය සමහර විට අර බුද්ධිවාදයම දැඩිව අරගෙන තර්කය ආරෝපණය කරගෙන, අරවා මෝඩ අය කරන දේවල් හැටියට චෛත්‍ය වන්දනාව ආදිය සලකනවා. නමුත් අපේ ධර්මයේ දක්වල තිබෙන්නෙ මේ ශාසනයේ එන චෛත්‍ය වන්දනාව ආදිය ගැඹුරු අර්ථයකින් කරන දෙයක්. මේ පින්වතුන් අහල තියෙනවා <u>ශාරීරික, පාරිභෝගික, උද්දේසික</u> කියලා චෛත්‍ය තුන් වර්ගයක් තිබෙන බව.

බුදු පියාණන් වහන්සේගේ ධාතූන් එහෙම නිධන් කර ගත්තු දාගැබ් ආදිය, ඒවා ශාරීරික. ඊළඟට උන් වහන්සේ පරිභෝග කළ බෝධීන් වහන්සේ, පාත්‍රා ධාතුව ආදිය ඒවා පාරිභෝගික. ඊළඟට උද්දේසික කියල කියන්නේ උන් වහන්සේ උදෙසා ඇති බුද්ධ රූප, පිළිම, බුදු පියාණන් වහන්සේ උදෙසා - මේවා සංකේත. බුද්ධානුස්සතිය සඳහා, බුදු ගුණ සිහිපත් කර ගැනීම සඳහා, උපකාර වන වස්තු. ඉතින් ඒවා ආශ්‍රය කරගෙනයි මනුෂ්‍යයින් තමන්ගේ සිත පිරිසිදු කර ගන්නේ. ප්‍රසාදයට පත් කර ගන්නේ. පහදවා ගන්නේ.

එතකොට එබඳු වස්තුවක් පිළිබඳව යම් කෙනෙක් නිග්‍රහ කළොත්, එබඳු දෙයක් විනාශ කළොත් මේ මෝඩයින්ගේ වැඩ. මේවායින් වැඩක් නැහැ, මේවා නිකම් ගල්, ගඩොල් ගොඩක්, කිව්වොත් හෙම ඒ තැනැත්තා බරපතල අකුසලයක් ඒ තුළින් සිද්ධ කර ගන්නවා. ඒ පිළිබඳව කුසල් අකුසල් පිළිබඳව අවබෝධයක් නැති කමෙනුයි, එබඳු සමහර අය මේවා අවතක්සේරුවට පත් කරන්නේ, සද්ධාවෙන් කරන මෝඩකම් හැටියට. නමුත් ඒ තුළින් නුවණැති පින්වතා මේක බුද්ධ වන්දනාවේම කොටසක් හැටියට සලකාගෙන බුදු පියාණන් වහන්සේ සිහියට නඟා ගැනීම සඳහා එදිනෙද ජීවිතයේම අපි දන්නවා කවුරු කවුරුත් ගෙවල් දොරවල්වල ජීවත් වන අය, තම තමන්ගේ මිය ගිය අය, තවත් හිතවත් අය සිහිපත් කර ගැනීම සඳහා ඡායා රූප හරි වෙන මොනව හරි සංකේත පාවිච්චි කරනවා. අර බුද්ධිවාදීන් පවා එහෙම කරනවා. නමුත් මෙන්න මෙතෙන්ට ආවහම කල්පනා කරන්න ඕන මෙතන අපට දැන් ජීවමානව නැති බුදු පියාණන් වහන්සේ සිහියට නඟා ගැනීමට අපට යම් යම් වස්තූන්, උපකාර අවශ්‍ය වෙනවා. හැම තිස්සෙම ඉබේටම ඒක අපේ හිතට එන්නේ නැහැ. ඒක දකිනකොට අපට අර ශ්‍රද්ධාව ඇති වෙනවා. එතන තමයි ආරම්භය තියෙන්නේ. ඒක සඳහා තමයි මෙච්චර කාලයක් ඒ විදියේ වස්තූන් පාවිච්චි කරන්නෙත්.

ඊළඟට බුදු පියාණන් වහන්සේ සිහියට නඟාගෙන ඇතිවන ප්‍රතිචාරය දැක්වීමක් හැටියට තමයි ඒ පුද පූජා කරන්නෙත්. ඒවා පිළිබඳවත් සමහර කෙනෙක් 'අහක යන අකුසල්' රැස් කර ගන්නවා මේවාට දෙස් කියලා. ඒ ශ්‍රද්ධාව කියන එක වෙන කෙනෙකුට තේරුම් ගන්න බැහැ. ඒ පුද්ගලයාගේ ශ්‍රද්ධාව, බුදු පියාණන් වහන්සේ පවා ඒවා පිළිබඳ උපේක්ෂා වෙනවා. ඒ ඒ තැනැත්තන්ගේ ශ්‍රද්ධාව ප්‍රකාශ කරන ආකාරය. නමුත් ඒ තුළින් ඒ තැනැත්තා තුළ ආධ්‍යාත්මික වර්ධනයක් වෙනවා. <u>ඊට නිග්‍රහ කළොත් ඒ වස්තූන් විනාශ කළොත් ඒ තැනැත්තා බරපතල අකුසලයක් කර ගත්තා වෙනවා.</u> අන්න ඒක නිසා මේ දේශනාවත් වරදවල තේරුම් ගන්න ඉඩ තිබෙන නිසයි අපි ඔය ටික ප්‍රකාශ කළේ.

ඉතින් කල්පනා කරන්න ඕන මේ සරණ යාම, තුණුරුවන්ගේ සරණ යාමට උපකාර වන දේවල් තමයි නිති පතාම මේ බුද්ධානුස්සති, ධම්මානුස්සති, සංඝානුස්සති වශයෙන් මේ ත්‍රිවිධ රත්නයේ ගුණ සම්භාරය තමන්ගේ හිතේ හොඳට ධාරණය කරගෙන, තැන්පත් කරගෙන, මොකද ඒ ත්‍රිවිධ රත්නය වැදගත් වන්නේ මොකද මේ

තමන්ගේ ගමනට බුදු පියාණන් වහන්සේ තමයි අපේ ශාස්තෘන් වහන්සේ. ඊළඟට උන්වහන්සේ ශාස්තෘන් වහන්සේ වෙන්නේ මක් නිසාද? උන්වහන්සේ යම්කිසි ධර්මයක් ප්‍රකාශ කළ නිසයි. ඒ නිසා තමයි අපි අර කිව්වෙ හරියාකාරව ත්‍රිවිධ රත්නයම පහළ උනේ ඇසළ පුර පසළොස්වක පොහෝ දවසෙයි කියලා. ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙන් ආරම්භ කළ ඒ මංගල ධර්ම දේශනාවෙන් ආරම්භ කළ ධර්ම දේශනා සමූහයයි අපි මේ ධර්ම රත්නය කියලා සලකන්නේ. ඊළඟට ඒ ධර්ම රත්නය ක්‍රියාත්මක කළ හැකි බවත් - එය ක්‍රියාත්මක කරන්න බැරි දෙයක් නම් අපට සංඝරත්නයෙන් වැඩක් නැහැ. ඒ සංඝරත්නය තුළින් පෙන්නුම් කරන්නේ මේ ධර්මය ක්‍රියාත්මක කළ හැකි බවත්, එහි ප්‍රායෝගික බවත්.

ඊළඟට ඒකේ අවස්ථාවල් අෂ්ටාර්ය පුද්ගල මහා සංඝ රත්නය කියල කියන්නේ අපි අර සමහර අවස්ථාවල කියන්නේ මේ මුළු මහත් ප්‍රතිපදාව එහෙම නැත්නම් මේ ලෝකෝත්තර ප්‍රතිපදාව - මහා මාර්ගයක් හැටියට සැලකුවොත් අෂ්ටාර්ය පුද්ගල මහා සංඝ රත්නය හරියට පහන් වැටවල් පහන් කණු අටක් වගෙයි. ඒ ඒ තත්ත්වවලින් පෙන්නුම් කරනවා මේ මේ තත්ත්වය ලබාගන්න පුළුවන් - සෝවාන් තත්ත්වය, සකදාගාමී තත්ත්වය. ඒ ඒ ආර්ය තත්ත්ව ලබාගන්න පුළුවන් කියන හැකියාව ඒ ආර්යයන් ලබා දෙනවා ලෝකයාට. එතකොට ඒක නිසා තමයි සඟ ගුණ වැදගත් වන්නේ - ඒ ලබාගත්තු ගුණ සම්පත්තිය නිසා තමයි. ඒ එක්කම තියෙනවා 'පූජාර්හ ගුණය' අරහං ගුණය කියල කියන්නේ, අර්හත් කියල කියන්නෙ ඒ පූජාවන් ලැබීමට සුදුසු ගුණය. ඉතින් බුදු පියාණන් වහන්සේ පූජාවන් ලැබීමට සුදුසු කෙනෙක් කියල අපි නිතර කියනකොට නිරායාසයෙන්ම අනේ අපේ හිත කියනවා අපට පුළුවන් දෙයක් අපි පූජා කරන්න ඕන. ඉතින් ලෝකයේ තියෙන පිරිසිදුම - සවභාව ධර්මය විසින් ලෝකයට නිති පතාම දෙන - සවාභාවික පිරිසිදුම දේ තමයි මල. ඉතින් ඒක නිසා තමයි අර දෙවියන් පරසතු මලින් කරන පූජාවල් වෙනුවට, අපි අපේ ප්‍රමාණයේ හැටියට වනපස මලින් කැලෙන් නෙලා ගත්තු මලකින් අපි පූජා කරනවා. අන්න ඒ වගේ ඒ ඒ පුද්ගලයා තමන්ගේ ශ්‍රද්ධාවෙ මට්ටම අනුව බුදු පියාණන් වහන්සේ පිළිබඳව යම්කිසි පූජාවක් කරනවා.

ඒ වගේම තමයි ධර්මයට කරන පූජාවත්. ඊළඟට සංඝයාට කරන පූජාවත්. අන්න ඒ තුළින් අපි කරන්නේ මොකක්ද, ඇතුළත අර ශ්‍රද්ධා ගුණය වඩාලනවා. ශ්‍රද්ධාවේ තෙතමන නැති තැන ගුණ ධර්මවල වගාවක් නැහැ. සමහර කෙනෙක් සල්ලි සාක්කුවේ තියාගෙන බඩු

ගන්න යනවා. සාප්පුවෙන් සාප්පුවට යනවා, වීදුරු ජනෙල්වලින් බල බලා නමුත් බඩුවක් ගන්නේ නැහැ. ආපහු හිස් අතින් ගෙදර එනවා. අන්න ඒ වගේ අය හුඟක් ඉන්නවා ලෝකයේ. හැම තැනම ගිහිල්ලා හොස්ස පොවනවා. නමුත් ප්‍රයෝජනයක් ගන්නේ නැහැ. හරි ශ්‍රද්ධාව නැහැ, හරියට කොතනක වත් ශ්‍රද්ධාව පිහිටන්නේ නැහැ. අන්න ඒක නිසා තමයි මේ ධර්මයෙන් වැඩ අරගෙන සංසාර දුක කෙළවර කර ගන්න ඕන නම් යම් කෙනෙකුට මේ ශ්‍රද්ධාව තිබිය යුතුයි. ඒක නිසා තමයි බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ 'දුක්ඛූපනිසා සද්ධා' කියලා. සද්ධාව ඇති වෙන්න නම් දුක පිළිබඳව යම් මට්ටමකින් අවබෝධයක් එන්ට ඕන. දුක ඇසුරු කරගෙන තමයි ශ්‍රද්ධාව තියෙන්නේ කියල බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරල තියෙනවා. ඕනෑම කෙනෙකුට දැන් සමාජයේ උනත් අපට දකින්ට පුළුවන් සමහර විට ධර්මය ගැන කොහෙත්ම උනන්දුවක් නැති, දැන් මේ කාලයේත් කොතෙකුත් අය අපට හමු වෙනවා. ඇවිල්ල සාකච්ඡා කරන අය තුළින් අපට දැනගන්න ලැබෙනවා, මුලදී ඒ අයගේ ජීවිත අන්න අර කියාපු බුද්ධි වාදය අනුව, එහෙම නැත්නම් වෙන දේවල් සොයමින් ගියා. එහෙම යන අවස්ථාවේදී ගෙදර දොරේ එහෙම, නැත්නම් තමන්ට ලෙඩ රෝග ආදී නොයෙකුත් විදියේ ආපද ඇවිල්ලා ඔන්න තේරෙනවා '<u>මේක රෝසමල් යහනාවක් නොවෙයි</u>. මේ ජීවිතය'. භයානක දුක් කම්කටොළු සහිත, කොයි වෙලාවේ මේ ජීවිතය නැති වෙනවද කියල දන්නේ නැති තත්ත්වයක්.

ඊළඟට දුක පිළිබඳව යම්කිසි මට්ටමකින් අවබෝධයක් එනවා. අන්න මේක තමයි බුදු පියාණන් වහන්සේ මට වඩා හොඳට, මට තේරෙනවාටත් වඩා ගැඹුරින් තේරුම් කරලා තිබෙන්නේ කියලා. ඔන්න ඊළඟට අර දුක්ඛ සත්‍යය එක්තරා මට්ටමකින් තේරුම් ගන්නවා. ඊළඟට තේරුම් ගන්නවා මේ දුකට හේතුව මගේ තියෙන තණ්හාවමයි නේද කියලා. ඒ තණ්හාව අඩුවුණු පමණට මේ දුකත් අඩු වෙනවා නේද කියලා ඒක තමයි මේ චතුරාර්‍ය සත්‍යය.

අද අදම තම තමන්ගේ ජීවිතය ගැන හිතල බැලුවත් එක්තරා මට්ටමකින් තමන්ට අවබෝධ කරන්ට පුළුවන් වන්නේ ඒක නිසා තමයි - සම්‍යක් දෘෂ්ටිය කියන එක. බුදු වෙනකන් රහත් වෙනකන් ඉන්න ඕන නැහැ. මේක තම තමන්ගේ මට්ටමින් මේ චතුරාර්‍ය සත්‍යය අවබෝධ කරගන්න පුළුවන්, සංසාර පැවැත්මේ දුක. ඒකට නිසි අවස්ථාවල් එනකම් සමහරු ඉන්නවා. ඇතැම් අය අතීත සංසාරයේ පාරමී ධර්ම වඩලා මේ මාර්ගයේ බොහෝ දුරට ගමන් කරන අයට අර

විදියේ මහා විප්ලවයක් මහා විනාශයක් ආපදවක් එන්න ඕන නැහැ. ඊට කලින්ම ඇතැම් කෙනෙක් - දැන් සමහරුන් උදේ ඉබේම අවදි වෙනවා, තවත් සමහරුන්ට එලාම් ඔරලෝසු, සමහරුන් එහෙමවත් අවදි වෙන්නෙ නැහැ, සමහරුන්ට බෝම්බයක් එහෙම පුපුරපුවාම අවදි වෙනවා, සමහරුන්ට බෝම්බයක් පිපුරුවත් අවදි වෙන්නෙ නැහැ. ඔන්න ඔය විදියේ තත්ත්වයක් ලෝකයේ තියෙනවා. ඇහැ ඇරෙන්නෙ නෑ. ඒක නිසා අපි කල්පනා කරන්න ඕන අර එක එක්කෙනාගේ සාංසාරික බුද්ධිය කියන එක වෙනම දෙයක්. ලෞකික බුද්ධිය වගේ නොවෙයි. සාංසාරික බුද්ධි මට්ටම සමහර විට හත් අවුරුදු දරුවකු තුළ පවා මෝරලා තිබෙන්න පුළුවන්. එහෙම අය තමයි අර 'කේසා, ලෝමා, නඛා, දන්තා, තචො' කියන තච පංචක කර්මස්ථානයෙන්, ඒක කියමින් කෙස් ඉවත් කරලා පැවිදි වෙනවාත් එක්කම රහත් වෙන්නේ. මුලු මහත් ශරීරයේ ඇති දුක් සවභාවය, පිළිකුල් සවභාවය, ලෝකයේ සංසාරයේ ඇති දුක් සවභාවය, හැම එකම තේරුම් අරගෙන මේ චතුරාර්‍ය සත්‍යය අවබෝධ කරන්නේ. අන්න ඒක නිසා ලෝකයේ සාංසාරික බුද්ධිය කියන එක වෙනම එකක්, සාමාන්‍ය ලෝකයා හිතන බුද්ධි මට්ටම වෙන එකක්. විභාග පාස් කරන්න එහෙම පාවිච්චි කරන්නේ ඒ බුද්ධියයි.

සාංසාරික බුද්ධිය තියුණු තැනැත්තා කල්පනා කරනවා මේක අඩාලව යා යුතු ගමනක් නොවෙයි, ඒකට වචන වශයෙන් දක්වනවා 'බුද්ධිමය, භාවමය,' එහෙම නැත්නම් බුද්ධිමය පක්ෂයත්, හැඟීම් පක්ෂයත් කියලා අපි එදිනෙදා පාවිච්චි කරනවා, හැම කෙනාගේම තියෙනවා. අපි ඒවා දක්වන්න වස්තු ඕන නිසා අපි කියන්නෙ 'මොළයයි හදවතයි' කියල. අපි සාමාන්‍යයෙන් එහෙම ප්‍රකාශ කළාට මොකද, දැන් හැම කෙනාගේම තියෙනවා බුද්ධිමය පැත්තකුත් තියෙනවා, හැඟීම් පැත්තකුත් තියෙනවා. එතකොට අර හැඟීම් පැත්ත පිරිසිදු කරන්නේ නැතිව, ඒව ගැන තැකීමක් නැතිව බුද්ධිය විතරක් දියුණු කළොත් අන්න කපටියෙක් වෙනවා. කෛරාටිකයෙක් වෙනවා. ඒක තමයි ධර්මයේ දක්වලා තියෙන්නේ. අර ඉන්ද්‍රිය ධර්ම හෙම දක්වන අවස්ථාවලදී 'බලවසද්ධො මන්ද පඤ්ඤො' මූඪ පක්ෂයට යනවා. ශ්‍රද්ධාව වැඩියි ප්‍රඥාව අඩුයි. එබඳු තැනැත්තා මෝඩ පැත්තට හැරෙනවා. අනෙක් පැත්තට කියන්නේ ශ්‍රද්ධාව අඩුයි. ප්‍රඥාව එහෙම නැත්නම් අවබෝධ ශක්තිය වැඩියි. බුද්ධි මට්ටම වැඩියි. එබඳු අය කෛරාටික පැත්තට යනවා කියලා කියනවා. එබඳු අය අන්තගාමීව මේවා ඔක්කොම ප්‍රතික්ෂේප කරලා වන්දන - මානන ආදිය එහෙම නැත්නම් බුද්ධානුස්සතිය වඩා ගැනීම සඳහා කරන ප්‍රයත්න, ඒව ගැන අවඥ

සහිතව ප්‍රකාශන කරලා තමන් අකුසල් සිද්ධ කර ගන්නවා. මෙන්න මේක ගැනත් එතකොට සැලකිලිමත් වෙන්න ඕන.

ඒක නිසා අපට මේ දේශනාව තුළින් පෙනෙනවා මේ සරණ ගමනයේ වටිනාකම. ඇත්ත වශයෙන්ම මේ ආපද සම්පන්න යුගයක තමන්ගේ ආපදවලදී හිත සනසා ගැනීම සඳහා, ශාන්තිය ලබා ගැනීම සඳහා ශාන්ති කර්ම බලාපොරොත්තුවෙන් නොයෙකුත් අත බලන බව අපට පේනවා සමාජයේ. ඒ තරම් ඒ ඒ අත, හිස් ලූ ලූ අත දුවන යුගයක් මේක. නමුත් මේ බෞද්ධයින් හැටියට තමන්ට තුණුරුවන් හඳුනාගන්න ලැබුණා නම් මව් පියන් ආශ්‍රයෙන් හරි පොත පත ආශ්‍රයෙන් හරි - තවත් අරහෙ මෙහෙ දුවන්න වැඩක් නැහැ. මේ තුණුරුවන්ගේ සරණ යාම පිළිබඳව බුදු පියාණන් වහන්සේ වදාරළ තියෙනවා ඒකාන්තවත් අවධාරණාත්මක වශයෙන් මේ ගාථා පෙළ ඉවර වෙන්නෙ 'එතං බො සරණං ඛෙමං එතං සරණ මුත්තමං එතං සරණ මාගම්ම සබ්බ දුක්ඛා පමුච්චති'. අර කියාපු සරණය නොවේ. මෙන්න මේ සරණය තමයි උතුම්ම සරණ, ආරක්ෂා සහිත සරණය. මෙබඳු සරණයක් සොයා යාමෙන් තමයි සියලු දුකෙන් මිදෙන්න පුළුවන් කියල.

එතකොට ඒ ආරම්භ කරන්නේ අර විදියට ධර්මය අහලා, තමන්ගේ එදිනෙද ජීවිතයේ අත්දැකීම් හා සංසන්දනය කරලා, මේක පිළිගත හැකි දෙයක්, මේක තමයි නියම මාර්ගය කියලා යම්කිසි අවබෝධයක් එනවා. එතන ඉඳලා ඉදිරියට යා යුතුයි. හරියාකාරව ප්‍රත්‍යක්ෂය කරාම යා යුතුයි. 'සම්මප්පඤ්ඤාය පස්සති' කියල කියන්නේ ප්‍රඥාව දියුණු කරන්න ඕන ඒකට. ඒ ගමන යන්නේ ඒක පයින් යන සාමාන්‍ය ගමනක් නොවේ. මෙන්න මේ කියාපු ශීල, සමාධි, ප්‍රඥා කියල කියන ඒ පියවර ඔස්සේයි. එහෙම නැත්නම් ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සම්මා දිට්ඨි, සම්මා සංකප්ප ආදී වශයෙන් සම්‍යක්, එතනම අපට පේනවා, ඒකට මාර්ගයක් කියල කියන්නේ මොකද කියන එක. ඒක ආර්ය අෂ්ටාංගික මාර්ගය ගැන ටිකක් හිතල බැලුවහම පේනවා.

පියවර වශයෙන් එතන තිබෙන්නේ, පියවර කියලා කියන්නේ අර ලෝකයේ අපි හිතන පියවර නොවෙයි. සම්‍යක් දෘෂ්ටිය කියල කියන එය ධර්මයේම දක්වලා තියෙනවා. සම්මා දිට්ඨිය ඇති තැනැත්තාට සම්‍යක් සංකල්පය පහළ වෙනවා කියලා බුදු පියාණන් වහන්සේ ප්‍රකාශ කරල තිබෙනවා, 'සම්මා දිට්ඨිස්ස සම්මා සංකප්පො පහොති' කියල. ඒක ස්වාභාවිකවම වෙන දෙයක්. සම්‍යක් දෘෂ්ටිය හොඳට වැඩෙනකොට හරි දැක්ම හරියට වැඩෙනකොට හරි සිතුම්

පැතුම් ඇති වෙනවා. ඊළඟට ඒ විදියටම දක්වනවා එකකට එකක් යා කරලා, සම්බන්ධ කරලා හරි සිතුම් පැතුම් ඇති වෙනකොට ඒ තැනැත්තාට හරි වචන ප්‍රකාශ කරන්න හිත් දෙනවා. හරි වචන ප්‍රකාශ කිරීම පිරිසිදු වෙනකොට හරි ක්‍රියා මාර්ගවලට යොමු වෙනවා. හරි ක්‍රියා මාර්ග සම්පූර්ණ කරනකොට තමන් තුළ ඇති කෙලෙස් ඉවත් කිරීමත් ඒව පිළිබඳව ඇති අඩුපාඩුකම් සකස් වෙනකොට ජීවිකාවම - නියම ආජීවය - දිවි පැවැත්ම - ඒකත් සකස් වෙනවා. ඒ දිවි පැවැත්ම සකස් කරන්න ගන්න උත්සාහයේදී අර කියාපු තමා තුළ ඇති විය හැකි කෙලෙස් වලට ඉඩ නොතැබීමත්, තමන් තුළ ඇති කෙලෙස් ඉවත් කිරීමත්, තමා තුළ නැති කුසල ධර්ම ළං කර ගැනීමත්, තමා තුළ ඇති කුසල ධර්ම දියුණු කර ගැනීමත් කියන සතරාකාර වීර්යයයක් වැඩෙනවා. නූපන් අකුසල් වළක්වා ගැනීමටත්, උපන්නාවූ අකුසල් දුරු කර ගැනීමටත්, නූපන් කුසල් ඇති කර ගැනීමටත්, උපන් කුසල් තහවුරු කර ගැනීමටත්. ඔය විදියට හතරාකාර වීර්යයක් සම්මා වායාම කියලා වැඩෙනවා. ඒ වීර්යය යොදන්න මේ සම්මා සති ඒ විදියට යෙදීමේදී සම්‍යක් සතිය හරි ආකාර සතිය දියුණු වෙනවා. ඒ සතිය තහවුරු වීම තමයි සමාධිය කියලා කියන්නේ. අන්න ඒකයි අපි ප්‍රකාශ කළේ සම්මා දිට්ඨියේ ඉඳලා අන්තිමට සමාධිය දක්වාම මේ ආර්ය අෂ්ටාංගික මාර්ගය ඇද ඇරලා මේක කෙලින් කර ගත්තු අවස්ථාවේ තමයි අන්න අර කියාපු සම්‍යක් දර්ශනය හැටියට ලෝකෝත්තර මාර්ග ඥානයක් පහළ වෙන්නේ. ඒ මාර්ග ඥානය තුළින් තමයි අර කෙලෙස් මට්ටම් මහා ඝන බහල, ඒ අවිද්‍යා අන්ධකාරය බිඳල, ප්‍රඥා ආලෝකය තුළින් කෙනෙකුට නිර්වාණය අවබෝධ කර ගන්ට පුළුවන් වෙන්නේ.

ඒක ඇතැම් ආචාර්යවරු දක්වලා තියෙනවා හොඳ උපමා දෙකකින්. මේ ඔක්කොම එකතු කරලා ගන්න පුළුවන් වටිනා උපමා දෙකක් තියෙනවා. එකක් තමයි පහනක් දැල්වීම. පහනක් දැල්වීමේ දී - මේ චතුරාර්ය සත්‍යයට සම්බන්ධ කරලයි එතන දක්වන්නේ - කාරණා හතරක් එක විට සිදධවෙනවා කියල කියනවා. අපි දන්නවා පහන දැල්වෙනකොට පහන් වැටිය එක්තරා ප්‍රමාණයකට දැවී යනවා. ඒ වගේම අඳුර දුරු වෙනවා. ආලෝකය පැතිරෙනවා. තෙල් හිඳෙනවා. තෙල් ටිකෙන් ටික අඩු වෙනවා. ඔන්න ඔය උපමා හතරට සංසන්දනය කරන්නේ චතුරාර්ය සත්‍යය. පහන් වැටිය දැවී යන්න වගේ දුක පිළිබඳව අවබෝධයත් ක්‍රම ක්‍රමයෙන් වැඩෙනවා. ඊළඟට අඳුර දුරු වෙනවා වාගේ තණ්හාව ප්‍රහීණ වෙනවා. ටිකින් ටික අඩු වෙනවා. ආලෝකය පැතිරෙන්නා වගේ මාර්ගය ආර්ය අෂ්ටාංගික මාර්ගය

වැඩෙනවා. ඊළඟට තෙල් සිඳී යනවා වගේ කෙලෙස් මට්ටම් අඩුවෙලා නිවන ප්‍රත්‍යක්ෂ වෙනවා.

තවත් උපමාවක් දක්වනවා ඉර පෑයීම පිළිබඳව. ඉර පෑයීමේදීත් ඒ ආලෝකය පිහිට කරගෙන අපට රූප පෙනෙනවා. ඊළඟට ඉර පායනකොට අන්ධකාරය එක්තරා ප්‍රමාණයකට දුරු වෙනවා. ඒ වගේම ආලෝකයත් පැතිරෙනවා. ඊළඟට සූර්යයාගේ රශ්මිය නිසා සීතලත් අඩු වෙනවා. ඒකට උපමා කරනවා - දැන් අර ඉර පායන අවස්ථාවේදී රූප දකිනවා වගේ තමයි - මේ දුක්ඛ සත්‍යය ක්‍රම ක්‍රමයෙන් අපට අවබෝධ වෙනවා, මේ ප්‍රඥා ආලෝකයෙන්. සූර්යයා පහළ වීමෙන් ඊළඟට අඳුර දුරු වෙනවා. ඒ වගේ තමයි තණ්හාව එක්තරා ප්‍රමාණයකට අඩු වෙනවා. ආලෝකය පැතිරීම තමයි මාර්ගය වැඩීම. අවසානයේදී කියවෙන සීතල අඩුවීම වගේ තමයි කෙලෙස් මට්ටම් අඩුවෙලා නිර්වාණ අවබෝධය ලැබීම.

නිරෝධ කියලා කියන එක ඔය විදියට චතුරාර්‍ය සත්‍යයට සම්බන්ධ කරනවා උපමා මාර්ගයෙන්. මේ කොයි හැටියට කියන්නෙත් මෙන්න මේ ප්‍රඥාව - සම්‍යක් ප්‍රඥාව - තුළින් තමයි අවසාන වශයෙන් කෙලෙස් වියලා දන්නේ. කෙලෙස් සංසිඳවලා මේ සංසාරයට හේතුවන කර්ම පටලැවිල්ලෙන් මිදෙන්න පුළුවන් වන්නේ. මේ අපි සංසාරයේ මෙච්චර කාලයක් අපි බලාපොරොත්තු නූනත් උපදින්නේ මොකද? ඒක හිතල බලන්න ටිකක්. අපේ චිත්ත සන්තානයේ තියෙනවා මේ සංස්කාර කියලා මෝහය අවිද්‍යාව නිසාම 'සකස් කරන සවභාවයක්' කර්ම රැස් කරනවා කුසල් හෝ අකුසල් හෝ කර්ම රැස් කරනවා. ඒ රැස් කරන කර්මවල විපාක දෙන ධර්මතාවක් තියෙනවා. ඒක සවභාවයක්මයි. යම් කිසි කර්මයක් රැස් කළා නම් ඒකට විපාක විඳින්න සිදු වෙනවා. ඒ කර්මයත් විපාකයත් අතර ගමන තමයි අපි සංසාර ගමන කියන්නේ. ඒකෙදි අපට බලාපොරොත්තු වෙන සැප පමණක් නොවේ කරල තියෙන දේවල්වල විපාක වශයෙන් දුක් සමූහයක් විඳින්න සිදු වෙනවා. වෙන අමතර දුකක් නැතත්, ඉපදීම මුල් කරගෙන තිබෙන දුක, කෙනෙක් උපන්න නම් එතන ඉඳල දිරනවා. දිරීම ඉක්මන් කරනවා රෝග පීඩා ආදියෙන්. ඊළඟට යම් අවස්ථාවක මැරෙන්න සිද්ධවෙනවා. ලොකුම බිය ඒකයි. ඒ විදියට විශාල දුක් සමූහයක් ජාති දුක හැටියට එනවා.

ඉතින් මේ දුක් සමුහයෙන්ම මිදෙන්න පුළුවන් වන්නේ අර කියාපු ලෝකෝත්තර මාර්ග ඥානයෙන්, සෝවාන්, සකදාගාමි, අනාගාමි,

අර්හත් කියන ඒ ලෝකෝත්තර මාර්ග ඥානවලින්. එතකොට මෙන්න මේ තුන් සරණය, තුන් සරණය හරිහැටි වටහාගෙන මේ පින්වත් පිරිස අද දින වටිනා පෝය දවසේ ඒ ත්‍රිවිධ රත්නයේම පිහිට සොයාගෙන වෙන පිහිටවල් සොයන්නේ නැතිව මේ ත්‍රිවිධ රත්නයම බලවත් කර ගැනීම සඳහා අර කියාපු සම්‍යක් ප්‍රඥාව, ලෝකෝත්තර සම්‍යක් ප්‍රඥාවට, උපකාර වන සීල, සමාධි, ප්‍රඥා වැඩීම, භාවනා කිරීම ආදියෙහි යෙදෙමින් මේ ජාති ජරා ව්‍යාධි මරණාදී සියලු සංසාර දුකින් අත් මිදිලා අති උතුම් වූ අමා මහ නිවනින් සැනසෙන්නට මේ ජීවිතයේදීම මේ ධර්ම ශ්‍රවණයත් ඒකාන්තයෙන් උපකාර වේවා! මේ ධර්ම ශ්‍රවණය තුළින් ඇතිවන සද්ධා, වීරිය, සති, සමාධි, පඤ්ඤා කියන ඒවා ඉන්ද්‍රිය ධර්ම, බල ධර්ම බවට පත් කරගෙන, කල්‍යාණ මිත්‍ර ආශ්‍රය තුළින් දුර්ලභ බුද්ධෝත්පාද කාලයක ලබාගත් මේ මනුෂ්‍ය ආත්ම භාවය ඵලවත් කරගෙන අමා මහ නිවනින් සැනසෙන්නට මේ පින්වත් පිරිසට මේ ධර්ම ශ්‍රවණයම ඒකාන්තයෙන් හේතු වාසනා වේවා!

ඒ වාගේම අද දින අපි ධර්ම දේශනාමය වශයෙන්, ධර්ම ශ්‍රවණමය වශයෙන්, රැස් කරගත් මේ කුසල සම්භාරය ශාසනාරක්ෂක දෙවි දේවතාවුන් වහන්සේලා ඇතුලු අපගේ මියගිය ඥාතීන් ඇතුලු අවීචියේ පටන් අකනිටා දක්වා යම්තාක් සත්ත්ව කෙනෙක් පින් අනුමෝදන් වෙන්ට කැමති නම් ඒ හැම කෙනෙක්ම පින් අනුමෝදන් වී තම තමන්ගේ ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවන සාක්ෂාත් කර ගනිත්වා! කියලා ඒ ප්‍රාර්ථනාව තබාගෙන මේ විදියට ගාථා කියලා පින් පමුණුවන්න.

'එත්තාවතා ච අම්හෙහි...'

# 52 වන දේශනය

## 52 වන දේශනය
(පහන් කණුව ධර්ම දේශනා අංක 160)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

සබ්භිරෙව සමාසෙථ පණ්ඩිතෙහත්ථදස්සිහි
අත්ථං මහන්තං ගම්භීරං දුද්දසං නිපුණං අණුං
ධීරා සමධිගච්ඡන්ති අප්පමත්තා විචක්ඛණා'ති

සැදැහැවත් පින්වතුනි,

සත්පුරුෂ ආශ්‍රය තුළින්, කල්‍යාණ මිත්‍ර ආශ්‍රය තුළින් කෙනෙකුට ලබා ගත හැකි උතුම්ම සම්පත්තියක් හැටියට බුදුරජාණන් වහන්සේ දක්වා වදාළා කෙළින්ම නිවනට අදාල ධර්ම කථා අසන්ට ලැබීම. එවැනි ධර්මකථා කිරීමේ විශේෂ දක්ෂතාව ඇති සංඝයා වහන්සේලායි බුදුරජාණන් වහන්සේ ධම්ම කථික නාමයෙන් හැඳින්වූයේ. ඒ විශේෂ දක්ෂතාව අනුව මේ බුද්ධ ශාසනයේ ධම්ම කථික භික්ෂූන් වහන්සේලා අතර එතදග්ග තනතුර ලබා ගත්තේ පුණ්ණ මන්තානි පුත්ත මහ රහතන් වහන්සේ. උන්වහන්සේ රහත් වුනාට පස්සේ ප්‍රීති වාක්‍යය වශයෙන් ප්‍රකාශ කළ ගාථා ධර්මයක් තමයි අද අපි මාතෘකා හැටියට තබා ගත්තේ. 'සබ්භිරෙව සමාසෙථ පණ්ඩිතෙහත්ථදස්සිහි' නියම යහපත දකින්නාවූ සත්පුරුෂ පණ්ඩිතයින් නුවණැත්තන් ඇසුරු කරන්න. 'අත්ථං මහන්තං ගම්භීරං දුද්දසං නිපුණං අණුං ධීරා සමධිගච්ඡන්ති අප්පමත්තා විචක්ඛණා' අප්‍රමාදීව කටයුතු කරන විචක්ෂණ බුද්ධියෙන් යුක්ත නුවණැත්තෝ ලැබීමට දුෂ්කර වූ ඉතාමත්ම සියුම් වූ මහත් වූ නිර්වාණාර්ථය පරමාර්ථය සාද ගනිත්, කියන එකයි මේ ගාථාවේ අර්ථය.

පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ කපිල වස්තු පුරයේ බමුණු ගමක බ්‍රාහ්මණ පවුලක උපන්න කෙනෙක්. අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්වාමීන් වහන්සේගේ බෑනා කෙනෙක් හැටියට ධර්මයේ සඳහන් වෙනවා. මේ ශාසනය ආරම්භ අවස්ථාවේදීම මේ පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ ගිහි බ්‍රාහ්මණ මානවකයෙක් හැටියට අඤ්ඤාකොණ්ඩඤ්ඤ ස්වාමීන් වහන්සේ ළඟට ගිහිල්ලා, රජගහ නුවර දී උන්වහන්සේ වෙතින් පැවිදි උපසම්පද ලබාගෙන ආපසු කපිල වස්තු පුරයට ඇවිත්, කපිල වස්තු පුරයේදී විදර්ශනා භාවනා වඩලා රහත්වුන බවයි පොත පතේ දැක්වෙන්නේ. ඒ වගේම රහත්වෙලා උන්වහන්සේ පන්සියයක් පමණ විශාල ගෝල පිරිසකට අවවාද අනුශාසනා කළා. ඒ ගෝල පිරිසට උන්වහන්සේ අවවාද

අනුශාසනා කළේ 'දස කථාවස්තු' නමින් බුදුරජාණන් වහන්සේ බොහෝ විට ප්‍රශංසා කොට වදාළ කථා මාර්ගයක් අනුවයි. මේ දස කථාවස්තු කියන්නේ පින්වතුනි, බුදුරජාණන් වහන්සේ වදාළා කෙලෙස් කපා හැරීමට උපකාර වන, චිත්ත ශක්තිය මතු කර දෙන, ඒකාන්ත නිර්වේදය, විරාගය, නිරෝධය. සංසිඳීම, නිර්වාණය කියන ඒ කාරණයට කෙළින්ම අදාල වන කථා වර්ග දහයක්. ඒවා හඳුන්වන්නේ මේ විදියටයි. අප්පිච්ඡ කථා, සන්තුට්ඨි කථා, පවිවේක කථා, අසංසග්ග කථා, විරියාරම්භ කථා, සීල කථා, සමාධි කථා, පඤ්ඤා කථා, විමුත්ති කථා, විමුත්තිඤාණදස්සන කථා. ඒ දස කථා වස්තු අපි කෙටියෙන් තේරුම් ගන්න බලමු. 'අප්පිච්ඡ කථා' කියලා කියන්නේ අල්පේච්ඡතාව - ආශාවන් අඩු බව පිළිබඳ ඒ ගුණය පිළිබඳව කරන කථා. 'සන්තුට්ඨි කථා' කියන්නේ ලද දෙයින් සතුටු වීමේ ගුණය ගැන, ඒකෙ ආනිශංස ප්‍රකාශ කරන කථා. 'පවිවේක කථා' කියන්නේ දැඩි විවේක වාසයේ ඇති වටිනාකම වර්ණනා කරන කථා. 'අසංසග්ග කථා' කියල කියන්නේ පිරිස්වලින් වෙන්ව වාසය කිරීම - භාවනාව සඳහා පිරිස්වලින් වෙන්ව වාසය කිරීම, ඒකෙ ආනිශංස දක්වෙන කථා. 'විරියාරම්භ කථා' කියල කියන්නේ නිවන සඳහා වීර්යය වැඩීමේ වටිනාකම ප්‍රකාශ කෙරෙන කථා. 'සීල කථා' කියල කියන්නේ සීලයේ වටිනාකම ගැන කියවෙන කථා. 'සමාධි කථා' - සමාධියේ වටිනාකම කියවෙන කථා. 'පඤ්ඤා කථා' - ප්‍රඥාවට අදාල කථා. 'විමුත්ති කථා' - විමුක්තිය නිවන පිළිබඳ කථා. 'විමුත්තිඤාණදස්සන කථා' - විමුක්ති ඥාණදර්ශනය කියල කියන්නේ විමුක්තිය ලබා දෙන ප්‍රත්‍යක්ෂය පිළිබඳවූ ඥාණදර්ශනය ගැන කථායි. ඔන්න ඔය කියන දස කථා වස්තූන් පිළිබඳව නිරන්තරයෙන්ම තමන්ගේ ගෝල පිරිසට කියමින් උන්වහන්සේ ඒ අය උනන්දු කළා.

පුණ්ණ මන්තානි පුත්ත මහ රහතන් වහන්සේගේ ඒ කථාවලින් උපකාර ලබාගෙන ඒ ගෝල පිරිස ඉක්මනින්ම රහත් බව ලබා ගත්තා. රහත් බව ලබාගෙන උපාධ්‍යායයන් වහන්සේගෙන් එක් අවස්ථාවක අවසර ඉල්ලුවා භාග්‍යවතුන් වහන්සේ දකින්න අපි යන්න ඕන. දැන් අපේ පැවිදි කාර්යය සම්පූර්ණයි කියල. එතකොට පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ කල්පනා කළා මම මේ ගෝල පිරිස පිරිවරාගෙන බුදුරජාණන් වහන්සේ දකින්න ගියොත් මම අසංසග්ග කථා කියන පිරිස්වලින් ඉවත් වීමේ ආනිශංස ගැන කියන කථාවත් එක්ක ගැළපෙන්නෙ නැහැ කියලා, ගෝල පිරිසට ඉස්සෙල්ල යන්න කිව්වා. ඒ ගෝල පිරිස ගිහිල්ලා බුදුරජාණන් වහන්සේ බැහැ දැකපු අවස්ථාව තමයි මැදුම් සඟියේ 'රථවිනීත සූත්‍රයේ' පළමුවෙන්ම දක්වෙන්නේ. 'රථවිනීත සූත්‍රයේ' මෙහෙම කියවෙනවා. එක් අවස්ථාවක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර වේළුවනාරාමයේ වැඩ වාසය කරනවා. ඒ අවස්ථාවේ 'ජාතිභූමක' භික්ෂූන් වහන්සේලා විශාල

පිරිසක්, 'ජාතිභූමක' කියල කියන්නේ පින්වතුනි බුදුරජාණන් වහන්සේගේ උපන් ගම. බුදුරජාණන් වහන්සේ දකින්න උපන් ගමෙන් වැඩම කළ ඒ ජාතිභූමක භික්ෂූන් විශාල පිරිසක් ඇවිල්ලා බුදුරජාණන් වහන්සේට වැඳලා, එකත්පස්ව ඉඳගත්තහම බුදුරජාණන් වහන්සේ උන්වහන්සේලාගෙන් මෙන්න මෙහෙම ප්‍රශ්නයක් අහනවා. 'මහණෙනි, කවුද මේ ජාතිභූමක භික්ෂූන් අතරින් මෙන්න මේ විදියට ගුණ කථනයකින් ඒ සබ්‍රහමචාරී වහන්සේලාගෙන් ගෙන් ගරු බුහුමන් ලබන්නේ? කොයි විදියේ එකක්ද?' බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා 'අත්තනාච අප්පිච්ඡො' තමාත් අල්පෙච්ඡව, අල්පෙච්ඡතාව පිළිබඳ කථාවක් භික්ෂූන් වහන්සේලාට කරනවා. තමාත් ලද දෙයින් සතුටුව, සන්තුෂ්ටිය ඇතිව, ලද දෙයින් සතුටු වීමේ ආනිශංස භික්ෂූන් වහන්සේලාට ප්‍රකාශ කරනවා. තමාත් දැඩි විවේකයට ලැදිව, දැඩි විවේකයේ ආනිශංස භික්ෂූන් වහන්සේලාට ප්‍රකාශ කරනවා. පවිවේක කථා, අසංසග්ග කථා - තමාත් පිරිස්වලින් ඉවත්ව වාසය කරමින්, පිරිස්වලින් ඉවත්ව විසීමේ ආනිශංස භික්ෂූන් වහන්සේලාට ප්‍රකාශ කරනවා. විරියාරම්භ කථා - තමාත් අරඹන ලද වීර්යය ඇතිව, වීර්යය ඇරඹීමේ ආනිශංස භික්ෂූන් වහන්සේලාට ප්‍රකාශ කරනවා. තමාත් ශීල සම්පන්නව, ශීල සම්පන්න වීම පිළිබඳ ආනිශංස භික්ෂූන් වහන්සේලාට ප්‍රකාශ කරනවා. තමාත් සමාධි සම්පන්නව, සමාධියේ අගය භික්ෂූන් වහන්සේලාට ප්‍රකාශ කරනවා. තමනුත් ප්‍රඥාව ඇතිව, ප්‍රඥාවට අදල කාරණාවල අගය භික්ෂූන් වහන්සේලාට ප්‍රකාශ කරනවා. තමනුත් විමුක්තිය ලබාගෙන, විමුක්තිය ලබා ගැනීමේ අගය භික්ෂූන් වහන්සේලාට ප්‍රකාශ කරනවා. තමනුත් විමුක්ති ඥානදර්ශනය ලබාගෙන, ඥානදර්ශනයට අදල කථා භික්ෂූන් වහන්සේලාට ප්‍රකාශ කරනවා. අන්න එබඳු ඒ විදියේ ගුණ රාවයක් කීර්ති රාවයක් ඇතිව ගරු බුහුමන් ලබන්නේ කවුද ඒ ජාතිභූමක භික්ෂූන් වහන්සේලා අතරින් කියලා බුදුරජාණන් වහන්සේ අහනවා.

පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේගේ ගෝල පිරිස ප්‍රකාශ කරනවා, 'ස්වාමීනි, ආයුෂ්මත් මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ ඒ ජාතිභූමක භික්ෂූන් වහන්සේලා අතර ඒ විදියේ කීර්ති රාවයකින් ගරු බුහුමන් ලබනවා' කියලා. මේ සංවාදය කෙරෙන අතරේ ඒ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ සමීපයේ වැඩ උන්නා අග්‍ර ශ්‍රාවක සාරිපුත්ත ස්වාමීන් වහන්සේ. උන්වහන්සේ කල්පනා කරනවා පුණ්ණ මන්තානි පුත්ත ආයුෂ්මතුන් වහන්සේට මේක ලොකු ලාභයක්, විශාල වාසනාවක්, උන්වහන්සේගේ ගෝල පිරිස මේ වගේ ගුණ කථනයක් කරනවා බුදුරජාණන් වහන්සේ හමුවේ. බුදුරජාණන් වහන්සේත් ඒක අනුමත කරනවා කියලා. ඊළඟට සාරිපුත්තයන් වහන්සේ කල්පනා කරනවා, මටත් කවදහරි මේ පුණ්ණ මන්තානි පුත්ත ආයුෂ්මතුන්

වහන්සේ දකින්න ඇත්නම් උන්වහන්සේ එක්ක ධර්ම කථාවක් කරන්න මට අවස්ථාවක් ලැබුණා නම් හොඳයි, කියලා සාරිපුත්ත ස්වාමීන් වහන්සේට සිතක් ඇතිවුණා. ඊළඟට මේ සූත්‍රයේ දැක්වෙන හැටියට බුදුරජාණන් වහන්සේ කලක් රජගහ නුවර වැඩ වාසය කරලා අනු පිළිවෙලින් චාරිකාවේ වැඩම කරලා සැවැත් නුවර ජේතවනාරාමයට වැඩම කළා. බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයට වැඩම කළ බව අහලා පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ සෙනසුන සකස් කරලා තියලා අනු පිළිවෙලින් සැවැත් නුවර ජේතවනාරාමය දක්වා වැඩම කරලා, යම් අවස්ථාවක බුදුරජාණන් වහන්සේව දකින්න පැමිණිලා, බුදුරජාණන් වහන්සේට වැඳලා එකත් පසෙක ඉඳ ගත්තා. බුදුරජාණන් වහන්සේ සතුටු සාමීචියේ යෙදිලා, ඒ වගේම උත්සාහවත් වෙන විදියේ, සතුටු වෙන විදියේ ධර්ම කථාවක් පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේට කළා. ඒ ධර්ම කථාව අහලා පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ දිවා විහරණය සඳහා - 'දිවා විහරණය' කියල කියන්නේ දිවා කාලය භාවනාවෙන් විවේකයෙන් ගත කිරීමයි - අන්ධ වනයට වැඩම කරන්ට පිටත් වුණා.

ඒ අවස්ථාවේ එතන හිටිය එක්තරා භික්ෂූන් වහන්සේ නමක් සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ළඟට ගිහිල්ලා කියනවා. 'ආයුෂ්මතුන් වහන්ස, ඔබ වහන්සේ නිරන්තරයෙන් ගුණ වැණුම් කළ පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ දැන් බුදුරජාණන් වහන්සේ දකින්න ඇවිල්ලා ධර්ම කථාවක් අහලා අන්ධ වනයට දිවා විහරණය සඳහා වැඩම කළා' කියලා. සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ඉක්මනට ඉක්මනට නිසීදනයත් අරගෙන පිටත් වුණා. පිටත් වෙලා පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ අන්ධ වනයට වැඩම කරන අතරේ උන් වහන්සේගේ හිස පේන මට්ටමින් ඈතින් ඈතින් උන්වහන්සේ පිටුපසින් යනවා, උන්වහන්සේට නොදනෙන ආකාරයට. පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ අන්ධ වනයට ඇතුල්වෙලා ගසක් මුල භාවනාවෙන් වැඩ ඉන්නවා. සාරිපුත්ත ස්වාමීන් වහන්සේත් අන්ධ වනයට ඇතුල්වෙලා වෙනත් ගසක් මුල භාවනාවෙන් වැඩ ඉන්නවා. දෙදෙනා වහන්සේලාම මුලු සවස් වරුවේම භාවනාවෙන් ගත කරලා, හැන්දෑ වරුවේ භාවනාවෙන් නැගිටලා, සාරිපුත්ත ස්වාමීන් වහන්සේ පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ ළඟට ගිහිල්ලා සතුටු සාමීචි කථා කරලා, ඔන්න දහම් ප්‍රශ්නයක් අහනවා, පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේගෙන්. 'ඇවැත්නි, ඔබ වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වෙතද බ්‍රහ්ම චරියාවෙන් වාසය කරන්නේ?' - බඹසර වාසය කරනවා කියන්නේ, පැවිදි ජීවිතය ගෙවන්නේ - භාග්‍යවතුන් වහන්සේ වෙතද? 'එසේය ඇවැත්නි' කියල කිව්වා. ඊළඟට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ අහනවා 'ඇවැත්නි. ඔබවහන්සේ ශීල විශුද්ධිය සඳහා ද

භාග්‍යවතුන් වහන්සේ වෙත බ්‍රහ්ම චරියාවෙන් වාසය කරන්නේ?' පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ පිළිතුරු දෙනවා 'නැත ඇවැත්නි' ඊළඟට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ අහනවා

'එහෙනම් චිත්ත විශුද්ධිය සඳහා ද?' 'නැත ඇවැත්නි'
'දිට්ඨි විශුද්ධිය සඳහා ද?' 'නැත ඇවැත්නි'
'කඞ්ඛාවිතරණ විශුද්ධිය සඳහා ද?' 'නැත ඇවැත්නි'
'මග්ගාමග්ග ඤාණදස්සන විශුද්ධිය සඳහා ද?' 'නැත ඇවැත්නි'
'පටිපදා ඤාණදස්සන විශුද්ධිය සඳහා ද?' 'නැත ඇවැත්නි'
'ඤාණදස්සන විශුද්ධිය සඳහා ද?' 'නැත ඇවැත්නි'
ඇසූ ප්‍රශ්න හතටම නැත කියලා පිළිතුරු දුන්නා.

මේ ධර්ම සාකච්ඡාව ඉදිරියට යන්න කලින් මේ පින්වතුන්ට මේ විශුද්ධි හත මොනවද කියලා කෙටියෙන් තේරුම් කරලා දෙන්න සිද්ධ වෙනවා. 'ශීල විශුද්ධිය' කියල කියන්නේ කයින් වචනයෙන් ජීවිකාව අතින් සිදුවෙන වැරදිවලින් වැළකීමෙන් ලැබෙන පිරිසිදු කමයි. ගිහියාට හෝ පැවිද්දට හෝ ඒ ඒ මට්ටමින්. 'චිත්ත විශුද්ධිය' කියල කියන්නේ චිත්ත සමාධියට බාධා වන නීවරණ ධර්මවලින් පිරිසිදු වීමෙන් ලැබෙන ඒ පිරිසිදු කමයි. 'දිට්ඨි විශුද්ධිය' කියල කියන්නේ මිථ්‍යා දිට්ඨිවලින් සිත වෙන්කර ගැනීමෙන් ලබන පිරිසිදු කමයි. 'කඞ්ඛාවිතරණ විශුද්ධිය' යනු සසර පැවැත්ම පිළිබඳව සැක දෙගිඩියා ඉවත් කරල ලබන පිරිසිදු කමයි. 'මග්ගාමග්ග ඤාණදස්සන විශුද්ධිය' කියලා කියන්නේ විදර්ශනා භාවනාවේදී ඉදිරිපත් වෙන ආලෝක ආදී උපක්ලේශ ධර්මවලින් සිත මුදාගෙන මග නොමග හරියට වටහා ගැනීමෙන් ලැබෙන පිරිසිදු කමයි. 'පටිපදා ඤාණදස්සන විශුද්ධිය' කියල කියන්නේ නිර්වාණගාමී ප්‍රතිපදාවට බාධාවන කෙලෙස් ඉවත් කර ගැනීමෙන් ලබන පිරිසිදු කමයි. 'ඤාණදස්සන විශුද්ධිය' කියන්නේ ලෝකෝත්තර මාර්ගයට බාධාවන කෙලෙස් ධර්ම මුලිනුපුටා දැමීමෙන් ලැබෙන පිරිසිදු කමයි. මේ විශුද්ධි හතයි මේ ශාසනයේ සප්ත විශුද්ධි වශයෙන් හැඳින්වෙන්නේ. එතකොට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේගෙන් කලින් සඳහන් කළ විදියට එකින් එක ප්‍රශ්න කළා. ශීල විශුද්ධිය සඳහා ද? නැත. චිත්ත විශුද්ධිය සඳහා ද? නැත. දිට්ඨි විශුද්ධිය සඳහා ද? නැත. ආදී වශයෙන්. එතකොට ඔය ටික කිව්වට පස්සේ සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ඊළඟට ප්‍රතිරාව වශයෙන් ඒ නැත නැත කියාපු කරුණු ටික ඉදිරිපත් කරලා දෙවෙනි ප්‍රශ්නය අහනවා.

'ඇවැත්නි, දැන් ඔබවහන්සේ කිව්වා මම ඇහැව්වහම ශීල විශුද්ධිය සඳහා ද භාග්‍යවතුන් වහන්සේ වෙත බ්‍රහ්මචරිය වාසය කරන්නේ කියලා, ඔබවහන්සේ නැත ඇවැත්නි කිව්වා. චිත්ත විශුද්ධිය

සඳහා ද කියලා ඇහුවහම ඒකටත් නැහැයි කිව්වා. දිට්ඨි විශුද්ධියටත් නැහැයි කිව්වා. කඞ්ඛාවිතරණ විශුද්ධිය සඳහා ද කියලා ඇහුවහම ඒකටත් නැතෙයි කිව්වා. මග්ගාමග්ග ඤාණදස්සන විශුද්ධිය සඳහා ද කියලා ඇහුවහම ඒකටත් නැතෙයි කිව්වා. පටිපදා ඤාණදස්සන විශුද්ධිය සඳහා ද කියලා ඇහුවහම ඒකටත් නැතෙයි කිව්වා. ඤාණදස්සන විශුද්ධිය සඳහා ද කියලා ඇහුවහම ඒකටත් නැතෙයි කිව්වා. එහෙම නම් මොකටද ඔබවහන්සේ මේ භාග්‍යවතුන් වහන්සේ වෙත බ්‍රහ්මචරිය වසන්නේ?' ඔන්න සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ඇසූ ප්‍රශ්නය. පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ ඒකට පිළිතුරු දෙනවා. 'අනුපාදා පරිනිර්වාණය සඳහායි මම භාග්‍යවතුන් වහන්සේ වෙත බ්‍රහ්මචරිය වසන්නේ.' අනුපාදා පරිනිර්වාණය කියල කියන්නේ පින්වතුනි, පරිනිබ්බානය - පරිනිර්වාණය කියන වචන මේ පින්වතුන්ට ඇහෙන කොට හිතෙන්නේ මෙය රහතන් වහන්සේගේ අවසන් මොහොත කියලා. එහෙම එකක් නොවෙයි මෙතන කියන්නේ. කිසිවක් අල්ලා නොගැනීමෙන් ලබන පූර්ණ නිවීම. ඒක මෙලොවම ප්‍රත්‍යක්ෂ කරන අරහත් ඵල සමාපත්තියේදී ප්‍රත්‍යක්ෂ කරන තත්ත්වයක්. එතකොට අන්න ඒ කිසිවක් අල්ලා නොගත් පූර්ණ නිවීම - පිරිනිවීම - සඳහායි මම මේ බ්‍රහ්මචරිය වාසය කරන්නේ කියලා පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ පිළිතුරු දුන්නා.

ඔන්න ඊළඟට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ වෙත ප්‍රශ්න මාලාවක් ඉදිරිපත් කරනවා. 'ඇවැත්නි, ශීල විශුද්ධියද මේ අනුපාදා පරිනිර්වාණය?' 'නැත ඇවැත්නි' පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ දෙවන වරටත් පිළිතුරු දෙනවා. 'චිත්ත විශුද්ධිය ද අනුපාදා පරිනිර්වාණය?' 'නැත ඇවැත්නි.' 'දිට්ඨි විශුද්ධියද?' 'නැත ඇවැත්නි.' 'කඞ්ඛාවිතරණ විශුද්ධියද?' 'නැත ඇවැත්නි.' 'මග්ගාමග්ග ඤාණදස්සන විශුද්ධියද?' 'නැත ඇවැත්නි.' 'පටිපදා ඤාණදස්සන විශුද්ධියද?' 'නැත ඇවැත්නි.' 'ඤාණදස්සන විශුද්ධියද?' 'නැත ඇවැත්නි. ඒ එකක්වත් අනුපාදා පරිනිර්වාණය නොවේ' යයි කියනවා. එතකොට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ අහනවා 'මේ කියාපුවායින් තොරවද අනුපාදා පරිනිර්වාණය තියෙන්නේ' කියල. 'ඒත් නැතය.' කියනවා. ඔන්න එතකොට ප්‍රහේලිකා විදියේ තත්ත්වයක් දැන් පැන නැගිලා තියෙන්නේ. පරස්පර විරෝධී වගේ. එතකොට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ඒ පරස්පර විරෝධී තත්ත්වය තවත් ප්‍රශ්න මාලාවකින් ඊළඟට ඉදිරිපත් කරනවා. 'දැන් ඇවැත්නි ඔබවහන්සේ කිව්වා, ශීල විශුද්ධිය අනුපාදා පරිනිර්වාණය නොවෙයි කියලා. චිත්ත විශුද්ධියත් නොවෙයි කිව්වා. දිට්ඨි විශුද්ධියත් නොවෙයි කිව්වා. කඞ්ඛාවිතරණ විශුද්ධියත් නොවෙයි කිව්වා. මග්ගාමග්ග ඤාණදස්සන විශුද්ධියත් නොවෙයි කිව්වා. පටිපදා

ඤාණදස්සන විශුද්ධියත් අනුපාද පරිනිර්වාණය නොවෙයි කිව්වා. ඤාණදස්සන විශුද්ධියත් අනුපාද පරිනිර්වාණය නොවෙයි කිව්වා. ඊළඟට ඒවායින් තොරව අනුපාද පරිනිර්වාණයක් තියෙනවද කියල ඇහුවහම ඒකටත් නැතෙයි කිව්වා. කොහොමද ඔබවහන්සේගේ ඒ කථාව මම තේරුම් ගන්නේ? ඔබවහන්සේ ඒ කියන එක කොහොමද මම තේරුම් ගන්නේ?' අර පරස්පර විරෝධී බව සාරිපුත්ත ස්වාමීන් වහන්සේ මතු කරල දුන්නා. ඔන්න දැන් තමයි පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ නියම පිළිතුර දෙන්නේ. ඇවැත්නි, ශීල විශුද්ධිය අනුපාද පරිනිර්වාණය හැටියට භාග්‍යවතුන් වහන්සේ දේශනා කළා නම් උපාදාන සහිත වූවක්ම අනුපාද පරිනිර්වාණය ලෙස දැක්වූවා වෙනවා. 'උපාදාන' කියන වචනය මේ පින්වතුන් අහල ඇතිනෙ. අල්ලා ගැනීමනෙ. 'අනුපාද' කියන්නෙ අල්ලා නොගැනීම. මෙතෙන්දි පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ මේ හේතුව හැටියට දක්වන්නේ මොකද? යම් විදියකින් බුදුරජාණන් වහන්සේ ශීල විශුද්ධිය අනුපාද පරිනිර්වාණය කියල කිව්ව නම් උපාදාන සහිත වූවක්ම අනුපාද පරිනිර්වාණය හැටියට දැක්වූවා වෙනවා. ඒ වගේමයි චිත්ත විශුද්ධියත්. චිත්ත විශුද්ධිය අනුපාද පරිනිර්වාණය හැටියට දැක්වූවා නම් බුදුරජාණන් වහන්සේ අන්න එතනත් උපාදාන අල්ලා ගැනීම් සහිත වූවක්ම අනුපාද පරිනිර්වාණය හැටියට දැක්වූවා වෙනවා. ඔය විදියට හත ගැනම කියලා අන්තිමට කියන වාක්‍යය ඊට වඩා වැදගත් වෙනවා. ඇවැත්නි, මේ හතෙන් තොරව අනුපාද පරිනිර්වාණයක් තියෙනවා නම් පෘථග්ජනයන් පිරිනිවිල ඉවරයි. පෘථග්ජනයට නැහැනෙ මේ හතම. හතෙන් එකක් වත් පෘථග්ජනයට නැහැනෙ. ඒක කියල ඉවරවෙලා පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ තව දුරටත් ඒක පැහැදිලි කිරීමක් වශයෙන් - හොඳයි ඇවැත්නි, මම උපමාවක් දෙන්නම්, මේ කාරණේ පැහැදිලි කරන්න. මේ ලෝකයේ ඇතැම් නුවණැති පුද්ගලයින් උපමාවන්ගෙනුත් ප්‍රකාශ කළ දේ අර්ථය තේරුම් ගන්නවා කියලා ඔන්න ඊළඟට උපමාව දෙනවා. මෙතෙක් මේ කථා මාර්ගය නොතේරුණු කෙනෙක් ඉන්නවා නම් ඊළඟට එන උපමාවෙන් තේරුම් ගන්න බලන්න. පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ ඊළඟට දෙන්නේ මහ පුදුම උපමාවක්. මේ විදියටයි ඒ උපමාව තියෙන්නේ.

ඇවැත්නි, පසේ නදී කොසොල් රජ්ජුරුවෝ සැවැත් නුවර වාසය කරන අවස්ථාවේදී සාකේත නුවර, ඒකත් කොසොල් රජ්ජුරුවන්ට අයිති නගරයක්. සාකේත නුවර හදිසි කටයුත්තක් සඳහා යන්න සිදුවෙනවා. ඒ විදියේ හදිසි ගමන් සඳහා මේ පසේ නදී කොසොල් රජ්ජුරුවන් වෙනුවෙන් කඩින් කඩ දුවන රථ හතක් අතරතුර මාර්ගයේ - දීර්ඝ මාර්ගයේ නවත්තල තියෙනවා. මේ කොසොල්

රජ්ජුරුවෝ සැවැත් නුවරින් පිටත්වෙලා ඇතුළු නුවර දොරටුව ළඟින් පළමුවෙනි රථයට නගිනවා. පළවෙනි රථයෙන් පිටත්වෙලා ගිහිල්ලා, දෙවෙනි රථය ළඟට ගිහිල්ලා, පළවෙනි රථය අතහරිනවා. දෙවෙනි රථයට නගිනවා. දෙවෙනි රථයෙන් ඊළඟට පිටත්වෙලා ගිහිල්ලා, තුන්වෙනි රථය ළඟට ගියාට පස්සේ දෙවෙනි රථය අතහරිනවා. තුන්වෙනි රථයට නගිනවා. ඔය විදියට දැන් හිතාගන්න පුළුවන්. තුන්වෙනි රථයෙන් හතරවෙනි රථය ළඟට ගිහිල්ලා, තුන්වෙනි රථය අතහරිනවා. හතරවෙනි රථයට නගිනවා. ඒකෙන් පස්වෙනි රථයට ළඟා වෙනවා. පස්වෙනි රථයෙන් හයවෙනි රථයට ළඟා වෙනවා. හයවෙනි රථයෙන් අන්තිමට ගිහින් හත්වෙනි රථයට මාරු වෙනවා. හත්වෙනි රථයෙන් තමයි සාකේත නුවරට රජතුමා පැමිණෙන්නෙ.

පැමිණියාට පස්සේ ඒ සාකේත නුවර ඉන්න නෑ හිතවතුන් මිත්‍රයින් රජතුමාගෙන් අහනවා 'මහරජතුමනි, ඔබ මේ රථයෙන්ද සැවැත් නුවර ඉඳල සාකේත නුවරට පැමිණියේ?' එතකොට කොහොමද කොසොල් රජ්ජුරුවෝ උත්තර දෙන්නේ. කොහොම උත්තර දුන්නහමද ඒක හරි උත්තර දීමක් වෙන්නේ කියා ඒ ප්‍රශ්නයත් නගලා, ඒ එක්කම පුණ්ණ මන්තානි පුත්ත සවාමීන් වහන්සේ රජතුමා පිළිතුරු දෙන ආකාරය කියනවා. මට සැවැත් නුවර ඉන්න කාලයේ හදිසි කාරණයක් නිසා යන්න සිද්ධවුණා සාකේත නුවරට. රථ හතක් නවත්තල තිබුණා. මම එක රථයකින් පිටත් වුණා. ඒ රථයෙන් දෙවෙනි රථයට ආවා. පළවෙනි රථය අත හැරියා. දෙවෙනි රථයට නැගුනා. දෙවෙනි රථයෙන් තුන්වෙනි රථය ළඟට ආවා. දෙවෙනි රථය අතහැරියා. ඔය විදියට හත්වෙනි රථයෙන් තමයි දැන් ඇවිල්ලා තියෙන්නේ කියලා, මුළු කතාන්තරයම පසේ නදී කොසොල් රජ්ජුරුවන්ට කියන්න සිද්ධ වෙනවා. ඒ උපමාවයි දුන්නේ. උපමාව අනුව උපමේය කියල කියන්නේ උපමාවකින් මතු කරල දෙන ධර්ම කාරණය. ඔන්න ධර්ම කාරණය ඊළඟට මතු කරල දෙනවා, පුණ්ණ මන්තානි පුත්ත සවාමීන් වහන්සේ. එසේම ඇවැත්නි, 'ශීල විශුද්ධි යාව දෙව චිත්ත විසුද්ධත්ථා' එතන වැදගත් වචනයක් සඳහන් වෙන නිසයි අපි ඒක පාලියෙන්ම කිව්වෙ. චිත්ත විශුද්ධිය හුදෙක් මේ '<u>යාව දෙව</u>' කියන පාලි වචනයට සිංහල අර්ථයක් හෙව්වොත් අපට කියන්න තියෙන්නෙ '<u>හුදෙක්</u>' කියන වචනයයි. ඒක සඳහාම පමණයි කියන එක - හුදෙක් කියන වචනය. එතකොට ශීල විශුද්ධිය හුදෙක් චිත්ත විශුද්ධිය සඳහායි. චිත්ත විශුද්ධිය හුදෙක් දිට්ඨි විශුද්ධිය සඳහායි. දිට්ඨි විශුද්ධිය හුදෙක් කඞ්ඛාවිතරණ විශුද්ධිය සඳහායි. ඔය ආදී වශයෙන් අර එක් එක් විශුද්ධියක් ඊළඟ විශුද්ධිය සඳහා උපකාර වෙනවා. අන්තිමට දක්වනවා ඔය විදියට ගිහිල්ලා ඤාණදස්සන විශුද්ධිය අවසාන වශයෙන් අනුපාද පරිනිර්වාණයට උපකාර වෙනවා. එතකොට ඤාණදස්සන විශුද්ධිය එක

පාරටම ලබා ගන්න බැහැ. අර විදියට විශුද්ධි පරම්පරාවෙන් ගිහිල්ල තමයි ඤාණදස්සන විශුද්ධිය තුළින් ඒ නිර්වාණය සාක්ෂාත් කරන්නේ. අනුපාද පරිනිර්වාණය කියල කියන්නේ ඤාණදස්සන විශුද්ධියවත් අල්ලා ගන්නේ නැත. ආයිත් කියනවා වෙන එකක් තබා ඤාණදස්සන විශුද්ධියවත් අල්ලා ගන්නේ නැහැ. එකක් තුළින් එකක් අත හැරලායි අනුපාද පරිනිර්වාණය තුළ කිසිවක් අල්ලා නොගත් පිරිනිවීමට පත් වෙන්නේ කියලා ඒ ධර්ම කාරණය පැහැදිලි කළා.

ඒකෙන් සතුටු වුණ සාරිපුත්ත ස්වාමීන් වහන්සේ අහනවා, 'ඇවැත්නි ඔබ වහන්සේගේ නම මොකක්ද? සබ්‍රහමචාරීන් වහන්සේලා ඔබවහන්සේ හඳුන්වන්නේ කොහොමද?' කියලා. එතකොට පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ කියනවා, 'මගේ නම පුණ්ණ. සබ්‍රහමචාරීන් වහන්සේලා මාව හඳුන්වන්නේ මන්තානිපුත්ත නමින්.' එතකොට ශාරිපුත්ත ස්වාමීන් වහන්සේ ප්‍රීතිය ප්‍රකාශ කිරීම් වශයෙන් කියනවා 'ආශ්චර්යයි අද්භූතයි. මේ පුණ්ණ මන්තානිපුත්ත ආයුෂ්මතුන් වහන්සේ මේ ගැඹුරු ප්‍රශ්නවලට පිළිතුරු දුන් ආකාරය. ඔබ වහන්සේ වගේ අය ඇසුරු කරන්නට සබ්‍රහමචාරීන්ට ලැබීම විශේෂ ලාභයක්' කියලා. පුණ්ණ මන්තානිපුත්ත ආයුෂ්මතුන් වහන්සේ, තමන්ගේ හිස මත දුහුල් සුහුඹුවක හිඳුවාගෙන යමින්, පරිහරණය කරමින් ඇසුරු කරන්න ලැබෙනවා නම් ඒකත් ලොකු ලාභයක්. අපටත් විශාල ලාභයක් ලැබුණේ. ඔබවහන්සේ හමුවෙන්න මේ විදියට ධර්ම සාකච්ඡාවක් කරන්න කියලා. ඒ ප්‍රීතිය සතුට ප්‍රකාශ කළේ අනුමෝදනා වශයෙන්. සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ඒ විදියට ප්‍රකාශ කළහම පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේත් අහනවා, ඔබ වහන්සේගේ නම මොකක්ද? සබ්‍රහමචාරී ස්වාමීන් වහන්සේලා ඔබවහන්සේ හඳුන්වන්නේ කොහොමද? ඔන්න සාරිපුත්ත ස්වාමීන් වහන්සේ කියනවා. මගේ නම උපතිස්ස. සබ්‍රහමචාරී ස්වාමීන් වහන්සේලා මාව හඳුන්වනවා සාරිපුත්ත නමින්. ඔන්න එතකොට පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරනවා. ආ! මේ ශාස්තෘන් වහන්සේ හා සමාන ශ්‍රාවකයෙක් එක්ක නේ සාකච්ඡා කරමින් සිටියේ! මම දැනගත්තේ නැහැනේ සාරිපුත්ත ස්වාමීන් වහන්සේ කියලා. මම දැනගත්තා නම් සාරිපුත්ත ස්වාමීන් වහන්සේ කියලා ආයුෂ්මතුන් කියලා අමතන්නේ නැහැනේ. එහෙනම් මට මේ කථා මාර්ගය මේ උපමා වැටහෙන්නෙත් නැහැ කියලා, අර විදියටම වර්ණනාව කරනවා. යම් සබ්‍රහමචාරීන් වහන්සේලාට මේ සාරිපුත්ත ආයුෂ්මතුන් වහන්සේ වැනි මේ ගැඹුරු ප්‍රශ්න මේ විදියට ක්‍රමානුකූලව ඉදිරිපත් කිරීමේ හැකියාව ඇති ස්වාමීන් වහන්සේ කෙනෙක් ඇසුරු කරන්න ලැබෙනවා නම් ඒක විශාල ලාභයක්. මේ වගේ ස්වාමීන් වහන්සේ කෙනෙක් හිස මත තබාගෙන වඩම්මවාගෙන පරිහරණය කරන්න ඇත්නම් ඒක ලොකු

ලාභයක්. අපටත් මේ සාරිපුත්ත ආයුෂ්මතුන් වහන්සේ දකින්න ලැබීම, සාකච්ඡා කරන්න ලැබීම ලොකු ලාභයක් කියලා අනුමෝදන් කරනවා. සතුට ප්‍රකාශ කරනවා. ඊළඟට මේ රථවිනීත සූත්‍රය අවසාන වන්නේ හරිම වටිනා පාඨයකින්. ඒකෙ අදහස මෙන්න මේ විදියට. මේ ශාසනයේ මහ ඇත්තු දෙන්නෙක් 'උභො මහානාගා' ඔවුනොවුන්ට අනුමෝදන් කළා, ඔවුනොවුන්ගේ සුභාෂිතය - ඒ කළ සාකච්ඡාව ගැන ඔවුනොවුන් පිළිබඳව වර්ණනා කළා, අනුමෝදන් කළා, කියලයි ඒ සූත්‍ර දේශනාව අවසාන වන්නේ.

මෙපමණකින් මේ පින්වතුන්ට ඒ ධර්ම සාකච්ඡාව පැහැදිලි නොවෙන්න පුළුවන්. ඒක ගැන අපි විවරණයක් කරනවා. ඊට කලින් මෙතෙක් මේ ආපු සිද්ධි සංඝටනාව, සිද්ධි කීපය, තුළින් මේ යුගයට ලැබෙන ආදර්ශයක් අපි මතු කරල දෙමු. මේ සාරිපුත්ත ස්වාමීන් වහන්සේ කියන්නේ එසේ මෙසේ කෙනෙකු නොවන බව අපි කවුරුත් දන්නවා. අග්‍ර ශ්‍රාවකයන් වහන්සේ. බුදුරජාණන් වහන්සේ ළඟට පූර්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේගේ ගෝලයන් ඇවිල්ලා ගුණ වර්ණනා කරන කොට උන්වහන්සේ මොන තරම් මුදිතා ගුණයකින්ද කල්පනා කළේ. අනේ මට කවදහරි මේ ආයුෂ්මතුන් දකින්න ඇත්නම්, උන්වහන්සේ එක්ක කථා කරන්න ඇත්නම් කියලා ලොකු මුදිතා ගුණයකින් අර තරම් ප්‍රාඥ කෙනෙක් උනත්. ඊළඟට එපමණක් නොවෙයි. උන්වහන්සේ වැඩිය බව සැවැත් නුවරදී අහන්ට ලැබුණ හැටියේ විගහට විගහට නිසීදනයත් අරගෙන පිටත් වුණා. පිටත්වෙලා ගියාට මොකද තමන්ට කොයි තරම් ඉක්මන්කම තිබුණාට මොකද අන්න බලන්න කොයි තරම් වටිනා ගුණයක්ද කියලා එක පාරටම කඩාගෙන වැදුනේ නැහැ. ඔබවහන්සේද කියලා එහෙම කඩාගෙන වැදුනේ නැහැ. පිටිපස්සෙන් හිස පමණක් පෙනෙන ඈතින් හිමිහිට හිමිහිට පූර්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ පිටිපස්සෙන් වැඩම කරලා උන්වහන්සේ භාවනාවෙන් වැඩ උන්නහම තමනුත් භාවනාවෙන් වැඩ උන්නා. මුළු හවස් වරුවක්ම ගෙව්වා අවසථාව එනකල්. එතනත් පේනවා උන්වහන්සේගේ වටිනා ගුණයක්. අන්න එතන තියෙන්නේ ආදර්ශයක් මේ යුගයට. ඒ අතීත ශ්‍රේෂ්ඨ ස්වාමීන් වහන්සේලා තමන්ගේ පෞද්ගලිකත්වය ඉස්මතු කළේ නැහැ. ධර්මයයි ඉස්මතු කළේ. ධර්මයටයි මුල් තැන දුන්නේ. පුද්ගල ප්‍රතිරූපය ගොඩනගා ගැනීම නොවේ. මේ ශාසනය ගොඩ නැගීම සඳහා පශ්චිම ජනතාවට ධර්මය ඉදිරිපත් කිරීම පිළිබඳවයි වෙහෙසුනේ. ඒ නිසා සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ගිය හැටියෙම කිව්වෙ නැහැ මම තමයි මේ ශාසනයේ අග්‍ර ශ්‍රාවක සාරිපුත්ත මහා ස්ථවිරපාදයන් වහන්සේ කියලා. එහෙම තමුන් හඳුන්වලා දුන්නේ නැහැ. ඒ වෙනුවට කවුද, කින්ද, මන්ද, වත් නැහැ. ධර්මයෙන්ම පටන් ගත්තා. ධර්ම ප්‍රශ්න කීපයක්

තුළින් පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ, සාරිපුත්ත ස්වාමීන් වහන්සේව හඳුනාගත්තා. සාරිපුත්ත ස්වාමීන් වහන්සේ, පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේව හඳුනාගත්තා. ඒක මේ යුගයට වටින ආදර්ශයක්. ඊළඟට තව දුරටත් මේ කථාව ආශ්‍රයෙන් අපි යමක් කියනවා නම් මේ කාලයේ බොහෝ දෙනෙක් අහන ප්‍රශ්නයක් තමයි 'සිවුපිළිසිඹියාපත්.' හැම තැනම මේ ධර්ම කථාවල කියවෙනවා සිවුපිළිසිඹියාපත් මහ රහතන් වහන්සේලා ගැන. ඉතින් මොකක්ද මේ පටිසම්භිදා හතර කියලා, හැම දෙනාම වගේ අහන එකක්. මේ පටිසම්භිදා හතර උපකාර කරගන්න හැටි අපට තේරෙන මට්ටමින් ඉදිරිපත් කරන්න බලමු. සිවුපිළිසිඹියා කියල කියන්නේ පින්වතුනි, 'අත්‍ථ, ධම්ම, නිරුත්ති, පටිභාන.' අත්‍ථ කියල කියන්නේ අපේ ඉදිරිපිට තියෙන යම්කිසි කාරණයක්. අප ඉදිරිපිට තියෙන්නේ හේතුඵලය පමණයි. හේතුඵලයයි පෙනෙන්නේ. ඒකෙ යට තියෙන හේතුව අපට පෙනෙන්නෙ නැහැ. 'අත්‍ථ පටිසම්භිදා' කියල කියන්නේ යම්කිසි ඉදිරිපත්වෙලා තියෙන කාරණය පිළිබඳ අවබෝධය. හරි අවබෝධය. 'ධම්ම පටිසම්භිදා' කියල කියන්නේ ඒකේ යට තියෙන ධර්මතාව හේතුව. හේතුව පිළිබඳ ඥාණය. 'නිරුත්ති පටිසම්භිදා' කියල කියන්නේ ඒ හේතුව තේරුම් කිරීමට ඉදිරිපත් කිරීම. විවරණය කිරීම පිළිබඳව නිරුක්තිය හා භාෂාව හා සම්බන්ධව අවසථානුකූලව තර්ක විතර්ක ආදිය, ඒවා ඉදිරිපත් වෙන ආකාරය අනුව භාෂා පිළිබඳ කොටසයි නිරුත්ති පටිසම්භිදා කියන්නේ. ඊළඟට ඒ කාරණය සමස්තයක් හැටියට සිතට කාවද්දලීමට ඒ සාර අර්ථය ඉදිරිපත් කිරීමට අවසථානුකූලව උපමා ආදිය වැටහීමේ ශක්තියයි, 'පටිභාන පටිසම්භිදා' කියන්නේ.

දැන් මේ කථාව ආශ්‍රයෙන් අපි විග්‍රහ කරල බලනවා නම් සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ඇහුවා පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේගෙන් කුමක් නිසාද ඇවැත්නි භාග්‍යවතුන් වහන්සේ සමීපයේ බ්‍රහ්මචරියාවෙන් වාසය කරන්නේ? ඔන්න ඕක තමයි ප්‍රශ්නය. එතකොට ඒ ප්‍රශ්නය ඉදිරිපත් කරලා, ඒකට පිළිතුර මොකක්ද? යට තියෙන හේතුව. ධර්මතාව. අන්න පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේගෙන් ප්‍රකාශ වුණානෙ. අනුපාදා පරිනිර්වාණය සඳහායි මේ බ්‍රහ්මචරියාව වාසය කරන්නේ. නමුත් ඒක එකපාරටම කෙනෙකුට තේරෙන්නෙ නැහැ. සාරිපුත්ත ස්වාමීන් වහන්සේට තේරුනේ නැතිවා නොවෙයි. මේ අප සඳහායි මේ විස්තර. මේ සාරිපුත්ත ස්වාමීන් වහන්සේ නොදන්නවා වගේ, වෙස්වලාගන උන්වහන්සේ තමන්ගේ ඒ ලොකුකම කියාගන්නේ නැතිව, අප වෙනුවෙන් කරපු සාකච්ඡාවක්. සාරිපුත්ත ස්වාමීන් වහන්සේට පින් දෙන්න වටිනවා. ඊළඟට ඒ ඉදිරිපත් කළ ප්‍රශ්න විසර්ජන තුළින් අපට පෙනෙන්නේ නිරුක්ති පටිසම්භිදාවයි. පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේගේ නිරුක්ති

පටිසම්භිදාවයි. උන්වහන්සේ අර ඉදිරිපත් කළ ප්‍රශ්නවලට 'ඔව්' කියයුතු තැන් වලට 'ඔව්' කිව්වා. 'නෑ' කියයුතු තැන් වලට 'නෑ' කිව්වා. අන්තිමට ඒ දෙකටම නැති තැන් වලදී මතු කරල දුන්නා 'ඔව්ත් නෑ, නැත් නෑ' මේකයි යථාර්ථය කියලා. එතකොට එය නිරුක්ති පටිසම්භිදාවට අදාලයි. ඒ කොච්චර කිව්වත් සාමාන්‍ය කෙනෙකුට මේ කතාන්තරය හරියට තේරෙන්නේ නැහැ, වචන ගොඩක් විතරයි. ඔන්න ඊළඟට ඒ පැහැදිලි වෙන ටික තමයි ධර්ම කථාව. අර පසේනදී කොසොල් රජු පිළිබඳ කථාවෙන් කියවෙන්නේ.

දැන් එතන ඉඳල මේ පින්වතුන්ට මේ ධර්ම කාරණයට අදාල කොටස උපමාව ආශ්‍රයෙන් අපි තේරුම් ගන්න බලමු. දැන් මේ සමාජයේ තියෙනවා ධාවන තරඟ කියලා දෙයක්. මේ ධාවන තරඟවල අපට අහන්න ලැබිල තියෙන හැටියට සහාය දිවීම කියල එකක් තියෙනවා. ඒ සහාය දිවීමේදී යෂ්ටිය තමයි සංකේතය - ඒ යෂ්ටිය සංකේතවත් කරන්නේ ඒ ජවයයි. එතකොට මේ සහාය දිවීමක් තුළින් කෙනෙක් වාර්තාවක් බිඳින්නනම් - ඒ පිරිස සාමූහික වශයෙන් කඩින් කඩ දුවලා අර යෂ්ටියත් අරගෙන - ටිකක් හිතල බලන්න - අපි හිතමු ඒ පළමුවෙනි ක්‍රීඩකයා ඒක පුළුවන් ඉක්මනින් අනිත් එක්කෙනාට බාර දෙන්න යනවා. දෙවෙනි එක්කෙනා නොඉවසිල්ලෙන් ඉන්නවා ඒක බාර ගන්න. එතන තියෙන්නේ අපේක්ෂාවනෙ. ඔන්න ඕකට අපි කියන්නෙ 'සාපේක්ෂකත්වය' කියල. ඒ කියන්නේ එකකට එකක් සම්බන්ධයි. එතකොට කඩින් කඩ දිවීමේදී අර රථ ගැන කිව්ව වගේ තමයි. පළමුවෙනි රථයේ ගියේ දෙවෙනි රථය අපේක්ෂාවෙන්. පළවෙනි රථය අතහැරල දෙවෙනි රථයට නැගල දෙවෙනි රථයෙන් යනකොට තුන්වෙනි රථය බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඔන්න ඔය විදියේ එකක් මෙතන තියෙන්නේ. මේ විශුද්ධි පරම්පරාව තුළ තිබෙන්නේ 'අනුපාද පරිනිර්වාණය' කියල කියන පරමාර්ථයයි. කිසිවක් අල්ලා නොගත් නිවන සඳහා අවශ්‍ය ජවයයි මතු කරල තියෙන්නේ. ශීල විශුද්ධිය අල්ලා ගන්නෙත් නැහැ. චිත්ත විශුද්ධිය අල්ලා ගන්නෙත් නැහැ. දිට්ඨි විශුද්ධිය අල්ලා ගන්නෙත් නැහැ. එකක්වත් අල්ලා ගන්නෙත් නැහැ. නමුත් එපමණකින් අතහැරියොත් අන්න පෘථග්ජනයත් නිවන් දැක්කා වෙනවා. අත හැරලත් බැහැ. ඒකනෙ අර අන්තිමට සාකච්ඡාවේ අවසාන කොටසේදී පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කළේ - මේ එකක්වත් අනුපාද පරිනිර්වාණයක් නොවේ. මෙයින් තොරව අනුපාද පරිනිර්වාණයකුත් නැහැ. මෙයින් තොරව පරිනිර්වාණයක් තියෙනව කියල කිව්වොත් පෘථග්ජනයත් පිරිනිවිල ඉවරයි. ඉතාමත්ම ගැඹුරු කාරණයක් මේ තුළ තිබෙන්නේ.

ඊළඟට, මේ ධර්මය තුළ තිබෙන මේ මැදුම් පිළිවෙතේම කොටසක් හැටියට මේක අපට දක්වන්න පුළුවන්. මේ ධර්මය පුරාම විහිදිලා තියෙනවා මධ්‍යම ප්‍රතිපදාවේ ලක්ෂණ. ඒ මධ්‍යම ප්‍රතිපදාවටම අදාලව තමයි - මේ පින්වතුන් අහල තියෙනවා යම් ප්‍රමාණයකට පටිච්ච සමුප්පාදය පිළිබඳව. පටිච්ච කියන වචනය ගැන හිතල බලන්න. පටිච්ච කියල කියන්නේ දෙකක්. එකිනෙකට සම්බන්ධයි. එකක් තව එකක් සඳහා, ඒ දෙක අතරේ සම්බන්ධකමක් තියෙනවා. පළවෙනි රථය එනකම් දෙවෙනි රථය බලාගන ඉන්නවා. දෙවෙනි රථය ළඟට එනකම් තුන්වෙනි රථය බලාගන ඉන්නවා. ඔය වගේ පටිච්ච සවභාවයක් ලෝකයේ තිබෙන්නේ. සංසාර ගඟ ගලාගන යන ගඟක්. අපි ඒවා කොටස් කරල පෙන්නුවට මේක ගලාගන යනවා. ඒක සන්තතියක්. ඒකයි ධර්මතාව. බුදුරජාණන් වහන්සේ කළේ ලෝකයේ තිබෙන පැවැත්මට අදාල සන්තානගත වූ ධර්මතාවක් මතු කරල දුන්නා. පැවැත්ම, නැවැත්ම කරා යන මාර්ගයට අදාල ධර්ම සමූහයක්, ධර්ම සන්තානයක් මතු කරල දුන්නා. ඒ ධර්ම හත තමයි මේ. එකක්වත් අල්ලගන්නේ නැතිව හැම එකකින්ම ප්‍රයෝජන ගන්න, අන්න ඒ විදියේ මහ පුදුම දෙයක්. ඒක නිසා බුදුරජාණන් වහන්සේ ඇතැම් අවසථාවන් වල මේ ධර්මතාව එක වාක්‍යයකින් දක්වා වදාළා. 'ඉති ඛො භික්ඛවෙ ධම්මාව ධම්මෙ අභිසන්දෙන්ති. ධම්මාව ධම්මෙ පරිපූරෙන්ති අපාරා පාරං ගමනාය' මෙසේ මහණෙනි, ධර්මානු ධර්මයන්ගේ පටිපදාව ධර්මානු ධර්මයන්ගේ පරිපූර්ණත්වයට පත්වෙයි. කුමක් සඳහාද? මෙතරින් එතරට යාම සඳහා, මෙතරින් එතරට යාම කෙරෙන්නේ අන්න අර ධර්මයෙන්මයි. කවුරුවත් යන ගමනක් නොවෙයි මේක. කවුරුවත් නිවන් දකින්න යන්නෙ නැහැ. දුකක ඉඳලා දුක්ඛ නිරෝධය දක්වා යන්නේ. එහෙම නැත්නම් ආත්ම වාදයක් වෙනවානෙ, මේ අනාත්ම ධර්මය. මේව තමයි හැමෝටම තියෙන ගැටළු. පටිච්ච සමුප්පාදය, අනාත්ම ධර්මය. මේ උපමාව තුළ තියෙනවා මේකට අදාල කාරණය. ඇත්ත වශයෙන් මේ ප්‍රතිපදාවල තියෙන්නේ ධර්ම සමූහයක්ම තමයි. ධර්මය කරා ක්‍රමානුකූලව එකකින් එකකට ගලා යනවා. ඒ ගලා යාම තුළින් එය පරිපූර්ණත්වයට පත් වෙනවා. ශීල විශුද්ධිය ගලා යාම තුළින් චිත්ත විශුද්ධිය දක්වා එකතුවෙලා ඒක පරිපූර්ණත්වයට පත් වෙනවා. චිත්ත විශුද්ධිය ගලාගෙන ගිහිල්ලා දිට්ඨි විශුද්ධිය දක්වා. ඔන්න ඔය විදියටයි අර කෙටි වාක්‍යයකින් බුදුරජාණන් වහන්සේ දක්වා වදාළේ. මෙතන අපි මැදුම් පිළිවෙත හඳුන්වන කොට වචන දෙකකින් මෙය පිඬු කරන්න පුළුවන්. අපි කිව්වා 'සාපේක්ෂක' යන වචනය. ඒක තේරුම් ගන්නයි අර සහාය දිවීම කඩින් කඩ දිවීම ගැන කිව්වේ. ඊළඟට කියන තවත් වටිනා වචනයක් තමයි 'ප්‍රායෝගික' කියන එක. ප්‍රායෝගික කියන්නේ කිසියම් අර්ථයක් සඳහා රජතුමාට ඉක්මනින් යා යුතු ගමනක් තිබුණා. ඒකට අවශ්‍ය ජවය නිෂ්පාදනය කරන්න සිද්ධ

වුණා. ඒක නිෂ්පාදනය කරන්න තමයි අර විදියට රථ හතක්. එක රථයක්වත් අල්ලා ගන්නේ නැහැ. නමුත් උපකාර කර ගත්තා. ඒ සේරම අතහැරියා. ඒකට කියනවා ප්‍රායෝගික කියලා. මැදුම් පිළිවෙත හරියාකාරව සම්පූර්ණ වෙන්න නම් ඔන්න ඔය වචන දෙකම අපි මතක තියාගන්න ඕන. එකකට එකක් උපකාර වෙනවනෙ. එකකවත් ඒකාන්ත වටිනාකමක් නැහැ. එකකවත් අල්ල ගන්න දෙයක් නැහැ. එකක් අනිකට උපකාර වෙනවා පමණයි. මොකද නිවන කියන එක අවසාන වශයෙන් බුදුරජාණන් වහන්සේ දක්වන්නේ 'අනුපාද පරිනිර්වාණය' - කිසිවක් අල්ලා නොගත් පිරිනිවීම. ඒක කරා යන මාර්ගය තුළත් තියෙන්නේ එක පැත්තකින් සාපේක්ෂකයි. එක එක අවස්ථා එක එක ධර්ම එකිනෙකට සම්බන්ධයි. පටිච්ච සමුප්පාද පිළිවෙලට, හේතු ඵල වශයෙන්, පුදුම විදියට එකිනෙකට සම්බන්ධවෙලා තියෙනවා. මේවා සාපේක්ෂක වුණ පමණින් ප්‍රතික්ෂේප කරන්නත් බැහැ. ප්‍රතික්ෂේප කළොත් පෘථග්ජනයත් පිරිනිවන් පෑව කියල කියන්න වෙනවා. ඉබේම සිද්ධ වෙනවත් නොවෙයි. මේ සංසාරයේ තියෙන ලොකුම ගැටළුව ඒකයි. මේවා ඔක්කොම අහක දලත් බැහැ. අල්ලගෙනත් බැහැ. එකකට එකක් ඉතාම සියුම් අන්දමින් උපකාර කර ගන්න ආකාරය බුදුරජාණන් වහන්සේ මතු කරල දුන්නා. මේ කාරණය අපට වචන දෙකකින් කියනවා නම් සාපේක්ෂක ප්‍රායෝගික, ඔය මැදුම් පිළිවෙත හඳුන්වන්න පුළුවන්. සාපේක්ෂ කියල කියන්නේ අන්න අර හේතු ප්‍රත්‍ය සම්බන්ධතාවකින් එකකට එකක් බැඳිල තියෙනවා. 'පටිච්ච' කියන වචනය තුළ තියෙන්නේ එකිනෙකට සම්බන්ධයි, එකිනෙකට උපකාර වන අන්දමින්. ඒ වගේම 'ප්‍රායෝගික' කියල කියන්නේ යම් කිසි අර්ථයක් ඉලක්කයක් සඳහා ගන්නා දෙයක්. නිකන්ම දෙයක් නොවෙයි.

ඉතින් මේ කාරණා දෙක අපි වෙනත් සූත්‍රයකට හිත යොදනවා නම් අවස්ථානුකූලව කෙටියෙන් නමුත් මේ ධර්මය ගැන දන්න බොහෝ පින්වතුන් අහලත් ඇති වටිනා සූත්‍ර දේශනාවක් 'අලගද්දූපම' කියලා. බුදුරජාණන් වහන්සේ එක්තරා අවස්ථාවක සංඝයා වහන්සේලා අමතලා ප්‍රකාශ කළ සූත්‍ර දේශනාවක්. සාරය විතරක් අපි කියමු. 'කුලලූපමං වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි නිත්ථරණත්ථාය නො ගහණත්ථාය' බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා සසරින් එතර වීම පිළිබඳ කාරණය ගැන. කෙනෙක් තමන් දීර්ඝ මාර්ගයක යනකොට යම්කිසි මහා ජලාශයක් හමුවුණා. මෙතනින් එතර වෙන්න නැවක්වත් නැහැ. පාලමක්වත් නැහැ. එතකොට මොකද කරන්න තියෙන්නේ. ළඟපාත තියෙන ගස් වැල් එකතු කරලා පහුරක් බැඳගෙන තමන්ගේ අතින් පයින් උපකාර අරගෙන පහුර උපකාරයෙන් එතර වෙනවා.

එතර වුණාට පස්සේ පහුරට කළ ගුණ සලකන්න කියලා පහුර කර ගහගෙන ගියොත් ඒක මෝඩ වැඩක්. ඒක එක අන්තයක්. නමුත් ඒ විදියට ඒ සූත්‍රයේ තවත් අන්තයක් දක්වනවා. ඒවා ඔක්කොම එපයි කිව්වොත්, ඔන්න එතකොට වෙන එක දක්වන්නේ ඒක වෙන උපමාවක්. අලගද්ද කියල කියන්නේ ඇත්ත වශයෙන්ම දිය නයා. දිය නයා අල්ලන්න දන්නේ නැති කෙනෙක් අල්ලන්නේ වල්ග කොනින්. වල්ග කොනින් ඇල්ලූ හැටියේ ඌ හැරිලා දෂට කරනවා. අපි හිතමු අපට ඕන අනුපාද පරිනිර්වාණයයි. අපට ශීල විශුද්ධි චිත්ත විශුද්ධි කථාන්තර ඕන නැහැ. අපට අනුපාද පරිනිර්වාණයයි ඕන. ඔන්න වල්ගෙන් ඇල්ලුවා. දැන් ඔහොම වල්ගෙන් අල්ලන අය හුඟක් ඉන්නවා. ශීලය ඕනත් නැහැ. සමාධිය ඕනත් නැහැ. යනවා එක පාරටම අපට ලබාගන්න පුළුවන් අනුපාද පරිනිර්වාණය. අපට පින් කරන්න ඕනත් නැහැ. සංසාරය ඕනත් නැහැ. මොකක්වත් ඕන නැහැ. ඒ අය තමයි සර්පයාගේ වල්ගෙන් අල්ලන්නෙ. ඒත් අපිත් මතක් කර ගන්න ඕන මැදුම් පිළිවෙත කියන්නේ ඒ දෙකට මැද. මේවා සාපේක්ෂකව හිතන්න ඕන. අතහරින්නෙත් නැහැ. එතකොට වල්ගා කොනෙන් ඇල්ලුවොත් අන්න වැරදියි. පහුර උපකාර කර ගන්නවා කියන්නේ තමන්ගේ වීර්යය අරඹලා. එතන පහුර වශයෙන් ඇත්ත වශයෙන් දක්වන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. ආර්ය අෂ්ටාංගික මාර්ගය කියන එක ලෝකයෙ හදල තියෙන මාර්ගයක් නොවෙයි. ඒක තමන්ම හදගන්න ඕන මාර්ගයක්. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ඒ ලක්ෂණයයි අර පහුර පිළිබඳ උපමාවෙන් දුන්නේ බුදුරජාණන් වහන්සේ. අරහෙන් මෙහෙන් ගස් අතු එකතු කරගෙන බැඳලා එහෙමයි පහුරක් හදගන්නේ. ඒක කර ගහගෙන යන්නෙ නැහැ කියල කියන්නේ ඒ එකක්වත් ග්‍රහණය කරන්නේ නැහැ. අනිත් අංගය තමයි මේවා ඔක්කොම අත හැරියොත් එහෙම ඒ තැනැත්තා එතෙන්දි පෘථග්ජනයා නිවන් දකිනවා කියන අන්තයටයි වැටෙන්නේ. ඒ තුළ එය විනාශයට පත් වෙනවා. එහෙම කියාපු අයත් බුද්ධ කාලයේ සිටියා. ඔය අරිට්ඨ ආදීන්. බුදුරජාණන් වහන්සේ අන්තරායකර ධර්මයන් ප්‍රකාශ කළහම මේවා අන්තරායක නොවේ කියලා අරිට්ඨ කියූ විට මෝඝ පුරුෂයා කියලා තදට අවවාද කරලා අන්තිමට ඒ විදියේ මිථ්‍යා දෘෂ්ටි කියන අය ළඟටවත් යන්න එපා කියලා බුදුරජාණන් වහන්සේ විනය නීති පැනවූවා. නමුත් එහෙම ඒවා බොහොම මේ කාලයේ තියෙනවා. අන්න අර වැරදි පැත්තට ගැනීමයි. එතකොට මැදුම් පිළිවෙත කියල කියන්නේ සාපේක්ෂ පැත්තත් ප්‍රායෝගික පැත්තත් හොඳට එකතු කරලා සංකලනය කරලා තේරුම් ගැනීමයි.

මේක තේරුම් ගන්න බැරිවීම නිසා ඇතිවෙච්ච පටලැවිල්ල තවත් තැනක සඳහන් වෙනවා. සුත්ත නිපාතයේ 'මාගන්දිය' කියල සූත්‍රයක් තියෙනවා. මාගන්දිය බ්‍රාහමණයා බුදුරජාණන් වහන්සේගෙන් ප්‍රශ්නයක් අහනවා, ගාථාවලින්. එතන තියෙන්නේ 'ආධ්‍යාත්මික ශාන්තිය කියල නුවණැත්තන් දක්වන එක. ඒක කොහොමද ලබා ගන්නේ?' අධ්‍යාත්ම ශාන්තිය කියල කියන්නේ නිවනටමයි. බමුණා අහන්නේ ආධ්‍යාත්මික ශාන්තිය ලබා ගන්නේ කොහොමද කියන එකයි. බුදුරජාණන් වහන්සේ ඒකට පළමුවෙන් දුන්න පිළිතුර හරියට අර පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේ දුන්න පිළිතුර වගේ. බුදුරජාණන් වහන්සේ වදරනවා 'න දිට්ඨියා න සුතියා න ඤාණෙන සීලබ්බතෙනාපි විසුද්ධිමාහ.' ඔය විදියටයි උත්තර දෙන්නේ. මම කියනවා ඒ විශුද්ධිය දිට්ඨියෙන් ලබා ගන්න බැහැ. (සුත කියන්නේ දැනුම, ඇසීම් ආදියෙන් ලබා ගන්නා දැනුම). දැනුමෙන් ලබාගන්නත් බැහැ, ඤාණයෙන් ලබාගන්නත් බැහැ, ශීල ව්‍රත ආදියෙන් ලබාගන්නත් බැහැ. ඒක එක පැත්තක් කියලා අනිත් පැත්තත් කියනවා 'අදිට්ඨියා අස්සුතියා අඤාණා අසීලතා අබ්බතා නොපි තෙන.' ශීලය නැතිව, ව්‍රතය නැතිව, ඤාණය නැතිව, දෘෂ්ටිය නැතිව, ශ්‍රැතිය නැතිව, ආදී කිසිවක් නැතිව බැහැ ලබා ගන්න. දිට්ඨියෙන්වත් ශ්‍රැතියෙන්වත් ඤාණයෙන්වත් ශිල ව්‍රත ආදියෙන්වත් ලබාගන්න බැහැ කියල ඉස්සෙල්ල කියල ඉවර වෙලා, ඊළඟට කියනවා ඒව නැතුවත් බැහැ කියලා. එහෙම ප්‍රකාශ කළහම මේ මාගන්දිය බ්‍රාහමණයා, සාරිපුත්ත ස්වාමීන් වහන්සේ අප සඳහා අතුරු ප්‍රශ්න ඇහුව වගේ මෙතෙන්දි නම් ඒ බමුණා නොදන්නාකමින් අහන්නේ, ඔබ වහන්සේ කිව්වා දිට්ඨියෙනුත් බැහැ, ශ්‍රැතයෙනුත් බැහැ, ඤාණයෙනුත් බැහැ, සීලබ්බතයෙනුත් බැහැ කියලා. ඒ ගත් කටටම කියනවා දිට්ඨිය නැතුවත් බැහැ, සීලය නැතුවත් බැහැ, ඤාණය නැතුවත් බැහැ කියලා අනිත් පැත්තටත් කියනවා. මේ විදියට බැලුවොත් මට නම් පේන්නේ ඔබ වහන්සේගේ ධර්මය මුළාවක්. 'මොහුමෙව ධම්මං' මහා මුළාවක්. බුදුරජාණන් වහන්සේ කෙටියෙන් දක්වනවා, මේ ධර්මය මේ එකක්වත් උපකාර කර ගන්නවා මිසක් ඒ කියන එකක්වත් 'එතෙ ච නිස්සජ්ජ අනුග්ගහාය' ග්‍රහණය නොකරයි. ග්‍රහණය නොකිරීමෙනුයි මේ ආධ්‍යාත්මික ශාන්තිය අත්කර ගන්නේ කියලා.

අතීතයේ සිටි දෘෂ්ටි ගතිකයින් නිවනට පැමිණියේ නැත්තේ මෙන්න මේ කියාපු ගැඹුරු පැත්ත නිසයි. ඇතැම් කොටසක් දෘෂ්ටි ආදීන් දැඩිව ග්‍රහණය කළා. ඒවා අල්ලා ගත්තා. තව කොටසක් සංජය බෙලලට්ඨිපුත්ත ආදී ශාස්තෘන් ඒ ඔක්කොම අත හැරියා. සමහරු 'නැත, නැත' කියල හැම එකකින්ම ඇඟ බේරා ගත්තා - ආඳ වගේ. ඒ දෙකම නොවේ බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ. මේක

ප්‍රායෝගික අර්ථයක්. බොහෝ දුරට පටිච්ච සමුප්පාද ධර්මතාව විග්‍රහ කරන අවස්ථාවේදී බුදුරජාණන් වහන්සේගේ උපමාවක් තිබෙනවා මේ ගංගා ගලනවා වගේ, කන්දක් උඩට වහින කොට ඒ වතුර පහත් බිම් අනුව ගලාගන යමින් ඇළ දොළ ගංගා පුරවමින් අවසානයේ මුහුද කරා ගලාගන යනවා. ඊළඟට මුහුදේ වතුර මට්ටම බහින කොට ඇළ දොළ ආදියේ වතුර මට්ටම් බහිනවා. ඒ විදියේ ධර්මතාවක් ලෝකයේ තියෙනවා. එකකින් එකකට. එකකින් එකකට උපකාර වන විදියේ. නමුත් අතීතයේ ඉඳලා පැරණිම ඓතිහාසික ග්‍රන්ථවල සඳහන් වෙනවා - වේද ආදී ග්‍රන්ථවල - නොදියුණු මනස ඇති පුද්ගලයා කල්පනා කරනවා මේවා ඇතුළේ කවුරුවත් පදිංචිවෙලා ඉන්නවා කියලා. වෙන එකක් තබා මේ පින්වතුන් අහල ඇති විදුලි කෙටීම්, ගෙරවීම්, ආදිය පවා කවුරු හරි කරන දේවල් හැටියට, දේදුන්න ආදිය ඉන්ද්‍රචාපය, ගින්න ආදිය ඇතිවෙලා තියෙන්නේ මේවා ඇතුළේ කෙනෙක් පදිංචිවෙලා කියලා අන්න ඒ විදියට හිතනවා. ඒක ප්‍රතික්ෂේප වෙනවා පටිච්ච සමුප්පාද ධර්මය තුළින්. බුදුරජාණන් වහන්සේ පෙන්වනවා මෙතන නිර්මාණ කරන්න කෙනෙක් නැහැ. ඒ වගේම විමුක්තිය හද දෙන්න කෙනෙකුත් නැහැ. දෙවියෙක් බඹෙක් ඊශ්වරයෙක් නැහැ. මෙතන තියෙන්නේ ධර්ම පරම්පරාවක් පමණයි. යම් ධර්ම පරම්පරාවක් තුළින් - මේක තේරුම් ගන්න. අවිද්‍යාව මුල් කරගෙන යම් සංස්කාර ක්‍රියාත්මක වීමට පෙළඹෙනවා. ඒ චතුරාර්ය සත්‍යය නොදැනීම නිසා ඒ සංස්කාර රැස් කිරීමේ අවසානය තමයි දුක. ඒ නොදැනුම් කම නිසා රැස් කරන සංස්කාර ගොඩක් තුළ කුසල් අකුසල් රැස් වෙනවා. පොත පතේ දක්වන්නේ උපමා වශයෙන්, සංසාරයේ අකුසල් කිරීම, පව් කිරීම - ඒක හරියට මරන්න ගෙනියන ගවයකුට උණු වතුර දීම වගේ. කුසල් කිරීම මරන්න ගෙනියන ගවයකුට ඇල් වතුර දීම වගේ. ඒ මොනවා බිව්වත් මරණයට පත් වෙනවා.

ඒ වගේ තමයි මේ සංස්කාර රැස් කිරීම. බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ සංස්කාර සංසිඳීම දක්වා යන ගමනයි. සංස්කාර සංසිඳුනු තැන. අන්න එතනයි දුක් කෙළවර වන්නේ. චතුරාර්ය සත්‍යය නොදැනීම නිසා සංස්කාර රැස් කිරීමක් වෙනවා. අර පුද්ගලයා කියල වෙන් කරගෙන ලෝකයෙන්, මේ සවභාව ධර්මයෙන් වෙන් වෙලා - ධීරයයි කියන සත්‍යයයි කියල කියන පුද්ගලයා හිතන්නේ අමුතුම විදියකට. දැන් ඔන්න ඔය පරිසර හිතකාමී කථාවක් යනවා. කොච්චර හිතකාමී වුණත් බුදුරජාණන් වහන්සේ දක්වන පරිසර හිතකාමිත්වය - භාවනාවේදී දක්වන්නේ මෙහෙමයි. මේක ඇතුළේ තියෙන පඨවිය කෙස්, ලොම්, නිය ආදී දේත් පිට තියෙන දේත් පඨවිය. ඒ දෙකම එකයි. අන්න නියම පරිසර හිතකාමිත්වය. පරිසරයත් එක්ක එකයි. ලේ, සෙම්, සොටු, මුත්‍රා ආදිය ඒවාමයි පිට තියෙන්නේ. අන්න ඒ විදියේ

ධාතුමනසිකාරය තුළින් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරනවා පරිසරයත් මේ පුද්ගලයා මමය මගේය කියල අල්ලගෙන තිබෙන මේ ශරීර කූඩුවත් එක වගේ. නමුත් මේ පුද්ගලයා මේ වෙන් කර ගැනීම තුළින් තමයි සංසාරයේ දිගින් දිගට යන්නේ. ඒ වෙන් කර ගැනීමම තමයි විඤ්ඤාණය කියල කියන්නේ. ගස්කොලන් වලට නැති දෙයක් තියෙනවා කියල කියන විඤ්ඤාණය, අපි ලොකුවට ගන්න මේ විඤ්ඤාණය බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ මහ දුකක් හැටියට. ලොකුම දුක ඒකයි. ඒක මායාවක් කියල කියනවා. ඒ මායාවට අහුවෙලා තමයි මේ සත්වයා සංසාරයේ නැවත නැවතත් භවයෙන් භවය ඉපිද ඉපිද යන්නේ. එතකොට ඉපදීම නැති කරන්න නම් අන්න අර චතුරාර්ය සත්‍යය පිළිබඳව අවබෝධය ඇති කරගන්ට ඕන. ඒ අවබෝධය තුළින් සංස්කාර සංසිඳුවන්නට ඕන. ඒ සංසිඳවීම කරා යන මාර්ගය තමයි ආර්ය අෂ්ටාංගික මාර්ගය. ඒක වෙන කිසිම ඍෂිවරුන්ටවත් කාටවත් සොයාගන්න බැරිවුණා. සම්මා සම්බුදු කෙනෙකුට පමණයි. පසේ බුදුරජාණන් වහන්සේලාත් ඒක ප්‍රත්‍යක්ෂ කර ගත්තත්, ගොළුවා දුටු හීනය වගේ උන්වහන්සේලාට ලෝකයාට එය තේරුම් කරල දෙන්න බැරි මොකද? මේ කියාපු ධර්මතාව අතක්කාවචරයි. තර්කයට අහු වෙන්නෙ නැහැ. ඒ තර්කයට අහු නො වෙන නිසාමයි පුණ්ණ මන්තානි පුත්ත සවාමීන් වහන්සේට සාරිපුත්ත සවාමීන් වහන්සේ එක්ක අච්චර වාද කරන්න සිද්ධවුණේ. තර්කයට අහු වෙන්නෙත් නැහැ. 'ඔව්' කියන්නත් බැහැ. 'නැහැ' කියන්නත් බැහැ. අන්න ඒ වගේ දෙයක් මෙතන තියෙන්නේ. ඒ වගේ ගැඹුරු ධර්මයකටයි අතක්කාවචර කියල කියන්නේ. මේ පින්වතුන් අහල ඇති ධර්මය අතක්කාවචරයි කියල. එක්කො 'ඔව්' කියන්න ඕන. නැත්නම් 'නැහැ' කියන්න ඕන. උසාවියෙ වගේ. තර්කය කියල කියන්නේ බෙද හද ගෙන කෑලි හදගෙන වචනවලින් හදගත්ත ලෝකයක්. ඉතින් මේ ලෝකයේ භාෂාව තුළමයි මනුෂ්‍යයා මුලාවෙලා ඉන්නේ. ඒ භාෂාවම උපකාර කරගෙන විමුක්ති මාර්ගය දැකීම කොයිතරම් අමාරු දෙයක්ද කියලා අපට හිතා ගන්න පුළුවන්.

බුදුරජාණන් වහන්සේ සත් සතියක් ගත කළේ මේ අවබෝධ කර ගත් ධර්මය - පටිච්ච සමුප්පාද ධර්මය ලෝකයාට ප්‍රකාශ කරන්නේ කොහොමද කියලා. මේක තේරුම් ගන්නේ කවුද කියලා. තණ්හාවෙන් නොවෙයි උන්වහන්සේ ධර්මය දේශනා කරන්ට මැලි වුණේ. අපට පේන හැටියට ධර්ම ගම්භීරත්වය නිසා. මේක ඉතාම සියුම්. දැන් අතනත් සඳහන් වුණේ 'දුද්දසං' කියලා, දැකීමට දුෂ්කරයි. කාරණා දෙකක් තියෙනවා - බුදුරජාණන් වහන්සේ 'අරිය පරියේසන සූත්‍රයේ' ප්‍රකාශ කරනවා, මේ ලෝකයාට තේරුම් ගන්න ඉතාමත්ම දුෂ්කර කාරණා දෙකක්. මෙන්න මේ 'ඉදප්පච්චයතාව' කියන වචනය 'පටිච්ච' කියන

වචනය හා සම්බන්ධයි. ඉදප්පච්චයතාව මේක නිසා මේක වෙනවා. මේක නොවන නිසා මේක වෙන්නෙ නැහැ කියලා කියනවා. ඔය ආදී වශයෙන් ඒ ඉදප්පච්චයතා ධර්මතාව සාමාන්‍ය ලෝකයාට තේරුම් ගන්න අමාරුයි. ඒ වගේම සියලු සංස්කාරයන්ගේ සංසිඳීම කියල කියන, සියල්ලක්ම අත හැරීම කියල කියන මෙන්න මේ නිවන් තත්ත්වයත් ලෝකයාට තේරුම් ගන්න අමාරුයි. එහෙම තේරුම් ගන්න අපහසු නිසයි බුදුරජාණන් වහන්සේ මේක දේශනා කරන්න මැලිවුණේ. අර මහා බ්‍රහමයා ඒ කියන විදියට ආරාධනා කළාට පස්සේ බුදුරජාණන් වහන්සේ ලෝකයා වෙනුවෙන් ඉතාමත්ම ගැඹුරු ධර්මය දේශනා කරනවා.

බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා තථාගතයන් වහන්සේලා පහළවූයේ හෝ වේවා නොවූයේ හෝ වේවා මේ ධර්මතාව කවදත් තියෙනවා. 'උප්පාද වා තථාගතානං අනුප්පාද වා තථාගතානං ඨිතා ව සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදෙ' තථාගතයන් වහන්සේලා පහළවූයේ හෝ නොවූයේ හෝ වේවා මේ ධර්මතාව කවදත් ලෝකයේ තියෙනවා. ඉදප්පච්චයතාව ඊළඟට 'තං තථාගතො අභිසම්බුජ්ඣති' තථාගතයන් වහන්සේ ඒ ධර්මතාව අවබෝධ කර ගන්නවා, තේරුම් ගන්නවා. 'අභිසම්බුජ්ඣිත්වා අභිසමෙත්වා ආචික්ඛති දෙසෙති පඤ්ඤපෙති පට්ඨපෙති විවරති විභජති උත්තානීකරොති' තථාගතයන් වහන්සේලා ඒ ධර්මය තේරුම් අරගෙන කියාදෙනවා. දේශනා කරනවා. විවරණය කරනවා. විභාග කරනවා. 'උත්තානීකරොති' විභාග කරල දක්වලා මේ බලන්න කියලා ඒ ගැඹුරු වූ ධර්මය, උඩින් තියෙන ධර්මය පහත් කරල පෙන්නුම් කරලා මෙන්න බලන්න කියලා දක්වනවා. අන්න ඒ විදියටයි තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ සාමාන්‍ය ලෝකයාට තේරුම් ගන්න බැරි ධර්මය, ගැඹුරු ධර්මය, විග්‍රහ කරල දැක්වූයේ. ඒ ධර්මයම තමයි සාරිපුත්ත මහා රහතන් වහන්සේලා, පුණ්ණ මන්තානි පුත්ත මහරහතන් වහන්සේලා, වැනි ශ්‍රේෂ්ඨ ස්වාමීන් වහන්සේලා ධර්ම සාකච්ඡා තුළින්, වෙස්වලාගෙන වාගේ මේ ධර්ම සාකච්ඡා කළේ, අප සඳහාය කියල අපි හිතාගන්න ඕන මේ අවස්ථාවේ. උන්වහන්සේට තිබුණා මම අග්‍ර ශ්‍රාවකයන් වහන්සේය කියල කෙළින්ම ගිහිල්ල කියන්න. කිව්ව හැටියේම පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේට අර ප්‍රතිභානය මතු වෙන්නෙ නැහැ. දැන් අපි කෙනෙක් ළඟට ගියහම කරන ධර්ම සාකච්ඡා තුළිනුයි අපට කාරණා මතුවෙන්නේ. ප්‍රශ්නයක් ඇහැව්වහම ඒක තුළින් තමයි, මේක මේ මනුෂ්‍යයාට තේරුම් කරල දෙන්නේ කොහොමද කියලා අපට උපමා වැටහෙන්නේ. ඒක සාමාන්‍ය කාරණයක්. ඒ වගේ මෙතනදිත් පුණ්ණ මන්තානි පුත්ත ස්වාමීන් වහන්සේගෙන් ධර්ම සාකච්ඡාවක් බලාපොරොත්තුවෙන්, සාරිපුත්ත

සවාමීන් වහන්සේ වෙස්වලාගෙන ගිහිල්ල, තමන් කවුද කියල කියන්නේ නැතිව නොදන්නවා වගේ, මේක මෙහෙම නම් මෙහෙම වෙන්නේ කොහොමද කියලා ඇහුවා. ඒක තුළින් අර වගේ වටිනා ධර්ම සාකච්ඡාවකුයි අපට මේ රථ විනීත සූත්‍රය තුළ තියෙන්නේ. එපමණක් නොවෙයි. පුණ්ණ මන්තානි පුත්ත සවාමීන් වහන්සේ ධර්ම කථික භික්ෂූන් වහන්සේලා අතර අග්‍ර තනතුර ලැබුවේ නිකම් නොවෙයි. ආනන්ද සවාමීන් වහන්සේ පවා එක්තරා අවස්ථාවක ප්‍රකාශ කරනවා අපි නවක භික්ෂූන් වහන්සේ නමක් වශයෙන් සිටි කාලේ ආයුෂ්මත් පුණ්ණ මන්තානි පුත්ත සවාමීන් වහන්සේ අපට බොහොම උපකාර වුණා ගැඹුරු ධර්ම කාරණා තේරුම් කර දීමෙන් කියලා එහෙමත් දක්වෙන තැන් තියෙනවා. මේ අවස්ථාවේ පුණ්ණ මන්තානි පුත්ත සවාමීන් වහන්සේගේ ගුණ සකන්ධයත්, ඉබේටම සාරිපුත්ත සවාමීන් වහන්සේගේ ගුණ සකන්ධයත්, මේ දේශනාව තුළින් ඉදිරිපත් උනා. ඒ සංවාදය තුළින් අපි ධර්ම කාරණා රාශියක් - සප්ත විශුද්ධි, දස කථා වස්තු ආදියට අදාල කාරණා මේ පින්වතුන්ට අහන්ට ලැබුණා. දැන් කල්පනා කරන්ට මේ ශාසනයෙන් අප වැඩ ගන්නවා කියල කියන්නේ මේ අපි අරඹලා තිබෙන ශීලයෙන් ආරම්භ කරගෙන යන ගමන සමාධියෙන් ශක්තිමත් කරගෙන ඊළඟට විදර්ශනා ප්‍රඥාව තුළින් තමයි මාර්ගඵල අවබෝධයෙන් අර කියාපු අනුපාද පරිනිර්වාණ කියන තත්ත්වය ලබාගන්න පුළුවන් වෙන්නේ.

කාලවේලා ඇති පරිදි මේ පින්වතුන් තම තමන් මේ කාරණා ගැඹුරින් කල්පනා කරලා ධාරණය කරගෙන මෙතනින් නවතින්නේ නැතිව ජීවිතයට ළං කරගෙන, මේ ධර්මයෙන්, ශාසනයෙන් නියම ප්‍රයෝජනයක් ගන්න නම් තමනුත් ඒ ධර්ම කරුණු ප්‍රත්‍යක්ෂ කර ගන්ට උත්සාහවත් වෙන්ට ඕන. මේ පින්වතුන් අද රකින ලද ශීලය තුළින් කරන ලද භාවනාව තුළින් මේ ඇසූ ධර්ම කථා තුළින් තමන් බලාපොරොත්තු වන ඒ උත්තමාර්ථයන් හැකිතාක් ඉක්මනින්ම සාක්ෂාත් කර ගැනීමට හේතු වාසනා වේවා'යි ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම අවීචියේ සිට අකනිටා දක්වා යම්තාක් සත්ත්ව කෙනෙක් මෙබඳු ධර්ම දේශනාවකින්, ධර්ම ශ්‍රවණයකින් පින් අනුමෝදන් වීමට කැමති නම් ඒ අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවනින් සැනසෙත්වා කියන ප්‍රාර්ථනාව ඇති කරගෙන මේ ගාථා කියා පින් දෙන්න.

'එත්තාවතා ච අම්හෙහි...'

# 53 වන දේශනය

## 53 වන දේශනය

(පහන් කණුව ධර්ම දේශනා අංක 162)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

මම සඞ්කප්ප මඤ්ඤාය සත්ථා ලොකෙ අනුත්තරො
මනොමයෙන කායෙන ඉද්ධියා උපසඞ්කමි

යදා මෙ අහු සඞ්කප්පො තතො උත්තරි දෙසයි
නිප්පපඤ්චරතො බුද්ධො නිප්පපඤ්චං අදෙසයි

තස්සාහං ධම්මමඤ්ඤාය විහාසිං සාසනෙ රතො
තිස්සො විජ්ජා අනුප්පත්තො කතං බුද්ධස්ස සාසනං

සැදැහැවත් පින්වතුනි,

අනුරුද්ධ මහ රහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේගේ අසූ මහ ශ්‍රාවකයින් වහන්සේලා අතර මුල් පෙළටම ලා ගැනෙන මහ රහතන් වහන්සේ නමක්. දිබ්බ චක්ඛු කියන දිව්‍යැස ලබාගත්තු භික්ෂූන් වහන්සේලා අතර ඒතදග්ග තනතුර බුදුරජාණන් වහන්සේගෙන් ලබා ගත්ත කෙනෙක්. උන්වහන්සේ ධ්‍යාන අභිඤ්ඤා ශක්තීන් ඉතාමත්ම ඉහළටම දියුණු කරගෙන තිබුණා. අද පවා චිත්ත ශක්තිය දියුණු කර ගන්න බලාපොරොත්තු වන යෝගාවචරයින්ට අනුරුද්ධ මහ රහතන් වහන්සේගේ චරිතය ආදර්ශයක් වෙන්න පුළුවනි. අනුරුද්ධ චරිතයට පසුබිම් වශයෙන් ධර්ම සාහිත්‍යයේ නොයෙකුත් විචිත්‍ර කථා ප්‍රවෘත්ති සඳහන් වෙනවා. නමුත් අපි මාතෘකාවට අදාල අන්දමින් මේ කෙටි කාලය තුළ යම්කිසි කරුණු සම්පිණ්ඩනයක් කරන්නයි බලාපොරොත්තු වෙන්නේ.

අනුරුද්ධ මහ රහතන් වහන්සේ බුදුරජාණන් වහන්සේගේ සුළුපියාණන් වන අමිතෝදන ශාක්‍ය රජුගේ පුත්‍රයෙක්. ඒ අනුරුද්ධ කුමාරයා තමන්ගේ සහෝදර මහානාම ශාක්‍යයාගේ උනන්දු කිරීම උඩ පැවිදිවෙන්න තීරණය කරලා මවගෙන් අවසර ඉල්ලුවහම මව ඊට විරුද්ධ වුණා. නැවත නැවත පෙරැත්ත කරන කොට මව එක්තරා උපායක් වශයෙන් කිව්වා, ඔබගේ මිත්‍ර, දැනට ශාක්‍ය රජු හැටියට ඉන්න භද්දිය රජු පැවිදි වෙනවා නම් පමණක්, මම ඔබට පැවිදි වෙන්න අවසර දෙනවා කියලා. අනුරුද්ධ කුමාරයා බොහොම දක්ෂ අන්දමින් මේ භද්දිය රජු තමුන්ගේ අඹු දරුවන් අත හැරලා රාජ්‍යයත් අත

හැරලා සතියක් තුළ පැවිදි වෙන අන්දමට කැමති කරවා ගත්තා. අන්තිමට අනුරුද්ධ, භද්දිය, ආනන්ද, භගු, කිම්බිල, දේවදත්ත යන ශාක්‍ය කුමාරවරුන් හය දෙනාම උපාලි කියන කපුවත් එක්ක උයනට යන හැටියට පිටත්වෙලා සේනාවත් එක්ක, සේනාව ඈතදීම නතර කරලා උපාලි කපුවත් එක්ක මේ හය දෙනා දේශ සීමාවෙන් එහා පැත්තට ගිහිල්ලා තමන්ගේ රාජාභරණ ගලවලා පොදියක් හැටියට සකස් කරලා ඒක උපාලි කපුවට දුන්නා. ඔබ මේවා අරගෙන ගිහිල්ලා හොඳට ජීවත්වෙන්න කියලා පිටත් වුණා. උපාලි කපුවත් ටික දුරක් ගිහිල්ලා කල්පනා කළා. දැන් මම මේවා අරගෙන ගියාම ශාක්‍යයින් හිතාවිය මම මේ කුමාරවරුන් මරලා ආභරණ ගත්තා කියලා. මේ අය අතහැරපු ආභරණ මට මොකටද? ඕන කෙනෙක් ගනිද්දවෙ කියලා ගහක එල්ලලා ගිහිල්ලා අර හය දෙනාටම එකතු වුණා. අන්තිමට මේ හය දෙනාත් උපාලි කපුවාත්. ඒ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ මල්ල රජ දරුවන්ගේ අනුපිය අඹ වනයේ වාසය කළේ. එතනට ගිහින් බුදුරජාණන් වහන්සේ ළඟ පැවිදි වුණා. තමන්ගේ ශාක්‍යයන්ගේ මාන්නය නැති කරන්න ඕන කියලා ඒ කුමාරවරුම කියලා පළමුවෙන්ම උපාලි කපුවා පැවිදි කිරීමත් විශේෂ සිද්ධියක්. ඉතින් කෙටියෙන් කියතොත් දැන් ඒ අනුරුද්ධ ස්වාමීන් වහන්සේ පැවිදි උනාට පස්සේ, ධුතාංග ආදී උග්‍ර ප්‍රතිපත්ති රකිමින් බොහොම උත්සාහ කළා ධ්‍යාන අභිඥා, මාර්ගඵල ලබාගන්න. උන්වහන්සේ බොහොම වීර්යය දැරුව බව සූත්‍ර දේශනා කීපයකින් හෙළි වෙනවා.

තමන්ගේ භාවනාව ගැන බුදුරජාණන් වහන්සේටත්, ශාරිපුත්ත මහ රහතන් වහන්සේටත්, අනුරුද්ධ ස්වාමීන් වහන්සේ කළ කරුණු සාකච්ඡා අද පවා යෝගාවචරයින්ට ඒවා තුළින් යම් යම් ප්‍රායෝගික කරුණු මතු කර ගන්න පුළුවන්. වඩාත්ම වැදගත් සිද්ධිය හැටියට සඳහන් වෙන්නේ, එක් අවස්ථාවක අනුරුද්ධ ස්වාමීන් වහන්සේ චේතිය රටේ පාචීන වංශ කියන උයනේ භාවනා කරමින් හිටියා. ඒ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ භග්ග රටේ සුංසුමාරගිරි කියන ප්‍රදේශයේ භේසකලා වනයේ වැඩ වාසය කළේ. අනුරුද්ධ ස්වාමීන් වහන්සේ භාවනා කරමින් ඉන්න අතරේ හිතට ධම්ම විතක්ක ධම්ම සිතුවිලි හතක් පෙළ ගැහිලා ආවා.

1. **'අප්පිච්ඡස්සායං ධම්මො නායං ධම්මො මහිච්ඡස්ස'**
   මේ ධර්මය ආශාවන් අඩු තැනැත්තාටය. ආශාවන් වැඩි තැනැත්තාට නොවේ.
2. **'සන්තුට්ඨස්සායං ධම්මො නායං ධම්මො අසන්තුට්ඨස්ස'**

මේ ධර්මය ලද දෙයින් සතුටු වන්නාටයි. ලද දෙයින් සතුටු නො වන්නාට නොවේ.

**3. 'පවිවිත්තස්සායං ධම්මො නායං ධම්මො සංගණිකාරාමස්ස'**

මේ ධර්මය දැඩි විවේකයෙන් වාසය කරන තැනැත්තාටය. පිරිස් එක්ක වාසය කැමති පුද්ගලයාට නොවේ.

**4. 'ආරද්ධ විරියස්සායං ධම්මො නායං ධම්මො කුසීතස්ස'**

මේ ධර්මය අරඹන ලද වීර්යය ඇත්තාටයි. කුසීතයාට නොවේ.

**5. 'උපට්ඨිතසතිස්සායං ධම්මො නායං ධම්මො මුට්ඨස්සතිස්ස'**

මේ ධර්මය එළඹ සිටි සිහිය ඇත්තාටයි. මුලා වූ සිහිය ඇත්තාට නොවේ.

**6. 'සමාහිතස්සායං ධම්මො නායං ධම්මො අසමාහිතස්ස'**

මේ ධර්මය සමාධිය ඇත්තාටයි. සමාධිය නැත්තාට නොවේ.

**7. 'පඤ්ඤවනතස්සායං ධම්මො නායං ධම්මො දුප්පඤ්ඤස්ස'**

මේ ධර්මය ප්‍රඥාවන්තයාටය .ප්‍රඥාව නැති පුද්ගලයාට නොවේ.

මේ විදියේ ධර්ම විතර්ක හතක් පහළවෙලා මේ ගැන හිතමින් ඉන්න අවස්ථාවේ බුදුරජාණන් වහන්සේට පෙනුණා අනුරුද්ධ ස්වාමීන් වහන්සේ මේ විතර්ක සිතමින් ඉන්න ආකාරය. දැකලා ඍද්ධි බලයෙන්ම මනෝමය කයකින් භේසකලා වනයෙන් අතුරුදහන්වෙලා අනුරුද්ධ ස්වාමීන් වහන්සේ ඉදිරියේ පෙනී සිටියා. පනවන ලද ආසනයේ වැඩ හිටියට පස්සේ, අනුරුද්ධ ස්වාමීන් වහන්සේ වන්දනා කළා. එතකොට බුදුරජාණන් වහන්සේට ප්‍රකාශ කරනවා. 'සාධු! සාධු! අනුරුද්ධ බොහොම හොඳයි, අනුරුද්ධ ඔබ මේ මහා පුරුෂ විතර්ක හතක් සිතමින් සිටින ආකාරය. මේ හතට තව අටවෙනි එකත්, අටවෙනි මහා පුරුෂ විතර්කයත් එකතු කර ගන්න' කියලා බුදුරජාණන් වහන්සේ අටවෙනි මහා පුරුෂ විතර්කයත් ප්‍රකාශ කළා.

**'නිප්පපඤ්චාරාමස්සායං ධම්මො නිප්පපඤ්චරතිනො නායං ධම්මො පපඤ්චාරාමස්ස පපඤ්චරතිනො'** මේ ධර්මය නිප්පපඤ්චයට කැමති නිප්පපඤ්චයේ ඇලුණු තැනැත්තාටයි. පපඤ්චයට ඇල්ම ඇති පපඤ්චයට ඇලුණු තැනැත්තාට නොවේ.

**'පපඤ්ච'** කියන වචනය අපි යථා කාලයේ තෝරනවා. මෙතනදී වැදගත් වන්නේ මෙපමණයි. ඒ අටවෙනි මහා පුරුෂ විතර්කයත් ඉදිරිපත් කරලා බුදුරජාණන් වහන්සේ තව දුරටත් උපදේශ වශයෙන් ඉදිරිපත් කරනවා, ඒ විතර්කයේ ආනිශංස. 'අනුරුද්ධ දැන් ඔබ මේ මහා පුරුෂ විතර්ක අටම එකතු කරගෙන වැඩ කටයුතු කරනවා නම් ඉක්මනින්ම ඔබට පුළුවන් පළවෙනි දෙවෙනි ආදී ධ්‍යානවලට සම

වැඩිලා ඒ ධ්‍යාන පිළිබඳව කුසලතා ඇති කර ගන්න. ඒ වගේම ලද දෙයින් සතුටු වීමේ ගුණයත් දියුණු කර ගන්න පුළුවන්.' තව විශේෂ අවවාදයක් දුන්නා බුදුරජාණන් වහන්සේ. 'අනුරුද්ධ ඔබ ලබන වස් කාලයත් මේ පාචීනවංස උයනේම වාසය කරන්න' කියලා. බුදුරජාණන් වහන්සේට පෙනෙන්න ඇති රහත් වීමට හොඳ පරිසරයක් එතන තියෙනවා කියලා. කොහොම හරි අනුරුද්ධ ස්වාමීන් වහන්සේත් බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය අනුව බොහොම දැඩි සේ භාවනා කරලා ඊළඟ වස් කාලය තුළ රහත් බවට පත්වුණා. රහත් වීමෙන් පස්සේ බුදුරජාණන් වහන්සේගෙන් ලැබුණු උපදේශය පිළිබඳවත් කෘතගුණ දැක්වීම් වශයෙන් ඒ ගැනත් සඳහන් කරමින් ප්‍රකාශ කළ ගාථා තුන තමයි අපි ආරම්භයේදී මාතෘකාව හැටියට තැබුවේ.

'මම සඞ්කප්පමඤ්ඤාය සත්ථා ලොකෙ අනුත්තරො
මනොමයෙන කායෙන ඉද්ධියා උපසඞ්කමි'

මගේ සිතුවිල්ල තේරුම් අරගෙන ලෝකයේ අනුත්තර වූ ශාස්තෘන් වහන්සේ මනෝමය කයකින් සෘද්ධියෙන් මා වෙත පැමිණියා.

'යදා මෙ අහු සඞ්කප්පො තතො උත්තරි දෙසයි
නිප්පපඤ්චරතො බුද්ධො නිප්පපඤ්චං අදෙසයි'

මා හිතූ යම් ආකාරයක් තිබුණා නම් ඊට වඩා ඉහළ යමක් මට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා. නිප්පපඤ්චයට කැමති බුදුරජාණන් වහන්සේ නිප්පපඤ්චය දේශනා කළා.

'තස්සාහං ධම්මමඤ්ඤාය විහාසිං සාසනෙ රතො
තිස්සො විජ්ජා අනුප්පත්තා කතං බුද්ධස්ස සාසනං'

උන්වහන්සේ දේශනා කළ ධර්මය තේරුම් අරගෙන ශාසනයට ඇලුම් ඇතිව මම වාසය කළා. ත්‍රිවිද්‍යාව මම සම්පූර්ණ කර ගත්තා. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය කරල නිමවුණා. ඒ කියන්නේ මම රහත් වුණා.

මේ ගාථා තුනෙනුත් කියවෙනවා බුදුරජාණන් වහන්සේ දුන්න උපදේශය විශේෂයෙන් රහත් වීමට උපකාර වුණ බව අනුරුද්ධ ස්වාමීන් වහන්සේට. ඒ වගේම ඒ මුල් මහා පුරුෂ විතක්ක හත ඒ විදියට පෙළ ගැස්වීමේ ගෞරවය අනුරුද්ධ ස්වාමීන් වහන්සේට අත්

වෙන බව හෙළි වෙනවා. ඒ සූත්‍රයේ සඳහන් වෙනවා බුදුරජාණන් වහන්සේ අනුරුද්ධ ස්වාමීන් වහන්සේට ඒ විදියට අනුශාසනා කරලා ආපහු භේසකලා වනයට වැඩියට පස්සේ සංඝයා වහන්සේලාට, මහණෙනි, මම නුඹලාට මහා පුරුෂ විතර්ක අටක් දේශනා කරනවා කියලා, අර සම්පූර්ණ දේශනාව වදළා. නමුත් මෙන්න මෙතනදී අපට මතුවුණා අමුතු වචනයක් '**පපඤ්ච**' කියලා. ඒ වගේම '**නිප්පපඤ්ච**' කියන ඒකේ විරුද්ධ වචනයත් ප්‍රකාශ වුණා. ඇත්ත වශයෙන්ම 'පපඤ්ච' කියන වචනය භාවනා යෝගීන්ට ඉතාමත්ම ප්‍රයෝජනවත් වචනයක්. බොහෝ දුරට බොහෝ දෙනාට දුරවබෝධ වචනයක්. මේ 'නිප්පපඤ්ච' කියන වචනය ඇත්ත වශයෙන්ම නිවනටත් යෙදිල තියෙනවා. 'නිප්පපඤ්ච' කියන එක නිවනේ තත්ත්වයක් හැටියට දක්වනවා.

අපි මේ 'ප්‍රපඤ්ච' කියන වචනය තේරුම් ගන්න බලමු. අද පවා සමාජයේ භාවිතා වෙනවා යමක් කෙටියෙන් කියන්නේ නැතිව වැල් වටාරම් කියන කොට ඔය 'ප්‍රපඤ්ච' නැතිව කථා කරන්න. 'ප්‍රපඤ්ච' නැතිව කෙටියෙන් කියන දෙයක් කියන්න කියල කියනවානෙ. එතකොට කථාව පිළිබඳව බලනකොට 'ප්‍රපඤ්චය' කියල කියන්නේ මාතෘකාවට අදාල නැති අන්දමින් අනවශ්‍ය වැල් වටාරම් කීමයි. නමුත් මේක භාවනාව, සිත පිළිබඳව කල්පනා කරල බලනකොට ඒකෙ තියෙන ගැඹුර අපට හෙළි වෙනවා. මැදුම් සඟියේ මධු පිණ්ඩික ආදී සූත්‍රවලින්. අපි මේ අවස්ථානුකූලව කෙටියෙන් සලකා ගත්තොත් ඒ මධු පිණ්ඩික සූත්‍රයේ සඳහන් වෙන විස්තර අනුව අපට හිතා ගන්න පුළුවන්; ඇස, කන, නාසය, දිව, කය, මන කියන මේ ඉන්ද්‍රිය හයට ඒවාට අදාල අරමුණු ගැටීමෙන් අප තුළ ඉස්සෙල්ලාම වේදනාවක් ඇති වෙනවා. යම් කිසි වේදනාවක් වින්දනයක් හටගන්නවා. ඒ වේදනා නිසා සඤ්ඤාවල් ඇති වෙනවා. සඤ්ඤා පිළිබඳ විතර්ක කරනවා. සිතිවිලි පවත්වනවා. අන්න ඒ සිතිවිලි පැවැත්වීම තුළින් 'ප්‍රපඤ්චයන්' ඇති වෙනවා කියලා කියනවා. ඒ ප්‍රපඤ්ච ඇතිවෙලා ඒ 'ප්‍රපඤ්චය' නිසා ඇතිකර ගත්තා වූ නොයෙකුත් අදහස්වලට යටවෙන බවත් ඒ සූත්‍රයේ ප්‍රකාශ කරනවා. ඒ 'විතර්ක' 'ප්‍රපඤ්ච' බවට පත්වෙන්න හේතුව මොකද? අර භාවනාවේදී අර කියාපු ඉන්ද්‍රිය හයට එන අරමුණක් ඔස්සේ එන සිතුවිල්ල තණ්හා, මාන, දිට්ඨි කියන, නැත්නම් මේ සත්වයා තුළ තිබෙන කෙලෙස්වල පෙළඹවීම උඩ, අතීත - අනාගත - වර්තමාන කියන කාලත්‍රයට විහිදුවල හිතේ ඇති කර ගන්න 'ප්‍රපඤ්චයන්' එතන තියෙන්නෙ. ඒ කියන්නේ අනවශ්‍ය සිතුවිලි රාශියක් මේ භාවනා යෝගීන්ට බොහෝ විට ඇති

වෙනවා. ඒක දන්නෙම නැතිව මාතෘකාවෙන් පිට. ඊළඟට ඒ සිතුවිලි විග්‍රහ කරල බැලුවොත් ඒවා යට තණ්හාව හරි මාන්නය හරි දිට්ඨිය හරි තියෙනවා. ඒ ප්‍රපඤ්චයන් ගිහිල්ල ඒවාට යට උනාට පස්සේ තමන් ඉන්නේ කොහේද කියලවත් දන්නෙ නැහැ. ඊළඟට ඒවායින් හදගන්න දේවල් අනාගත සිද්ධියක් වර්තමාන හැටියට පේනවා. අතීත සිද්ධියක් වර්තමාන හැටියට පේනවා. ඒ අනුව ක්‍රියා කරන්න පවා පෙළඹෙනවා. මේවා ගැන නොයෙකුත් නිදර්ශන තියෙනවා. ඒවා කියන්න ඕන නැහැ. මේ අවස්ථාවේ කියන්න ඕන නැත්තේ, තම තමනුත් යෝගාවචරයනුත් මේවා අත්දැකල ඇති. කෙසේ හෝ වේවා මේ 'ප්‍රපඤ්ච' කියන වචනය ඉතාම වැදගත්.

ඒ ප්‍රපඤ්ච තත්ත්වය සම්පූර්ණයෙන් නිවනේ නැති බව පෙන්නුම් කිරීමට තමයි නිවන 'නිප්පපඤ්ච' නමින් හඳුන්වලා තියෙන්නේ. දැන් අර ගාථාවෙත් තියෙන්නේ බුදුරජාණන් වහන්සේ 'නිප්පපඤ්චයට' කැමතියි මට 'නිප්පපඤ්චය' දේශනා කළා. එයින් අපට හිතාගන්න තියෙන්නේ අර හොඳ විතර්ක නමුත් අනුරුද්ධ ස්වාමීන් වහන්සේ ඒක තුළින් 'ප්‍රපඤ්චයට' ගියා. ඔන්න ඔතනයි භාවනා යෝගීන් බොහෝදෙනා අහුවෙන්නේ. අපි හිතමු ආනාපානයට ඉඳගත්තා කියලා. නමුත් අන්තිමට බලනකොට මේ බුදු ගුණ හරි මොකක් හරි හිත හිතා ඉන්නවා. ඒක අදාල නැහැ ඒ භාවනාවට. ඒ විතර්ක තුළින් ඇති කරන ඒ 'ප්‍රපඤ්චය' භාවනාවට බාධාවක් බව පැහැදිලිවම පෙනීයන තවත් කෙටි සූත්‍ර දේශනාවක් අපට හමු වෙනවා. සාරිපුත්ත ස්වාමීන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට දේශනා කළ උපදේශාත්මක කෙටි දේශනාවක්. එහි සාරිපුත්ත ස්වාමීන් වහන්සේ කියනවා, ඇවැත්නි, යම් කිසි භික්ෂූවකගේ භාවනාවෙ පිරිහීමක් සිදුවෙන්න පුළුවන් කාරණා පහක් තියෙනවා. ඒ මොනවාද? 'කම්මාරාමතා.' අපි කෙටියෙන් ගත්තොත් කම්මාරාමතා කියල කියන්නේ භාවනාවට අදල නැති නොයෙකුත් වැඩ කටයුතුවලට හිත කය යෙදීම, වැඩ කටයුතුවලට කැමැත්ත. 'භස්සාරාමතා' නිතර කථාවට දෙඩ දෙඩා ඉන්න කැමැත්ත. 'නිද්දාරාමතා' නින්දට කැමතියි. 'සංගණිකාරාමතා' පිරිස් එක්ක ගැවසෙන්න කැමතියි. අන්තිමට දක්වනවා 'පපඤ්චාරාමතා' ප්‍රපඤ්චයට කැමතියි. සිතුවිලිවලට කැමතියි. 'පපඤ්ච' කියන වචනයේ වැදගත්කම නිසාදෝ සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ඒ කෙටි දේශනාව අගට ගාථා දෙකක් වදාළා.

යො පපඤ්චං අනුයුත්තො පපඤ්චාභිරතො මගො
විරාධයී සො නිබ්බානං යොගක්ඛෙමං අනුත්තරං

යො ච පපඤ්චං හිත්වාන නිප්පපඤ්චපථෙ රතො
ආරාධයී සො නිබ්බානං යොගක්ඛෙමං අනුත්තරං

එක සමාන ගාථා දෙකක්. දෙපැත්ත පෙන්නුම් කරනවා. යම් කෙනෙක් මෙතන 'මග' කියන වචනය කියනවා. 'මග' කියල කියන්නේ මෝඩයා. යම් මෝඩ පුද්ගලයෙක් ප්‍රපඤ්චයෙහිම යෙදිල, ප්‍රපඤ්චයට ඇලුම් කරන විදිහේ කෙනෙක් වෙනවා නම් ඒ තැනැත්තා නිවනින් ඈත් වෙනවා. 'විරාධයී සො නිබ්බානං යොගක්ඛෙමං අනුත්තරං' යොගක්ඛෙම කියල කියන්නේ යුග බන්ධනයෙන් මිදුණා කියල කියන එක. නිවනින් ඈත් වෙනවා. නමුත් යම් කෙනෙක් 'යො ච පපඤ්චං හිත්වාන' ප්‍රපඤ්චයෙන් ඈත් වෙලා 'නිප්පපඤ්චපථෙ රතො' ප්‍රපඤ්චයෙන් ඉවත් වූ මාර්ගයෙහි ඇලෙනවා නම් 'ආරාධයෙ සො නිබ්බානං යොගක්ඛෙමං අනුත්තරං' ඒ තැනැත්තා නිවනට ආරාධනා කරනවා. නිවනට කිට්ටු වෙනවා කියන එකයි. නිවන් ලබනවා කියන එකයි. එයිනුත් අපට පේනවා 'ප්‍රපඤ්ච' 'නිප්‍රපඤ්ච' කියන වචන ඉතාමත්ම වැදගත් බව. ඉන් අපට හිතාගන්න පුළුවන් අප තුළ තිබෙන මේ සියුම් ඇල්ම තමයි සිතුවිලි වලට තියෙන ඇල්ම කියන එක. සතිපට්ඨාන ආදී සූත්‍රවල ප්‍රකාශ වෙන්නෙ 'ධම්ම' කියල ඒ කියන්නේ සිතුවිලි. 'ධම්ම තණ්හා ලොකෙ පිය රූපං සාත රූපං එත්ථෙසා තණ්හා උප්පජ්ජමානා උප්පජ්ජති එත්ථ නිවිසමානා නිවිසති' ඒ කියන්නේ ලෝකයේ ඉතාමත්ම ප්‍රියයි මේ සිතුවිලි කියන ජාතියට. ධම්මා, ධම්ම තණ්හා. ඒක කාටවත්ම පේන්නෙ නැහැ, සාමාන්‍යයෙන්. ඈතුළත තියෙන සියුම් බන්ධනයක්, සිතූ දේවල්. නමුත් ඒක තමයි අවසානයට තියෙන සියුම්ම බන්ධනය. සියුම් පටලැවිල්ල.

මේ 'විතක්ක පටලැවිල්ල' අනුරුද්ධ ස්වාමීන් වහන්සේට තිබුණු බව කියන තවත් ලස්සන සිද්ධියක් අපට සූත්‍ර දේශනාවල හමු වෙනවා. කෙලින්ම අනුරුද්ධ ස්වාමීන් වහන්සේ ගිහිල්ලා තමන් වහන්සේගේ භාවනා ගැටළු සාරිපුත්ත ස්වාමීන් වහන්සේ එක්ක සාකච්ඡා කරනවා. මේ ප්‍රශ්න ඉදිරිපත් කරන්නේ මෙහෙමයි. 'ඇවැත්නි සාරිපුත්ත, මනුෂ්‍යත්වය ඉක්ම වූ පිරිසිදු දිවැසින් දහසක් ලෝක ධාතුන් මම දකිනවා. මට පේනවා. මම වීර්යය අරඹල තියෙනවා. මගේ සතියත් හොඳට පිහිටලා තියෙනවා. කයත් සන්සුන්. මට සමාධියත් තියෙනවා. ඒ උනාට මගේ සිත ආශ්‍රවයන්ගෙන් මිදිලා රහත් වෙන්නේ නැහැ.' ඔන්න තමන්ගේ ලෙඩේ ප්‍රකාශ කළා. එතකොට සාරිපුත්ත ස්වාමීන් වහන්සේ ඉතාමත්ම දක්ෂ මනෝ වෛද්‍යවරයෙක් හැටියට ඒ අනුරුද්ධ ස්වාමීන් වහන්සේගේ ඒ ප්‍රකාශය තුළින්ම ඒ තියෙන ලෙඩේ හෙළි

කරනවා පුදුම විදියට. මෙන්න මෙහෙමයි සාරිපුත්ත ස්වාමීන් වහන්සේ විග්‍රහ කරන්නේ. 'දැන් ආයුෂ්මත් අනුරුද්ධ කිව්ව නේද මනුෂ්‍යත්වය ඉක්ම වූ ඉතාමත්ම පිරිසිදු දිවැසින් මම දහසක් ලෝක දකිනවා කියලා. ඒ ඔබේ 'මාන්නය'යි. එහෙම කිව්වෙ ඔබේ මාන්නයයි. ඔබ දැන් කිව්වා නේද මම වීර්යය අරඹලා තියෙනවා. මගේ සතිය හොඳයි. මගේ කයත් සන්සුන්. මගේ හිත සමාධිමත් කියලා. ඒක ඔබේ 'උද්ධච්චය.' ඊළඟට කියනවා දැන් ඔබ කිව්ව නේ ඒ උනාට මම තාම රහත් වෙන්නෙ නැතිය කියල. ඒක ඔබේ 'කුක්කුච්චයයි.' කුකුස. ඒක නිසා අනුරුද්ධ ඔන්න ඔය කියාපු කෙලෙස් තුන ඉවත් කරලා, ඒවායේ සිත යොදන්නෙ නැතිව 'අමතාය ධාතු' 'අමත ධාතුව' නමින් හැඳින්වෙන නිවනට හිත යොමු කරන්න.'

පින්වතුනි, නිවන කියන්නේ දැන් හිතන විදියේ එකක් නොවෙයි. ඒ කියාපු කෙලෙස් වලින් කොටින්ම පඤ්චස්කන්ධයෙන් සිත මුදා ගැනීමේ තත්ත්වයයි. නිවන හඳුන්වන 'අමතාය ධාතු' අමත ධාතුව කියන එක බොහෝ විට දේශනා වලත් දක්වන්නේ 'එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං' ඒ තුළින් හිතාගන්න පුළුවන් මේ ශාන්ත ප්‍රණීත හැටියට අර කියාපු සිතුවිලි නොවේ. නියම ශාන්ත ප්‍රණීත වෙන්නේ 'සබ්බසංඛාරසමථො' සංස්කාර සංසිඳවීමයි. ඒ උපධි හැටියට අල්ල ගත්තු දේවල් අත හැරීමයි. අන්න එහෙම පෙන්නුම් කිරීමෙන් අපට පේනවා තමන්ට මෙන්න මේ දේවල් තියෙනවා, මට දිව්‍ය ලෝක පේනවා, මම හොඳට වීර්යය කරනවා කියලා හිත හිතා ඉන්න එක ප්‍රමාදයක්. ඒවා සියුම් කෙලෙස්. ඊළඟට ඒ ඔක්කොම කෙලෙස් වගේ නොවෙයි මට තාම මේක ලැබුණෙ නැහැ කියල හිතන එක. ඒක කුකුසක්. යෝගාවචරයෙකුට තියෙන්නේ තමන්ට අයිති වැඩ කටයුතුවල යෙදෙනවා මිසක් අපේක්ෂා වැඩි කර ගැනීම නොවෙයි. අපේක්ෂා වැඩි උන හැටියේ භාවනාව නොවෙයි, එතකොට කෝ මට මේක ලැබුණෙ නැහැ කියලා හිතන එකත් තමන්ගේ භාවනා පරිහානියට හේතුවක්. මේ අනුරුද්ධ ස්වාමීන් වහන්සේගේ ඒ ප්‍රශ්නය තුළින් අපට යමක් තේරුම් ගන්න පුළුවන්.

ඊළඟට අපට ඒ වගේම වැදගත් සූත්‍ර දේශනාවක් හමු වෙනවා 'උපක්කිලෙස' කියන සූත්‍රය. ඉතාමත්ම වැදගත් වටිනා සූත්‍රයක් මේ අනුරුද්ධ චරිතයේ. ඒ වගේම ඒකත් යෝගාවචරයින්ටත් ඉතාම වැදගත් සූත්‍රයක් හේතු රාශියක් නිසා. ඒක ආරම්භ කරන්නේ මෙහෙමයි. ශාසනයේ එක්තරා සංවේගජනක අවස්ථාවක්. ඒ කියන්නේ මේ පින්වතුන් අහල ඇති, යම් අවස්ථාවක කොසඹෑ නුවර භික්ෂූන් කලහ

කරන්න පටන් අරගෙන දෙපිලක් වෙලා අන්තිමට බුදුරජාණන් වහන්සේ විවේකයට වැඩම කළ බව පාරිලෙය්‍ය වනයට. ඒ කතාන්තරය මේ පින්වතුන් කවුරුත් අහල තියෙනවා. අන්න ඒ සිද්ධියට අදාලවයි. කොසඹෑ නුවර බුදුරජාණන් වහන්සේ ඝොෂිතාරාමයේ වැඩ වාසය කරන අවස්ථාවක සංඝයා වහන්සේලා එහෙම කලහ කරගෙන විවාද කරනකොට බුදුරජාණන් වහන්සේ එතනට ගිහිල්ලා ඒ සංඝයා වහන්සේලා සමගි කරන්න උත්සාහ කරමින් ප්‍රකාශ කළා. 'මහණෙනි, කලහ කරන්න එපා. විවාද කරන්න එපා. සමගි වෙන්න.' කියලා. ඒ පිරිස අතර සිටි එක් කටකාර භික්ෂුවක් කියනවා 'ධර්ම ස්වාමී වූ භාග්‍යවතුන් වහන්සේ, මේ ගැන කරදර වෙන්න එපා. තමන් වහන්සේගේ විවේකය අනුව එදිනෙද සැප විහරණ වශයෙන් ධ්‍යාන භාවනාවේ යෙදිල ඉන්න.' ඒකයි ඒකෙ අදහස. 'අපි අපේ කලහය විසඳගන්නම්.' දෙවන වරටත් බුදුරජාණන් වහන්සේ සමගි වෙන්න කිව්වහම අර භික්ෂුවත් දෙවන වරටත් එහෙමම කිව්වා. අනික් කවුරුවත් නවත්වන්න ගියෙත් නැහැ. තුන්වෙනි වරටත් බුදුරජාණන් වහන්සේ වදාළහම තුන්වෙනි වරටත් අර භික්ෂුව අර විදියට කටකාර විදියට කිව්වා. බුදුරජාණන් වහන්සේ එදින පිණ්ඩපාතේ ගිහින් ඇවිත් සේනාසනය සකස් කරලා තියලා පාත්‍ර සිවුරු අරගෙනම හිටගෙනම ගාථා පෙළක් වදාළ බවයි සඳහන් වෙන්නේ. ධම්මපදයේ ඒ සමහර ගාථා තියෙනවා. වෛරයේ ආදීනව, කලහ දබරවල ආදීනව, ඒ වගේම විවේක සුවයේ විවේකයේ වටිනාකම ප්‍රකාශ වෙන ගාථා පෙළක් වදාරලා, බුදුරජාණන් වහන්සේ පාරිලෙය්‍ය වනයට වැඩම කරන අතර මග, භගු ස්වාමීන් වහන්සේ විවේකයෙන් තනිව වැඩ සිටින තැනට වැඩියා. එතැන දී භගු ස්වාමීන් වහන්සේට ධර්ම කථාවක් කළා.

ඊළඟට උන්වහන්සේ වැඩම කළේ පාචීන වංශ උයනේ මේ අනුරුද්ධ, නන්දිය, කිම්බිල කියන ඒ තුන් නම - පුදුම තුන් හවුලක් ඒ ස්වාමීන් වහන්සේලා - පාචීන වංශදයේ භාවනා කරන තැනට. බුදුරජාණන් වහන්සේ ඒ උයනට ඇතුළු වෙන්න එනකොට උයන්පල්ලා ඈතදීම දැකලා බුදුරජාණන් වහන්සේ අඳුනාගන්නේ නැතිව කියනවා 'මහණ, මේ උයනට ඇතුළු වෙන්න එපා. මේ උයනේ භාවනා කරන ස්වාමීන් වහන්සේලා තුන් නමක් ඉන්නවා. කුල පුත්‍රයන් තුන් නමක්. ඒ අයට කරදර කරන්න එපා. ඇතුළු වෙන්න එපා.' කියලා. ඒ වචන ඇහිලා අනුරුද්ධ ස්වාමීන් වහන්සේ බලනකොට බුදුරජාණන් වහන්සේ වඩිනවා. ඉතින් අර උයන්පල්ලාට කිව්වා 'උයන්පල්ල, එහෙම කියන්න එපා. මේ අපේ ශාස්තෘන් වහන්සේ.' විගහට ගිහිල්ලා නන්දිය, කිම්බිල කියන ස්වාමීන් වහන්සේලාටත් කිව්වා. 'ආයුෂ්මතුනි, එන්න එන්න. මෙන්න අපේ ශාස්තෘන් වහන්සේ

වැඩම කරල තියෙනවා.' එක නමක් ගිහිල්ලා බුදුරජාණන් වහන්සේගේ පාත්‍ර සිවුරු පිළිගත්තා. එක නමක් ආසන පිළියෙල කළා. තව නමක් පා සෝදන පැන් තැබුවා. බුදුරජාණන් වහන්සේ පා සෝද ආසනයේ වැඩ හිටියට පස්සේ තුන් නමම වන්දනා කළා. සිරිත් පරිදි බුදුරජාණන් වහන්සේ 'කොහොමද පිණ්ඩපාතෙ හෙම ලැබෙනවද' ආදී වශයෙන් සුව දුක් විචාරලා ඊළඟට වැදගත් ප්‍රශ්නයක් අහනවා. එතන බුදුරජාණන් වහන්සේ අනුරුද්ධ කියල අමතන්නේ. නමුත් බහුවචනයෙන්. එයින් අපට හිතාගන්න තියෙන්නේ අනුරුද්ධ ස්වාමීන් වහන්සේ ප්‍රධාන තුන් නම.

අපි හිතමු දැන් මේ කාලයේ කියනවා නම් 'කොහොමද අනුරුද්ධලා සමගිව විවාද නො කර, කිරියි වතුරයි වගේ එකමුතුව ඔවුනොවුන් දෙස ප්‍රිය ඇසින් බලමින් වාසය කරනවද? නියම සමගියේ ලක්ෂණයි බුදුරජාණන් වහන්සේ දක්වූයේ. අනුරුද්ධ ස්වාමීන් වහන්සේ ලස්සනට පිළිතුරු දෙනවා. 'එසේය ස්වාමීනි, අපි ඒ විදිහට සමගිව සතුටින් කිරියි වතුරයි වගේ එකමුතුව ඔවුනොවුන් දෙස ප්‍රිය ඇසින් බලමින් වාසය කරනවා.' එයින් සෑහීමට පත් බුදුරජාණන් වහන්සේ අහනවා 'කොහොමද අනුරුද්ධ ඔබ තුන්දෙනා මේ විදියට සමගියෙන් වාසය කරන්නේ?' අනුරුද්ධ ස්වාමීන් වහන්සේ දෙන විස්තරය ඉතාමත් වැදගත්. ලස්සනයි. අනුරුද්ධ ස්වාමීන් වහන්සේ කියනවා 'සමහර විට මට හිතෙනවා ස්වාමීනි, මේක මට ලොකු ලාභයක් ලැබිල තියෙන්නේ. මේ ආයුෂ්මතුන් වහන්සේලා සමග එකට වාසය කරන්න ලැබීම. මම මේ ආයුෂ්මතුන් වහන්සේලා දෙනම පිළිබඳව මෛත්‍රී සහගත කාය කර්ම පවත්වනවා, එළිපිටත් රහසිනුත්. මෛත්‍රී සහගත වාක් කර්ම පවත්වනවා, එළිපිටත් රහසිනුත්. මෛත්‍රී සහගත මනෝ කර්ම, සිතුවිලි පවත්වනවා, එළිපිටත් රහසිනුත්. ඒ වගේම ස්වාමීනි මට ඇතැම් අවස්ථාවක හිතෙනවා මම මගේ සිත ඉවත් කරලා මේ ආයුෂ්මතුන් වහන්සේලාගේ හිත අනුව පවතින්න ඕන කියලා, මට එහෙමත් හිතෙනවා. ඇතැම් අවස්ථාවල මට හිතෙනවා ඇත්ත වශයෙන් අපි කයින් තුන් දෙනෙක් වුණාට අපි සිතින් එකයි.' අනුරුද්ධ ස්වාමීන් වහන්සේ එසේ ප්‍රකාශ කළා වගේම නන්දිය ස්වාමීන් වහන්සේත් ඒ වගේම ප්‍රකාශ කළා. කිම්බිල ස්වාමීන් වහන්සේත් ඒ වගේම ප්‍රකාශ කළා.

බුදුරජාණන් වහන්සේ 'සාධු! සාධු!' කියල ඒක අනුමෝදන් කරල, ඊළඟට අහනවා තව දුරටත් 'කොහොමද, අනුරුද්ධයිනි! ඔබ අප්‍රමාදීව දවස ගත කරනවද වීර්ය වඩමින්?' 'එසේය ස්වාමීනි' කියල ඊළඟට අනුරුද්ධ ස්වාමීන් වහන්සේ ඒ තුන් නමගේ දින චරියාව

ප්‍රකාශ කරනවා. එයත් ඉතාමත්ම විශේෂයෙන් සඟ පරපුරට වැදගත් ආදර්ශයක්. අනුරුද්ධ ස්වාමීන් වහන්සේ මේ විදියටයි ප්‍රකාශ කරන්නේ. තුන් නමයිනෙ එතන ඉන්නේ. "ස්වාමීනි අපි තුන් නමම ගමට පිණ්ඩපාතේ වැඩලා, පළමුවෙන්ම පිණ්ඩපාතේ අරගෙන එන භික්ෂූන් වහන්සේ ආසන පනවනවා. ඊළඟට පැන් බීමට පා සේදීම් ආදියට පැන් සකස් කරලා තබනවා. වැඩි ආහාර දන බඳුන සකස් කරල තබනවා. ඊළඟට ගමෙන් අන්තිමටම පිණ්ඩපාතේ වඩින භික්ෂුව ඒ වැඩි ආහාර බඳුනෙන් යමක් තියෙනවා නම් තමන්ට අනුභව කරන්න, කැමති ඒවා අනුභව කරනවා. එහෙම නැත්නම් වැඩි ආහාර බඳුන ගෙනිහිල්ල තණකොළ නැති තැනක, එහෙම නැත්නම් සතුන් නැති දියක පා කරල හරිනවා. ඊළඟට ඒ භාජන සෝදලා තියෙනවා. ආසන ඉවත් කරල තබනවා. ඒ වගේම දන ශාලාව අමදිනවා. ඒ වගේම අපි තුන් නමගෙන් යම් කෙනෙක් හිස් පැන් භාජනයක් තියෙනවා දැක්කොත් ඒක අපි පුරවලා තියෙනවා. තනියම ඒක උස්සන්න බැරි නම් දෙවැන්නෙකුට අතින් සංඥාවක් කරලා අපි දෙන්න එක්ක එකතු වෙලා පැන් භාජනය ගෙන එනවා. ඒ වෙනුවෙන් වචනයක්වත් අපි වියදම් කරන්නේ නැහැ.' මේ සමගිය පෙන්නුම් කරන්නේ. 'ඒ වගේම දවස් පහකට වරක් අපි තුන් නමම මුළු රාත්‍රියේම ධර්ම සාකච්ඡාවේ යෙදෙනවා. අවදියෙන් ධර්ම සාකච්ඡා කරනවා' කියලා. බුදුරජාණන් වහන්සේ ඒකට සාධු! සාධු! කියලා බොහොම හොඳයි අනුරුද්ධයිනි. ඊළඟට අහනව 'ඔබ මේ අන්දමට සමගියෙන් ජීවත් වන අතරේ, අනුරුද්ධයිනි! ඔබ යම්කිසි උත්තර මානුෂීය ධර්මයක් භාවනාවෙන් උතුම් තත්ත්වයක් ලබාගෙන තියෙනවද?' ඔන්න ඒ අවස්ථාවේ අනුරුද්ධ ස්වාමීන් වහන්සේ ඒ තුන් නමටම පොදු වුණ භාවනා ගැටළුවක් ප්‍රකාශ කරනවා.

'ස්වාමීනි, අපට යම් අවස්ථාවලදී භාවනාවේදී ආලෝකයක් දකින්න ලැබෙනවා. රූපත් පේනවා. නමුත් ටික වෙලාවකින් ඒවා නැති වෙලා යනවා. එයට හේතුව අපට සලකාගන්න බැහැ. අපි දන්නෙ නැහැ.' ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ බෝධිසත්ත්ව අවදියේ අත්දැකීම් ලස්සනට ඉදිරිපත් කරනවා අනුරුද්ධ ස්වාමීන් වහන්සේලාට උපදෙස් වශයෙන්. මේ කාලයේ එකම දේ අහන කට්ටියට භාවනාව ගැන, අන්න ඒ අයට ප්‍රයෝජනවත් බුදුරජාණන් වහන්සේ කොයි තරම් වීර්යයක් දරුවද භාවනාව පිළිබඳව කියල. 'අනුරුද්ධයිනි, මටත් ඔහොම අවස්ථාවක් ඇතිවුණා. සමහර අවස්ථාවල ආලෝකයක් පේනවා. දර්ශන පේනවා. හිටපු ගමන් නැති වෙලා යනවා. මම එතකොට මොකද මෙහෙම

උනේ කියල ඒකට හේතුව විමසල බලනවා. හේතුව විමසල බලනකොට මට පෙනුනා මට 'දෙගිඩියාව - විචිකිච්ඡාව' ඇතිවුණා. ඒ විචිකිච්ඡාව ඇතිවුණ නිසා මගේ සමාධිය නැතිවෙලා ගියා, ගිලිහී ගියා. ඒක නිසයි අර ආලෝකය නැති වුණේත් රූප දර්ශනය නැති වුණේත්. ඉතින් මම ඊළඟට අධිෂ්ඨාන කරනවා 'විචිකිච්ඡාව' නැතිව මම භාවනා කරනවා කියලා. ඔහොම කරගෙන යනකොට ඔන්න ඒ ආලෝකය එනවා. දර්ශන පේනවා. නමුත් ආයිත් ඒවා නැතිවෙලා යනවා. ඒ වෙලාවේ මම සලකල බලනකොට මෙහෙම හිතෙනවා. ඒ ලැබුණු ආලෝකය ආදිය මම හරියට මෙනෙහි කළේ නැහැ. මෙනෙහි කිරීමේ අඩුපාඩුවක් නිසා ඒ ඇතිවුණු සමාධිය ගිලිහිලා නැතිවුණා.' ඔය විදියට එකොළහක්ම ඒ අවස්ථාවේ සඳහන් කරනවා, බෝධිසත්ත්වයන් වහන්සේට එකොළොස් උපක්ලේශයන් ඇතිවූ බව. ඇතැම් අවස්ථාවල සඳහන් වෙනවා 'ථීනමිද්ධය' කියන නිදිමත නිසා, තවත් අවස්ථාවක යම්කිසි තැතිගැන්මක් නිසා, ඒ හුදකලාව භාවනා කරන අවස්ථාවල සතෙකුගේ හඬකින් හරි නැත්නම් භාවනාව තුළින්ම ඇතිවන යම් දර්ශන නිසා ඇතිවුණ යම්කිසි තැතිගැන්මක් හේතුවෙන්, තවත් අවස්ථාවල අනවශ්‍ය උදම්වීමක්. ලොකු සතුටක්; සීමාන්තික සතුටක් ඇති වෙනවා. තවත් අවස්ථාවක ඒ රූප දර්ශන දකීමෙන් ඒවාට ඕනෑවට වඩා ඇල්ම කිරීම නිසා සමාධිය ගිලිහුණා. තවත් අවස්ථාවක වීර්යය වැඩිවීම නිසාත්, වීර්යය අඩුවීම නිසාත් සමාධිය නැතිවුණා. තවත් අවස්ථාවක කායදරථ කියන කයට ලොකු වෙහෙසක් ඇතිවීම නිසා සමාධිය ගිලිහුණා. මේ උපක්කිලේස බොහෝවිට නොපෙනෙන සියුම් දේවල්. සමහර විට භාවනා කරගෙන යනවිට සතුට එනවිට කවුරුත් හිතන්නෙ ඒවා භාවනාවට හොඳයි කියලා. නමුත් ඒවා භාවනාවට බාධාවල්. ඔන්න ඔය විදියට හිතාගන්න පුළුවන්. ඉතින් ඒ විදියට අනුශාසනාවක් කරලයි බුදුරජාණන් වහන්සේ පාරිලෙය්‍ය වනයට වැඩම කළේ. එතකොට 'උපක්කිලේස සූත්‍රයෙනුත්' අපට බොහෝ දේවල් අනුරුද්ධ ස්වාමීන් වහන්සේගේ ජීවිතය පිළිබඳව දැනගන්න පුළුවන්.

ඊළඟට වැදගත් සූත්‍රයක් - එයිනුත් හුඟක් වැදගත් කාරණා අපට එකතු කර ගන්න පුළුවන් ජීවිතයට, 'චූලගොසිඞ්ග සූත්‍රය' කියලා. එය මැදුම් සඟියේ තියෙන්නේ. ඒ අවස්ථාව සඳහන් වෙන්නේ මෙහෙමයි. බුදුරජාණන් වහන්සේ නාදික කියන ගමේ ගිඤ්ජකාවසථ කියන ගඩොල් ආවාසයේ වැඩ සිටියා කාලයක්. ඒ කිට්ටුවම තමයි ගොසිඞ්ග සාල වනය පිහිටලා තියෙන්නේ. ගොසිඞ්ග සාල වනයේ මේ අවස්ථාවේ අනුරුද්ධ, නන්දිය, කිම්බිල කියන මේ තුන් නම භාවනා

කරමින් සිටියා. බුදුරජාණන් වහන්සේ සවස් වරුවේ භාවනාවෙන් නැගිටලා මේ ගොසිඞග සාල වනයට වැඩම කරන අතරේ - මෙතනත්, මේ සූත්‍ර දේශනාවේ සඳහන් වෙන්නේ යම් කිසි හේතුවක් නිසා අර උපක්කිලේස සූත්‍රයේ වගේම උයන්පල්ලා ඇතදීම බුදුරජාණන් වහන්සේ හඳුනාගන්නේ නැතිව, මේකට ඇතුලු වන්න එපා කියනවා. එතකොට අනුරුද්ධ ස්වාමීන් වහන්සේ ඒක වළක්වලා, ඒක ඒ ආකාරයෙන් සඳහන් වෙන්නේ.

ඊළඟට මේ පින්වතුන්ට හිතාගන්න පුළුවන් බුදුරජාණන් වහන්සේ සිරිත් පරිදි සුව දුක් විමසලා 'කොහොමද ජීවත් වෙන්නේ' කියල අහපුවහම අර කලින් කියපු ආකාරයටම මේ ගොසිඞග සාල වනයෙදිත් මේ තුන් නම ප්‍රකාශ කරනවා තමන්ගේ දින චරියාවත් සමගි කමත්. නමුත් ඔන්න භාවනාව ගැන බුදුරජාණන් වහන්සේ අහපු අවස්ථාවේ දී විශේෂයි. බුදුරජාණන් වහන්සේ අනුරුද්ධ ස්වාමීන් වහන්සේගෙන් අහනවා 'කොහොමද දැන් උත්තර මානුෂීය ධර්ම වඩාගෙන තියෙනවද?' කියලා. ඒ අවස්ථාවේ අනුරුද්ධ ස්වාමීන් වහන්සේ කියනවා 'මොකද නැත්තේ ස්වාමීනි' කියලා. අගෞරවයකින් කිව්ව නොවෙයි. එහෙම කියලා අරහත්වය ලබාගත්ත බව ප්‍රකාශ කරනවා. මොකක්ද ඉස්සෙල්ල කියන්නේ? අපි කියල තුන් නම වෙනුවෙන්මයි කථා කරන්නේ අනුරුද්ධ ස්වාමීන් වහන්සේ. අපි කාමයන්ගෙන් ඉවත් වූ ප්‍රථම ධ්‍යානයට කැමති හැටියට සම වදිනවා. බුදුරජාණන් වහන්සේ අහනවා ඒ ඉක්මවල තවත් ඔබ ලබාගෙන තියෙනවද කියලා. එතකොට කියනවා දෙවන ධ්‍යානය. ඔහොම එක පාරටම කියන්නේ නැහැ; අරහත්වය ලබාගත්ත බව. අනුරුද්ධ ස්වාමීන් වහන්සේ, එකින් එක එකින් එක ඉහළ ඉහළ ධ්‍යාන දක්වා කියලා, අන්තිමට නෙවසඤ්ඤානාසඤ්ඤ කියන ඒ ඉහළ අරූප ධ්‍යාන තත්ත්වයන් ඉක්මවලා 'සඤ්ඤාවෙදයිත නිරොධය' කියන ඒ තත්ත්වයට පත්වෙලා එයින් නැගිටලා ප්‍රඥාවෙන් දැකලා ආශ්‍රවයන් ක්ෂය කළ බවත් ප්‍රකාශ කළා. ඒ කියන්නේ රහත් වුණා. එතකොට බුදුරජාණන් වහන්සේ 'බොහොම හොඳයි, සාධු! සාධු!' කියලා, තවත් ධර්මකථාවකුත් කරලා වැඩම කළා.

වැඩම කළාට පස්සේ අමුතු සිද්ධියක්. නන්දිය, කිම්බිල කියන ස්වාමීන් වහන්සේලා දෙනම ඇවිල්ලා අනුරුද්ධ ස්වාමීන් වහන්සේගෙන් අහනවා 'ඇවැත්නි, ඔබට අපි කිව්වද අපි මේ තත්ත්ව ලබාගෙන කියලා? බුදුරජාණන් වහන්සේට කිව්වනේ අරහත්වය දක්වාම. අපි තුන් නමම වෙනුවෙන් ප්‍රකාශ කළේ?' එතකොට අනුරුද්ධ ස්වාමීන් වහන්සේ කියනවා 'ආයුෂ්මතුන් වහන්සේලා මට

කිච්ච නොවෙයි. මම හිතින් දුටුවා, ඔබ වහන්සේලා මේවා ලබාගෙන තිබෙන බව. ඒ වගේම දේවතාවනුත් මට ඇවිල්ල කිව්වා.' මෙතන විශේෂ දෙයක් තියෙනවා. ඒ කියන්නේ මේ තුන් නම අර තරම් සමගියෙන් එකට ආහාර බෙදා හදාගෙන හිටියට තමන්ට ලැබුණු උත්තර මානුෂීය ගුණ ධර්ම ඔවුනොවුන්ට ප්‍රකාශ කළේ නැහැ. ඒක ශාසනයේ හඳුන්වන්නේ වටිනා ගුණ ධර්මයක් හැටියට. 'අධිගම අප්පිච්ඡතා' කියනවා. ඒකත් අල්පේච්ඡතා ගුණයක්. තමන් ලබාගත්තු තත්තවය, කිය කියා යන ප්‍රසිද්ධ කරන පොත් පත්වල දන විදියේ එකක් නොවෙයිනෙ. ඒක ගැඹුරු වටිනා දෙයක්. ඒකෙ වටිනාකම නැතිවෙලා යනවා කිය කියා යනකොට. මේක වෙන එකක් තබා ඉතාමත් උත්කෘෂ්ට අන්දමින් රැකිය යුත්තක්. එකට හිටිය මේ තුන් නමවත් ඔවුනොවුන්ට කිව්වෙ නැහැ, තමන් මේ මේ ධ්‍යාන තත්තව ලබාගෙන රහත්වෙලා ඉන්නවා කියලා.

මෙන්න මේ ගුණය තේරුම් ගත්තු, සාමාන්‍ය මනුෂ්‍යයෙක් නොවෙයි මෙතන කියන්නේ යක්ෂයෙක්; දීඝ පරජන කියන යක්ෂයෙක්. ඊළඟට අමුතුම කථා මගකට යනවා. දීඝ පරජන කියන යක්ෂයා මේ කථා ප්‍රවෘත්තිය අහන් ඉඳලා, බුදුරජාණන් වහන්සේ වැඩම කළාට පස්සේ, බුදුරජාණන් වහන්සේ ළඟට ගිහිල්ලා, එක්තරා ගුණ කථනයක් ප්‍රකාශ කරනවා, මේ තුන් නම පිළිබඳව. මේ තරම් වටිනා ගුණ සම්පන්න අය කියන එකයි ඒ දීඝ පරජන කියන යක්ෂයා ප්‍රකාශ කරන්නේ. මේ වජ්ජි රටට ලොකු ලාභයක්. වජ්ජි රටේ වැසියන්ට විශාල ලාභයක්. තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ මේ රටේ වාසය කිරීම. ඒ වගේම මෙන්න මේ අනුරුද්ධ, නන්දිය, කිම්බිල කියන මේ තුන් නම වාසය කිරීමත් කියලා ඒ ගුණ ඝෝෂයක් ප්‍රකාශ කළා. ඒ සූත්‍රයේ සඳහන් වෙන ආකාරයට ඒ දීඝ පරජන යක්ෂයාගේ ප්‍රකාශය ප්‍රතිරාව කළා. මේ පින්වතුන් දන්නවා ධම්මචක්කපපවත්තන සූත්‍රයේ කියන ආකාරයට භූමාටු දෙවියන් ඒක ප්‍රතිරාව කළා. ඊළඟට චාතුර්මහාරාජික තාවතිංස ආදී වශයෙන් අකනිට්ඨා දක්වා මේ තුන්දෙනා පිළිබඳ ඒ කීර්ති ඝෝෂාව ප්‍රකාශ වුණ බව ඒ සූත්‍රයේ සඳහන් වෙනවා. ඒ සූත්‍රයේ සඳහන් වෙනවා බුදුරජාණන් වහන්සේත් එයට එකතු කළා කියලා 'එසේය දීඝ, එසේය දීඝ, මේ තුන් නම කොයි තරම් වටිනවාද කියතොත්...' ඔන්න බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළ ටික. 'යම් පවුලකින් මේ තුන් නම ගිහිල්ල පැවිදි වූවා නම් ඒ පවුලේ අය මේ තුන් නම ගැන ප්‍රසාද සිතින් පහන් සිතින් සිතනවා නම් දීර්ඝ කාලයක් හිත සුව පිණිස ඒ පවුලට හේතු වෙනවා, ඒ සිතුවිල්ල. ඒ වගේම යම් ගමකින් යම් නගරයකින්, යම් ජනපදයකින්

මේ තුන් නම පිටවෙලා මහණ වුනා නම් ඒ අය හිතනවා නම් මේ තුන් නම ගැන, ඒ අයට එය විශාල කුසල ආනිශංසයක් කියලා. අන්තිමට කියනවා දෙවියන්-මරුන්-බඹුන් සහිත ලෝකයද, දෙවි මිනිසුන් - මහණ බමුණන් සහිත ප්‍රජාවද මේ තිදෙන පහන් සිතින් සිහිකරන්නාහුද, එය ඔවුන්ට බොහෝ කලක් හිත සැප පිණිස වන්නේය' කියල. ලොකු ගෞරවයක් බුදුරජාණන් වහන්සේ විසින් ඒ තුන් නම ගැන කළ ප්‍රකාශය. චූල ගොසිඞග සූත්‍රයෙන් අපට පේනවා අනුරුද්ධ ස්වාමීන් වහන්සේ අර කියාපු කුසල් සිත් ඔක්කොම ලබල රහත් වුණ බව.

ඒ වගේ වටිනා චරිතයකින් ශාසනයට ලැබුණු විශාල අනුග්‍රහයක් අපට දකින්න ලැබෙනවා 'මහා පරිනිබ්බාන' සූත්‍රයෙන්. මහා පරිනිබ්බාන සූත්‍රය මේ පින්වතුන් දන්නවා. බුදුරජාණන් වහන්සේ පරිනිර්වාණයට කලින්ම අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා පිරිනිවන් පාලා ඉවරයි. ඒ පිරිනිවන් පාන අවස්ථාවේ ආනන්ද ස්වාමීන් වහන්සේ ළඟ හිටියා. ඊළඟට සිටිය ස්වාමීන් වහන්සේලා අතර ඉතාමත්ම වැදගත් වටිනාම ස්වාමීන් වහන්සේ නමක්, මේ යුගයේ නම් සංවිධායක වගේ තමයි අනුරුද්ධ මහ රහතන් වහන්සේ. ඒ උන්වහන්සේගේ දිව්‍යස් ශක්තිය තුළින් මහා පරිනිර්වාණය හා සම්බන්ධ කටයුතු හොඳින් කරන්න අවස්ථාව සැලසුණු ආකාරය පිළිබඳව සඳහන් වෙනවා. මහා පරිනිබ්බාන සූත්‍රය ඉතා දීර්ඝ සූත්‍රයක්. එයින් අවශ්‍ය ටික ගත්තොත් බුදුරජාණන් වහන්සේ පරිනිර්වාණ මඤ්චකයේ වැඩ ඉඳ ගෙන - පරිනිර්වාණ අවස්ථාවේදී මේ පින්වතුන් අහල තියෙනවා බුදුරජාණන් වහන්සේගේ 'පච්ඡිමා බුද්ධ වාචා' කියල කියන අවසාන බුද්ධ වචනය 'හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි වො, වය ධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදෙථ.' දැන් ඉතින් මහණෙනි! මම නුඹලාට ආමන්ත්‍රණය කරමි. සංස්කාරයන් නැසෙන සුළුයි. අප්‍රමාදීවම නිවනට කටයුතු සම්පාදනය කරන්න. යනුවෙන් ප්‍රකාශ කරලා, බුදුරජාණන් වහන්සේ පරිනිර්වාණයට සූදානම්ව, පළමුවෙන්ම ප්‍රථම ධ්‍යානයට සම වැදිලා, දෙවෙනි ධ්‍යානය, තුන්වෙනි ධ්‍යානය ආදී වශයෙන් සඤ්ඤාවේදයිත නිරෝධය දක්වාම සම වැදුණා. සඤ්ඤාවේදයිත නිරෝධයට සම වැදුනහම ආනන්ද ස්වාමීන් වහන්සේ හිතුවා පිරිනිවන් පෑවය කියලා. 'ස්වාමීනි අනුරුද්ධ, භාග්‍යවතුන් වහන්සේ පිරිනිවන් පෑවද?' කියලා ආනන්ද ස්වාමීන් වහන්සේ ඇසුවා. අනුරුද්ධ ස්වාමීන් වහන්සේ කියනවා 'නෑ ආනන්ද, බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑවේ නැහැ. උන්වහන්සේ සඤ්ඤාවේදයිත නිරෝධයට සම වැදුණා විතරයි.' බුදුරජාණන් වහන්සේ ඊට පස්සේ ආයිත් යට යට ධ්‍යානවලට සම වැදුණා,

නෙවසඤ්ඤානාසඤ්ඤායතන ආදී වශයෙන්. ආයිත් ප්‍රථම ධ්‍යානය දක්වා පහළ ධ්‍යානවලට සම වැදිලා, ආයිත් ඉහළට පළවෙනි ධ්‍යානයේ ඉඳලා දෙවෙනි ධ්‍යානයට, දෙවෙනි ධ්‍යානයේ ඉඳලා තුන්වෙනි ධ්‍යානයට, තුන්වෙනි ධ්‍යානයේ ඉඳලා හතර වෙනි ධ්‍යානයට සම වැදිලා ඉවර වෙලා තමයි, බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා වදාළේ. ඒ පිරිනිවන් පා වදාළ අවස්ථාවේදී ඒ සූත්‍රයේ සඳහන් වෙන ආකාරයට මහා භූමි කම්පා ආදී විශේෂ දේවල් සිදු වුණා. ශක්‍ර දෙවියන්, මහා බ්‍රහ්මයා ආදීන් ගාථා ප්‍රකාශ කළා කියලා සඳහන් වෙනවා. මෙහිදී අනුරුද්ධ ස්වාමීන් වහන්සේගේ විශේෂත්වය තියෙන්නේ - ඇත්ත වශයෙන් බුදුරජාණන් වහන්සේගේ සිත පරිනිර්වාණයට පත් වූ ආකාරය ප්‍රකාශ කෙරෙන ඉතාම වටිනා ගාථා දෙකක් අනුරුද්ධ ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කළා.

'නාහු අස්සාසපස්සාසො ඨිත චිත්තස්ස තාදිනො
අනෙජො සන්තිමාරබ්භ යං කාල මකරී මුනි
අසල්ලීනෙන චිත්තෙන වෙදනං අජ්ඣවාසයි
පජ්ජෝතස්සෙව නිබ්බානං විමොක්ඛො චෙතසො අහු'

තෘෂ්ණාව ඉවත් කළ මේ බුද්ධ මුනිවරයා - ස්ථිර සිත් ඇති බුද්ධ මුනිවරයා යම් නිර්වාණ ශාන්තියක් මුල් කරගෙන කාලක්‍රියා කළ සේක් ද (කාලක්‍රියා කළා කියන එක මෙතන සඳහන් වෙන්නේ විශේෂ අර්ථයකින්) උන් වහන්සේගේ ආශ්වාස ප්‍රශ්වාස නතර විය.

'අසල්ලීනෙන චිත්තෙන වෙදනං අජ්ඣවාසයි
පජ්ජෝතස්සෙව නිබ්බානං විමොක්ඛො චෙතසො අහු'

'අසල්ලීනෙන චිත්තෙන වෙදනං අජ්ඣවාසයි' - ඒ මරණ වේදනාව නො සැඟවූ සිතින් දරාගත්තා. ඒ සමාධි ශක්තිය තුළින්. 'පජ්ජෝතස්සෙව නිබ්බානං විමොක්ඛො චෙතසො අහු' - පන්දමක් නිවී යාමක් මෙන් සිතෙහි විමුක්තිය විය. බුදුරජාණන් වහන්සේගේ සිත පරිනිර්වාණයට පත් වූ ආකාරය අනුරුද්ධ ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කළා. ඒකත් වැදගත් දෙයක්. ඒවා ගැන දිගට නොකිව්වත් අපි වෙන තැන් වල මේවා විස්තර කරල තියෙනවා.

ඒ පරිනිර්වාණයට පත් වූ අවස්ථාවේදී නො රහත් සංඝයා වහන්සේලා බිම පෙරළි පෙරළී ශෝක කරමින් හැඬූ බව සඳහන් වෙනවා. 'තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑවා ඉක්මන් වැඩියි. ලෝකයේ තිබුණ ඇස නැති වුණා ඉක්මන් වැඩියි.' කියලා ශෝක

වෙන අවස්ථාවේදී අනුරුද්ධ ස්වාමීන් වහන්සේ උන්වහන්සේලා අස්වසමින් මෙහෙම ප්‍රකාශ කරනවා. 'මහණෙනි, අඬන්න එපා. වැලපෙන්න එපා. ඇයි භාග්‍යවතුන් වහන්සේ කලින්ම කියල තියෙනවනේ, සියලුම ප්‍රිය මනාප අයගෙන් වෙන් වීමක් වෙනස් වීමක් වෙනවය කියල. මේ සංඛත වූ හේතු ප්‍රත්‍යයන්ගෙන් සකස් කළ දෙයක්, නො නැසී නො මැකී නො දිරා පවත්වනවා කියන එක වෙන්න බැරි දෙයක්. ඒ වගේම දේවතාවුන් දෙස් පවරනවාය සංඝයා වහන්සේලාගේ මේ හැසිරීම ගැන.' කියල. එතකොට සංඝයා වහන්සේලා අහනවා කොහොමද දේවතාවුන් හා සම්බන්ධීකරණය කරන්නේ අනුරුද්ධ ස්වාමීන් වහන්සේ? කුමක්ද මේ අවස්ථාවේ දේවතාවුන් පවසන්නේ? කියල ඇහුවා. එතකොට කියනවා නො රහත් දේවතාවනුත් අර විදියට වැලපෙනවාය. අඬනවාය. නමුත් රහතන් වහන්සේලා එහෙම හැම සංස්කාරයක්ම අනිත්‍යයි කියල හිත සනස ගන්නවාය කියල.

ඊළඟට අනුරුද්ධ ස්වාමීන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේට කිව්වා, දැන් ගිහිල්ලා කුසිනාරා නුවර මල්ල රජ දරුවන්ට දන්වන්න, භාග්‍යවතුන් වහන්සේ පරිනිර්වාණයට පත් වුණා කියලා. ආනන්ද ස්වාමීන් වහන්සේ අර විදියට ප්‍රකාශ කළ හැටියේ, මල්ල රජ දරුවනුත්, අර විදියටම අඬන්න දොඩන්න පටන් ගත්තා. ඒ වගේම කිව්වා දැන් ඊළඟට කරන්න තියෙන ටික භාර ගන්න කියල. ආදාහනය හා සම්බන්ධ කටයුතු භාර ගන්නය කියන එකයි. ඉතින් ඒ මල්ල රජ දරුවන් ඇවිල්ලා බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී දේහය ආදාහන මළුවට ගෙන යාමට අට දෙනෙක් මල්ල රජ දරුවන්, හොඳට නාලා පිරිසිදු වස්ත්‍ර හැඳගෙන, බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී දේහය ඔසවන්න බලනවා බලනවා ඔසවන්න බැහැ. ඔන්න ඒ අවස්ථාවේදී අනුරුද්ධ ස්වාමීන් වහන්සේගෙන් අහනවා 'ඇයි ස්වාමීනි, අපි මෙච්චර උත්සාහ කරද්දිත් ඔසවන්න බැරි?' ඔන්න එතකොට මල්ල රජ දරුවන්ට කියනවා ඔබලාගේ අදහස වෙනස්. දෙවියන්ගේ බලාපොරොත්තුව වෙනස්. එතකොට අහනවා. 'කොහොමද දෙවියෝ බලාපොරොත්තු වෙන්නේ?' කියලා. 'ඔබ බලාපොරොත්තු වන්නේ නගරයේ දකුණු දොරින් ශ්‍රී දේහය අරගෙන ගිහිල්ලා නගරයෙන් පිට ශ්‍රී දේහය ආදාහනය කරන්න. නමුත් දේවතාවුන් බලාපොරොත්තු වෙන්නේ උතුරු දොරටුවෙන් ගෙනහිල්ලා නගරයට නැගෙනහිර දිශාවෙන් පිහිටි මකුට බන්ධන කියන චෛත්‍යය ළඟ ආදාහනය කරන්න. දේවතාවන්ගේ අදහසුත් ඉෂ්ට වේවා!' කියලා කිව්වට පස්සේ, ඒ විදියට බුද්ධ ශරීරය ගෙනිහිල්ලා, චිතකයේ තබලා, මල්ල රජ දරුවන් හතර දෙනෙක් අර

වගේම පිරිසිදු බවට පත්ව සූදනම් වෙලා, මේ චිතකයට ගිනි තියන්න උත්සාහ කරනවා. ගිනි තියන්න උත්සාහ කළත් ගිනි අල්ලන්නේ නැහැ. ඒ අවස්ථාවේදීත් අනුරුද්ධ ස්වාමීන් වහන්සේගෙන් අහනවා 'මොකද ස්වාමීනි, මේ චිතකය ගිනි අල්ලන්නේ නැත්තෙ.' ඒ අවස්ථාවේදීත් අනුරුද්ධ ස්වාමීන් වහන්සේ වදාරණවා දේවතාවුන්ගේ බලාපොරොත්තුව වෙනස්. ඔබේ බලාපොරොත්තුව වෙනස්. දේවතාවුන් මෙන්න මෙහෙම කල්පනා කරනවා. අනුරුද්ධ ස්වාමීන් වහන්සේගේම වචනවලින් සඳහන් කරනවා නම් 'දැන් ආයුෂ්මත් මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ පන්සියයක් භික්ෂූන් සමග පාවා නුවර සිට කුසිනාරා නුවර දීඝ මාර්ගයේ ගමන් කරමින් සිටිනවා. දේවතාවුන්ගේ අදහස මේකයි. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ඇවිල්ල බුදුරජාණන් වහන්සේගේ දෙපා වදින තුරු මේ චිතකය නො දැල්වේවා!' කියලා. එහෙම දේවතාවුන්ගේ බලාපොරොත්තුව තියෙනවා කියල කිව්වහම ඒ ඉල්ලීම අනුව මේ අය චිතකය ගිනි දැල්වීම මදක් ප්‍රමාද කළා. යථා කාලයේදී මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ පන්සියයක් පිරිසක් සමග පැමිණිලා ඇඳිලි බැඳගෙන චිතකය වටා තුන් වරක් පැදකුණු කරලා බුදුරජාණන් වහන්සේගේ පාද ප්‍රදේශයෙන් චිතකය විවෘත කරලා මහා කාශ්‍යප මහ රහතන් වහන්සේත් වන්දනා කළා. ඒ පන්සියයක් භික්ෂූන් වහන්සේලාත් වන්දනා කළා. වන්දනා කළ හැටියේම චිතකය ඉබේටම ගිනි දැල්වුණු බව ඒ දේශනාවේ සඳහන් වෙනවා.

එතකොට ඔන්න අපට පේනවා දැන් මේ කාලේ ඔය විදියේ උත්සව අවස්ථාවලදී අපි කියන්න ඕන නැහැනෙ, නා නා විධ උපකරණ - කනේ උපකරණ, ඇහේ උපකරණ - තියාගන ඒවා සංවිධානය කරන හැටි. ඒත් දිව්‍ය ලෝකයත් එක්ක සම්බන්ධීකරණ පවත්වන්න පුළුවන් ශක්තියක් නැහැනෙ. ඒ සම්බන්ධීකරණ කරන්න පුළුවන් ශක්තියක් මේ කාලයේ ඇතිවෙයි කියලා හිතන්න අමාරුයි. අනුරුද්ධ ස්වාමීන් වහන්සේ ඒ කිසිවක් නැතිව ඒ කාරිය ඉටුකළා. දැන් මේ කාලයේ පරිගණක පුහුණුව වගේ තමයි අතීත කාලයේ ධ්‍යාන ආදිය පිළිබඳව තිබුණු උනන්දුව. හැම කෙනෙක්ම විශේෂ උත්සාහයක් දැක්වූවා සිත දියුණු කර ගන්න. ඒ බාහිර උපකරණ එක්ක, මෙවලම් එක්ක කරන දෙයක් නොවෙයි. අන්න එබඳු යුගයක අනුරුද්ධ ස්වාමීන් වහන්සේ අර විදියට කැපී පෙනුනේ; උන්වහන්සේලාට කැපී පෙනෙන්ට අවශ්‍යතාවක් නැතත්. ඊට වඩා වැඩි අනිකුත් ස්වාමීන් වහන්සේලා පරිනිර්වාණයට පත්ව සිටි නිසා අනුරුද්ධ ස්වාමීන් වහන්සේ ඉතාමත්ම දක්ෂ අන්දමින්, අවස්ථානුකූලව ඒ මහා පරිනිර්වාණය කියන උත්තරීතර අවස්ථාවේ ඒ කටයුතු සංවිධානය

කළා. උන්වහන්සේගේ ධ්‍යාන අභිඥාඥ ශක්තීන් උපකාර කරගෙන. එතකොට අපි කල්පනා කරන්න ඕන මේ යුගයේ අවුරුද්දක් ආරම්භ වන යුගයේ අර කියාපු මෙවලම් වල ආනිශංස වගේම ආදීනවත් ලෝකෙට ප්‍රකට වෙන අවස්ථාවක්. ඒ වගේම මනුෂ්‍යයාගේ අර කියාපු චිත්ත ශක්තීන්. අපේ මනුෂ්‍යත්වය හා සම්බන්ධ විශේෂ ශක්තීන් හා ගුණ ධර්ම, ඒවා පරිහානියට යන අවස්ථාවක් මේක. එබඳු අවස්ථාවක දැන් අපි ප්‍රකාශ කළ අනුරුද්ධ ස්වාමීන් වහන්සේගේ චරිතය - අර කියාපු වටිනා ගුණ ධර්ම, සමගි බවේ පරමාදර්ශයක් කියලා කියන්න පුළුවන්. මේ සියුමැලි රජ දරුවන් - ධර්මයේ සඳහන් වෙන හැටියට ඒ ඒ ඍතු තුනට සිදුහත් කුමරුට තිබුණ වගේ ඍතු තුනට ගැළපෙන මන්දිර - සමහර විට වැසි ඍතුවේ පහළ මාලයට බහින්නෙවත් නැතිව, සියුමැලි ශරීර ඇති ශාක්‍ය කුමාරවරු - ඒ කැලේ අර විදියට දුක් මහන්සි වෙලා භාවනා කරල, විශේෂ වීර්යයක් දරලා අර තත්ත්ව ලබාගත්තේ වෙන කිසිවක් නිසා නොවෙයි. සංසාර විමුක්තිය අරමුණු කරගෙන. එපමණක් නොවෙයි. ඒ අර ලබාගත්තු ධ්‍යාන අභිඥාඥ ආදිය තුළින්, අර විදියට ලෝකයට විශාල සේවයක් සිදු කළා. ඒ නිසා මේ පින්වතුන්ට සිතන්න අවස්ථාවක්. විශේෂයෙන්ම භාවනා යෝගීන්ට යෝගාවචරයින්ට මේ අනුරුද්ධ චරිතය. අඩුපාඩුකම් වගේම ඒ ශක්තිය තුළින් ප්‍රකාශ කරන ලද කාරණා ආශ්‍රයෙන් මේ සිතේ උපක්ලේශ, අපි අර ප්‍රකාශ කරපු ප්‍රපඤ්ච කියන වචනය - භාවනා යෝගීන්ට බොහෝ විට හොඳ මුහුණුවරින් පෙනෙන ඒ බාධක තේරුම් ගන්න පුළුවන්; බුදුරජාණන් වහන්සේත් සාරිපුත්ත ස්වාමීන් වහන්සේත් අනුරුද්ධ ස්වාමීන් වහන්සේ සමග කළ සාකච්ඡාවලින්. ඊළඟට උන්වහන්සේලා ධ්‍යාන අභිඥාඥ ආදිය ලබාගෙන ලෝකයාට විශාල සේවයක් ඒවා තුළින් කළ බව පේනවා.

එතකොට මේ බුද්ධ ශාසනයෙහි පරමාර්ථයන්, අපි හිතා බලනවා නම් අධ්‍යාත්ම ශක්තිය දියුණු කර ගැනීමත්, සීල සමාධි ප්‍රඥා කියල තුනක් තියෙනවා. සීලය උපකාර කරගෙන සමාධිය වඩලා, ඊළඟට ඒක උපකාර කරගෙන තමයි ප්‍රඥාව ලබා ගන්න පුළුවන්. දැන් මේ කාලයේ නොයෙකුත් විදියේ කථාන්තර ඇහෙනවා. බණක් ඇසූ පමණින් ඒ මාර්ගඵල ලබාගන්න පුළුවන් කියලා. ඇතැම් තැන් වල සූත්‍ර දේශනා වල අතීත ජීවිත වල ඒවා දියුණු කරගත්ත අය නම් සෝවාන් ඵලය පමණක් නොවෙයි, අරහත් ඵලය පවා ලබාගත්තා, පොඩි බුද්ධ වචනයක් උපකාර කරගෙන. යම් කිසි කෙනෙක් සිතනවා නම්, මේවා දැන් මේ කාලයේ උපකරණ වගේ ක්ෂණිකව ලබාගන්න පුළුවන් කියලා ඒක මුළාවක්. අන්න ඒක නිසා අපි කල්පනා කරන්න ඕන. ශාසනික වටිනාකම් කියන්නේ මේවයි. අපි මේ උපකරණ පාවිච්චි කරන බව ඇත්ත. නමුත් මේවා උපකරණ හැටියටම පාවිච්චි කරනවා මිසක් මේවා අපේ ජීවිතයේ පරමාර්ථ, ඉලක්කයන් කර ගන්න නරකයි.

මේවායින් යම් පිහිටක් අපට ලබාගන්න පුළුවන් නම් අපේ අධ්‍යාත්ම ශක්තිය දියුණු කර ගැනීමට, අන්න ඒකයි අවශ්‍යවන්නේ. ජීවිතයේදී අපි සිවුපසය උපකාර කර ගන්නවා වගේ රහත් වීමට. මේ ප්‍රකාශ කරන වචන මේ යාන්ත්‍රික යුගයේ මේ විදියට උපකරණ ආදිය උපකාර කරගෙනයි මේ පින්වතුන් බණ අහන්නේ. තවත් නොයෙකුත් දේවල් කරනවා. නමුත් ධර්මය සුලබ වීම පමණකින්ම ශාසනය දියුණු වෙනවා කියලා හිතන්න අමාරුයි. ඒ සුලබ වීම නිසාම මේවා නිසරු දේවල්, මේවා වැදගැම්මකට නැති දේවල් හැටියට කෙනෙක් හිතන්න පෙළඹුනොත් ඒක ලොකු මෝඩ කමක්. මේ බුද්ධෝත්පාද කාලය දුර්ලභයි කියලා අපි කීමට කියනවා. ධර්මය දුර්ලභයි කියල කියනවා. නමුත් මේ ධර්මය දුර්ලභ නොවෙයි. දැන් බැලුවහම ඕනෑවටත් වඩා සුලබයි. සාක්කුවේ දාගෙන යන්න පුළුවන් ත්‍රිපිටකය. හිතට අරගන්න, කට පාඩම් කර ගන්න ඕන නැහැ. ඒ වගේ යුගයක්. ඒ වගේම තමයි මේ කාලයේ භාවනා යෝගීන් බලාපොරොත්තු වෙන්නෙත්. මේ මාර්ගඵල කියන එකත් ක්ෂණිකව ලබාගන්නයි. දැන් පලතුරු කඩ බවට පත් වීගන යනවා භාවනා මධ්‍යස්ථාන පවා.

අපි කල්පනා කරන්න ඕන අර අනුරුද්ධ වැනි මහා පින්වන්ත ස්වාමීන් වහන්සේලා පවා, මහා වීර්යයක් දරලයි අර තත්ත්ව ලබා ගත්තේ. ඒ නිසා අපේ ජීවිතවල ඉදිරි වර්ෂයේ හෝ මේ පින්වතුන් කල්පනාවට ගන්න ඕන, සාමාන්‍ය ලෝකයා හිතන ආකාරයට වඩා අපේ නියම පරමාර්ථය කුමක් විය යුතුද කියලා මේ ශාසනයේ. ඒක නිසයි අනුරුද්ධ ස්වාමීන් වහන්සේත් කුකුසක් ඇතිකර ගත්තේ මට දිව්‍ය ලෝකත් පේනවා. මට සමාධියත් තියෙනවා. කෝ තාම නෑ ආශ්‍රවයන්ගෙන් හිත මිදුණේ. ඇත්ත වශයෙන්ම අර්හත්වයයි අපේ ඉලක්කය විය යුත්තේ. අභිඥා පමණක් ලබා ගත්තොත් - හින්දු යෝගීන්ට පවා සමහර විට ඒ ශක්තීන් තිබුණා. අපි අහල තියෙනවා දේවදත්ත ස්ථවිරයනුත් මේ අභිඥා ලබා ගත්තා කියලා. ලෞකික අභිඥා පමණක් මදි. ලෞකික අභිඥා විදර්ශනාත්මක නුවණින් ඒවා හරියට පරිහරණය කරන්ට දැනගන්ට ඕන. චිත්ත ශක්තීන් එහෙම නැත්තම් තමන්ගේ විනාශය - මඟ වරදිනවා. ඒක නිසා තමයි බෞද්ධයින් වශයෙන් ඒ ටිකත් මතක තියාගන්න ඕන. අර කියාපු යෝග භාවනා ආදිය ලොකුවට අරගෙන, එපමණකින් මේ බුද්ධ ශාසනයේ ඇති වටිනාම ජීවය වන නිවන් පරිණිවිධය අමතක නොකර, බුදුරජාණන් වහන්සේ දක්වන මේ සංසාර විමුක්තිය ඉලක්කය හැටියට හිතේ තබාගන්ට ඕන.

ඒකට උපකාර වන අන්දමින් මේ අවස්ථාවේ මේ පින්වතුන් අද දවසේ වටිනා ශීලයක් සමාදන් වුණා. ශීලයේ පිහිටලයි මේ සමාධිය වඩන්න පුළුවන් වෙන්නේ. ඒ ශීලයේ පිහිටලා අපි ඒ සමාධිය

කියල කියන එක සති සමපජඤ්ඤයත් උපකාර කරගෙන, එපමණකින් නවතින්නෙ නැතිව, යම් කිසි සමාධි නිමිත්තක් - දැන් ඒ සමාධි නිමිත්තක් වඩපු බව පැහැදිලි වෙනවා, බුදුරජාණන් වහන්සේ බෝධිසත්තව කාලයේ උත්සාහ කරපු ආකාරයෙන්, අර උපකෙලශ ධර්ම ගැන සඳහන් කරන කොට. අනුරුදධ සවාමීන් වහන්සේ උත්සාහවන්තව භාවනාව සඳහා වීර්යය කළ ආකාරයත් පැහැදිලිව දක්වෙනවා. නමුත් ඇතැම් කෙනෙක් කල්පනා කරනවා ඒවා අනවශ්‍යයි. සතිය විතරක් තිබුණම ඇති. සති සමපජඤ්ඤය විතරක් තිබුණම ඇති කියලා. එපමණක් මදි. එහෙම නම් සමාධිය ගැන කියන්න අවශ්‍යතාවක් නැහැ. නමුත් බුදුරජාණන් වහන්සේ සතිය ළඟට සමාධිය ගැන කියල තියෙනවා. එම නිසා සමපජඤ්ඤය තුළ සමාධිය ලබන ශක්තියක් තියෙනවා. ඒ වගේම උසස් පරමාර්ථත්, විපස්සනාවට හැරෙන පැත්තකුත් තියෙනවා. ඒවා අපි තේරුම් අරගෙන, අවසාන පරමාර්ථය අපේ නිවනය කියන එකත් තේරුම් අරගෙන, තමන්ගේ සංසාරික විශේෂ හැකියාවන් අනුව සමාධිය ඉහළටම වඩලා ඒ උතුම් විමුක්තිය සාක්ෂාත් කරගන්න උත්සාහවත් වෙන්න ඕන. මේ අපි පාවිච්චි කරන ඇසින්, අපට මේ ඇසින් හරියට පේන්නෙ නැත්නම් උපැස් යුවලක් යොදගෙන, තවත් උපකරණ යොදගෙන ඈත බලන්නෙ. නමුත් අර දිවැස දියුණු කරගත් අනුරුදධ සවාමීන් වහන්සේලා වැනි හොඳට ධ්‍යාන ශක්තීන් දියුණු කරපු උත්තමයන් වහන්සේලාට, අර ප්‍රශ්න අහනකොට, ඒ දිව්‍ය ලෝකවල දෙවියන් විතරක් නොවෙයි, ඔවුන්ගේ සිතුම් පැතුම් පවා පේනවා. කොයි තරම් පුදුම ශක්තියක්ද! අතීතයේ ඒ හිටපු සවාමීන් වහන්සේලා රජ, සිටු, කුලවලින් ඇවිල්ලා වීර්යය වඩලා එබඳු ශක්තීන් ලබාගත්ත බව දැනගැනීම මේ යෝගාවචර පින්වතුන්ට ලොකු ධෛර්යයක්. ඊළඟ අවුරුද්දේත් අපි අර කියාපු තාක්ෂණයටම යටවෙලා මේ ක්ෂණ සම්පත්තිය නැති කර ගන්නේ නැතිව, මේ ක්ෂණ සම්පත්තියත් තේරුම් අරගෙන ශීල සමාධි ප්‍රඥා ධර්ම මාර්ගයේ යාමට මේ පින්වතුන් අධිෂ්ඨාන කර ගන්න ඕන.

අද දවසේ තම තමන්ගේ නිවෙස් වලින් ඉවත්වෙලා යම්කිසි ප්‍රමාණයකට නෙකඛම්මය ඇතිකරගෙන මේ පින්වතුන් විවේකයට යොමු වුණා. ඇත්ත වශයෙන් හැම දෙනාටම මහණ වෙන්න බැරි උනත්, හිතන්න නරකයි අපට මේ ධ්‍යාන ආදී ඒ ශක්තීන් ලබාගන්න බැහැ කියලා. විවේක වාසයට පුරුදු වීම තුළින් ආරම්භයේදී ශීලයක පිහිටලා ඊළඟට ඒ තම තමන්ගේ යම්කිසි කමටහනක් නිරන්තරයෙන් වඩනවා නම් ඒක තුළින් අර කියාපු ශක්තීන් දියුණු කර ගන්න පුළුවන්. ඒක තුළින් තමයි මේ මනුෂ්‍යත්වයේ නියම ශක්තියෙන්, බුදුරජාණන් වහන්සේ ගමන් කළ නියම මාර්ගයේ ගමන් කළා කියන්නේ.

අපේ මේ ශීල සමාදානය තුළින් තම තමන්ට හුරු පුරුදු බණ භාවනා ආදිය මේ කාලය තුළ කෙරෙන්ට ඇති. මේ දේශනාවෙන් මේ යෝගාවචර පින්වතුන්ට අනුරුද්ධ ආදී ස්වාමීන් වහන්සේලාගේ ආදර්ශවත් චරිත උපකාර කරගෙන උන්වහන්සේලා ගත්තු වීර්යයෙන් සියයෙන් පංගුවක් හරි තමන් ද ගනිමින්, මේ ධර්ම මාර්ගයේ ගමන් කරමින්, මේ දුර්ලභ බුද්ධොත්පාද කාලයේ දුර්ලභ මනුෂ්‍ය ආත්ම භාවයෙන් ලද හැකි උපරිම ඵලය මේ රහත් චරිතවලින් අපට පෙන්නුම් කරනවා. අන්න ඒ පරමාර්ථය මේ ජීවිතය තුළ ලබා ගැනීමට උත්සාහ කරන්න ඕන. අපට කියන්න සිදු වෙනවා දැන් මේ රටේ නොයෙකුත් තැන්වලින් ආරාධනා තියෙනවා අපිත් එක්ක යන්න ඉන්න. ඔච්චර ඉක්මන් වෙන්නෙ මොකටද, ඊළඟ බස් එකේ යමු කියලා. උදේ වරුවේ ඒ අවස්ථාවේදීත් කිව්වෙ ඒ ආරාධනා පිළිගන්න එපා. එහෙම උනොත් හැමදම පෝලිමේ. ඒක නිසා මේ දුර්ලභ අවස්ථාව තේරුම් ගත්තෙ නැත්නම්, ප්‍රයෝජන ගත්තෙ නැත්නම්, තමන්ට දුක් වෙන්න වෙනවා. මේ මනුෂ්‍ය ආත්ම භාවයෙන් ගිහිල්ලා කොහේ උපදීද දන්නෙ නැහැ; මේ තමන්ගේ හිත. ඒ නිසා තම තමන් නියම ප්‍රයෝජන ගන්න ඕන. අන්න ඒ නිසා මේ තාක්ෂණයේ කෙළවරට යාම නොවේ. තමන්ගේ ඇතුළත තියෙන, නියම ශක්තියෙන්, අධ්‍යාත්ම ශක්තීන් දියුණු කරගෙන ලෝකයාටත් යහපතක් සලසන අතර, තමන්ගේ සංසාරික විමුක්තියත් උදාකර ගැනීමට, මේ අවුරුද්දක් අවසාන වෙලා අවුරුද්දක් ආරම්භ කරන්න සූදනම් වෙන අවස්ථාවේ මේ පින්වතුන් අධිෂ්ඨාන කර ගන්නා ලෙස අපි ඉල්ලා සිටිනවා. ඒ වගේම මේ දේශනාවත් පින්වතුන්ගේ ඒ අනාගත උතුම් ප්‍රාර්ථනා ඉෂ්ට සිද්ධ කරගන්න උපනිශ්‍රය වේවා! හේතු වාසනා වේවා! කියල ප්‍රාර්ථනා කරනවා.

ඒ වගේම අවීචියේ සිට අකනිටා දක්වා යම්තාක් සත්ත්ව කෙනෙක් මේ ධර්ම දේශනාමය කුසලයත් ධර්ම ශ්‍රවණමය කුසලයත් අනුමෝදන් වීමට බලාපොරොත්තු වෙනවා නම්, ඒ අනුමෝදන් වීම තුළින් ඒ බලාපොරොත්තු වන උත්තමාර්ථයන් ඉක්මනින්ම සාක්ෂාත් කර ගනිත්වා කියා බලාපොරොත්තුවෙන් මේ ගාථා කියා පින්දෙන්න.

'එත්තාවතා ච අම්හෙහි...'

# 54 වන දේශනය

# 54 වන දේශනය

(පහන් කණුව ධර්ම දේශනා අංක 203)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

අහො බුද්ධා අහො ධම්මා අහො නො සත්ථු සම්පද
යත්ථ එතාදිසං ධම්මං සාවකො සච්ඡිකාහිසි

අසඞ්ඛෙය්‍යෙසු කප්පෙසු සක්කායාධිගතා අහූ
තෙසමයං පච්ඡිමකො පච්ඡිමො යං සමුස්සයො
ජාතිමරණසංසාරො නත්ථි දානි පුනබ්භවො'ති

සැදැහැවත් පින්වතුනි,

කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ චිත්‍ර කථික ශ්‍රාවක භික්ෂූන් වහන්සේලා අතර එතදග්ග තනතුර බුදුරජාණන් වහන්සේගෙන් ලබා ගත්තු සවාමීන් වහන්සේ නමක්. අවස්ථානුකූල උපමා නිදර්ශන දක්වමින් විචිත්‍ර අන්දමින් ධර්ම දේශනා කිරීමේ හැකියාවයි චිත්‍ර කථික වචනයෙන් හැඟෙන්නේ. අරහත්වය ලැබුවට පස්සෙ ඒ කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ රත්නත්‍රයේ ගුණ අගය කරමින් වදාළ හැටියට, ථෙරගාථා පාළියේ සඳහන් වෙන ගාථා දෙකකුයි අද අපි මාතෘකා ලෙස ඉදිරිපත් කර ගත්තේ. මේ ගාථාවේ 'අහෝ' කියන නිපාත පදය යෙදිල තියෙන්නේ ආශ්චර්යය හඟවන අර්ථයෙන්. අහෝ! බුදුරජාණන් වහන්සේලා කෙතරම් ආශ්චර්යවත්ද? අහෝ! උන්වහන්සේලාගේ ධර්මය කෙතරම් ආශ්චර්යවත්ද? අහෝ! අපට ලැබී ඇති ශාස්තෘ සම්පත්තිය කෙතරම් ආශ්චර්යවත්ද? යම්බඳු ශාස්තෘ සම්පත්තියක් තුළ යම්බඳු ශාසන බ්‍රහමචරියාවක් තුළ මෙබඳු ධර්මයක් ශ්‍රාවකයන් වහන්සේ නමක් ශ්‍රාවක කෙනෙක් සාක්ෂාත් කරන්නේද අන්න එබඳු ශාස්තෘ සම්පත්තිය කෙතරම් ආශ්චර්යවත්ද?'. ඊළඟ ගාථාවේ කියන්නේ අසංඛ්‍ය ගණන් කල්ප වල සක්කාය නම් වූ පඤ්චඋපාදානස්කන්ධ මට ලැබිල තියෙනවා, පහළවෙලා තියෙනවා. ඒවායින් මේ අවසාන පඤ්චඋපාදානස්කන්ධයයි. අවසාන සක්කායයි. මේ අන්තිම ශරීරයයි. ජාති මරණ සංසාරයක් නැවත භවයක් නැත. ඔන්න ඒ ගාථා දෙකෙහි අදහස.

මේ ගාථා දෙක තුළින් කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ තමන් වහන්සේගේ ප්‍රත්‍යක්ෂය නිදර්ශනය කරගෙන ඒ රත්නත්‍රයේ ගුණ අගය කරල තියෙනවා ඉතාම ලස්සනට. කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේගේ ඒ විචිත්‍ර කථිකත්වය වගේම උන්වහන්සේගේ ජීවිත ප්‍රවෘත්තියෙත් යම් යම් විචිත්‍ර ලක්ෂණ තියෙනවා. ඔය අපදාන පාළිය ආදී ග්‍රන්ථවල සඳහන් වෙන හැටියට ඒතදග්ග තනතුර ලැබූ අනෙක්

ස්වාමීන් වහන්සේලා වගේම මේ කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේත් අතීත බුද්ධ ශාසනවල ඒ තත්ත්වය පතාගෙන දීර්ඝ කාලයක් පාරමී ධර්ම පිරූ කෙනෙක් හැටියටත්, අපේ බුදුරජාණන් වහන්සේගේ කාලයේ රජගහ නුවර සිටු දියණියකගේ පුත්‍රයෙක් හැටියට උපන් බවත් සඳහන් වෙනවා. ඒ උත්පත්තිය පිළිබඳව මෙහෙමයි සඳහන් වෙන්නේ.

ඒ සිටු දියණිය මහණ වීමට ලොකුම ඕනෑ කමක් ඇතිව භික්ෂුණියක් වෙන්න මව් පියන්ගෙන් අවසර ඉල්ලූ නමුත් අවසර දුන්නේ නැහැ. ඒ වෙනුවට යම් කිසි කෙනකුට පාවා දුන්නා. පාවා දීල වැඩි කලක් යන්න කලින් ඒ සිටු දියණිය ස්වාමි පුරුෂයාගෙන් අවසර ලබාගෙන මෙහෙණි සස්නෙ පැවිදි වුණා. නමුත් ඒ වනවිට ඇය ගර්භනීව සිටි බව ඇය දැනගෙන සිටියේ නැහැ. දරු ගැබ මෝරනකොට ඒ භික්ෂුණීන් වහන්සේලා ඇය ගැන සැක කරලා දේවදත්ත ස්ථවිරයන්ට මේ ගැන දැන්වූවා. දේවදත්ත ස්ථවිරයන් කිව්වා මේ භික්ෂුණියගේ සිවුර අරවන්නය කියලා. නමුත් ඒ කුමාර කාශ්‍යප මාතාවය කියල කියමු ඒ භික්ෂුණිය, බුදුරජාණන් වහන්සේ ළඟට මේක යොමු කරන්න සැලැස්සුවහම බුදුරජාණන් වහන්සේ විනයධර භික්ෂූන් වහන්සේලා අතර අග්‍ර උපාලි ස්ථවිරයන් වහන්සේට පැවරුවා මේ ප්‍රශ්නය විසඳන්න. උපාලි රහතන් වහන්සේ, සැවැත් නුවර වාසීනුත් විශාඛා මහා උපාසිකාවනුත් කැඳවලා රජු සහිත පිරිසක් මැද තිරයක් බැඳ, විශාඛාව ලවා මේ භික්ෂුණිය පරීක්ෂා කරන්න සලස්වලා නිගමනය කළා ඒ ගැබ ගිහි කාලයේ පිහිටි එකක්ය, ඇය නිර්දෝෂීය කියලා. නිසි කාලයේ දී මෙහෙණ ආරාමයේදීම මේ දරුවා බිහි වුණා. පසේනදී කොසොල් රජ්ජුරුවෝ, මේ දරුවා ඇති දැඩි කිරීම භික්ෂුණීන් වහන්සේලාට පලිබෝධයක්ය කරදරයක්ය කියලා පසේනදී කොසොල් රජ්ජුරුවෝ භාර ගත්තා මේ දරුවා ඇති දැඩි කරන්න. ඒක නිසා කුමාර කාශ්‍යප නම ලැබුණා කියල කියනවා. ඒ වගේම මේ කුමාරයා අවුරුදු හතේදීම පැවිදි බිමට පත් වුණා.

උන්වහන්සේ සම්බන්ධයෙන් ත්‍රිපිටක සාහිත්‍යයේ සඳහන් වෙන වැදගත්ම සූත්‍රයක් තිබෙනවා 'වම්මික සූත්‍රය' කියලා මැදුම් සඟියේ. ඇත්ත වශයෙන් ඒක උන්වහන්සේගේ දේශනාවක් නොවේ. එතන තියෙන්නේ ඒ කුමාර කාශ්‍යප ස්වාමීන් වහන්සේ එතකොට රහත් වෙලත් නැහැ. එක දවසක් අන්ධ වනයේ රාත්‍රි කාලයේ භාවනා කරන අතරේ දේවතාවෙක් ඇවිල්ලා මහා ගැඹුරු ප්‍රහේලිකා විදියේ ප්‍රශ්න පහළොවක්, හුඹහක් පිළිබඳව උපමා රූපකාර්ථවත් මහ ගැඹුරු ප්‍රශ්න පහළොවක්, උන්වහන්සේට ඉදිරිපත් කළා. මේ ප්‍රශ්නවලට වෙන

කෙනෙකුට මේ ලෝක ධාතුවේ උත්තර දෙන්න බැහැ. බුදුරජාණන් වහන්සේට විතරයි උත්තර දෙන්න පුළුවන්, ගිහිල්ලා බුදුරජාණන් වහන්සේගෙන් අහන්න කිව්වා. ඒ වගේම කුමාර කාශ්‍යප සවාමීන් වහන්සේ ඒ ප්‍රශ්න ඇහැව්වහම බුදුරජාණන් වහන්සේ දීපු විවරණය තමයි වම්මික සූත්‍රයේ සඳහන් වෙන්නේ. අපදන පාළියේ කියවෙන හැටියට බුදුරජාණන් වහන්සේගේ ඒ ගැඹුරු විවරණය උපකාර වුණා, කුමාර කාශ්‍යප සවාමීන් වහන්සේට රහත් වෙන්න.

මේ චිත්‍ත කථික වශයෙන් එතදගග තනතුර ලැබූ නමුත් අපට දක්නට ලැබෙන මේ සූත්‍ර දේශනා අතර කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේගේ චිත්‍ත කථික බව හෙළිවෙන එකම සූත්‍රය දීඝ නිකායේ පායාසි සූත්‍රයයි. එය ඉතාම දිග සූත්‍රයක්. උපමා කතා රාශියක් තියෙන සූත්‍රයක්. අපි ඒකෙන් මේ වෙලාවට ගැලපෙන උපමා කීපයක් විතරක් එළියට ගන්න බලමු. මෙහෙමයි ඒ කථාන්තරය සඳහන් වෙන්නේ. මේ පායාසි සූත්‍රය උගතුන්ගේ මතයට අනුව සමබුදධ පරිනිර්වාණයෙන් පස්සේ දේශනා කළ සූත්‍රයක් බවයි පෙනෙන්නෙ. එතකොට ඒ කාලෙ වෙනකොට මේ කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ වයෝවෘදධ ගරු කටයුතු තත්තවයක හිටල තියෙනවා. මෙහෙමයි සඳහන් වෙන්නේ. කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ එක් අවසථාවක පන්සියයක් සඟ පිරිස පිරිවරාගෙන කොසොල් රටේ චාරිකාවේ වැඩම කරන අතරේ සේතව්‍යා නුවරට වැඩම කරලා එම නුවරට උතුරින් පිහිටි 'සිංසපා වන' කියන ඇට්ටේරියා වනයක ලැගුම් ගත්තා. නවාතැන් ගත්තා. ඊළඟට මේ සේතව්‍යා නුවර ගැන කියවෙනවා පොතේ මෙහෙම.

සේතව්‍යා නගරයට අධිපතිව සිටියේ පායාසි රාජඤ්ඤ නමින් පසේනදී කොසොල් රජ්ජුරුවෝ පත් කළ ප්‍රාදේශීය පාලකයෙක්. රජෙක් නොවෙයි රාජඤ්ඤ නමින් හැඳින්වෙනවා. ඒ පාලකයා පිළිබඳ විශේෂ වශයෙන් සඳහන් වෙන්නේ මෙහෙමයි. ඒ පාලකයා මහා බරපතල මිථ්‍යා දෘෂටියක් දැඩිව ගත්ත කෙනෙක්. මොකක්ද එයා දැඩිව ගත්ත දෘෂටිය. පරලොවක් නැත. ඕපපාතික වශයෙන් උපදින සත්ත්වයින් නැත. හොඳ නරක කර්මවල විපාක නැත, කියලා මහා භයානක පාපී දෘෂටියක් අරගෙන සිටිය කෙනෙක් ඔය පායාසි රාජඤ්ඤයා. ඉතින් ඊළඟට මෙහෙමයි සඳහන් වෙන්නේ. අර කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ වැඩියාය කියන ප්‍රවෘත්තිය පැතිර ගියාම - ඒ සේතව්‍යා නුවර - මෙන්න මෙහෙම පණ්ඩිත, ව්‍යකත, මේධාවි, චිත්‍ත කථික, වයෝවෘදධ මහ රහතන් වහන්සේ නමක් වැඩල ඉන්නවා කියලා. උන්වහන්සේ පිළිබඳ කීර්ති රාවය පැතිර ගිහිල්ලා - සේතව්‍යා නගර වාසීන් පිරිස් හැදිලා උන්වහන්සේ දැකීමට ඒ සිංසපා වනයට යන අතරේ, ඒක දැක්කා අර පායාසි රාජඤ්ඤයා දවල්

කාලයේ විවේක ගන්න අවස්ථාවේ. ඒ පිරිස යනව දැකලා තමන්ගේ දොරටුපාලයාගෙන් ඇහුවා 'කොහෙද මේ පිරිස යන්නෙ' කියලා. ඒ දොරටුපාලයා කිව්වා මෙන්න මෙහෙම. 'කුමාර කාශ්‍යප කියලා ස්වාමීන් වහන්සේ නමක් වැඩලා පිරිස යනවා' කියලා. එතකොට පායාසි රාජඤ්ඤයා අර සේවකයන්ට කියනවා 'එහෙනම් ගිහිල්ලා ඒ පිරිසට කියන්න, මේ පායාසි රාජඤ්ඤයාත් එනකම් යන්න එපා. මමත් එනවා ඕගොල්ලො එක්ක යන්න. අර ශ්‍රමණයා පරලොවක් ඇත, ඕපපාතික සත්ත්වයන් ඇත, හොඳ නරක කර්මවල විපාක ඇත කියලා බොරු ප්‍රචාරයක් කරලා මෝඩ බමුණන් රවට්ටන්න කලින් මමත් යන්න ඕන' කියලා. ඔන්න එහෙම ගියා.

ඒ රාජඤ්ඤයා අර පිරිසත් එක්කම ගිහිල්ලා කුමාර කාශ්‍යප ස්වාමීන් වහන්සේ එක්ක සතුටු සාමීචි කරලා ඊළඟට කෙලින්ම කිව්වේ තමන්ගේ දෘෂ්ටිය. 'මගේ මතය කස්සපය, මගේ මතය මේකයි. පරලොවක් නැත. ඕපපාතික වශයෙන් උපදින සත්ත්වයින් නැත. හොඳ නරක කර්මවල විපාක නැත.' එතකොට කුමාර කාශ්‍යප ස්වාමීන් වහන්සේ වදාරණවා 'මෙහෙම දෘෂ්ටියක් මම නම් අහල නැහැ. මේක නම් මහ වැරදි දෘෂ්ටියක්' කියලා. ඉස්සෙල්ලාම ඇහැව්වේ 'මේ ඉර හඳ කියන දේවල් මේ ලෝකෙට අයිති දේවල්ද?' කියලා. එතකොට කියනවා 'මේ ලෝකෙට නොවෙයි, ඒවා ඇත දිව්‍ය ඉහළ ලෝකයට අයිතියි' කියලා පිළිගන්නවා. එතකොට අහනවා, 'මොකද ඔබ මෙහෙම දෘෂ්ටියක් ගත්තේ' කියලා. ඔන්න එතන ඉඳලා මහා දීර්ඝ සාකච්ඡාවක් යනවා. කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේගේ ඉවසීමේ ශක්තියත්, ඒ විචිත්‍ර ප්‍රතිභානයත් හෙළිවන දීර්ඝ කථා.

සමහර උපමා කථා හරිම දිගයි. ඔන්න මෙහෙමයි ආරම්භ වෙන්නේ. 'මොකද මෙහෙම දෘෂ්ටියක්, මේ විදියේ වැරදි අදහසක් ගත්තේ' කියා අහනවා. ඒකට පායාසි රාජඤ්ඤයා කියනවා එයා කරපු පර්යේෂණ වගේ දේවල්. ඔහු කියනවා 'මගේ හිත මිත්‍ර ඥාතීන් ඉන්නවා ඔය දස අකුසල්ම කරන. ප්‍රාණඝාත, අදින්නාදාන, ආදී අකුසල්ම කරන මගේ ඥාති හිත මිත්‍රයින් ගිලන් වෙලා මිය යන්න ආසන්න අවස්ථාවේ, මම ළඟට ගිහිල්ලා ඒ ගොල්ලන්ට කියනවා, ඔය ගොල්ලො මැරිලා ගිහිල්ලා නිරයේ එහෙම උපන්නොත්, මට ඇවිල්ල කියන්න පරලොවක් තියෙනවාය කියලා. මම එහෙම කිව්වට මොකද කවුරුවත් තවම මට ඇවිල්ල කිව්වෙ නැත පරලොවක් තියෙනවාය කියලා.' අන්න ඒක අනුවයි මේ පායාසි රාජඤ්ඤයා කියන්නේ පරලොවක් නැත කියලා. ඒකට කාශ්‍යප ස්වාමීන් වහන්සේ දෙන උපමාව මෙහෙමයි. 'දැන් රාජඤ්ඤය ඔබ, අපි හිතමු රාජපුරුෂයෙක්ය කියලා. ඒ වගේ සේවකයො කවුරු හරි ඔය වැරැද්දක් කළ අපරාධ කාරයෙක්

අල්ලගෙන එනවා දඬුවම් පමුණුවන්න මේ මනුෂ්‍යයාට කියලා. එතකොට ඔබ දඬුවම හැටියට දෙනවා 'මෙයාව රැහැණකින් බැඳලා, වද බෙර ගහමින් ගිහිල්ලා, නගරයේ දකුණු දිසාවේ මිනිසුන් මරණ තැන තියලා, බෙල්ල කපල මරන්නය' කියලා. එහෙම කිව්වහම අර වධකයෝ මේ පුරුෂයාව බැඳගෙන ගිහිල්ලා, හිස ගසාලන්න ඉඳගත්තහම, අර පුරුෂයාට කියන්න පුළුවන්ද ඒ වධකයින්ට, ටිකක් ඉන්න මම මගේ ඥාතීන්ගෙන් මිත්‍රයින්ගෙන් අවසර, සමු අරගෙන එනකම් කියලා?' 'එහෙම බැහැ' කියනවා. එතකොට කියනවා 'රාජඤ්ඤය, මනුෂ්‍ය වූ ඒ හොරාට ඒ චෝර ඝාතකයින්ගෙන් අවසර ලැබෙන්නෙ නැත්නම් නිරයට ගියාට පස්සෙ නිරය පල්ලන්ගෙන් අවසර ලබා ගන්න පුළුවන්ද? මේ රාජඤ්ඤයාට මේ කාරණය කියනකම් ඉන්නය කියලා.' එතකොට 'බැරිය' කියලා කිව්වා. රාජඤ්ඤ කියනවා 'ඒ වුණාට ස්වාමීනි මම මගේ දෘෂ්ටියේ පිහිටලා ඉන්නවා කියලා.'

නැවතත් ඒකට තව හේතුවක් කියනවා. ඒ විදියටමයි යන්නේ. 'ඒ දස අකුසල්නෙ. දස කුසල් කරන ප්‍රාණඝාත ආදියෙන් වැළකී සිටින මගේ හිත මිත්‍රාදීන් ළඟට ගිහිල්ලා ඒත් මරණ අවස්ථාවේ දී මම කියනවා ඕගොල්ලො දිව්‍ය ලෝකෙ උපන්නොත් ඇවිල්ලා මට කියන්න.' අර විදියටම හිතාගන්න මේ පින්වතුන්. 'ඒ අය කවුරුත් මෙතෙක් ආවෙ නැත.' මම එහෙම කිව්වට මට පණිවිඩය දෙන්න.' එතකොට කාශ්‍යප ස්වාමීන් වහන්සේ කියන්නේ 'අශූචි වළක වැටුණු මිනිසකු ඒකෙන් ගොඩ අරගෙන නාවලා හෝදලා ගත්තට පස්සේ ආයෙ අශූචි වළට යන්නෙ නැතුව වගේ, මේ මනුෂ්‍ය ලෝකයෙන් ගිහිල්ලා, දිව්‍ය ලෝකෙ දිව්‍ය සම්පත් විඳින කෙනා මනුෂ්‍ය ලෝකෙට ඇවිල්ලා, රාජඤ්ඤට ඕක කියන්න වෙහෙසෙන්නෙ නැහැ' කියලා. ඒකටම අදාළ තවත් එකක්, අර රාජඤ්ඤයා කියනවා 'ශ්‍රමණ බ්‍රාහමණයින්ම කියනවය පඤ්චශීලය හරියට රැක්කොත් තව්තිසා දිව්‍ය ලෝකෙ යනවය කියල. එබඳු අයටත් මම කියනවා පඤ්චශීලය හරියට රකින නිසා තව්තිසා දිව්‍ය ලෝකයේ උපන්නොත් ඇවිල්ලා කියන්න කියලා. එතනදිත් ඒ කවුරුවත් ඇවිල්ල කියන්නෙ නැහැ' කිව්වහම කාශ්‍යප ස්වාමීන් වහන්සේ තව්තිසා දෙව්ලොව ආයුෂ පිළිබඳව කියනවා. 'මනුෂ්‍ය ලෝකයේ වර්ෂ සියයක් ඒ දිව්‍ය ලෝකයේ එක දවසයි. එතකොට ඒ දිව්‍ය ලෝකයේ උපන්නට පස්සේ කෙනෙක් ඔය කියාපු පණිවිඩය ඉෂට කරන්න දැන් දවසක් දෙකක් සැප විඳල එනව කියල හිතුවොත්, මේ මනුෂ්‍ය ලෝකයේ එතකොට ඔබ ජීවත්ව ඉන්නවද නැද්ද' කියල කියනවා. එයටත් උත්තර දෙනවා.

ඊළඟට තව මෙයා කරපු පර්යේෂණයක් කියනවා. කොටින්ම කියතොත් පින්වතුනි, හොඳට කල්පනා කරල බලන්න, දැන් මේ කාලෙ භෞතික විද්‍යාඥයින් ඒ කාලයට වඩා දියුණු යන්ත්‍ර සූත්‍ර ආදියෙන් සිතේ ක්‍රියාකාරිත්වය දැනගන්න කරන පර්යේෂණවල ආදි පුරුෂයා වගේ, මේ පායාසි රාජඤ්ඤයා. ඔන්න ඊළඟට කියන එකෙන් තේරුම් ගන්න. මේ අවස්ථාවේදී පායාසි රාජඤ්ඤයා තමා කරපු පර්යේෂණයකුත් ඒකෙ ප්‍රතිඵලත් කියනවා. 'මා ළඟට අර වගේ අපරාධකාරයෙක් ගෙනාවහම මම ඒ මිනිස්සුන්ට කියනවා, ඒ පුරුෂයා මහ හැලියක දාල වහල, දැඩි හමකින් ඒ මුව විට වහලා, මැටිවලිනුත් ඒ මුව විට හොඳට වහලා, උදුනක තියල ගිනි දල්වන්න කියලා. අර පුරුෂයා මැරෙන වෙලාව වෙනකොට මම හිමිහිට ඇරල බලනවා මේ හැලියෙන් ජීවය පිටවෙනවද කියලා. එහෙම කළාට මොකද ඒ පර්යේෂණයේ ප්‍රතිඵලය ලෙස මට නම් පේන්නෙ නැහැ ජීවයක් පිට වෙනවා.' ඕක හරි මෝඩ පර්යේෂණයක්.

කාශ්‍යප ස්වාමීන් වහන්සේ මේකට දෙන පිළිතුර ටිකක් හිතල බලන්න වටිනවා. උන්වහන්සේ අහනවා 'රාජඤ්ඤ, ඔබට මතකද ඔබ දවල් කාලයේ නින්දට ගිහිල්ලා - ඇත්ත වශයෙන් දවල්ට වුණත් හීන පේනවනෙ - හීනෙන් ඔබට පේනව නේද ලස්සන රමණීය පොකුණු, උයන්වතුවලට හෙම ගිහිල්ලා සිටින අවස්ථාවන්. ඔබට මතකද?' 'ඔව්' කියල කියනවා. 'අන්න එබඳු අවස්ථාවල ඔබට ආරක්ෂාවට ඉන්න ඒ පරිවාර සත්‍රීන් වැනි කට්ටිය ඉන්නව නම්, ඒ අයට පේනවද ඔබේ ජීවය යනවා, ඔබේ හිත යනවා.' 'නෑ' කියනවා. ඉන් අපට යමක් හිතා ගන්න පුළුවන් එතකොට. කාශ්‍යප ස්වාමීන් වහන්සේ කියනවා 'ජීවමාන ඔබේ හිත ගමන් කරන ආකාරය ඒ අයට පේන්නෙ නැත්නම්, මරණ අවස්ථාවේ හිත යන හැටි කොහොමද දැනගන්නේ.' ඉතින් එහෙම කිව්වට මොකද සෑහෙන පර්යේෂණ ගොඩක් කරපු කෙනෙක්, මේ රාජඤ්ඤ. කොටින්ම කියතොත් පර්යේෂණ කරපු භෞතික විද්‍යාඥයින් අතර ආදි පුරුෂයා යයි කියන්න පුළුවන්.

ඔන්න ඊළඟට කියනවා 'මම ඇතැම් අවස්ථාවල අර විදියේ වධයට කැප කරපු කෙනෙක් මරන්න කලින් තරාදියක තියලා කිරල බලනවා. ඊළඟට එයා මැරුණට පස්සෙ කිරල බලනවා. මැරුණට පස්සෙ කිරල බැලුවහම කලින්ට වැඩිය බරයි. ජීවය ගියානම් බර අඩු වෙන්න එපායැ.' ඔන්න ඕකයි තර්කය. එතකොට කාශ්‍යප ස්වාමීන් වහන්සේ අහනවා, 'රාජඤ්ඤය, එහෙනම් මේ ප්‍රශ්නයට උත්තර දෙන්න. යකඩ ගුලියක් මුලු දවසක් තිස්සේ රත් කළාට පස්සේ කිරල බැලුවහම ඒක සැහැල්ලු නේද? ඒක හොඳට නිවුණහම ඒක හොඳට බර නේද?' එතකොට රාජඤ්ඤයාත් කියනවා 'එහෙම තමයි. අර

තේජෝ ධාතුවත් වායෝ ධාතුවත් එකතුවෙලා ක්‍රියාත්මක වෙන අවස්ථාවේ, යකඩ ගුලිය සැහැල්ලුයි. ඒවා සංසිඳුන වෙලාවට බරයි.' 'අන්න ඒ වගේ' කාශ්‍යප ස්වාමීන් වහන්සේ කියනවා, 'මේ ශරීරයේ ආයුෂයත් උෂ්ණයත් විඤ්ඤාණයත් 'ආයු උස්මා විඤ්ඤාණ' තියෙන තාක් ශරීරය සැහැල්ලුයි. මිය ගියාට පස්සේ ඒක දරදඬුයි. බරයි.' ඔන්න ඒ විදියට ඒකට උත්තර දෙනවා. ඔහොම නා නා විධ පර්යේෂණ.

තවත් සමහර ඒවා හරි හාස්‍ය ජනකයි. ඔහු කියනවා 'මේ ශීලවන්ත අය මිය ගියාට පස්සෙ දිව්‍ය ලෝක ආදී තැන් වල යනව නම්, ඇයි ඒ අය තමන්ගෙ ජීවිතය ආරක්ෂා කර ගන්නෙ? ඊට කලින් විෂ කාල හරි මැරෙන්න පුළුවන්නෙ. ඊළඟට ගිහිල්ල උපදින්නෙ හොඳ තැනක බව දන්නවා නම්. මට පේන්නෙ නැහැ කවුරුවත් එහෙම කරන බව.' එතෙන්දි කාශ්‍යප ස්වාමීන් වහන්සේ අමුතු උපමාවක් දෙනවා. මෙහෙමයි කියවෙන්නෙ. උපමා කථානෙ මේවා. ඇත්ත දේවල් හෝ වේවා මෙහෙම කියනවා. එක්තරා බමුණකුට භාර්යාවන් දෙන්නෙක් හිටියය. එයින් එක භාර්යාවකගේ දරුවකුට අවුරුදු දහයක් දොළහක් වෙලාය. අනික් භාර්යාව දරුවෙක් ලබන්න ඉඳිද්දී බ්‍රාහමණයා කාළක්‍රියා කළාය. අවුරුදු දහයක දොළහක අර කොල්ලා කියනවලු පුංචි අම්මට 'දැන් ඉතින් මේ වස්තු සම්භාරය මේ තාත්තගේ, ඒවා මටයි අයිති. ඔයාට නොවෙයි. ඒ නිසා මට පවරලා දෙන්න.' කියලා. එතකොට මේ ස්ත්‍රිය කියනවා, 'ටිකක් ඉන්න මට මේ දරුවා ලැබෙන කල්. මේ දරුවා පිරිමියෙක් වුණොත්, ඒ දරුවටත් අයිති වෙනවා කොටසක්. ගැහැණියක් වුණොත් ඔබට පවරා දෙනවා' කියලා. නැවත නැවත අර ළමයා හිරිහැර කරනවා. පස්සෙ මේ ස්ත්‍රිය, ඒ කාලෙ මේ කාලෙ වගේ තිබුණෙ නැහැනෙ උපකරණ ආදිය දරුවකුගේ තත්තවය කුසේ ඉඳිද්දී කියන්න. එහෙම නැත්නම් උප්පත්තිය දැන් මේ කාලේ බොහෝ දෙනා කරන්න වගේ ඉක්මන් කරන ක්‍රමත් නැහැනෙ. මේ තැනැත්තිය කළේ මොකක්ද, පිහියකුත් අරගෙන කාමරේකට ගිහිල්ල, අර දරුවා ඉක්මනින් උපද්දවා ගන්න, යම්කිසි සැත්කමක් කරල, ඒකෙන්ම මරණයට පත් වුණා. ඒ උපමාව දීල කාශ්‍යප ස්වාමීන් වහන්සේ කියනවා 'අන්න ඒ වගේ සිල්වතුන් ජීවිතය නොපැසූ - ඒ කියන්නෙ තව යන්න තියෙද්දී, ඒක අකාලයේ නැති කර ගන්නෙ නැත. ඒ දරුවා හම්බවෙන්න කලින් උපද්දවාගන්න යනවා වගේ වැඩක්ය, සුගතිය බලාපොරොත්තුවෙන් දිවි නසා ගැනීම.' ඒකයි ඒකෙ අදහස.

ඒ විදියට උපමා දෙනවා දෙනවා. නමුත් මේ පුද්ගලයා - රාජඤ්ඤයා කියනව තව තවත් ඔය විදියට කාරණා කෙළවරක් නැතිව. කියාගෙන ගිහිල්ලා යම් අවස්ථාවක කියනවා, යම් ප්‍රමාණයකට ඒත්තු ගියාට පස්සේ, 'මම දැන් මගේ මේ මතය අහක් කළොත්, පසේනදී කොසොල් රජ්ජුරුවෝ ආදී හුඟක් අයත්, අසල්වාසී රටවල කට්ටියත් දන්නවා, රාජඤ්ඤයාගේ මේ විදියේ දෘෂ්ටියක් තියෙනවා කියලා. මම ඒ දෘෂ්ටිය ඉවත් කළොත්, අනිත් අයගෙන් මට එක එක විදියේ චෝදනා එල්ල විය හැකියි. එහෙම නැත්නම් ඒ අය මාව හෙළා දකිනවා. මෙච්චර කාලයක් මම මෝඩ කමක් කළයි කියලා.' මේක තේරුම් ගියාට පස්සෙත්, ඒත්තු ගියාට පස්සෙත්, රාජඤ්ඤයා කැමති නැහැ මාන්නය නිසා මේක අතහරින්න. අන්න ඒ අවස්ථාවේ කුමාර කාශ්‍යප රහතන් වහන්සේ මහා උපමා ගොඩක් කියනවා. ඒ ඔක්කොම කියාගෙන ගියොත් මහ දිග විස්තරයක්. මේ මම කියන්නේ අත්‍යවශ්‍ය ටික විතරයි. ඔන්න ඒ අවස්ථාවේ කියනවා 'මම මේක අතහරින්නෙ නැත්තෙ ඒත්තු නොගිය නිසා නොවෙයි, ලැජ්ජාව නිසයි. මෙච්චර කාලයක් මම අරගෙන ආපු දෘෂ්ටිය' කියල කිව්වහම කාශ්‍යප ස්වාමීන් වහන්සේ දුන්න උපමාව අපි කාටත් මතක තියාගන්න වටිනා හොඳ කථාවක්.

මේ පින්වතුන් අහලත් ඇති. උන්වහන්සේ කියනවා, 'රාජඤ්ඤය, එක්තරා ජනපදයක මිනිස්සු ඒ ජනපදය අතහැරල ගියා. එතකොට දැන් ශූන්‍ය ජනපදයක්, පාළු ජනපදයක්. ඒ කිට්ටුව මොකක් හරි වෙන ජනපදයක යාළුවෝ දෙන්නෙක් කථා කර ගත්තා. 'අපි යමු ඒ පාළු ජනපදයට. යමක්, ධනයක් එකතු කර ගන්න.' ඔන්න ඊළඟට දෙදෙනා ගමන් අරඹලා ඉස්සෙල්ලම ගිය ගමේ තියෙනවා, හණවැහැරි - හණ හුඟක් වීසි කරල දාල තියෙනවා. මේ යාළුවෝ දෙන්නා 'අපි එහෙනම් හණමිටි බැඳ ගනිමු' කියලා දෙන්නා හණමිටි දෙකක් බැඳ ගත්තා. බැඳගෙන තව ඉස්සරහට යනකොට ඊළඟ ගමේ තියෙනවා හණ නූල්. එක යහළුවෙක් කියනවා 'අපි මේ හණ වැහැරි එකතු කරගෙන යන්නෙ මොකටද? නූල්නෙ වැදගත් වෙන්නෙ. අපි මේ හණ ටික වීසි කරල නූල් ටික ගනිමු' කියලා. නමුත් අනික් යාළුවා කියන්නේ මොකක්ද, 'මම මේ හණමිටි හුඟක් දුර අරගෙන ඇවිල්ල තියෙනවා. මේ හණ මිටි හොඳට බැඳල තියෙනවා. මට ඒක අතහරින්න බැහැ.' ඒක නිසා ඒ යාළුවා හණ මිටිය එහෙමම අරගෙන ගියා. අනික් යාළුවා හණ නූල් මිටියක් බැඳගෙන ගියා. තව ඉස්සරහට යනකොට තියෙනවා හණරෙදි, ගෝනි කියල කියන්නෙ. හණ නූල් වීසි කරල දාල අර යාළුවා කියනවා 'යාළුවේ වටිනා දෙයක් ගෙනිච්චහම

අපට ප්‍රයෝජනවත්නෙ.' එයා හණ නූල් ඉවත් කරලා හණ රෙදි මිටියක් බැඳ ගත්තා. අනික් එක්කෙනා කරගහගත්තු හණ මිටිය එහෙමමයි. ඔහොම ඔහොම යනව දිගට කථාව. අපි කෙටි කළොත්, ඔන්න ඊළඟට යන ගමේ එක තැනක කපු තියෙනවා, ඊළඟට කපු නූල් තියෙනවා. ඊළඟට කපු රෙදි තියෙනවා. එහෙම හිතා ගන්න. ඔය හැම තැනකදීම අර ඥානවන්ත එක්කෙනා පරණ මිටිය අත හැරලා අලුත් වටිනා දේ අල්ල ගත්තා.

ඊළඟට ඈත යනකොට ලෝහ, පරණ යකඩ, අතහැරපුව තියෙනවා. පරණ යකඩ වුණත් වටිනවනෙ. කොහොමත් යකඩත් තියෙනවා. ඊළඟට ඊයම්, තඹ, ඔහොම ඔහොම ක්‍රම ක්‍රමයෙන් වටිනා දේවල් ලැයිස්තුවක් තියෙනවා. ඊළඟට රිදී. රිදීත් අතහැරල දල තියෙනවා. මේ උපමාවටනෙ කියන්නෙ. එතකොට ඒවත් අර එක යහළුවෙක්, ඥානවන්ත එක්කෙනා, රිදී මිටිය බැඳ ගත්තා. අරය තවම පරණ හණ මිටියමයි. අන්තිමට එන තැන රත්‍රන් අතහැරල තියෙනවා. ඕව එකතු කර ගත්තා අර ඥානවන්ත යහළුවා. අනිත් එක්කෙනා ගත්තු හණමිටිය එහෙමමයි. අන්තිමට මේ දෙන්නා තමන්ගේ ගමට ආපහු ගියා. ගියහම අර රත්තරන් මිටිය බැඳගත්තු කෙනාගෙ ගෙදර කට්ටිය හරි සතුටු වුණා. නෑයො මව්පියො ඔක්කොම සතුටුයි. පරණ හණ මිටිය කරගහගත්තු ගෙදර කට්ටිය බොහොම දුර්මුඛ වුණා. ඒ වගේ රාජඤ්ඤ ඔබත් මේ හණ මිටිය කරගහගෙන ඉන්නෙ' කියල කිව්වහම, එතෙන්දි තමයි පායාසි රාජඤ්ඤ කියන්නේ, 'ස්වාමීනි, මට මේ මුල් උපමා කීපයක් අහනකොටත් මට තේරුණා. නමුත් ඔබවහන්සේගේ විචිත්‍ර පටිභානය දැනගන්න මම බොරුවට මේ තව තව විරුද්ධ බව පෙන්නුවා කියලා. ඊට පස්සෙ රාජඤ්ඤයා කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ ළඟ, ඒ අර වෙන තැන් වලත් කියනව වගේ, 'අභික්කන්තං භන්තෙ' ආදී වශයෙන් විශිෂ්ටයි, අති විශිෂ්ටයි කියලා තුණුරුවන් සරණ ගිහිල්ලා, දිවි හිමි තාක් මම උපාසකයෙක් වෙනවා කිව්වා.

තව දුරටත් කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේට කියනවා 'ස්වාමීනි, මම කැමතියි ලොකු දානයක් දෙන්න. ඔය පළවෙනි වරට, දන් දෙන හැටි මෙච්චර කාලයක් හිතුවෙත් නැති මිනිහෙක් මම. ලොකු දානයක් දෙන්න කැමතියි. මට ඒක ගැන අනුශාසනා කරන්න' ය කියලා, මේ දාන ගැන නොදන්නා මනුස්සයාට. මෙහිදී කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ යමක් දේශනා කළා. 'යම් දානයක යම් යාගයක ගව, එළු, බැටළු ආදීන් ඝාතනය කරනව නම්, ඒ වගේම, ඒ දානය පිළිගන්න ඉන්නෙ මිථ්‍යා සංකල්ප, මිථ්‍යා සමාධි ආදිය ඇති මිථ්‍යා දෘෂ්ටික අය නම් ඒ දානය මහත්ඵල මහානිසංස වෙන්නෙ

නැහැ. හරියට යම්කිසි ගොවියෙක්, නඟුලයි බිත්තර වී යි අරගෙන කැලයට ගිහිල්ලා, හරියට සකස් නො කළ බිමක, හරියට සාරවත් නොවූ පුහුවෙලා තියෙන හොඳට රැක බලා නොගත්ත වී තැන්පත් කළහම, හොඳ අස්වැන්නක් නොලැබෙනව වගේ, එබඳු යාගවල ආනිසංස අඩුයි. ඊළඟට කියනවා 'නියම යාගයක් නම් අර විදියේ සත්ත්ව ඝාතනයක් නැහැ. ඒ වගේම දනය ලබන අය සම්මා දිට්ඨි, සම්මා සංකල්ප, සම්මා වාචා ඇති අය. ඒ වගේ අයට දෙන දනය මහත්ඵලයි මහානිසංසයි' කියල. ඒකත් අර ගොවිතැනේ උපමාවෙන් කිව්වොත්, හරියට බිම සකස් කරල කෙත සකස් කරල හරි විදියට නියම ආකාරයේ බීජ තැන්පත් කලොත්, ඒකෙ අස්වැන්න වැඩියි වගේ.

ඊළඟට පායාසි රාජඤ්ඤයා පළමු වරට දන් වැටක් දීම ආරම්භ කළා. දන් වැටක් කියන්නේ, මහණ බමුණන්ට ඒ වගේම දුගී, මගී, යාචකාදීන්ට ලොකු දන් දීමක්. නිති පතා දන් දීමක් ආරම්භ කළා. එතනදී මෙහෙම සඳහන් වෙනවා. ඒ දනයේ දී මේ රාජඤ්ඤයා දෙන්නෙ මොනවද කාඩි හොද්දයි නිවුඩු සාලෙ බතයි. ඉතින් මේ දනෙ ටික කලක් යනකොට ඒක පිළිබඳව, ඒ දනෙ බෙදීම් සකස් කිරීම් ආදී සංවිධානය බාරව කටයුතු කළ උත්තර කියන මානවකයෙක්, මේ පායාසි රාජඤ්ඤයාගේ හිතවත් මානවකයෙක්, නොයෙකුත් ඇනුම් පද කියනවා. 'මම මේ ලෝකේ මිසක් පරලොව දී නම් මේ පායාසි රාජඤ්ඤයා එක්ක එකතු වෙන්න කැමති නැහැ.' කියල. ඉතින් ගෙන්වල ඇහුවා මොකද එහෙම කියන්නෙ කියලා. 'රාජඤ්ඤය,' එහෙම නැත්නම් 'භවත්' කියල කියමු. එහෙම නැත්නම් 'දේවයන් වහන්ස' කියලා. 'ස්වාමීනි, ඔබ මේ තමන් පයින්වත් ස්පර්ශ කරන්න කැමති නැති ආහාර අනුන්ට දෙනවා. පයින්වත් ස්පර්ශ කරන්න කැමති නැති දළ රෙදි, රෙදි වර්ග අනුන්ට දෙනවා' කියල කිව්වහම, එයා ඒ අදහස් වෙනස් කරලා කිව්වා 'එහෙනම් මම ගන්න ආහාරම දනයේදී ඒ අයට දෙන්න සලස්වන්නම්. මම අඳින වස්ත්‍ර වගේ හොඳ ඒවා දෙන්න' කියලා උත්තර මානවකයාට කිව්වා. ඒ වගේ ඉතින් දන් වැට ගියා. ගිහිල්ලා ගිහිල්ලා ඊළඟට තියෙන්නේ විපාක පැත්ත.

ඒ පායාසි සූත්‍රය අවසාන වෙන්නෙ අමුතු අමුතු ඓතිහාසික සිද්ධිවලින්. ඒවා මේ කාලෙ කෙනෙක් අවිශ්වාස කරන්නත් පුළුවන්. නමුත් මෙහෙමයි තියෙන්නේ. අන්තිමට මේ දනයේ ආනිශංස හැටියට පායාසි රාජඤ්ඤයා මිය ගිහිල්ලා චාතුර්මහාරාජික කියන දිව්‍ය ලෝකයට අයිති සේරිස්සක කියන ශූන්‍ය දිව්‍ය විමානයක උපත ලැබුවා. ඒ දනයේ සංවිධාන කටයුතු කළ උත්තර මානවකයා තව්තිසා

දිව්‍ය ලෝකයේ ඊට වඩා සම්පත් ඇති තැනක ඉපදුනා. හේතුව මොකද? අන්න එතන කියවෙනවා, ඔය දන කථා පිළිබඳ යම්කිසි දෙයක්. අනිත් තැන් වලත් මේ පින්වතුන් කියවලත් ඇති. දනයක් දීමේදී ඒක හරියාකාරව කෙරෙන ආකාරය ගැන වචන හතරකින් කියවෙනවා.

'සක්කච්චං දනං දෙති' හරියට සකසා දෙනවා, හොඳට පිළිවෙලට.

'සහත්‍ථා දනං දෙති' සියතින් දන් දෙනවා.

'චිත්තීකත්‍වා දනං දෙති' හොඳට සදධා කරුණා ආදියෙන් සිත ප්‍රසාදයට පත් කරගෙන දෙනවා.

'අනපවිද්ධං දනං දෙති' වීසි කරන විදියට නොවෙයි හොඳට සත්කාර කරල දෙනවා.

ඔන්න ඕකයි හොඳ දනයක් කියල කියන්නේ. සක්කච්චං, සහත්‍ථා, චිත්තීකත්‍වා, අනපවිද්ධං. නමුත් වැරදි විදියටයි දුන්නෙ පායාසි රාජඤ්ඤයා. 'අසක්කච්චං' යටත් පිරිසෙයින් මුල් කාලයේ දී නොසකසා දන් දුන්නා, හරියට නොවෙයි. අර කාඩි හොද්දයි නිවුඩු සාලේ බතුයි. ඒවගේම තමා සියතින් කළාත් නොවෙයි. සිත පහදවාගෙන කළාත් නොවෙයි. වීසි කරන්න වගේ. ඒ නිසා රාජඤ්ඤයාට ආනිශංස අඩු බව පෙන්නුම් කරනවා. චාතුර්මහාරාජිකයේ පාළු විමානයක එයා පහළ වුණා. නමුත් තව්තිසා භවනේ හොඳ සැප ඇති තැනක උත්තර මානවකයා උපන්නා.

මේ කථාව තව දුරටත් යනවා. මේ පින්වතුන් අහල තියෙනවා යසකුල පුත්‍රයා පිළිබඳව. යසකුල පුත්‍රයාගේ පස්පනස් යහළුවන් අතර ප්‍රධාන හතරදෙනා විමල, සුබාහු, පුණ්ණජි, ගවම්පති කියල හතර දෙනෙක් ගැන කියවෙනවා. ඒ ගවම්පති කියන සවාමීන් වහන්සේ ඒ වෙනකොට ඉතාම වයෝවෘද්ධයි. උන්වහන්සේගේ සිරිතක් තිබුණලු - ඒ වෙනකොට රහතන් වහන්සේ නමක්. දිවා විහරණය සඳහා යන්නේ අර කියාපු සේරීසසක කියන ශූන්‍ය විමානයට. චාතුර්මහාරාජිකයට අයිති ඒ පාළු විමානයට දිවා විහරණය සඳහා යාමේ සිරිතක්, ඒ ගවම්පති රහතන් වහන්සේට තිබුණලු. එක දවසක් ද යනකොට මෙන්න ඉන්නවා රාජඤ්ඤයා. ඇහුව 'ඔබ කවුද' කියලා.

'මම තමයි පායාසි'

'ඇයි ඔබ වෙත තිබුණනෙ මෙහෙම මිථ්‍යා දෘෂ්ටියක්, පරලොවක් නැත. ඕපපාතික සත්ත්වයින් නැත. ආදී වශයෙන්.'

'ඔව් තිබුණ තමයි. නමුත් කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ මගේ ඒ දෘෂ්ටිය ඉවත් කළා. ඒක නිසා තමයි චාතුර්මහාරාජිකයේ ඉපදුනේ.'

'එතකොට ඔබේ දන කටයුතු කළ උත්තර මානවකයා කොහේද?'

'එයා මට වඩා හොඳින් දන කටයුතු කරලා ගිහිල්ලා තව්තිසා දෙව්ලොව උපන්නා.' කියල තියෙනවා.

විමාන වත්ථු ප්‍රකරණයේ පායාසි රාජඤ්ඤයා හැඳින්වෙන්නේ සේරිසසක නමින්. මේක දිග කථාන්තරයක්. පායාසි රාජඤ්ඤයා ඊළඟට ගවම්පති මහ රහතන් වහන්සේගෙන් ඉල්ලීමක් කරනවා. 'ස්වාමීන් වහන්ස, මනුස්ස ලෝකෙට ගිහිල්ලා මනුෂ්‍යයින්ට කියන්න මේ නිදර්ශනයත් එක්ක පායාසි රාජඤ්ඤයා නො සකසා දන් දීලා, සියතින් දන් නොදී, හිත පහදවා ගන්නෙ නැතිව දන් දීලා, ඊළඟට වීසි කරන්න වගේ දන් දීලා චාතුර්මහාරාජිකයේ පාළු විමානයක උපන්නය. නමුත් පායාසි රාජඤ්ඤයාගේ සංවිධායක ගෝලයා උත්තර මානවකයා, අර කියාපු දේවල අනිත් පැත්ත - සකසා සියතින්, හිත පහදවාගෙන, වීසි කරන්නෙ නැතිව, හොඳ සත්කාර බුහුමන් සහිතව දන් දීලා, තව්තිසා දෙව් ලොවට ගියාය කියලා මනුස්ස ලෝකෙට ගිහින් දේශනා කරන්න ස්වාමීනි, මේ මනුස්සයින්ට. සකසා දන් දෙන්න. සියතින් දන් දෙන්න. සිත පහදවා ගෙන දන් දෙන්න. වීසි කරනවා වගේ දන් දෙන්න එපා කියල.' ඉතින් ඔන්න ඔය විදියටයි ඒ සූත්‍රය ඉවර වෙන්නෙ.

ඉතින් අපට හිතා ගන්න තියෙන්නේ අර තරම් අපායෙ යන්න තරම් පව් කරපු කෙනෙක්, හිතා ගන්න පුළුවන් මහ දරුණු විදියට - කොයි නායකයත් දන්නවනෙ. ඒව කියන්න ඕන නැහැනෙ. ඕකනෙ රජ වෙනව කියන්නෙ අපායට යන්න දොරටුවක් වගේ දෙයක් කියන්නෙ. මොන හේතුවෙන් හරි කර්ම, කර්ම ඵල නො අදහගෙන අර විදියට පාප කර්මයේ ගැලිල හිටිය නම් මේ මනුස්සයා යන තැන කියන්න බැහැ. අන්තිමට නිරයට වැටෙන්නේ. නමුත් කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේගේ කරුණාව නිසා ඉවසීම නිසා අර තරම් උපමා කථා රාශියක් දීලා රාජඤ්ඤයා හැරෙව්ව නිසා දිව්‍ය ලෝකෙ ගියා කියා අටුවා ආදියේ තව දුරටත් කියනවා. කෙනෙක් අහන්න

පුළුවන් අර තරම් පාප කර්ම කළා නම් කොහොමද මෙහෙම වෙන්නෙ කියලා. අපි කියමු නිවුඩු හාලේ බත් හෝ වේවා, වෙනත් දනයක් හෝ වේවා, (පසු කාලීනව හොඳට දන් දුන්නා) කුමාර කාශ්‍යප වැනි මහ රහතන් වහන්සේ නමක් නිරෝධ සමාපත්තියෙන් නැගී සිටින අවස්ථාවේම දනයක් දෙන්න ලැබුණොත් ඒ කුසලයෙන්ම ඊළඟ ආත්මයේ අපායෙන් බේරෙනවා. කෙනෙක් අහන්න පුළුවන් අච්චර පව් කරපු කෙනෙක් කොහොමද චාතුර්මහාරාජිකයට යන්නෙ කියලා.

ඔන්න ඔය විදියටයි, කුසල් අකුසල් කර්මවල මහ ගැඹුරු පැත්තක් තියෙනවා. තුණුරුවන්ගේ පහළවීම ලෝකයාට ඒ තරම් ශාන්තියක් වෙන්නේ ඒ නිසයි. අන්න ඒක කල්පනා කරන්න. නමුත් මේ කාලෙත් ඉන්නවා භෞතික වාදීන්. මේක තුළින් ගත හැකි පාඩම් ගැනත් හිතන්න. කථාන්තර කීම පමණක් නොවෙයි. මේ කාලෙ ගැන හිතල බලනකොට, ඒ කාලේ තරම් ප්‍රාථමික උපකරණ නොවෙයි තියෙන්නෙ. හැලියක දල පර්යේෂණ කරනව වගේ. නමුත් මේ කාලෙ ඊට වඩා සියුම් අන්දමින් කරන්නෙත් ඒකමයි. එකක් මට කියන්න අමතක වුණා. මේ වෙලාවට ගැලපෙන උපමා කථාවක්.

අර තව්තිසා දෙව් ලොව ගැන කියූ අවස්ථාවේ රාජඤ්ඤයා කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේගෙන් අහනවා 'කොහොමද ඔබවහන්සේ කියන්නේ තව්තිසා දෙව් ලොවක් තියෙනවය, මෙච්චර ආයුෂ තියෙනවය, කොහොමද ඔබවහන්සේ දැකලද?' ඔන්න එතකොට කියන උපමාව. 'රාජඤ්ඤය, උපතින්ම ඇස් නැති කෙනෙක් කියනවා මේ ඉර, හඳ, තාරකා නැතිය කියලා. ඒක පිළිගත හැකිද? නැත. අන්න ඒ වගේ තමයි, යෝගී ස්වාමීන් වහන්සේලා ඉන්නවා වනගතව, දිවැස් උපදවාගෙන. අන්න ඒ දිවැසින් තමයි මේ කියන්නෙත්, මසැසින් නොවෙයි.' කියලා කුමාර කාශ්‍යප ස්වාමීන් වහන්සේටත් අර උපමා කථා අතරතුර එක තැනක කියවුණා. ඒකම මෙතෙන්දි ආයිත් මතු කර ගත්තොත් - දැන් කරන්නෙත් ඒකයි.

අපි කලිනුත් කියල තියෙනවා. ඇස් තුනක් තියෙනවා. ඇස් තුනක් කිව්වහම ඇස් තුනේ විවිධ කථාන්තරත් තියෙනවා. නමුත් ධර්මයේ තියෙන්නේ මසැස, දිවැස, පැණැස. මසැස මාංශ චක්ෂුසයි. දිවැස කියන්නේ අර විදියට ධ්‍යාන තුළින් මතු කර ගන්න යෝගීන්ට ඍෂිවරුන්ට තිබුණු එක. ඊළඟට තියෙනව ප්‍රඥ ඇස. හිතේ ගමන ආදිය ගැන කියනකොට, දැන් අපේ පටිච්චසමුප්පාද දේශනා මේ පින්වතුන් යම් තරමක් අහන්න ඇති. හිතේ පැවැත්ම ගැන මසැසින් කවදාවත් තීරණයක් ගන්න බැහැ. දැන් භෞතික විද්‍යාව නාමයෙන්

යන්නේ එක්කො මොළේ ඒව ක්‍රියාත්මක වෙන හැටි පරීක්ෂා කරලා තවත් දේවල් කරලා. ඕක අනුවනේ දැන් හිත ගැන ලොකුවට කථා කරන්නනේ - මේ අය මනෝ විද්‍යාව කියල අල්ලගන්නේ. ඒක ඉතාම සීමිතයි, මොකද මේ ඉන්ද්‍රිය පහටම සම්බන්ධ කරලා ගත්තු උපකරණ මගිනුයි ඒ නිගමන වලට බහින්නේ. නමුත් ඊළඟට තියෙනවා දිවැස. ඒක ඊට වඩා ඉහළයි. ඒ දිවැසින් තමයි පරලොවක් තියෙන බවක් පේන්නේ. නැවත උපතක් පේන්නේ. ඊළඟට කර්ම විපාකාදිය තියෙන බව පේන්නේ. අතීතයේ ඍෂිවරුන්ට ඒ මට්ටම පෙනුණා. නමුත් හිත පිළිබඳ ඔක්කොම අහුවෙන්නේ නැහැ ඒකට. මසැසට වඩා දිවැස ශ්‍රේෂ්ඨයි. දිවැසට වඩා පැණැස ශ්‍රේෂ්ඨයි. ඒ ප්‍රඥා ඇසට අහුවෙන හිතේ ක්‍රියාකාරිත්වය තමයි පටිච්චසමුප්පාද දේශනා ආදියෙනුත් අපි මෙතෙක් පෙන්නුවේ.

කිසිම ඍෂිවරයකුට යෝගියෙකුට නොපෙනුන එකක් බුදුරජාණන් වහන්සේට පෙනුනා. අන්න ඒ වගේ ගැඹුරු දෙයක් මෙතන තියෙන්නේ. නමුත් මේවා ලිහිල් කරගෙන මනුෂ්‍යයින් මනෝ විද්‍යාවයි අරකයි මේකයි ගැන කියනවා. යම් ප්‍රමාණයකට කියන ඒවා හරියන්න පුළුවන්. නමුත් ඒ නිසයි අපි කිව්වේ භෞතික විද්‍යාවේ ආදි පුරුෂයා වගේ මේ රාජඤ්ඤයා කියලා. ඒක තුළින් ගත්තු වැරදි දෘෂ්ටි කොයි තරම් දුර යනවද කියලා මේ කාලෙත් දකින්න පුළුවන්. ඇතැම් කෙනෙක් කියනවා මට ඒක පෙනෙන්නෙ නැහැ. අපේ විද්‍යාඥයින් කියල නැහැ පරලොවක් තියෙනව කියල, ඒ අදහස දැඩිව ගන්නවා. අන්න එබඳු අයට තමයි සුභාෂිතයෙන් කියවෙන, සුභාෂිතයක් කියතොත් - සුභාෂිතය කියන්නේ අලගියවන්න මුකවෙටි තුමා ඉතා සරල භාෂාවෙන් කියාපු යම් කිසි කාරණයක්. මේ පරණ අය දන්නවත් ඇති.

ඇතත් නැතත් පරලොව සුදනෙනි මහත
හලොත් යෙහෙකි පව් කම් නොතබාම සිත
නැතත් එ පරලොව ඉන් වන අවැඩ නැත
ඇතොත් නැතැයි පව් කළ හට වෙයි විපත

ආන්න එතකොට ඒකෙ තියෙනවා අර ගැඹුරු සත්‍යය. ඔය සුභාෂිතයේ තිබෙන කවියේ ඇති ගැඹුරු අර්ථය ධර්මයෙන් කිව්වොත් 'අපණ්ණක ප්‍රතිපදව' නමින් හඳුන්වන්න පුළුවන්. ඊළඟට එතෙන්ට යමු. අපණ්ණක ප්‍රතිපදව කියන වචනය පවා බොහෝ දෙනෙකුට තේරුම් ගන්න අමාරුයි. ජාතක කථා අතරින් පළවෙනි ජාතකයත් අපණ්ණක ජාතකයයි. ඊළඟට මැදුම් සඟියෙත් තියෙනවා අපණ්ණක

සූත්‍රය කියලා විශේෂ සූත්‍රයක්. අපි මෙතෙන්දි අපණ්ණක ජාතක කථාව ගැන කෙටියෙන් කියතොත්, බෝධි සත්තවයන් හා දේවදත්තයන් වෙළෙන්දෙ දෙන්නෙක් හැටියට කාන්තාරයක් මැදින් යන අතරේ, යක්ෂයෙක් මේ අය ගොදුරු කර ගන්න හිතලා, එහා පැත්තේ හොඳට වතුර තියෙන බව පෙන්නන්න, තෙත් හිස කෙස් ඇතිව, නෙළුම් මල් ආදිය අරගෙන ඉස්සරහට එනවා. ඇහුවහම කියනවා අරහෙ වතුර තියෙනවා කියලා. පළමුවෙනි වෙළෙන්ද ගැල්වල තිබුණු වතුර ඔක්කොම වීසි කරලා, ඒ හේතුව නිසාම අර යකාට ගොදුරු වුණා. දෙවෙනියට ආ බෝධිසත්තවයන් වහන්සේ කල්පනා කරනවා, මෙයා කියන එක ඇත්ත වෙන්නත් පුළුවන්, නැත්ත වෙන්නත් පුළුවන්, අපි වතුර ටික ගෙනිච්චොත් ටිකක් කරදර වෙනවා විතරයි. ඒක පස්සෙ වීසි කරනවා. අන්න නුවණින් කල්පනා කරලා ඒ විපතින් ගැලවුණා. අපණ්ණක ප්‍රතිපදවේ තියෙන සාමාන්‍ය සිද්ධාන්තය මෙහෙම කියන්න පුළුවන්. හරි ගියත් හරි, වැරදුනත් හරි, අපි අවසානයේ කියපු එක.

'අපණ්ණක සූත්‍රයේ' බුදුරජාණන් වහන්සේ මෙහෙම දක්වනවා. ඒක ඉතාම වටිනා සූත්‍රයක්. සාලෙය්‍යක කියන ඒ ප්‍රදේශයේ ගෘහපතියන්ට බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක කිව්වා ඔබට ආකාරවතී සද්ධාව කියන කරුණු - හිතා මතා තීරණයක් අරගෙන ගන්න සද්ධාවක්, ශාස්තෲන් වහන්සේ කෙනෙක් නැත්නම් ඔබට මා කියනවා ඔය කාරණය ගැන මෙන්න මෙහෙම සිද්ධාන්තයක් අනුගමනය කරන්න. හොඳ නරක හරි වැරදි තේරුම් ගැනීමට. ඒකට කියනවා අපණ්ණක ප්‍රතිපදව. ඊළඟට නිදර්ශන දක්වන්නේ මෙහෙමයි. එක්තරා ශාස්තෲවරයෙක් ඇවිල්ලා කියනවා ඔබට අර කියාපු දස වස්තුක මිථ්‍යා දෘෂ්ටිය - එක එකක් විස්තර නොකළට මේ පින්වතුන් දන්නවා. දන, මාන, යාග, හෝම, මව්, පියන්, ඒව නැත. 'නත්‍ථි දින්‍නං නත්‍ථි යිට්‍ඨං' ආදී වශයෙන් මෙලොවක් නැත. පරලොවක් නැත. අන්තිමට ඕපපාතික සත්ත්වයන් නැත, වශයෙන් මිථ්‍යා දෘෂ්ටිය ගත්තු කෙනෙක් ඒක කියනවා.

ඊළඟට සම්‍යක් දෘෂ්ටිය ගත්තු කට්ටිය කියනවා, මේව තියෙනවය, යාග හෝම ආදියේ ප්‍රතිඵල තියෙනවය කියල. ඊළඟට කෙනෙක් හරියට ශාස්තෲවරයෙක් නැත්නම් දෙගිඩියාවට බහිනවා. මේ දෙන්නගෙන් කියන හරි එක මොකක්ද කියලා. ඔන්න ඊළඟට බුදුරජාණන් වහන්සේ වදරණවා ඒවා විසඳගන්න ක්‍රමය. මේ නුවණැත්තා කල්පනා කරන්ට ඕන විසඳගන්න ක්‍රමය. දැන් මේ කලින් කියාපු කෙනාගේ මතය මම පිළි අරගත්තොත් ඒකෙ ප්‍රතිඵලය මොකක්ද? ඒ නාස්තික දෘෂ්ටිය ගත්තු කෙනාගෙන් බලාපොරොත්තු

විය හැක්කේ කුමක්ද? එයා කුසල් අකුසල් පිළිබඳ අවබෝධයක් නැතිව නොයෙකුත් අපරාධ කරමින් ජීවිතය ගෙවනවා. ඒ අතරතුර නුවණැත්තන්ගේ ගර්හාවට ලක් වෙනවා. අපරාධවලට අහුඋනහම ඉබේම ඒක වෙනවා. ඒ අතරතුර ඇත්ත වශයෙන් පරලොවක් නැත්නම් ඒකට බයවෙන්න දෙයක් නැහැ. නමුත් මෙලොවම ඒකට විපාක විඳල ඉවරයි. තිබුණොත් ගිහිල්ල වැටෙන්නෙ භයානක තැනක. ඊළඟට දෙවෙනි සම්‍යක් දෘෂ්ටික ශාස්තෲවරයා කියාපු එක ගැන මෙහෙම හිතන්ට ඕන. මේ අපණ්ණක ප්‍රතිපදාව අනුව එන නිගමන ක්‍රමය. දැන් මේ අය කියන එක ඇත්ත නම් ඒ මතය ගත්ත අය මෙලොව පවා නරක දේවලින් ඈත්වෙලා හොඳ ජීවිතයක් ගෙවනවා. නුවණැත්තන්ගේ ප්‍රශංසාවට ලක් වෙනවා. ඒ අයගේ මතය වැරදුනොත් පාඩුවක් වෙන්නේ නැහැ. හරි ගියොත් නම් දිව්‍ය ලෝකේ යනවා. ඔහොම සළකගන්න. ඒ විදියට නිදර්ශන දීමෙන් බුදුරජාණන් වහන්සේ වදරන්නේ, ඒක තුළින් අපට ගන්න තියෙන්නේ අපණ්ණක ප්‍රතිපදාව ගැනයි.

මේ කාලෙත් බොහෝ දෙනාට තියෙන ගැටළුවක් මේක. අහවලා මෙහෙම කියනවා, අහවලා මෙහෙම කියනවා. ඒක ඉතින් අවස්ථානුකූලව හිතන්න ඕන. ඒකෙ ප්‍රතිඵල, ආදීනව, ආනිශංස පක්ෂය එහෙම තීරණ ගන්න ඕන. දැන් අර රාජඤ්ඤයා තමන්ගේ පර්යේෂණ ලොකුවට අල්ලගෙන තමයි අර විදියේ මිථ්‍යා දෘෂ්ටියක් දීර්ඝ කාලයක් අරගෙන ආවේ. ඒ වගේම මේ කාලෙත් ඔය වගේ කට්ටිය ඉන්නවා, මහ ලොකු නම් ගහ ගත්තු. දර්ශනිකයන් වේවා, විද්‍යාඥයින් වේවා, එයා මෙහෙම කිව්වා. අරයා මෙහෙම කිව්වා. මේ පර්යේෂණයේ ප්‍රතිඵලය මෙහෙමයි. ඒක නිසා කර්ම විපාක නැහැ. තාම දිව්‍ය ලෝක අරව මේව පෙනිල නැහැ. ඔය වගේ ප්‍රකාශන. එබඳු අවස්ථාවල අන්න අර විදියට හිතන්න ඕන, බුදුරජාණන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව පිහිටුවා ගන්න බැරිනම්.

ශ්‍රද්ධාව ඇති අයට ඔය ප්‍රශ්නය නැහැ. ශ්‍රද්ධාව නැති නමුත් නුවණැති අයට ගත හැකි ක්‍රියා මාර්ගය තමයි අපණ්ණක ප්‍රතිපදාව තුළින් දක්වූවේ. එබඳු අවස්ථාවල කල්පනා කරන්න ඕන, මෙලෝ වශයෙනුත් අර කියාපු සම්‍යක් දෘෂ්ටියේ ආනිශංස තියෙනවා. පරලොව වශයෙනුත් තියෙනවා. ඒකයි අපි කිව්වේ හරි ගියත් හරි වැරදුනත් හරි දැන් අපි කල්පනා කරන්ට ඕන අපේ ජීවිත සකස් කර ගන්ට. මේක කථා කිය කියා ඉන්ට පමණක් නොවෙයි. මේ පායාසි රාජඤ්ඤ කථාව කීප පැත්තකින්ම අපටත් ආදර්ශයක්. එක පැත්තකින් කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ, උන්වහන්සේගේ කරුණා සම්පත්තිය නිසා, එක

පැත්තකින් චිත්ත කථිකත්වය නිසා, අර රාජඤ්ඤයා අහන අහන ප්‍රශ්නයට ගැලපෙන නොයෙක් උපමා දුන්නා. උපමා කථා දුන්නා. දීල දීල එයා මෙල්ල කරලා අන්තිමට එයා දනපතියෙක් කරලා, එහෙම නැත්නම් දන් දෙන්න සලස්සලා, දිව්‍ය ලෝකෙට පවා යවන්න කරුණු සැලැස්සුවා.

ඊළඟට දනය ගැන කියාපු ටික අපි කල්පනා කරන්ට ඕන. බත් හැන්දක් බෙදන විට පවා අන්න අර කරුණු සිහියට ගන්නට ඕන. දැන් කාලෙ භෞතික ක්‍රියාවලියක් වගේ කෙරෙන ගනු දෙනුවක් නොවෙයි දනය කියන එක. දන කථාව අමුතුවෙන් නොකීවත් මේ පින්වතුන්ට බොහොම හුරු පුරුදු දෙයක්. නමුත් දනය කියල කියන්නේ දීමනාම පමණක් නොවෙයි. තුන් සිත පහදගෙන දීම ආදී නොයෙකුත් විස්තර මේ පින්වතුන් අහල තියෙනවා. ඒක කොයි තරම් ගැඹුරු දෙයක්ද කියලා මේ පින්වතුන්ට මේ කථාවෙන් පැහැදිලි වෙනවා. ඒ දන කළමනා දුන්න රාජඤ්ඤයාට වඩා ඉහළ ගියා, හොඳට සකසලා සියතින් දුන්න එයාගෙ ගෝලයා, උත්තර මානවකයා. ඒවායේ ආනිශංස වින්ද. අන්න ඒවා කල්පනා කරලා, ඒවායේ ගැඹුර කල්පනා කරලා, නිකම් පේන්න භෞතික ක්‍රියාවක් නොවෙයි දීම කියන එක - බැලුවහම ඒ විදියටයි පේන්නෙ. සාමාන්‍ය ලෝකෙ ගනු දෙනුවක් නොවෙයි. සිත සකස් කරගෙන සියතින් දීම ආදී ගැඹුරු අදහසක් මෙතන තියෙන්නෙ. එතකොට ඒ දන සංකල්පයත් ගැඹුරට යන එකක්. ඒකෙනුත් යමක් මේ පින්වතුන්ට ඉගෙන ගන්න පුළුවන්.

ඊළඟට මෙලෝ පරලෝ පිළිබඳ කථාව. නිරන්තරයෙන් කල්පනා කරන්න ඕන අපි කියාපු ඇස් තුන ගැන. අපේ මසැස ප්‍රමාණවත් නැහැ කියලා. නොයෙකුත් උපකරණ අටවාගෙන මේ ශත වර්ෂ ගණනක් කළේ මොකක්ද? ඒත් ඒ ගමනමයි යන්නේ. ඇහැට පේනව මදි. කණ්ණාඩිය ද ගත්තා. කණ්ණාඩියත් මදි කියලා දුර දක්නය අනු දක්නය ගත්තා. අනිත් ඒවත් එහෙමයි. කනට ඇහෙනව මදි කියලා තව තව දේවල්. දැන් ඕව කියන්න ඕන නැහැ. ඇත්ත වශයෙන් මේ යුගයේ කෙනකුට කියන්න පුළුවන් සෑහෙන මුදලක් තියෙනවා නම් අභිඤ්ඤා ඕන නැහැ. අභිඤ්ඤා ඕන නැහැ. දිවැස ගෙදර තියෙනවා අර පෙට්ටියේ. ඊළඟට දිව කන තියෙනවා. මේ කට්ටියගේ උපකරණ එකක් දෙකක් නොවෙයි ගණනක් තියෙනවා. දිව කනින් අහගෙනනෙ පාරවල්වල යන්නෙත්. දිව කනත් ළඟ තියෙනවා. අහසින් යාමත් ඒ වගෙයි. හැම එකක්ම ඒ වගෙයි. එහෙම බලනකොට අභිඤ්ඤා අවශ්‍ය නැහැ මේ කාලයේ. නමුත් ගැඹුරින් බලනකොට ඉන්ද්‍රියයන්ට මුළාවීමමයි. ඉන්ද්‍රියයන්ට මුළාවීමමයි ඉදිරියට යන්නෙ. ඒක

තුළ සත්‍යය නැහැ. සත්‍යයෙන් ඈත් වීමමයි. අපට ඒවයින් මිදෙන්න බැරි බව ඇත්ත මේ යන රැල්ල අනුව. නමුත් කල්පනා කරන්න ඕන, දැන් මේ කාලේ යල් පැනපු හැටියට හිතන ධර්මයේ තමයි සත්‍යය තියෙන්නේ. අරවාට යට වෙච්ච අය - ඒ යන රැල්ලට යට වෙච්ච අයගේ මොළවලට වෙන්නේ මොට්ට වෙන එකයි. අවසානයේ උපකරණවලට යට වෙන එකයි. අපි ඒ ආදීනව දැනගෙන, දැන් මේ අපි කියන එකත් ඇත්ත වශයෙන් වාර්තා වෙනවා. ඒක නිසා සමහර විට මේ පින්වතුන් කල්පනා කරනව ඇති, දැන් ඉතින් නිදගත්තත් කමක් නැහැ. මේක ඊට පස්සෙ අහගන්න බැරියැ. නමුත් අතීතයේ ධර්ම ශ්‍රවණය කළ ආකාරය දැන ගැනීම අපට ඉතාමත්ම වටිනා දෙයක්.

ඒ කාලයේ ධර්ම දේශනාවක් ආරම්භ කරන කොට - අපි දන්න කාලයේ පවා ඉස්සෙල්ල කියන්නේ බණ ඇසිය යුතු ආකාරය. ඒවා දැන් කියන්නෙ වත් නැහැ. ඒවට උපකරණ තියෙනවනෙ. අපි නිතර මතක් කරන '**අට්ඨිං කත්වා, මනසිකත්වා, සබ්බ චෙතසො සමන්නාහරිත්වා, ඔහිතසොතො, ධම්මං සුණාති.**' අන්න එබඳු අවස්ථාවලයි මාර්ග ඵල පහළ වෙන්නෙ, සමාධිය ඇතිවෙන්නෙ. **අට්ඨිකත්වා** කියන්නේ මෙයින් මට වැඩක් ඇතය කියල හිතාගෙන, **මනසිකත්වා** පදයක් පාසා මෙනෙහි කරමින්, **සබ්බ චෙතසො සමන්නාහරිත්වා** - මුලු හිතම ඒකට යොදාගෙන, **ඔහිතසොතො** කන් නමාගෙන, අන්න එහෙම අහනකොට තමයි ඒක තුළම සමාධිය පිහිටන්නෙ.

විශේෂයෙන් බුදුරජාණන් වහන්සේට කන් දෙනකොට අර කියාපු ස්වාමීන් වහන්සේලාට කන් දෙනකොට සර්පයෙක් කෑවත් දන්නෙ නැහැ. ඒ තරම් පුදුම විදියේ සමාධියකට සම වැදිලා. අන්න එබඳු අයට මාර්ග ඵල දුර නැහැ. ඒක තුළම නීවරණ ඉවත්වෙලා ඒක තුළම සමාධිය ඇවිල්ලා. ඒකනෙ බුදුරජාණන් වහන්සේ වදාරන්නේ යම් අවස්ථාවක බුදුරජාණන් වහන්සේගේ ධර්මය අහනව නම් ඒ වෙලාවේ රාග සහගත සිතක් හට ගන්නේ නැහැ, ද්වේශ සහගත සිතක් හට ගන්නේ නැහැ, මෝහ සහගත සිතක් හට ගන්නේ නැහැ, නීවරණ ධර්ම ඉවත් වෙනවා. ඉවත් වෙලා සමාධිය සකස් වෙනවා. ඒක තමයි කියන්නේ 'කල්ල චිත්තං, මුදුචිත්තං, වීනීවරණචිත්තං.' බුදුරජාණන් වහන්සේගේ ඒ දේශනා ශෛලිය ගැනත් අපි යම් අවස්ථාවල කියල තියෙනවා මේ පින්වතුන්ට. එක බණක් තුළින්, කවදාවත් බණ ඇහැව්වෙ නැති කෙනෙක් කොහොමද සෝවාන් වෙන්නෙ කියන එක සමහරුන්ට මහ ප්‍රශ්නයක්. නමුත් බුදුරජාණන් වහන්සේගේ දේශනා ශෛලිය මහ පුදුමයි.

'ආනුපුබ්බි කථා' අනුපිළිවෙල කථා. ඕවා ගැන අපි වැඩි විස්තර කියල තියෙනවා වෙන අවසථාවල. 'දාන කථං, සීලකථං. සග්ගකථං, කාමානං ආදීනවං, ඕකාරං සංකිලේසං නෙක්ඛම්මෙ ච ආනිසංසං' කියන ටික තමයි ඒ අනුපිළිවෙල කථාවට අයිති මූලික ටික. ඒ කියන්නේ දාන කථාව තුළින් යමක් දෙන්නෙ නැති හිඟන්නන්ට පවා අනේ! යමක් දෙන්න තිබුණ නම් මම දෙනවා කියන ඒ දාන සිතුවිල්ල පහළවෙලා ඉවරයි. සීල කථා දාන් කාලේ වගේ පින්වතුනි, සිල් සමාදන් වෙන්න කියන්නේ නැතත් සීල කථාවලින් බුදුරජාණන් වහන්සේ සීලයේ ආනිසංස කියනකොට, එතන එතනම අනුමෝදන් වී ඒ ශික්ෂාපද සමාදන්වෙලා ඉවරයි. එතකොට දානයත් හරි සීලයත් හරි. ඊළඟට ඒ දෙකේ ආනිශංස සග්ගකථා කියනකොට දිව්‍ය ලෝකේ ගියා වගෙයි. ඊට පස්සේ එතන ඉඳලා කාමානං ආදීනවං - දෙව් ලොව මිනිස් ලොව සැප ඔක්කොම ආදීනව, ඒවායේ කෙලෙස් උපදවන සවභාවය, ඒවායේ ලාමක සවභාවය, බුදුරජාණන් වහන්සේ දේශනා කරල නෙක්ඛම්මයේ ආනිශංස කියනකොට ඔන්න අනික් පැත්තට හැරෙනවා.

බොහෝ විට සඳහන් වෙන පාඨයක්. ඒ අවසථාවේ බුදුරජාණන් වහන්සේ හිත දිහා බලාගෙන ඉන්නේ මේ ශ්‍රාවකයාගේ. ඒකයි එතන කියන්නේ 'යථා භගවා අඤ්ඤාසි කල්ල චිත්තං, මුදුචිත්තං, විනීවරණචිත්තං, උදග්ග චිත්තං, පසන්න චිත්තං.' ඒ ශ්‍රාවකයාගේ සිත හරියට සකස්වෙලා, මෘදුවෙලා, නීවරණ ඉවත්වෙලා, හොඳට ඔද ගැන්විලා, හොඳට සතුටින් ප්‍රමෝදයෙන් තියෙන අවසථාව බලල තමයි, ඊළඟටයි චතුරාර්‍ය සත්‍ය දෙශනාව බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ. දුක්ඛ, සමුදය, නිරොධ, මග්ග. අන්න ඒ විදියේ දේශනා ශෛලිය තුළ වගේම, ඒ ධර්‍මය ශ්‍රවණය කරන ආකාරයත් අනුවයි මාර්ගඵල ආදිය ලැබෙන්නේ.

දැන් මොකක්ද කියන්නේ බණ ඇහැව්වහම ඇති සෝවාන් වෙන්න. ඒ කථාව කියනවා දැන් බොහෝ දෙනා. බණ ඇහැව්වහම ඇති, බණ අහන්නෙ කොහොමද කියල නැහැ. ඒක ඇත්ත වශයෙන් කියනවා නම් මේ යන්ත්‍රයයි සෝවාන් වෙන්න ඕන, අහන කට්ටිය නොවෙයි. අන්න ඒ වගේ ඒක. එබඳු යුගයක්. අපි මේව මතක් කරල දෙන්නේ කාලානුරූපව, මොකද අර කිව්ව යන්ත්‍ර ආදියට වහල් වෙලා මේ මසැසට පමණක් සීමා වෙච්ච ලෝකයක්. එබඳු යුගයක අන්න අර පායාසි රාජඤ්ඤයා වගේ. ඒ අයට අනුගාමිකයොත් ඉන්න ඇති. මේ යුගයෙත් එහෙමමයි. ඒක නිසා මේ පින්වතුන් ඒවායින් පරෙස්සම් වෙලා අපි කියන මේ බුදුරජාණන් වහන්සේ වදාළ සීල, සමාධි, ප්‍රඥා

නමැති මේ මාර්ගයේ යන්න. ආයෙ කෙටි ක්‍රම බොත්තම් තද කිරීමෙන් මාර්ග ඵල ලබාගන්නා ක්‍රම, ඒ විදියේ දේවල් නැතිව මුල ඉඳලම යන්න ඕන. ඒ නිසා ඒ යම්කිසි සීලයක පිහිටලා ඊළඟට ඒ සීලය උපකාර කරගෙන අපි බොහෝ අවස්ථාවල කියන හැටියට ඊළඟට යම් සමාධි තත්ත්වයක් පිළිබඳව උත්සාහවත් විය යුතුයි.

දැන් නම් යන කථාවල හැටියට අප ළඟට එන අයගෙන් කියවෙන එකක් තමයි බොහෝ දෙනා භාවනාවය කියලා කියන්නේ නිකම් හිත දිහා බලා ඉන්න එකය කියලා. හිත දිහා බලන් ඉන්න ඔක්කොම හරිය කියනවා. හරි ලේසි වැඩේ. සමාධියක් ගැන කථාවකුත් නැහැ. ඊළඟට සමාධිය ඕනැත් නැහැයි කියනවා. අපි ඉතින් ප්‍රඥාවන්ත අය. අපට සමාධියක් ඕන නැහැ. ඔන්න ඔය විදියට කථාන්තර යනවා. නමුත් හිතාගන්න ඕන 'නත්ථි ඣානං අපඤ්ඤස්ස පඤ්ඤා නත්ථි අජ්ඣායතො යම්හි ඣානං ච පඤ්ඤා ච නිබ්බානසවෙ සන්තිකෙ' යන ඒ බුද්ධ වචනය අනුව ප්‍රඥාව නැති කෙනාට ධ්‍යානයක් නැහැ. ධ්‍යානය නැති කෙනාට ප්‍රඥාව නැහැ. ඒ දෙකම ඇතිකෙනා තමයි නිවනට ළඟ කියලා බුදුරජාණන් වහන්සේ වදාරළා තියෙනවා. එතකොට මේ කථාන්තරය ආශ්‍රයෙන් අපි තේරුම් ගන්න ඕන බුදුරජාණන් වහන්සේගේ දේශනාවේ ශ්‍රේෂ්ඨත්වය. ඒ වගේම උන්වහන්සේගේ ශ්‍රාවකයන්ගේ විචිත්‍ර ප්‍රතිභානය. අතීතයේ ඒ විචිත්‍ර ප්‍රතිභාන ශක්තිය, විචිත්‍ර දේශනා ශෛලිය යොදා ගත්තේ නිවනට එල්ල කරලයි. නිවනම එල්ල කරලයි. ඒක අහල ඉවර වෙනකොට දහම් මඟට නැඹුරුවෙලා ඉවරයි. නමුත් මේක ප්‍රසිද්ධිය සඳහා යන එකක් නොවෙයි. විචිත්‍ර දේශනා, විචිත්‍ර ධර්ම කථිකත්වය කියන ඒවා - ඒ වචන - දැන් නිකම් පාවිච්චි වෙනවා.

අර කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ වගේ ශ්‍රේෂ්ඨ උත්තමයන්ගේ විචිත්‍ර දේශනා ශෛලියට උපකාර වීම සඳහා වෙන්න ඇති, දේවතාවෙක් ඇවිල්ලා මහ ගැඹුරු ප්‍රශ්න පහළොවක් ස්වාමීන් වහන්සේගෙන් අහනවා. ඒක අපි කියන්න ගියේ නැහැ. ඒක උන්වහන්සේගේ දේශනාවක් නොවෙයි. වම්මික සූත්‍රය කියන එක ඉතාම ගැඹුරු සූත්‍රයක්. ඒකෙ තියෙන්නේ දේවතාවෙක් ඇවිල්ලා අහනවා, හුඹහ උපමාවකින් ඉතාම ගැඹුරු ප්‍රශ්න පහළොවක්. වෙන කෙනකුට උත්තර දෙන්න බැහැ, ගිහිල්ලා බුදුරජාණන් වහන්සේගෙන් අහන්න කියනවා. නමුත් ඒක කුමාර කාශ්‍යප ස්වාමීන් වහන්සේට කිව්වෙ මොකද කියලා අපි හිතුවොත් ඒක උන්වහන්සේගේ අරහත්වයට කර්මස්ථානයක් වෙන්න ඇති. උන්වහන්සේගේ විචිත්‍ර

කථිකත්වයට කර්මසථානයක් වෙන්න ඇති. අපි එහෙම හිතා ගන්ට ඕන.

මේ ධර්ම කථා තුළින් අපි වඩාත් උත්සාහවන්ත වෙන්න ඕන. උපාසිකාවො වේවා උපාසකයො වේවා බුද්ධ කාලය සිහිපත් කර ගත්තහම හොඳයි. දැන් යන්නෙ අනිත් පැත්තනෙ. මේ කාලයේ තියෙන බැරිය කියන සංඥාව කඩල දල හැකි සංඥාව උපදවාගෙන වීර්යය කළ යුතුයි. කාරණය ඇත්ත තමයි. දහසක් බාධක අර කියාපු නවීකරණ රැල්ල තුළ. නමුත් යම් කෙනෙක් නුවණින් කල්පනා කරලා, අනවශ්‍ය දේවල් අත හැරලා වැදගත් අවශ්‍ය දේවල් කිට්ටු කරගෙන, මේ කෙටි ජීවිත කාලය තුළ උත්සාහ ගන්නවා නම් ආයිත් කල් දන්නෙ නැතුව, ඒ බලාපොරොත්තු වන උත්තමාර්ථයන් ළඟා කර ගන්න පුළුවන් වෙනවා.

අන්න ඒක නිසා මේ පින්වතුන් අද දිනත් වටිනා සීලයක් සමාදන් වෙලා, ඒවා හෙළා දකින්නෙ නැතිව, අපට සීලාදී ගුණ ධර්ම අවශ්‍ය නැහැ. අපට පුළුවන් මාර්ග ඵලවලට පනින්න කියලා හිතන්නෙ නැතිව, එදිනෙදා ජීවිත රටාවෙන් ඉවත්වෙලා එක දවසක් හෝ රහතන් වහන්සේලාගේ ප්‍රතිපත්තියට නැඹුරු වීම් වශයෙන් වටිනා සීලයක් සමාදන් වෙලා, ඊළඟට අද මේ දවස ඒ වෙනුවෙන් තම තමන්ගේ බණ භාවනාවලට හිත යොදගෙන ගත කරනවා. එබඳු අවසථාවකයි, මේ ධර්මය හරියට තේරුම් ගන්නව නම් තේරුම් ගන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා මේ අපි කියාපු වචන ටිකත් තේරුම් අරගෙන එක පැත්තකින් අර කියාපු දෘෂ්ටිවල අඩුපාඩුකම් තියෙනවා නම් සම්‍යක් දෘෂ්ටියෙන් ඒවා හරිගස්ස ගන්න. මේ රාජඤ්ඤයාගේ වචනම පාවිච්චි කරන්න ඕන. මම මෙහෙම පාපී දෘෂ්ටියක ඉඳලා, කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ නිසයි, අපායට යන්න හිටිය මම මෙහෙම දිව්‍ය ආත්ම භාවයක් ලැබුවේ, කියන එක කල්පනා කරගෙන දන සීල භාවනා කියන ඒ තුනේම වටිනාකම තේරුම් ගන්න ඕන, මේ කියාපු ධර්ම කථාව ආශ්‍රයෙන්.

මේ හැම එකක්ම කරන්නේ මේ ජීවත් වන කෙටි කාලය තුළ. මොකද මේ වටිනා අවසථාව ගිලිහිලා ගියොත් ඊළඟට ගිහිල්ල උපදින තැන ගැනයි, දැන් බොහෝ දෙනා ඇත්ත වශයෙන් බයට කල්පනා කරන්නේ. කොහේ ගිහිල්ලා උපදිනවද දන්නෙ නැහැ, නැවත උත්පත්තිය කියන එක සත්‍ය දෙයක් නම්. ඒකෙ භයානක කම තමයි බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ. යටත් පිරිසෙයින් සෝවාන් වුණොත් - දහම් ඇස පහළ වීමේ ශ්‍රේෂ්ඨත්වය වන්නේ, ඒ දහම් ඇස පහළ වුණාට පස්සෙ අපායට යන්න සුදුසුකම් නැතිවෙනවා. තිරිසන් ලෝකෙට යන්න සුදුසුකම් නැතිවෙනවා. සක්කාය දිට්ඨිය නැති

වීමෙන්. එතනයි රහස. අන්න ඒ නිසා ඒ දහම් ඇස පහළ වීමේ ප්‍රමාණයෙන්වත් සංසාරයේ මහා දුක්ඛස්කන්ධ කන්දරාවකින් මිදෙනවා කියලා බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරල තියෙනවා. ඒව තේරුම් අරගෙන, බැරිය කියන සංඥාව ඉවත් කරලා හැකි සංඥාව උපදවාගෙන, මේ ධර්ම මාර්ගයේ තව තවත් ඉදිරියට යාමට, මේ අද දින පවත්වපු දේශනාව උපකාර වේවා! කියල අපි ප්‍රාර්ථනා කර ගනිමු.

එසේ ප්‍රාර්ථනා කරගෙන අපි නිරන්තරයෙන් කියන ආකාරයට, අවීචියේ සිට අකනිටා දක්වා යම්තාක් කිසියම් සත්ත්ව කෙනෙක් මෙම ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුසලයන් අනුමෝදන් වීමට කැමති නම්, ඒ අනුමෝදන් වීම තුළින් බලාපොරොත්තු වන උත්තමාර්ථය ප්‍රාර්ථනීය බෝධියකින් සාක්ෂාත් කර ගනිත්වායි ප්‍රාර්ථනා කරගෙන මේ ගාථා කියන්න.

'එත්තාවතා ච අම්හෙහි...'

# 55 වන දේශනය

# 55 වන දේශනය

(පහන් කණුව ධර්‍ම දේශනා අංක 208)

'නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස'

කෙනස්සු නිවුතො ලොකො
කෙනස්සු නප්පකාසති
කිස්සාභිලෙපනං බ්‍රෑසි
කිංසු තස්ස මහබ්භයං

අවිජ්ජාය නිවුතො ලොකො
වෙවිච්ඡා පමාද නප්පකාසතී
ජප්පාභිලෙපනං බ්‍රෑමි
දුක්ඛං අස්ස මහබ්භයං

සවන්ති සබ්බධී සොතා
සොතානං කිං නිවාරණං
සොතානං සංවරං බ්‍රෑහි
කෙන සොතා පිථීයරෙ

යානි සොතානි ලොකස්මිං
සති තෙසං නිවාරණං
සොතානං සංවරං බ්‍රෑමි
පඤ්ඤායෙතෙ පිථීයරෙ

සැදැහැවත් පින්වතුනි,

තිලෝගුරු බුදුරජාණන් වහන්සේ අපට හඳුන්වා දෙනවා ලෝකය අවිද්‍යා අන්ධකාරයෙන් වැසුණු තැනක් හැටියට. මුළු මහත් බෞද්ධ ප්‍රතිපදාවම අවිද්‍යාවේ සිට විද්‍යාව කරා යන ගමනක්. අඳුරේ සිට ආලෝකය කරා යන ගමනක්. ඒ බව හෙළිවෙන ගාථා කීපයකුයි අද අපි මාතෘකාව හැටියට ඉදිරියට ගත්තේ. සුත්ත නිපාතයේ පාරායණ වග්ගයේ අජිත මාණව පුච්ඡා නමැති සූත්‍රයේයි මේ ගාථා දක්නට ලැබෙන්නේ. ගාථා වල නිදාන කථාව වශයෙන් දැක්වෙන්නේ බාවරී බ්‍රාහමණයා පිළිබඳ ප්‍රවෘත්තියයි. කෙටියෙන් දක්වතොත් - බාවරී කියන, වේද ග්‍රන්ථවල පරතෙරට ගිය බ්‍රාහමණ ආචාර්යවරයෙක්, කොසොල් රටේ ඉඳල තමන්ගේ ශිෂ්‍යයින් දහසය දෙනා සමග දක්ෂිණා පථය නමින් ඒ කාලයේ හැඳින්වුණු දකුණු ඉන්දියාවේ ඈත ප්‍රදේශය

බලා පිටත්ව ගියා. පිටත්ව ගියේ ආකිඤ්චඤ්ඤායතන නම් වූ කිසිවක් නැති බව සොයාගෙනයි. එහෙම සොයාගෙන දුර මාර්ගයක් ගෙවල ගිහිල්ල ගෝදාවරී නදී තීරයේ, අස්සක කියන රටේ රජුට අයිති ප්‍රදේශයක, මෙම පිරිස ආශ්‍රමයක් හදාගෙන වාසය කළා. ඒ ආශ්‍රමයේ ශිෂ්‍ය පිරිසත් ක්‍රම ක්‍රමයෙන් වැඩි උනා. ඒ වගේම ඒ ගම් ප්‍රදේශයත් ක්‍රමයෙන් සමෘද්ධිමත් උනා. රජතුමා ඒ ගම් ප්‍රදේශයේ ආදායම මේ ආශ්‍රමයටම යොමු කළා. නමුත් බාවරී බ්‍රාහ්මණය ඒව යොදා ගත්ත, යාග පවත්වන්න කලින් කලට.

එක අවස්ථාවක ඒ ආදායම යොදල මහා යාගයක් පවත්වල, ඒ බාවරී බ්‍රාහ්මණ ආචාර්යවරයා ආශ්‍රමයට ආව හැටියෙම, එක්තරා ආගන්තුක බ්‍රාහ්මණයෙක් ඇවිල්ල ඉල්ලනව, මට කහවණු පන්සීයක් දෙන්න කියල. එතකොට මේ බාවරී බ්‍රාහ්මණයා කියනවා මගේ තිබුණු ඔක්කොම දාන වස්තුව දීල ඉවරයි. කහවණු පන්සීයක් දෙන්න හැටියක් නැහැ කියල. එතකොට මේ කුහක බ්‍රාහ්මණයා කියනව 'ඔබට ඒ මා ඉල්ලන දේ දෙන්න බැරිනම් සත් දිනකින් ඔබේ හිස සත්කඩකට පැලෙනවා ඇති' කියල. මේක ශාපයක් නිසා මේ බාවරී බ්‍රාහ්මණයා බයවෙලා, ආහාරත් නොගෙන, ධ්‍යාන වඩන්නත් බැරිව, දුකෙන් ඉන්නව දැකල, හිතවත් දේවතාවෙක් ඇවිල්ල බාවරී බ්‍රාහ්මණයාට කියනව සැනසීම් වශයෙන්, 'ඒ කුහක බ්‍රාහ්මණයා හිස් මුදුන දන්නෙත් නැහැ. හිස් මුදුනේ ඇද වැටීම දන්නෙත් නැහැ. ඒ පිළිබඳ ඥානයක් ඒ බ්‍රාහ්මණයාට නැහැ' කියල කිවුවා. එතකොට මේ බාවරී බ්‍රාහ්මණයා ඒ දේවතාවාට කියනවා, 'ඔබ දන්නවද හිස්මුදුන මොකක්ද කියල, හිස් මුදුනේ ඇද වැටීම මොකක්ද?' කියල. දේවතාවා කියනවා 'මාත් ඒක දන්නේ නැහැ. හිස් මුදුනත් හිස් මුදුනේ ඇද වැටීමත් පිළිබඳ ඥානය බුදුවරුන්ටම විශේෂ වූ දෙයක්. බුදුවරුන් තමයි ඒ ඥානය දන්නේ.' එවිට ආයිත් කියනවා, 'මේ මුළු පොළෝ තලයේ යම් කෙනෙක් දන්නව නම් මේ කාරණය මට ඒක කියන්නය' කියල. ඔන්න එතකොට දේවතාවා ප්‍රවෘත්තියක් හෙළි කරනවා. 'කපිලවස්තු පුරයෙන් නික්මිලා ඒ ශාක්‍යසිංහ ලෝක නාථයාණන් වහන්සේ සම්බෝධියට පත්වෙලා, දැන් කොසොල් රටේ වාසය කරමින් ලෝකයාට ධර්මය දේශනා කරනවා. විමුක්තව. ඒ සම්බුද්ධ රජාණන් වහන්සේ ළඟට ගිහිල්ල ඔය ප්‍රශ්නය අහන්න'ය කියල. සම්බුද්ධ කියන නම ඇහුන හැටියේ බ්‍රාහ්මණයාගේ ශෝකය සන්සිඳිල හිත ප්‍රීතියෙන් ඉල්පිලා ගියා. ඊට පස්සෙ අහනවා, 'කවර ගමක, ජනපදයක, නගරයකද ඒ භාග්‍යවතුන් වහන්සේ වැඩ වාසය කරන්නේ?' කියල. එතකොට මේ දේවතාවා කියනව 'කොසොල් රටේ සැවැත් නුවර' කියල.

මේ බාවරී බ්‍රාහමණයා, තමන් බොහොම වයෝවෘද්ධ නිසා ශිෂ්‍යයන් දහසය දෙනාට කථා කරල කියනව, ලෝකයේ කලාතුරකින් පහළ වෙන බුදු කෙනෙක්, සම්බුදු කෙනෙක් දැන් පහළවෙලා ඉන්නවා. ඔය පිරිස ගිහිල්ල බුදුරජාණන් වහන්සේ හමුවෙන්න කියල කිවුවහම ඒ පිරිස, ඒ ශිෂ්‍යයින් අහනව 'අපි කොහොමද අඳුනගන්නේ බුදුකෙනෙක්ය කියල.' එතකොට මේ බාවරී බ්‍රාහමණයා කියනව, 'අපේ වේද ග්‍රන්ථවල තියෙනව දෙතිස් මහ පුරුෂ ලක්‍ෂණයක් ගැන. ඒ ලක්‍ෂණ යම් පුරුෂයකුගේ ශරීරය තුළ තියෙනව නම් ඒ පුද්ගලයාට යා හැකි මාර්‍ග දෙකයි තියෙන්නෙ. ගිහිව හිටියොත් චක්‍රවර්ති රජු වෙනව. පැවිදි උනොත් සම්බෝධියට පැමිණෙනව' කියල. ඊළඟට කිවුව 'ඔබ හැම ගිහිල්ල බුදුරජාණන් වහන්සේ මුණ ගැහුනහම මනසින්ම මෙන්න මේ ප්‍රශ්න අහන්න. මගේ වයස, මගේ ගෝත්‍රය, මගේ දැනුම, මගේ ශරීරයේ ලක්‍ෂණ, ශිෂ්‍ය ප්‍රමාණය ආදිය ගැන මනසින්ම අහන්න. ඒ වගේම මුදුනත්, ඒ හිස් මුදුන ඇද වැටීම ගැනත් මනසින්ම ප්‍රශ්න කරන්න. අනාවරණ ඥාන දර්‍ශනය බුදුරජාණන් වහන්සේට තිබෙන නිසා, මනසින් ඇසූ ප්‍රශ්න වලට වචනයෙන් පිළිතුරු දෙනවා ඇති.'

ඒ ශිෂ්‍ය පිරිස පිටත්ව ගියා. දක්‍ෂිණා පථයේ ඉඳල දීර්‍ඝ මාර්‍ගයේ. මේ පිරිස දහසය දෙනෙක්. අජිත, තිස්ස මෙත්තෙයා, පුණ්ණක, මෙත්තගු, ධෝතක, උපසීව, නන්‍ද, හේමක, තොදෙය්‍ය, කප්ප, ජතුකණ්ණි, භද්‍රාවුධ, උදය, පෝසාල, මෝඝරාජ, පිංගිය කියන දහසය දෙනායි, මේ ශිෂ්‍ය පිරිස. එතකොට දිග මාර්‍ගය ගෙවලා ඒ පිරිස යනකොට, බුදුරජාණන් වහන්සේ මගධ රටේ පාසාණක චෛත්‍යය ළඟ, සංඝයා වහන්සේලාට ධර්‍මය දේශනා කරමින් හිටියේ. මේ පිරිස ඒ කන්දට නැගලා - අජිත මානවකයා ඒ බාවරී බ්‍රාහමණයා පැවරූ ප්‍රශ්න හිතින්ම ඇහුවා. පළමුවෙන්ම ඇසුවේ තමන්ගේ ආචාර්‍යවරයා පිළිබඳව. බුදුරජාණන් වහන්සේ වචනයෙන් පිළිතුරු දුන්න. බාවරී බ්‍රාහමණයාගේ වයස එකසිය විස්සයි. ගොත්‍රනාමය බාවරී. ශරීරයේ දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණ වලින් තුනක් තියෙනවා. වේදපාරග තත්තවයට පැමිණි කෙනෙක්. ශිෂ්‍යයින් පන්සීයයි. ඔය ආදී වශයෙන් ප්‍රකාශ කළා. අහන් හිටිය පිරිස පුදුමයට පත් උනා. කිසිම ප්‍රශ්නයක් නැතිව බුදුරජාණන් වහන්සේ මේ ප්‍රකාශ කරන ආකාරය. ඉන්පසු අජිත නැමති ප්‍රධාන ශිෂ්‍යයා අර කියාපු ප්‍රශ්නයත් ඇහැව්ව හිතෙන්. බාවරී බ්‍රාහමණයා අහනවය, මුදුන මොකක්ද, මුදුනේ ඇද වැටීම මොකක්ද කියල. ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ ගාථාවකින් ප්‍රකාශ කරනවා.

අවිජ්ජා මුද්ධාති ජානාහි - විජ්ජා මුද්ධාධි පාතිනී

සද්ධා සති සමාධීහි - ඡන්ද විරියෙන සංයුතා.

ඒ ගාථාවෙන් ප්‍රකාශ කෙරෙන්නේ අවිද්‍යාව මුදුනයි - හිස් මුදුනයි. හිස් මුදුන ඇද හැලීම විද්‍යාවයි. ඒ විද්‍යාව ඡන්ද, විරිය, සති, සමාධි - ඒවායින් යුක්තයි. මේ ගාථාව ප්‍රකාශ කළ හැටියේ අජිත ප්‍රධාන ඒ ශිෂ්‍යයින් දහසය දෙනා බොහොම භක්තියෙන් බුදුරජාණන් වහන්සේගේ පා ළඟ ඇද වැටිල ප්‍රකාශ කරනව, 'බාවරී තමන්ගේ ශිෂ්‍යයින් සමග භාග්‍යවතුන් වහන්සේට වන්දනා කරනවා' කියල. එහෙම කිවුවහම බුදුරජාණන් වහන්සේත් ආශීර්වාද කරනවා, ඒ ශිෂ්‍යයින් වගේම බාවරීත් සුඛිත වේවා! කියල. අජිත මානවකයාටත් විශේෂ ආශීර්වාදයක් කරනවා, 'ඔබත් සුවපත් වේවා! ඔබත් දීර්ඝායුෂ්ක වේවා!' කියල. ඊළඟට පවරනවා 'බාවරීට හෝ ඔබ හැමට යම් ප්‍රශ්නයක් තිබෙනවානම් ඒ ප්රශ්න මගෙන් අහන්න. මම පිළිතුරු දෙන්නම්.' කියල. ඔන්න ඒ අවස්ථාවේ තමයි අර ප්‍රධාන ශිෂ්‍යයා වන අජිත අපි මාතෘකා කළ ගාථාවලින් තමන්ගේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ. මේ පාරායණ වග්ගයේ ඒ දහසය දෙනාගේම ප්‍රශ්නත් ඒවාට බුදුරජාණන් වහන්සේ දුන්න පිළිතුරුත් මහ ගැඹුරු අන්දමින් සඳහන් වෙනවා. අජිත මානවකයා ඇසූ ප්‍රශ්නය තමයි අපි මාතෘකාව හැටියට ගත්තේ.

කෙනස්සු නිවුතො ලොකො - කෙනස්සු නප්පකාසති
කිස්සාභිලෙපනං බ්‍රෑසි - කිංසු තස්ස මහබ්භයං

මේ ලෝකය කුමකින් වැසුනේ වේද?
කුමක් නිසා මේ ලෝකය නො බබලන්නේද?
මේ ලෝකයට ඇති ඇලෙන සුළු ලාටුව මොකක්ද?
මේ ලෝකයට ඇති ලොකුම භය මොකක්ද?

ඔන්න බුදුරජාණන් වහන්සේ පිළිතුරු දෙනව.

අවිජ්ජාය නිවුතො ලොකො - වෙවිච්ඡා පමාදා නප්පකාසති
ජප්පාභිලෙපනං බ්‍රෑමි - දුක්ඛං අස්ස මහබ්භයං

මේ ලෝකය අවිද්‍යාවෙන් වැහිලයි තියෙන්නෙ.
මසුරුකම ප්‍රමාදය නිසා බබලන්නෙ නැහැ.
ඊළඟට තණ්හාව තමයි ලෝකය ඇලිල ඉන්න ලාටුව.
දුකයි ලෝකයට තියෙන මහත් භය.

ඊළඟට තවත් ප්‍රශ්නයක් අජිත මානවකයා අහනව.

සවන්ති සබ්බධි සොතා - සොතානං කිං නිවාරණං
සොතානං සංවරං බ්‍රෑහි - කෙන සොතා පිථීයරෙ
හැම පැත්තෙන්ම තණ්හා දිය පහරවල් ගලා ගෙන එනව.
මේ දිය පහරවල් වළක්වන්නේ කොහොමද?
මේ දිය පහරවල් සංවර කිරීම ගැන ප්‍රකාශ කළ මැනව.
මේ දිය පහරවල් සම්පූර්ණයෙන් වසාලන්නේ කුමකින්ද?

ඔන්න බුදුරජාණන් වහන්සේ පිළිතුරු දෙනවා.

යානි සොතානි ලොකස්මිං - සති තෙසං නිවාරණං
සොතානං සංවරං බ්‍රෑමි - පඤ්ඤායෙතෙ පිථීයරෙ

යම්තාක් ලෝකයේ තණ්හා සැඩ වතුරු තියෙනවා නම්,
සතියයි ඒවායේ නිවාරණය, වැළැක්වීම.

ඒකයි ඒ දියවැල්වල සංවරය කිරීම. නමුත්,
ප්‍රඥාවෙනුයි ඒවා මුළුමනින්ම වසාලනු ලැබෙන්නෙ.

ඔන්න ඒ ප්‍රශ්නත් බුදුරජාණන් වහන්සේ ඒවාට දුන්න පිළිතුරුත් ප්‍රකාශ කළා. දන් තියෙන්නෙ මේ ගැන යමක් කියන්නයි. මේ පින්වතුන්ට තේරෙන්න ඇති, මේ ගාථාවලින් අපට නිතර හමුවෙන අවිද්‍යාවත් තෘෂ්ණාවත් ගැන ප්‍රධාන වශයෙන්ම කියැුනා. ධර්මය දන්න කවුරුත් ඒ කාරණා ගැන ඒ ඒ තැන්වලින් කියවල තියෙනව. විශේෂයෙන්ම 'අනමතග්ග සංයුක්තයේ' බුදුරජාණන් වහන්සේ මේ අවිද්‍යාවත් තණ්හාවත් ගැන ප්‍රකාශ කරපු පාඨය මහ පුදුම සහගතයි.

'අනමතග්ගොයං භික්ඛවෙ සංසාරො පුබ්බාකොටි න පඤ්ඤායති. අවිජ්ජා නීවරණානං සත්තානං තණ්හා සංයොජනානං සන්ධාවතං සංසරතං' ආදී වශයෙන් ප්‍රකාශ කරල තියෙනව.

මේ අවිද්‍යාවෙන් වැහිල තණ්හාවෙන් බැඳිල සසර දුවන්නා වූ, සැරිසරන්නා වූ සත්ත්වයාගේ මුල් කෙළවරක් නොපෙනේ. අවිද්‍යාව පිළිබඳව මුල් කෙළවරක් පෙන්නුම් කරන්න බැරි බව, සමහර තැන් වල බුදුරජාණන් වහන්සේ මෙන්න මෙහෙමත් පෙන්වා දෙනවා.

'ඉතො පුබ්බෙ අවිජ්ජා නහොසි අථ පච්ඡා සමභවී'

මීට කලින් අවිද්‍යාව තිබුණෙ නැහැ. ඊට පස්සෙයි ඇතිඋනේ කියල අවිද්‍යාවේ සීමාවක් දක්වන්න බැහැ. අවිද්‍යාවත් තණ්හාවත් දෙන්නා නිසා තමයි මේ දීර්ඝ කාලයක් සංසාරයේ ලෝකයා සැරිසරන්නේ. ඊළඟට මෙතන කියඋනා අවිද්‍යාවෙන් ලෝකය වැහුනයි කියල. මොකක්ද මේ ලෝකය! මොකක්ද මේ ලෝකය!! ඒක ගැනත් අපි ආර්‍ය්‍ය ව්‍යවහාරයට අනුව මේ ධර්මයට අනුව ලෝකය කියන එක තේරුම් ගන්න උත්සාහ කරමු. අද මේ ලෝකය ගැන බොහෝ දෙනා කථා කරනව. මේ ලෝකය ගැන කථා කළාට මොකද, මේ ලෝකය ගැන තේරුමක් වත් නැති අය බොහෝ විටම විවිධ මත පළ කරනවා. බුදුරජාණන් වහන්සේ ලෝකය ගැන හඳුන්වල දෙනව. ඒ ඒ තැන් වල සූත්‍රවලින් පෙන්වල දෙනව. එක් අවසථාවක බුදුරජාණන් වහන්සේගෙන් අහනව සමිද්ධි කියන සවාමීන් වහන්සේ,

'ලොකො ලොකොති භන්තෙ වුච්චති කිත්තාවතානුඛො භන්තෙ ලොකොති වුච්චති.'

'ලෝකය, ලෝකය කියල මිනිස්සු කියනව. කෙතෙකින්ද මේ ලෝකයක් වෙන්නෙ?'

ඔන්න එතකොට බුදුරජාණන් වහන්සේ කියනව,

'යත්ථ ඛො සමිද්ධි අත්ථි චක්ඛු, අත්ථි රූපා, අත්ථි චක්ඛු විඤ්ඤාණං, අත්ථි චක්ඛු විඤ්ඤාතබ්බා ධම්මා, අත්ථි තත්ථ ලොකොවා ලොක පඤ්ඤත්තිවා.'

'යම් තැනක ඇසක් තියෙනව නම්, රූප තියෙනව නම්, චක්ඛු විඤ්ඤාණයක් තියෙනව නම්, චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු දේවල් තියෙනව නම් අන්න එතන ලෝකයක් තියෙනවා. ලෝක ප්‍රඥප්තියක් තියෙනවා' කියල. ඒ විදියට ඇස, කණ, නාසය, දිව, කය, මන කියන ආයතන හය ආශ්‍රයෙන් - ලෝකය හඳුන්වන්නෙ. ඒ විදියට කොතෙකුත් තැන් වල මෙයට සමාන විග්‍රහයන් දක්නට ලැබෙනවා. ආනන්ද සවාමීන් වහන්සේත් එක් අවසථාවක සංඝයා වහන්සේලා අමතල ප්‍රකාශ කරනවා. 'යෙන ඛො ආවුසො ලොකස්මිං ලොක සඤ්ඤී හොති ලොකමානී අයං වුච්චති අරියස්ස විනයෙ ලොකො' යමකින් ලෝකය පිළිබඳව සංඥාවක් මානයක් ඇති කර ගන්නවා නම් ඒකයි මේ ආර්‍ය්‍ය ව්‍යවහාරයේ ලෝකයයි කියල කියන්නේ. කුමකින් ද මේ ලෝකය පිළිබඳ සංඥාවක් මානයක් ඇති කර ගන්නෙ? ඇස, කණ, නාසය, දිව, කය, මන. ඔන්න ඔයින්. අපට තේරෙනව බුදුරජාණන් වහන්සේගේ ධර්මයට අනුව ලෝකය කියන්නේ සළායතන ලෝකයයි.

සළායතනයට පර්‍යාපන්නව සළායතනයට ඇතුල් වන හරිය තමයි ලෝකය.

ඊළඟට අපි මේක ගැන වඩාත් ගැඹුරු අවබෝධයක් ලබා ගන්න, එක්තරා වටිනා කථාවක් ඉදිරිපත් කරමු. අංගුත්තර නිකායේ එක තැනක වේරඤ්ජ කියන බ්‍රාහමණයෙක් බුදුරජාණන් වහන්සේට නිග්‍රහ කිරීමට වචන කීපයක් යෙදුව. බුදුරජාණන් වහන්සේ හැම වචනයකටම නව්‍යාර්ථයක් නංවල, ධර්මය පැත්තට නැඹුරු කරල, ඒ වචනයේ තියෙන ඒ කිලිටි බව නැති කළා. ඒ වගේ මේ වේරඤ්ජ බ්‍රාහමණයා කිවුව එක වචනයක් තමයි, 'අපගබ්භො සමණො ගොතමො' ශ්‍රමණ ගෞතමයින් අපගබ්භ යයි කිවුව. ඉන් අදහස් කළේ නරක උත්පත්තියක් තියෙනව කියන එකයි. නරක ගර්භයකින් උපන් කියන එකයි. අපි හිතමු ඔය මේ කාලයේ කුණුහරුප කියන්න වගේ එහෙම එකක්. එතකොට බුදුරජාණන් වහන්සේ කිවුව 'ඔව්.' එහෙම තමයි. මම 'අපගබ්භ' තමයි. 'මම නැවත මවුකුසක උපත ලබන්නේ නැහැ. ඒක නිසා ඔබ කියපු එක හරි' එහෙම කියල නැවැත්වුවෙ නැහැ. ඔන්න අමුතු උපමාවක් දෙනව. 'බ්‍රාහමණය, යම්කිසි කිකිලියක් බිත්තර 8 ක් හෝ 10 ක් හෝ 12 ක් දමල ඒ බිත්තර රකිනව. ඒ රැක්ක බිත්තර වලින් යම්කිසි කුකුල් පැටියෙක් පළමුවෙනි වරට නිය තුඩින් හරි හොටයෙන් හරි ඒ බිත්තර කටුව බිඳගෙන එළියට එනව. ඒ කුකුල් පැටියට බ්‍රාහමණය, නුඹ කියන්නේ කණිෂ්ඨ කියලද? ජ්‍යෙෂ්ඨ කියලද?' බ්‍රාහමණයා කියනව 'භවත් ගෞතමය, මම එයාට කියන්නේ ජ්‍යෙෂ්ඨ කියලයි. අන්න ඒ වගේ හිතාගන්න' කියල. බුදුරජාණන් වහන්සේත් ඒකට සම්බන්ධ කරනවා, 'එසේම, මේ අවිද්‍යාවෙන් වැසුණාවූ, අවිද්‍යාව නැමති බිත්තර කටුවෙ හිරවෙලා ඉන්නාවූ ලෝක සත්ත්වයා අතර, මමයි පළමුවෙන්ම ඒ බිත්තර කටුව බිඳගෙන එළියට ආව 'කුක්කුට පෝතකයා' කුකුල් පැටියා. ඒක නිසා මට ජ්‍යෙෂ්ඨ කියන වචනය කියන්න වෙනවය' කියල.

ඕක ආශ්‍රයෙන් අපට හිතාගන්න පුළුවන්, මොකක්ද බිත්තර කටුව? මොකක්ද බිත්තර කටුව? එතකොට මුළු මහත් ලෝකයා හිරවෙලා ඉන්න බිත්තර කටුව තමයි අර අපි කලින් කියාපු සළායතන බිත්තර කටුව. මේ විද්‍යාඥයො ඇතුළු හැම කෙනෙක්ම ඕක තුළයි හිරවෙලා ඉන්නෙ. එතකොට බිත්තර කටුව බිඳගෙන එළියට එනව කියන්නෙ මොකක්ද? ලෝකෝත්තර වීම. මේ බිත්තර කටුවට සීමා වුණු ප්‍රත්‍යක්ෂය ගැනයි හැම දෙනෙක්ම කථා කරන්නෙ. විද්‍යාඥයො කථා කරන්නෙත්. හැම කෙනෙක්ම දන්නෙත්. නමුත් බුදුරජාණන් වහන්සේගේ ධර්මය ලෝකෝත්තර කියල කියනව. සළායතන නිරෝධ

කියල එක පැත්තකින් පෙන්නුම් කරනව. මේ සළායතන නිරෝධය උන අවස්ථාවේදීත් යම්කිසි ප්‍රත්‍යක්‍ෂයක් තියෙනව. අන්න ඒක තමයි අර බිත්තර කටුවෙන් එළියට ඒම. එතනයි විමුක්තිය තියෙන්නෙ. එතනයි නිවන. අන්න ඒ පැත්තෙන් හිතා ගන්න. අපි අවිද්‍යාවත් ලෝකයත් පිළිබඳ වඩා ගැඹුරු අර්ථයක් එතනින් දුන්නෙ.

ඊළඟට තණ්හාව ගැනත් කියමු. බොහෝවිට තණ්හාව ගැන කියනකොට ලාටුව කියන වචනය යෙදෙනව - 'ලේප'. සමහර විට 'විසත්තිකා' කියලත් කියනව. විසත්තිකා කියන්නෙ ඇලෙන සුළු දෙයක්. සංයෝජන කියන එක තුළ තියෙන්නේත් ඒ බැඳෙන ගතිය. එතකොට අවිද්‍යාවෙන් වහනව. තණ්හාවෙන් අලවනව. එහෙම නැත්නම් බඳිනව. ඔය දෙක තමයි අපි සමහර විට කියන්නෙ තාත්තයි අම්මයි කියල සංසාරෙ. ඔය දෙක තුළින් තමයි මේ මුළු මහත් සංසාර දුක රැස් වෙන්නෙ. පටිච්ච සමුප්පාදය බැලුවහම පේනව අවිජ්ජා පච්චයා කියල පටන් ගත්තහම මැද හරියේ තියෙන්නෙ තණ්හා. කොහෙන් බැලුවත් ඒ දෙක තමයි.

තණ්හාව ගැන, ඒ ඇලෙන සුළු බව පෙන්වන තවත් වටිනා උපමාවක් එක අවස්ථාවක බුදුරජාණන් වහන්සේ කියනව, සතිපට්ඨාන සංයුක්තයේ. මහණෙනි, මේ හිමාලය වනයේ ඇතැම් ප්‍රදේශ තියෙනව සම භූමිභාග. ඒවායේ මනුෂ්‍යයිනුත් සැරිසරනවා. වඳුරොත් සැරිසරනවා. අන්න එවැනි භූමි භාගයක, වඳුරු වැද්දෙක් සමහර විට වඳුරන් අල්ලන්න ලාටු වගයක් අටවනවා. අපි හිතමු මොකක් හරි ලී කැබැල්ලක නැත්නම් ගසක කඳක ලාටු අලවල තියෙනව. වඳුරන්ට රස ඇති ලාටුවක් වෙන්න ඇති. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා, එච්චර ලොල් සවභාවය නැති යම්කිසි අවබෝධයක් ඇති වඳුරන් ඈතදීම දැකල ඒ ලාටුවෙන් ඉවත් වෙනවා. නමුත් ලොල් සවභාවය ඇති මෝඩ වඳුරො ඇවිල්ල ඒ ලාටුව දැකල, ඔන්න එක අතකින් අල්ලනව. ඒක ඇලෙනවා. දෙවෙනි අතෙන් ඒක මුදා ගන්න බලනව. ඒකත් ඇලෙනව. කකුලක් ළං කරනවා අත මුදා ගන්න. ඒකත් ඇලෙනවා. දෙවෙනි කකුල ළං කරනවා. ඒකත් ඇලෙනවා. ඊට පස්සෙ ඉතින් තමන්ගේ කට - හොම්බ කිට්ටු කරනවා, අත මුදා ගන්න. ඒකත් ඇලෙනවා. ඔන්න එතකොට පස් තැනකින් ඇලිල ඉන්නකොට, අර වඳුරු වැද්දා ඇවිල්ල විදල, වඳුරා ලී කෑල්ලත් එක්කම උස්සගෙන යනවා. මොකක්ද මේ උපමාවෙන් කියන්නෙ. පංචකාම ගුණ. පංචකාමයත් අන්න ඒ විධියයි කියල බුදුරජාණන් වහන්සේ උපමාවෙන් පෙන්නුම් කරනවා. ඒ අර ඇලෙන සුළු ගතිය හොඳට පෙන්නුම් කරනවා, ඒ උපමාව තුළින්. මුළු මහත් දුක සකස් වෙන්නෙ

ඔය දෙක තුළයි. 'ජපපාභිලෙපනං බ්‍රෑමි' (තණ්හාව තමයි ලෝකය ඇලිල ඉන්න ලාටුව)

ඊළඟට ලෝකෙට තියෙන ලොකුම භය තමයි දුක. පටිච්ච සමුප්පාද සූත්‍රවලිනුත් අපට පෙන්නුම් කරන්නෙ දුක සකස් වෙන හැටි. මුළු මහත් පඤ්ච උපාදානසක්ඣ දුක්ඛය සකස් වෙන හැටි. අවිද්‍යාවෙන් පටන්ගෙන තණ්හාවත් - ඒ දෙක එකතු වෙලා අන්තිමට මුළු මහත් පඤ්ච උපාදානසක්ඣ දුක්ඛයක් සකස් වෙනව. ඒ මුල් ගාථාවෙන් කියවුණු ප්‍රධාන කාරණා ටිකයි ඒ පෙන්නුවේ. ඊළඟට කියන්නෙත් තණ්හාවෙම ස්වභාවයක්. 'සවනති සබ්බධී සොතා' අජිත මානවකයා අහනවා. හැම පැත්තෙන්ම තණ්හා දිය පහරවල් ගලාගෙන එනවා. කොහොමද මේවා වළක්වන්නේ? කියන ප්‍රශ්නයයි අහන්නේ. ඒ දිය පහරවල් ගැනත් සමහර අවස්ථාවල දක්වල තියෙනවා, තිස් හයක් හැටියට. 'යසස ඡත්තිංසතී සොතා මනාපසසවනා භූසා' යනුවෙන්. මේව තේරුම් කරන්නෙ මෙහෙමයි. ඇස, කණ, නාසය, දිව, කය, මන යන ඉන්ද්‍රියවලින් ඒ අරමුණු වෙතට ගලාගෙන යනව තණ්හා දිය පහරවල්. ඒ හය කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා කියන 3 න් වැඩි කරපුවහම 18 ක් වෙනවා. ඒක ආධ්‍යාත්මික බාහිර කියන 2 න් වැඩි කළහම 36 ක් වෙනවා. සමහර අටුවා ආදියේ දක්වනවා ඒක අතීත අනාගත වර්තමාන වශයෙන් තවත් 3 කින් වැඩි කරපුවහම 108 ක් වෙනවා. ඔන්න ඔහොම 108 ක් වූ තණ්හා දිය පහරවල් වළක්වන්නේ කොහොමද? කියන එකයි ඒ අජිතගේ ප්‍රශ්නය. බුදුරජාණන් වහන්සේ කියනව, ඒක සතියෙන්. සතියෙනුයි. 'සති නිවාරණං' ඒ නිසා තමයි, මේ පින්වතුන්ට හිතාගන්න පුළුවන්, සතර සතිපට්ඨානයට අර තරම් තැනක් බුදුරජාණන් වහන්සේ දීල තියෙන්නෙ. ඒකායන මාර්ගය හැටියට 'චත්තාරො සතිපට්ඨානා' මේ සතියත් ප්‍රඥවත් තමයි ඇත්ත වශයෙන් මේ ධර්ම අතර ප්‍රායෝගික වශයෙන් ඉතාමත්ම වැදගත් දේවල්. මේ සතියේ වැදගත්කම හෙළි වන තව නොයෙකුත් සූත්‍ර තිබෙනවා. මේවා අපි එක එකක් පෙන්නුම් කරන්නේ මේවා ගැන ගැඹුරින් හිතන්නයි.

එක් අවස්ථාවක උණ්ණාභ කියල බ්‍රාහමණයෙක් බුදුරජාණන් වහන්සේගෙන් ඇවිල්ල අහනව, මේ පංචේන්ද්‍රියයන් - ඇස, කණ, නාසය, දිව, කය කියන ඒ ඉන්ද්‍රියයන්ට අදාල වෙන වෙනම ගොදුරු බිම් තියෙනව. ඒ කියන්නේ ඇසට රූප දකින්න මිසක් කණින් කරන දේවල් කරන්න බැහැ. ඒ කණට බැහැ රූප දකින්න. ඒ වගේ එක එක්කෙනාට අයිති ගොදුරු විෂයයන් - ගෝචර විෂය කියල කියන්නේ,

ඇස ගොදුරු ගන්නේ රූප මාර්ගයෙන්. ඇසට රූප ගොදුරු. කණට ශබ්ද ගොදුරු - ඒ විදියට හිතා ගන්න. ඒ මුල් පහට අදාල ගොදුරු බිම් වෙනස්. ඊළඟට ඒ බ්‍රාහමණයා අහනව, භවත් ගෞතමයිනි, මේ ඉන්ද්‍රියයන් පහේ ගොදුරු බිම්වලින් ගේන ගොදුරුවලට පිළිසරණ මොකක්ද? පිළිසරණ කියන්නේ ඒව ගිහිල්ල එකතු වෙන්නෙ කොහෙද? බුදුරජාණන් වහන්සේ පිළිතුරු දෙනවා. 'මනසයි.' මේ පින්වතුන්ට ඒක හිතාගන්න පුළුවන්. මේ බාහිර ඉන්ද්‍රියයන් පහෙන් ගිහිල්ල එකතු වෙනව, මනසට. ඔන්න ඊළඟට තව ප්‍රශ්නයක් අහනව. මනසට පිළිසරණ මොකක්ද? බුදුරජාණන් වහන්සේ ඊට දෙන පිළිතුර සතිය. මනසට පිළිසරණ සතිය. මේක තවත් ඈතට යනවා. ගැටළුවක් නැත්නම් ප්‍රහේලිකාවක් වගේ සාමාන්‍යයෙන් බැලුවහම. නමුත් මුළු මහත් ධර්මයම ඒක තුළ අඩංගු වෙනවා. ඊළඟට අහනව සතියට පිළිසරණ මොකක්ද? සතියට පිළිසරණ විමුක්තියයි. විමුක්තියට පිළිසරණ මොකක්ද? විමුක්තියට පිළිසරණ නිවනයි. එතනින්ම කථාව ඉවරයි.

මෙයින් අපට පේන්නේ සතිය කොයි තරම් වැදගත් ද කියල. කයින් ගේන ඒව සිතට ආවට පස්සෙ ඒවා පිළිබඳ කිසියම් පාලනයක් කරන්න පුළුවන් සතියෙන්. ඒ නිසාම තමයි කොතෙකුත් සූත්‍රවල මේ පින්වතුන් අහල තියෙන්නෙ - විශේෂයෙන්ම ඉන්ද්‍රිය සංවරය ගැන කියනකොට - සතිය දොරටුපාලයෙක් හැටියටත් දක්වල තියෙනව. 'ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා' කියල තියෙන්නෙ. දොරටුපාලයාට අයිති වැඩක්නෙ, සුදුසු අය ඇතුල් කරනව, නුසුදුසු අය එනකොට දොර වහනව. අන්න ඒ වගේ. තවත් තැන් වල 'සති ආරක්ඛ සාරථී' කියල සතිය හඳුන්වල තියෙනවා. රථයක උපමාවකින් දක්වපු අවස්ථා තියෙනව. රථයක් පදවන සාරථී - රියදුරා - ඒ වගේම රැක්මේ යෙදෙන කෙනා, ඒ වගේම දොරටුපාලයා, ඒ විධියටයි සතියේ කෘත්‍යය පෙන්නුම් කරන්නේ. සිතට ආරක්ෂාව සපයා දෙනවා. ඒ නිසා තමයි ඒ සතිය ඒ තරම් වැදගත් හැටියට මේ ගාථාවේ පෙන්වා දෙන්නෙ. නමුත් අන්තිම පදය සමහර විට ගැටළුවක් වෙන්න පුළුවන්. සතියෙන් කරන්නේ වැළැක්වීම විතරයි. තාවකාලිකව ගලාගෙන එන දිය පහරවල් වැළැක්වීම පමණයි, සතියෙන් කෙරෙන්නෙ. මේක සම්පූර්ණයෙන් මුළුමනින් වසාලන්නේ ප්‍රඥාවෙන්. එතන ගැටළුවක්.

මොකක්ද මේ ප්‍රඥාව කියන්නේ? කොහොමද මේ ප්‍රඥාවෙන් ඔක්කොම වහන්නේ? දිය පහරවල්. එතන ඉඳල අපි ටිකක් ඈතට යමු. දැන් අපි ප්‍රකාශ කළානේ, මුදුනත්, මුදුනේ ඇද හැලීමත් කියන කථාන්තරය. ඒකනේ මේ මුළු මහත් දේශනාවට මුල. එතකොට මුදුන

අවිද්‍යාව කියල කිව්ව. මුදුනෙ ඇද හැලීම කියන්නෙ අවිද්‍යාව බිඳ හෙලීම. අවිද්‍යාව බිඳ හෙලන්නේ කොහොමද? අවිද්‍යාව බිඳ හෙලීම තුළින් තමයි විද්‍යාව මතුවන්නේ. අවිද්‍යාව නැති වෙනකොට විද්‍යාව මතුවෙනවා. 'විජ්ජා' කියන්නේ අවබෝධය. අවබෝධය ගැන කියනකොට ප්‍රඥා කථාව එනවා. ප්‍රඥාව ආලෝකයක් හැටියට දක්වෙනවා, සමහර තැන් වල. අපි කිවුවනේ බිත්තර කටුවෙ හිරවෙලා ඉන්නව කියල. බිත්තර කටුවෙන් එලියට ආවට පස්සෙ තමයි නියම විදියටම පේන්නෙ. බිත්තර කටුවෙ හිරවෙලා ඉන්න කෙනාට ඊට එහාට පේන්නෙ නැහැනෙ. ඒක නිසා තමයි, මහ පුදුම විදියට ප්‍රඥාව ගැන දක්වල තියෙන්නෙ. ඇතැම් තැන් වල ප්‍රඥාව ඇසක් හැටියට දක්වනව. මේ පින්වතුන් අහල ඇති මසැස, දිවැස, පැණැස, මාංශ චක්ෂුසය කාටත් තියෙනව. ඊළඟට දිබ්බ චක්ඛු කියල කියන ඍෂිවරුන් ධ්‍යාන ලාභීන් ලබාගන්නා දිවැස. ඊටත් වඩා ඉහළ එක තමයි බුදුරජාණන් වහන්සේ ලෝකයට හඳුන්වල දුන් ප්‍රඥා ඇස. ඒ ප්‍රඥා ඇස මතු කර දුන්න ආකාරය දක්වෙන, ප්‍රඥාව හඳුන්වන එක්තරා පාඨයක් තියෙනව.

'උදයත්ථ ගාමිනී පඤ්ඤා අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛඛය ගාමිනියා' මේ ප්‍රඥාවේ මූල බීජය එහෙම නැත්නම් ප්‍රඥාව ආරම්භ වෙන්නේ යෝගාවචරයාගේ අවබෝධයට ගැලපෙන ආකාරයට. 'උදයත්ථ ගාමිනී' ඇතිවීම් නැතිවීම් පෙනෙන ප්‍රඥාව. එතකොට ලෝකයා ඉන්නෙ සමුදය පක්ෂයේ. සාමාන්‍යයෙන් නිරෝධය විෂය වෙන්නෙ නැහැ. ඒක පෘථග්ජනයා නො තකා හරිමින් නිරන්තරයෙන් සමුදයෙන් සමුදයට යනවා. ඒකයි 'තණ්හා පොනොභවිකා' කියල කියන්නේ. පුනර්භවය - භවයෙන් භවය ඇඳනවා. අලවනවා. ප්‍රඥාවේ මූලික කෘත්‍යයා වැසිල තියෙන නිරෝධය මතු කරල දෙනව. ඒකෙ මූලික එක තමයි 'උදයත්ථගාමී.' මේ ලෝකයේ ඇතිවීමත් නැතිවීමත් - අනිත්‍යතාව කියන එක යෝගාවචරයා තේරුම් ගන්නේ ඔන්න ඔය වචන දෙකෙන්. සමුදය - වය කියල කියන්න පුළුවන්. උදය - අත්ථගම කියල කියන්න පුළුවන්. ඇතිවීම නැතිවීම. මේක සංස්කාරවල සවභාවයයි.

අනිච්චාවත සංඛාරා
උප්පාද වය ධම්මිනො
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති
තෙසං වූපසමො සුඛො

ඔතනම තියෙනව ඔක්කොම. මැරුණට පස්සෙ කියන එකක් නොවෙයි මේක.

අනිච්චා වත සංඛාරා - සංස්කාර හැම එකක්ම අනිත්‍යයි.
උප්පාද වය ධම්මිනො - ඇතිවීම් නැතිවීම් සවභාවයයි.
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති - ඇතිවෙන්නේ නැතිවෙන්නයි.
තෙසං වූපසමො සුඛො - ඒවායේ සන්සිදීම සුවයයි. අන්න ඒ ටික තමයි ප්‍රඥාවට හේතු වෙන්නෙ, නිරෝධය කරා යන මාර්ගය.

ඒ ප්‍රඥාව ඇතැම් තැන් වල ආලෝකයක් හැටියට දක්වනවා. මේවා සමහර විට කෙනෙකුට ගැටළු වෙන්න පුළුවන්. මේවා නිකම් උපමා කියලත් හිතන්න පුළුවන්, ඇතැම් තැන් වල බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන ඒවා. ආලෝකයට උපමා රාශියක් තියෙනවා. 'ආභා' කියල කියනව. 'පභා' කියල කියනව. එක් සූත්‍රයක් තියෙනව, සමහරු එතරම් ගණන් ගන්නෙ නැති. ලස්සනට කියාපු එකක් කියල හිතනව. 'චතස්සො ඉමා භික්ඛවෙ පභා කතමා චතස්සො. චන්දප්පභා, සුරියප්පභා, අග්ගිප්පභා, පඤ්ඤාපභා.' ඒ අතරින් 'චතුන්නං පභානං පඤ්ඤාපභා,' ලෝකයේ ඒ ප්‍රභාවල් ආලෝකවල් තියෙන්නෙ හතරයි. චන්ද්‍රප්‍රභාව, සූරියප්‍රභාව, අග්නිප්‍රභාව - (ගින්නේ ප්‍රභාව), අන්තිමට කියනව පඤ්ඤාපභා. ඔක්කෝම ප්‍රභාවන් පරදිනව මේ ප්‍රඥා ප්‍රභාවෙන්. මේක නිකම්ම කියාපු එකක් නොවෙන බව හිතාගන්න පුළුවන්. අපි කිව්වනේ මේක අවිද්‍යාවේ සිට විද්‍යාව කරා යන ගමනක්. ඒ වගේම අඳුරේ සිට ආලෝකය කරා යන ගමනක්. පඤ්ඤා වචනය තුළ තියෙන්නේ ඒ ආලෝකයයි. 'පඤ්ඤා පජ්ජෝතො' කියල කියනව. රහතන් වහන්සේගේ ප්‍රත්‍යක්ෂය ගැන කියවෙන නොයෙකුත් තැන් වල අවසාන වශයෙන් සඳහන් වෙන එකක් තමයි,

'පඤ්ඤාය චස්ස දිස්වා ආසවානං පරික්ඛයං ගච්ඡන්ති'
ප්‍රඥාවෙන් දැකල ආශ්‍රවයන් ක්ෂය වෙනව.

අන්න ඒක නිසා තමයි කිවුවේ මේ ගලාගෙන එන තණ්හා සැඩ වතුරු, සතියෙන් සම්පූර්ණයෙන්ම වසාලන්න බැහැ. ඒක කරන්න ඕනෙ ප්‍රඥාවෙන්මයි. මොකද ආසව කියන වචනය තුළ තියෙන්නෙත් ගලා යාමනෙ. ආශ්‍රවයන් ක්ෂය කරන තාක් විමුක්තිය සම්පූර්ණ නැහැ. අන්න ඒ ආශ්‍රවයන් ක්ෂය කළ අවස්ථාවේයි ඔක්කොම සම්පූර්ණ වන්නේ. ආලෝකය - ප්‍රඥා ආලෝකය - ඇතුළතින් එන ආලෝකයක්. ඒ ආලෝකය, - මෙතන කිවුවනෙ චන්ද්‍රප්‍රභාව, සූර්යප්‍රභාව, ඒ හැම එකක්ම පරදවනව කියල. ඒකට අදාල ගාථාවක් තියෙනව, දීර්ඝ කාලයක් උගතුන් සාකච්ඡා කළ එකක්. බාහිය සූත්‍රයේ අගට.

යත්ථ ආපො ච පඨවි - තෙජො වායො න ගාධති

න තත්‍ථ සුක්කා ජෝතන්ති - ආදිච්චො නප්පකාසති
න තත්‍ථ චන්දිමා භාති - තමො තත්‍ථ න විජ්ජති
යදා ච අත්තනාවෙදි - මුනි මොනෙන බ්‍රාහමණො
අථ රූපා අරූපා ච - සුඛ දුක්ඛා පමුච්චති

මේක මහ ප්‍රහේලිකා ගාථාවක් හැටියටයි තියෙන්නෙ. බාහිය දරුචීරිය ඒ තාපස තුමා ක්ෂණිකව රහත්වෙලා පිරිනිවන් පෑවට පස්සෙ, ඒ පිළිබඳව උදාන ගාථාවක් හැටියට, බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළ ගාථාව මහ ගැඹුරු එකක්. ඒක තුළ මේ කාරණය කියවෙනවා සියුම් අන්දමින්.

'යත්‍ථ ආපො ච පඨවි - තෙජො වායො න ගාධති'

යම් තැනක, ඒ කියන්නේ යම් විඤ්ඤාණයක් තුළ, හැම කෙනාම මේ මහා භූත ධර්ම තුළ නේ රඳා පවතින්නේ, මේ පඨවි, ආපො, තේජෝ, වායෝ ඒ සිතේ පිහිටන්නේ නැහැ. පිහිටීමක් ලබන්නේ නැහැ. අන්න එබඳු ඒ තත්ත්වයේ දී

න තත්‍ථ සුක්කා ජෝතන්ති - තරු බබලන්නේ නැහැ.

ආදිච්චො නප්පකාසති - සූර්යයාවත් ප්‍රකාශයට පත්වෙන්නේ නැහැ. ආලෝකය විහිදුවන්නේ නැහැ.

න තත්‍ථ චන්දිමා භාති - හඳ වත් දිලිසෙන්නේ නැහැ.

මොකද හේතුව? ඒ ප්‍රඥා ප්‍රභාවය තුළ - අර ලෝකයාට ආලෝකය දෙන වස්තු ඔක්කොම මාධ්‍යයක් ඔස්සේ එන්නේ. ලෝකයා යමක් දකින්නේ මාධ්‍යයක් ඔස්සේයි. එක්කෝ තරු එළිය ඕනෙ, අන්ධකාර රාත්‍රියක නම්. එහෙම නැත්නම් හඳ එළිය ඕනෙ. නැත්නම් ඉර එළිය ඕනෙ. එහෙමත් නැත්නම් - අග්නි කියල කියන්නේ, ගිනි - විදුලිය ආදී ඔක්කොම එයට අයිතියි. ඒ ආලෝකයක් තුළින් තමයි අපි දකින්නේ. නමුත් ප්‍රඥා ආලෝකයක් ආවහම අරවා නිෂ්ප්‍රභා වෙනවා. හඳ, ඉර, තරු ඔක්කොම නිෂ්ප්‍රභා වෙනවා. ඒකයි අපට කියන්න තියෙන්නෙ. මොකද ඒකට අරව අහුවෙන්නෙ නැහැ. අර සළායතනයෙන් මිදුණ අවස්ථාවේ ඒ ප්‍රඥා ප්‍රභාව, අන්න ඒක තුළ තමයි ආශ්‍රවයන් ක්ෂය වෙනව කියල කියන්නේ.

'පඤ්ඤාය තස්ස දිස්වා' ඒ ප්‍රඥාව තුළින් දකල ආශ්‍රවයන් ක්ෂය වෙනවා. අන්න විමුක්තිය. සති ළඟට තියෙන පඤ්ඤා කියන වචනය ඉතාම වැදගත් වෙනවා. සමහර අය මෙය නොයෙකුත් ආකාරයෙන්

තේරුම් කරනවා. මේකට හොඳ සාධකයක් අජිත මානව පුච්ඡාවෙමත් සඳහන් වෙනව. අර ගාථාවලට උත්තර ලැබුණට පස්සෙ අජිත මානවකයා බුදුරජාණන් වහන්සේගෙන් අහනව, 'යම් තැනක නාම රූපය උපරෝධනය වේද ඒ කොතැනද?' කියල අහනව. (යත්ථ නාමඤ්ච රූපඤ්ච, අසෙසං උපරුජ්ඣති) අන්න එතෙන්දි බුදුරජාණන් වහන්සේ කියනව 'විඤ්ඤාණස්ස නිරොධෙන, එත්ථෙතං උපරුජ්ඣති' විඤ්ඤාණය නිරුද්ධ උන අවස්ථාවෙයි මේ නාම රූපය උපරෝධනය වෙන්නෙ. නිරොධය, උපරොධනය කියල වචන දෙකක් එතන සඳහන් වෙනව. විඤ්ඤාණ නිරෝධය කියල කියන්නේ - අභිසංඛත විඤ්ඤාණය, නොරහත් විඤ්ඤාණය නාම රූපය ඇසුරු කරගෙනයි තියෙන්නෙ. නාම රූපය ඇසුරු කරගෙන පැවති සංඛත විඤ්ඤාණය, සකස් කර ගත්තු විඤ්ඤාණය, යම් වෙලාවක නිරුද්ධ උනාද අන්න ඒ අවස්ථාව අනිදස්සන විඤ්ඤාණය කියල කියනව. ඒ විඤ්ඤාණය නාම රූපය පෙන්නුම් කරන්නේ නැහැ. ඒ අනිදස්සන විඤ්ඤාණය තමයි ඒ විමුක්ත සිතේ තත්තවය. එතන තමයි අර හඳ, ඉර ආදියට තැනක් නැත්තේ. සූත්‍රය අවසාන වෙන අවස්ථාවෙත් ඒ විදියේ දෙයක් කියවෙනවා.

විඤ්ඤාණං අනිදස්සනං - අනන්තං සබ්බතො පහං
එත්ථ ආපො ච පඨවි - තෙජො වායො න ගාධති
එත්ථ දීඝං ච රස්සං ච - අණුං ථූලං සුභාසුභං

ඔය විදියට දිගට යනව ඒ ගාථාව. ඒ කියන්නේ ඒ අනිදස්සන විඤ්ඤාණය, නාම රූපයක් පෙන්නුම් නොකරන විඤ්ඤාණය, ඒ විමුක්ත හිත. ඒක අනන්තයි. දිග කොට ආදී ඒ අන්ත කිසිවක් නැහැ. 'අනන්තං සබ්බතො පහං' හැම පැත්තෙන්ම ආලෝකවත්. අන්න ඒකයි හේතුව. එතකොට හැම පැත්තෙන්ම ආලෝකවත් නිසා ලෝකයා ආලෝකය දෙන වස්තු හැටියට දක්වන දේ සියල්ලම නිෂ්ප්‍රභා වෙන අවස්ථාවක් ඒක. ඒකයි හඳ, හිරු ආදිය නො බබලනවා කියල කිවුවෙ. මේවායින් ලැබෙන්නේ සාමාන්‍ය වචනවලින් ලැබෙන අර්ථය නොවෙයි. ප්‍රඥා ආලෝකය කියන එක බාහිරව වෙන එකක් නොවෙයි. ඇතුළතින්ම එන එකක්. ඒ ඇතුළතින්ම එන ප්‍රඥා ආලෝකය හමුවේ මුළු මහත් නාම රූප ලෝකය නිරුද්ධ වෙනවා. එහෙම නැත්නම් උපරෝධනය වෙනවා. ඒ උපරෝධනය වුණු තත්තවය තමයි අරහත්ඵල සමාපත්තිය තුළ තියෙන්නේ. ඒකට අදල සූත්‍ර අපි නොයෙකුත් අවස්ථාවල පෙන්නුම් කරල තියෙනව. සළායතන නිරෝධය - සළායතන නිරෝධයම නිවන හැටියට දක්වල තියෙනව. අර කිවුව ආකාරයට සළායතනය ලෝකය නම්, ඒ ලෝකයේ නිරෝධය

කියන්නේ ලෝකෝත්තර තත්තවයක්. බිත්තර කටුව බිඳගෙන එළියට ආපු අවසථාව. සාමාන්‍ය ලෝකයා හිතන දර්‍ශනය නොවෙයි. ඒ දර්‍ශනය එහෙමපිටින්ම විවෘත දර්‍ශනයක්, ඒ විවෘත මනස තුළ තියෙන්නේ. මේ හඳගත්තු දෙයක් තමයි සංඛත කියන්නේ. නාම රූපය සංඛත දෙයක්. ඒක හඳගන්න හැටිත් ඊළඟට අපි තව ටිකක් කියනවනම් - මේවා ගැන අපි යම් යම් ප්‍රමාණයකට පටිච්ච සමුප්පාද දේශනාවල කියල තියෙනව.

පටිච්ච සමුප්පාදයේ අංග දෙළහ අපි කවුරුත් දන්නා හැටියට පටන් ගන්නෙ අවිද්‍යාවෙන් තමයි. නමුත් අපි පෙන්වල දුන්න ඒ අවිද්‍යාව නමැති අන්ධකාරය තුළ යම්කිසි සංස්කරණයක් කෙරෙනවා. ඒ සංස්කරණය - අපට කියන්න පුළුවන් අඳුරෙ අතපත ගෑමක් වගේ. ඒ අඳුරෙ අතපත ගෑම තුළින් පෘථග්ජන පුද්ගලයා හඳගන්නව ඒ සංස්කරණය. සමහර විට දක්වනව මෙහෙම. පැවැත්ම සඳහා මූලිකවම අවශ්‍යවෙන සංස්කරණය තමයි ආශ්වාස ප්‍රශ්වාස දෙක. මේ ආශ්වාස ප්‍රශ්වාස දෙක තමා සහ ලෝකය පිළිබඳ හැඟීම් ලබා දෙන දෙයක්. ආශ්වාසයට ගන්න හුස්ම ටික පිටත ලෝකයෙන් ගන්න දෙයක්. අරගෙන ආපහු දෙනව ලෝකයට. එතනම අහුවෙනව ලෝකයට. ආශ්වාස ප්‍රශ්වාස තමයි 'කාය සංස්කාර' හැටියට දක්වන්නේ, අවිජ්ජා පච්චයා සංඛාරා කියන තැන. ඊළඟට වචී සංඛාරො, ලෝකයා ජීවත් වෙන්නට වචන පාවිච්චි කරනවා, අදහස් හුවමාරු කර ගැනීමට. නමුත් ඒක යටින් තියෙනව සංස්කාර හැටියට දක්වන විතක්ක විචාර. වචනයක් පිට කරන්න කලින් - ප්‍රශ්නයක් නම් හුඟාක්වෙලා හිතලනේ වචනයක් පිට කරන්නේ. අන්න එබඳු අවසථාවල - හිතාගන්න.

බුදුරජාණන් වහන්සේ එතන සංඛාර කියල හැඳින්වූවේ කර්‍ම නොවෙයි. ඉතාම සියුම් සංස්කාර පැත්ත. ආශ්වාස ප්‍රශ්වාස. ඒවත් භවයට අයිතියි. පැවැත්ම එතනමයි තියෙන්නේ. ආශ්වාසයක් අරගෙන ඒක රඳවගන්න බලනව. ඒක ගියහම විගහට හුස්මක් ගන්නව. තණ්හාව එතනම තියෙනව. අවිද්‍යාව එතනම තියෙනව. මේ ආධ්‍යාත්මික වශයෙන් උපාදින්න ශරීරය රැක ගැන්ම සඳහා විතක්ක විචාර - ඒවා තුළින් අර වචනය නිකුත් කරනව. ඊළඟට සංඥා වේදනා චිත්ත සංස්කාර. සංඥාවත් වේදනාවත් නිසා තමයි චේතනාවල් ආදිය සකස්වෙලා අපි ක්‍රියා කිරීමට පෙළඹෙන්නේ. අවිද්‍යා පසුබිම තුළ ඒ සංස්කාරවලින් කෙරෙන්නෙ මොකක්ද? ඒක තුළින් මතුවෙන්නෙ විඤ්ඤාණයත් නාමරූපයත් කියල දෙකක්. විඤ්ඤාණ කියල කියන්නේ වෙන් කර ගැනීම. එක් කෙනෙකුගේ විඤ්ඤාණය තව කෙනෙකුගේ විඤ්ඤාණයට වෙනස්. අනිත් ඔක්කොම සම උනත්, විඤ්ඤාණ

වශයෙන් බලනකොට ඒක ඉතාමත්ම පෞද්ගලික දෙයක්. ලෝකය විඤ්ඤාණයේ පිළිබිඹු වෙනවා, නාම රූප වශයෙන්. ඒක අපි පෙන්නුම් කරල දීල තියෙනවා. වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාර - ඒ නාම ධර්ම තුළින් හඳුනගන්නවා. පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන මහා භූත ධර්මත්. හිතාගන්න අපි මනුෂ්‍යයින් වශයෙන්, ඒ වේදනා සංඥා චේතනාවලින් ලබන ඒ ප්‍රත්‍යක්ෂය තිරිසනුන්ට නැහැ. කුරුල්ලන්ට නැහැ. දියේ ඉන්න සතුන්ට නැහැ. ඔවුන්ට තියෙන්නේ වෙනම ලෝකයක්. ඔවුන්ගේ සළායතන ලෝකය වෙනස්. ඒ නිසා තමයි බුදුරජාණන් වහන්සේ ලෝකය හැඳින්වූයේ හැම තිස්සෙම සළායතන ආශ්‍රයෙන්. එක එක සත්වයාට පෞද්ගලික වූ සළායතන ආශ්‍රයෙනුයි බුදුරජාණන් වහන්සේ ලෝකය පෙන්වූයේ. මොකද ලෝකයේ ආරම්භයත් ලෝකයේ නිරෝධයත් එතනමයි. ලෝකයේ නිරෝධය ගැන කථා කරනකොට - ඔන්න ඔය විදියේ දෙයක් මෙතන තියෙන්නේ. නාමරූපයත් විඤ්ඤාණයත් අතර තමයි සංඛතය සකස් වෙන්නෙ.

ඊළඟට නාමරූප පච්චයා සළායතනං. ඒ විඤ්ඤාණයත් නාමරූපයත් අතර ඇතිවෙච්ච - අපි ද්වයතාවය කියල කිව්වෙ. දෙකක්. දෙකකට බෙදිල යාම. ඒක සළායතනය තුළත් තියෙනවා. සළායතනය කියල කියන්නේ පින්වතුනි, ආයතන හය කියල කියන්නේ - ඇසත් රූපයත්, කණත් ශබ්දයත්, ආදී වශයෙන් ජෝඩු ජෝඩු යන්නෙ. කොයිතරම් ද කියතොත් එක් අවස්ථාවක බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළා, 'මහණෙනි, මම නුඹලාට දෙකක් දේශනා කරනවා. මොකක් ද දෙක? ඇසයි රූපයයි, කණයි ශබ්දයයි, නැහැයයි ගඳ සුවඳයි,' ඔය විදියට කිවුව. මනසයි සිතිවිලියි (ධර්මයි). ඊළඟට බුදුරජාණන් වහන්සේ අභියෝගයක් වගේ කරනවා. මහණෙනි, කවුරුවත් කිවුවොත් මේ දෙක හැර වෙන දෙකක් ලෝකයේ තියෙනවය කියල, ඒක නිකම් හිස් ප්‍රලාපයක්. එයින් පෙන්නුම් කරන්නේ මේ දෙක තමයි දෙක. අන්න ඒ දෙක අතර තරගය තුළින් තමයි පඤ්ච උපාදානස්කන්ධයක් රැස්වෙන්නෙ. ඇස රූපවලට ඇලුම් කරනවා. එක්කො ගැටෙනවා. කණ ශබ්දවලට ඇලුම් කරනවා, ආදී වශයෙන්. ඊළඟට ඒක තුළින් අන්න කර්ම රැස්වෙනවා.

නාම ධර්ම ගැන කිවුවනේ. වේදනා සංඥා, චේතනා, ඵස්ස, මනසිකාර. අපි අර ඇඟිලි පහේ උපමාවෙන් කිවුවේ. මේ පින්වතුන් සිහිපත් කර ගන්න. වේදනාව සුලැඟිල්ලයි කිවුවා. සංඥාව මුදුඇඟිල්ලයි කිවුවා. චේතනාව තමයි මැදඇඟිල්ල, කැපී පෙනෙන මැදඇඟිල්ල. ඊළඟට දබරයට එන ඵස්ස. ඒ දබරැඟිල්ල. අන්තිමට

මහපටැඟිල්ල තමයි මනසිකාරය. අපි නොයෙකුත් ආකාරයෙන් පෙන්නුවේ. මේ ප්‍රඥව කරා යන ගමන පටන් ගන්නේ යෝනිසෝමනසිකාරයෙන්. අපි නොයෙකුත් උපමාවලින් දැක්වුවේ. ලෝකයේ තියෙන කථාන්තරවලින් ගත්තත් නීතිමය වශයෙන් බලනවානම්, සාක්කි කාරයෙක් නැත්නම් නඩුවක් අහක දන්න එපායැ. මේ විඤ්ඤාණයත් නාමරූපයත් අතර ප්‍රශ්නය, මුළු මහත් ඈත අතීතයේ ඉඳල ඒ ඍෂිවරුන්ට පවා සාක්කි කාරයෙක් නැති නඩුවක් වගේ තෝරගන්න බැරිඋනා. විඤ්ඤාණය කොහොමද තෝරගන්නේ. විඤ්ඤාණයෙන්මනෙ හැම දෙයක්ම අපට ඉදිරිපත් කරන්නෙ. කොහොමද ඒක තෝරගන්නෙ. අන්න බුදුරජාණන් වහන්සේ මැදුම් පිළිවෙත යෙදුව. විත්තිකාරයින්ගෙන් කෙනෙක් සාක්කිකාරයෙක් කරගත්ත. ලොකුම වරදකාරයා කවුද? මනසිකාරයා. අයෝනිසො හැටියට මේ අවිද්‍යාවත් තණ්හාවත් එකතු කරගෙන මේ කරපු අපරාධයේ ඇතුළත කථාන්තරය හෙලිකරගන්න අන්න අර අයෝනිසෝමනසිකාරයාට සමාව දීල, තමුසේ අපට කථාන්තරය කියනව කියල යෝනිසො කර ගත්ත. ධර්මයේ යොනිසෝමනසිකාරය කියල කියන්නේ නිසි ආකාර මෙනෙහි කිරීම තුළින් - ඒක මුල් කරගෙන තමයි අර කිවුව ප්‍රඥා මාර්ගයේ යන්නෙ.

'උදයත්ථගාමිනී' සාමාන්‍ය ලෝකයාට නොපෙනෙන ගෙවීයාම. නිරෝධය. ආර්ය ශ්‍රාවකයාට, යෝගාවචරයාට පෙනෙනව අනිත්‍යතාව හරියාකාරව. සාමාන්‍ය ලෝකයා අනිත්‍යයයි කියන්නේ මේ තිබුණ එකක් දිරාපත් උනා. ඒක අහක් කරල වෙන එකක් ගත්තා. ඊට වැඩිය අනිත්‍ය තත්තවයක් ලෝකයා දන්නෙ නැහැ. බුදුරජාණන් වහන්සේ පෙන්නුව මේක විනිවිද යන ප්‍රඥවක්. විනිවිද යාමක් කිවුවෙ මොකද? 'අරියාය නිබ්බෙධිකාය' යමක් පහළ වෙනකොටම දකිනව ඒක විනාශවෙන්න තියෙන එකක් බව. එතනයි විනිවිද යාම. ලෝකයාගේ පැත්ත සමුදය පැත්ත. නිරෝධය අමතක කරලා සමුදයම මතු කර ගන්නව. ඒක තුළ තණ්හාවෙන් අලවල එකකට එකක් සම්බන්ධ කරල අලවල ගන්නව. ඒ වෙනුවට යෝගාවචරයා නිරෝධය මතු කරල ගන්නව, අමාරුවෙන් නමුත් ඇතිවීම් නැතිවීම් දෙකෙන්. එතනයි විමුක්තිය තියෙන්නේ. මොකද ඇතිවන හැම එකක්ම නිරුද්ධ වෙනව නම්, එතන ස්ථාවරයක් ගන්න බැහැ. මමය මාගේය කියල ගන්න බැහැ. ඒ විනිවිද යාමයි 'නිබ්බෙධිකා පඤ්ඤා' කියල කියන්නේ. ක්‍රම ක්‍රමයෙන් ඒ අනිත්‍යතාව පිළිබඳවයි නැඟීම - ඒකෙ හිත යොදන්න යොදන්න අන්තිමට සමුදය නොපෙනී යන තරමට නිරෝධය මතුවෙනව. මොකද හටගත්ත හැම දෙයක්ම නිරුද්ධ වී යනව නම් ඒක

ගැනනෙ හිත යොදන්න තියෙන්නෙ. විමුක්තිය තියෙන්නෙත් එතනනෙ. ඒ නිරෝධය කරා යන ගමන විදශීකයාට වැටහෙන විධියට කිවුවොත් - දූන් බොහෝ දෙනා සංඛතය එක පැත්තකට දල අසංඛතය අනිත් පැත්තට දල තෝරනව, ඔය නොයෙකුත් මහ උගතුන්. නමුත් මෙතනයි තියෙන්නේ. අර කිවුව විඤ්ඤාණය, අභිසංඛත විඤ්ඤාණයක්, නාමරූපය පෙන්නුම් කරන විඤ්ඤාණය. යම් අවස්ථාවක අර විධියට නාමරූපය පිළිබඳ කලකිරීම් ඇති කරගෙන විදශීකයා නාමරූප සංස්කාර මෙනෙහි කිරීම තුළින් - ඇස කන නාසය දිව කය මන කියන ඒවට එන අරමුණු හඳුන්වන්නෙ නාමරූප සංස්කාර හැටියට. - ඒවාට එන අරමුණුවල තියෙන්නෙ අර කියාපු වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාරත් ඒවායින් අල්ලන මහා භූත ධම්ත් එතනම තියෙනව. ඕනෑම අරමුණක රූපයක වේවා ශබ්දයක වේවා හැම එකකම - අන්න ඒවා - යම් අවස්ථාවක ඒවායේ අනිත්‍ය දුක්ඛ අනාත්ම ස්වභාවය දැකල, ඒවායින් හිත මුදා ගත්තොත් අන්න එතකොට තමයි 'විඤ්ඤාණං අනිදස්සනං' නාමරූපයක් පිළිබිඹු නොකරන විඤ්ඤාණය. එතැනයි අර විමුක්තිය තියෙන්නෙ. ඒකමයි 'සබ්බතො පහං' ආදී වශයෙන් දක්වූයේ ඒ ප්‍රභාව.

මහා පුදුම දේශනාවක්. බුදුරජාණන් වහන්සේ එතන පෙන්නුම් කරල තියෙන්නේ ලෝකය හා ලෝකුත්තර බව අතර වෙනස. සාමාන්‍යයෙන් ලොකුත්තර කියන එක බොහෝදෙනා තෝරන්නේ - අපි හිතමු රහතන් වහන්සේ පිරිනිවන් පෑව කියල. ඊට පස්සෙ යම්කිසි තැනක ගිහිල්ල උපදිනව ඉර, හඳ, තාරකා නැති - ඔන්න ඔහොමයි මෙතෙක් කාලයක් තේරුවේ. නමුත් ගැඹුර මෙතනයි. ඒ ඇතුළතින්ම එන මහා ප්‍රඥාව. ඒක අමාධ්‍යමයි. මාධ්‍ය වශයෙන් තමයි ලෝකයා සාමාන්‍යයෙන් දකින්නෙ, හඳ එළියෙන්, තරු එළියෙන්. මේක එහෙම නොවෙයි. ඇතුළතින් එන ප්‍රභාවක්. ඒ ප්‍රභාව තුළින් දක්වන්නේ මොකක්ද? ලෝකයේ ශූන්‍යත්වයයි. ලෝකයේ ශූන්‍යත්වය දකින්නේ කොහොමද? 'සබ්බතො පහං' හැම පැත්තෙන්ම ආලෝකය ආවහම. අපි හිතමු විනිවිද පේන යමක් වීදුරු කෑල්ලක් වගේ දෙයක්. සෑහෙන ආලෝකයක් ආවොත් ඒක නොපෙනී යන තත්තවයට එනවනේ. අන්න ඒ වගේ ලෝකයා මේ මවාගත්තු ඒ සංඛත ලෝකයේ හැටි ගැඹුරින් දක්කොත් යම් අවස්ථාවක හිත විමුක්ත වෙනව. ඒ විමුක්ත වීම තුළින් තමයි නිවන කියල කියන්නේ. නිබ්බානය - එතන තියෙන ප්‍රතිඵලය මොකක්ද? විඤ්ඤාණය නාමරූපයේ බැඳිල තිබෙන තාක් තමයි නැවත උපතක් පවතින්නේ. විමුක්ත සිත, ඇතැම් විට දිවයිනක් හැටියට දක්වනවා. රහතන් වහන්සේලා ඒ අරහත්ඵල සමාපත්තියට

සම වැදිල සිටින අවස්ථාවේ, හෙණ ගැහුවත් ඇහෙන්නෙ නැහැ කියල නොයෙක් විට කියන්නෙ. ඒ සළායතනයෙන් මිදුනු අවස්ථාව. ඒක මේ ජීවිතයේ දී නිවන් සුව විඳීමයි.

ඊළඟට උන්වහන්සේලාගේ අවසාන මොහොතේ අර කියපු ප්‍රත්‍යක්ෂය ඉස්සරහට එනව. මොකද හේතුව. ජීවත් වන කාලය තුළ උනත් අමෘත කියන නොමැරෙන බවක් පිළිබඳ අත්දැකීමක් ලැබුව නම්, තණ්හාව නැති වෙනකොට මරණය පිළිබඳ භයක් නැහැ කියන ප්‍රත්‍යක්ෂය ඒ පුද්ගලයා ලැබුවා නම්, මරණය ඉදිරියට ආවත් ඒ මොහොතේ දී මතුවන්නේ ඒ සිතේ සටහන් වෙලා තියෙන අරහත්ඵල සමාපත්තියයි. බුදුරජාණන් වහන්සේලා රහතන් වහන්සේලා අවසාන වශයෙන් - අප කීමට කියනව - ධ්‍යානයක් තුළින් පිරිනිවන් පෑව කියල. නමුත් ගැඹුර තියෙන්නේ, ඒ ධ්‍යානයෙන් ඊළඟට අන්න අර ඵල සමාපත්තියට සම වදිනව. ධ්‍යානය පලාගෙන යනව. ධ්‍යානය පලාගෙන ඵල සමාපත්තියට සම වැදිලයි බුදුරජාණන් වහන්සේලා වේවා රහතන් වහන්සේලා වේවා ශරීරය අත හරින්නේ. ඒ නිසයි අපි කලින් අවස්ථාවල විස්තර කළ පරිදි දබ්බමල්ලපුත්ත ආදී රහතන් වහන්සේලා ශරීරයට ගිනි දල්වාගෙන පරිනිර්වාණයට පත් උන බව සඳහන් වන්නේ. මේ කාලෙ කරන ගිනි දැල්වීමක් වගේ නොවෙයි ඒක. උන්වහන්සේලා ඇඳුමක් අතහැරල ඒකට ගිනි තියන්න වගේ තමන්ගේ ඒ අරහත් ඵල සමාපත්තිය තුළින් - ශරීරය ඉවතට දල තමයි අර තේජෝ කසිණ ශක්තිය තුළින් ඒක දවල තිබුණෙ. ඒ අර විමුක්තිය පෙන්නුම් කරන කාරණයක්. ඒකයි බුදුරජාණන් වහන්සේ ඒ අවස්ථාවේදී විශේෂ උදාන ගාථාවක් පවා ප්‍රකාශ කළේ.

'අභෙදි කායො නිරොධි සඤ්ඤා වෙදනා සීතිරහංසු සබ්බා සංඛාරා වූපසමිංසු විඤ්ඤාණං අත්ථමගමා.'

ඒ දබ්බමල්ලපුත්ත මහ රහතන් වහන්සේ ගිනි දල්වාගෙන පරිනිර්වාණයට පත් උන අවස්ථාවේ අළුත් නැහැ. දැලිත් නැහැ. ඒක තමයි විශේෂ උදාන වාක්‍යයක් හැටියට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළේ. හොඳට පිරිසිදුවටම පෙන්නුම් කළා නිර්වාණ තත්තවය.

අභෙදි කායො - ශරීරය බිඳී ගියා.
නිරොධි සඤ්ඤා - සංඥව නිරුද්ධ උනා.
වෙදනා සීතිරහංසු සබ්බා - සියලුම වේදනාවන් සිසිල් උනා.

අපි හිතන්නෙ ගිනි දල්වගත්තහම දබ්බමල්ලපුත්ත මහ රහතන්

වහන්සේට උෂ්ණය දැනෙන්ට ඇතියි කියල. නැහැ. වේදනාවන් සිසිල් උනා.

> සංඛාරා වූපසමිංසු - සියලුම සංස්කාරයන් සන්සිඳුන.
> ආයෙත් නැවත උත්පත්තියට හිත ගියේ නැහැ.
> විඤ්ඤාණං අත්ථමගමා - විඤ්ඤාණය අස්තයට ගියා.

විඤ්ඤාණය ඇත්ත වශයෙන්ම කෙළවරට ගියා. ඔය විඤ්ඤාණ අස්තගමය තුළ තමයි ඔක්කොම ප්‍රශ්නය තියෙන්නෙ. විඤ්ඤාණය මෙච්චර කාලයක් සංසාරයේ යන්නෙ, අවිද්‍යාවත් තණ්හාවත් උපකාර කර ගෙන, කර්ම රැස් කරනවා. ඒ නිසා තමයි පඤ්ච උපාදාන ස්කන්ධයක් රැස්වෙනව කියල කියන්නේ. ඇතැම් තැන් වල ධර්මයේ සඳහන් වෙනව සංසකාර නිරෝධයෙන් මේ ඔක්කොම ප්‍රශ්න විසඳෙනව කියල. බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරල තියෙනව එක් අවස්ථාවක -

'කායෙවා භික්ඛවෙ සති කාය සඤ්චෙතනා හෙතු උප්පජ්ජති අජ්ඣත්තං සුඛ දුක්ඛං'

කයක් කියල දෙයක් ඇති කල්හි කය පිළිබඳව චේතනා ඇතිවීම තුළින් ඇතුළතින් සැප දුක් ඇතිවෙයි. ඒ වගේම වචනය පිළිබඳව - වචනය කියල දෙයක් ගත්තහම ඒක ආශ්‍රයෙන් සැප දුක් ඇති වෙනව. මනස පිළිබඳවත් එහෙම ප්‍රකාශ කරනවා. හැම එකක්ම අවිජ්ජාව ප්‍රත්‍ය කරගෙනයි කියනව. නමුත් ඔන්න අවසාන වශයෙන් දක්වනවා -

'අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා සො කායො න හොති යම්පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං සා වාචා න හොති යම්පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං සො මනො න හොති යම්පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං ඛෙත්තං තං න හොති, වත්ථුං තං න හොති, ආයතනං තං න හොති, අධිකරණං තං න හොති යම්පච්චයාස්ස තං උප්පජ්ජති අජ්ඣත්තං සුඛදුක්ඛං'

නමුත් අවිද්‍යා නිරෝධයෙන් - අපි ආරම්භයේදී කිව්ව අවිද්‍යාව නිසා කාය සංස්කාර, වචී සංස්කාර, චිත්ත සංස්කාර ඇතිවෙනව කියල. මේ කියන්නේ අවිද්‍යාව සම්පූර්ණයෙන්ම නිරුද්ධ උන අවස්ථාවේ කය කියල දෙයකුත් නැහැ. වචන කියල දෙයකුත් නැහැ. මනස කියල දෙයකුත් නැහැ. ඒවා තමයි අර කර්ම රැස්වෙන කෙත උනේ, හේතුව උනේ. ඒවා ඔක්කොම නැති උනා කියන එකයි පෙන්නුම් කරන්නේ. විමුක්තිය, පරිනිර්වාණ තත්තවය ගූඪ ගුප්ත දෙයක්

හැටියටයි පෙන්නුම් කරන්නෙ. ඒ නිසා තමයි බුදුරජාණන් වහන්සේගේ මහා පුදුම දේශනාවක් තියෙන්නෙ. අපි මේවා ගැන නොයෙකුත් දේශනා වෙනම පවත්වල තියෙනව. විදේශිකයින් පවා පුදුම වෙන මහා දේශනාවක්. වෙන තැන් වල විමුක්තිය හොයන අයට ඒක හොඳ පිලිතුරක්.

'ඉමස්මිං එව බ්‍යාමමත්තෙ කලෙබරෙ සඤ්ඤිම්හි සමනකෙ ලොකංච පඤ්ඤපෙමි. ලොක සමුදයංච, ලොක නිරොධංච, ලොක නිරොධ ගාමිනී පටිපදංච'

සංඥවත් මනසත් ඇති මේ ශරීරය තුළම, මේ කලේබරය තුලම, මෘත කලේබරය නොවෙයි. සංඥවත් මනසත් ඇති මේ ශරීර කූඩුව තුළම මම ලෝකයත්, ලෝක සමුදයත්, ලෝක නිරෝධයත් ලෝක නිරෝධ ගාමිනී ප්‍රතිපදවත් දක්වාලම් කියල - බුදුරජාණන් වහන්සේ මහා පුදුම සිංහ නාදයක් ප්‍රකාශ කළේ, අන්න ඔය කාරණාව නිසයි. එතකොට මේ ප්‍රඥව කියන එක අන්න අර කිව්ව විදියට 'උදයත්‍ථගාමිනී පඤ්ඤ' යෝගාවචරයකුට ආරම්භ කරන්න තියෙන්නේ එතනයි. අනිච්ච සඤ්ඤව වැඩීම තුළින් ඒ අනිත්‍යතාව පැති දෙකක් හැටියට පේනව, ඇතිවීම් - නැතිවීම්, ඒක ඔස්සේ තව තවත් හිත ගැඹුරට ගැඹුරට යොදන්න මනසිකාරය - එතෙන්දි තමයි අර යොනිසෝමනසිකාරය, අපි අර සාක්කිකාරයෙක් කර ගත්තු විත්තිකාරයා, අන්තිමට කථාව හෙළි කරනව.

මේ හැම එකක්ම යොනිසෝ මනසිකාරය තුළින් ඉතාමත්ම සියුම්ව දකින්න දකින්න අනිත්‍යතාව මතුවෙනව. නිරෝධය මතුවෙනව. එතකොට ඒ සමුදය තුළින් භවය වැඩෙන්න වගේ, නිරෝධය මතු උන වෙලාවෙ එතනම භව නිරෝධයයි. එතන මතුවෙන්නෙ. ඒ නිසා තමයි හැම තැනම වගේ බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරන්නේ 'භව නිරොධො නිබ්බානං,' 'භව නිරොධො නිබ්බානං.' භව නිරොධයමයි නිවන කියන්නේ. නමුත් භව නිරෝධය කියනකොට බොහෝ දෙනා බය වෙනව. මොකද ඒ තරම් භව තෘෂ්ණාව ලෝකයා තුළ තියෙන නිසා. නමුත් මේ භව නිරෝධය ප්‍රත්‍යක්ෂයක් හැටියටයි දක්වන්නේ. භව නිරෝධය කියන එක මෙලොවම ලබන ප්‍රත්‍යක්ෂයක්. ඒක තුළ තියෙන්නේ විමුක්ති සුවයක්. භවය තුළ දුක නම් තියෙන්නෙ භවය නිරුද්ධ වීම ප්‍රත්‍යක්ෂයක් වූ තැන - ඒක තුළ විමුක්ති සුවයයි තියෙන්නෙ. ඒ විමුක්ති සුවය විඳිනව කියල කියන්නේ ඒකයි. ඒ ජීවමාන රහතන් වහන්සේ පවා ඒක ප්‍රත්‍යක්ෂයක් හැටියට ඒ විමුක්ති සුවය වින්ද. ඒක නිසා තමයි නිවන ගැන

කියනකොට 'දිට්ඨෙව ධම්මෙ නිබ්බානං' කියල කියන්නේ. දිට්ඨ ධම්මයෙහිම ලබා ගත හැකි දෙයක්. දැන් කරන්න. පරලොව ගිහිල්ල ලබන්න නොවෙයි. 'දිට්ඨෙව ධම්මෙ' ඒ නිවන පිළිබඳවයි. එතකොට නිවීම කියල කියන්නේ අවසාන වශයෙන් අර සාංසාරික දුක්ඛස්කන්ධය, පඤ්චුපාදනස්කන්ධය, නිරුද්ධ කිරීමයි. ඒ ටික තමයි. අපි නොයෙකුත් දේශනාවල මතුකළා නිවන ගැන කියවෙන පද මාලාවක්. උපසමානුස්සති හැටියට නිවනට හිත යෙදීමේදීත් ඒක උපකාර කරගන්න පුළුවන්.

'එතං සන්තං එතං පණීතං යදිදං සබ්බසංඛාරසමථො සබ්බූපධි පටිනිස්සග්ගො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං'

ඒ වචන කීපය තුළ මේ ඔක්කොම කියාපු දේ අඩංගු වෙනවා.

සබ්බසංඛාරසමථො - සියළු සංස්කාර සංසිඳුනා නම්,
සබ්බූපධි පටිනිස්සග්ගො - උපධි කියල කියන්නේ පඤ්ච උපාදන ස්කන්ධය. මේ ගොඩගහගෙන තියෙන පඤ්ච උපාදනස්කන්ධය ඒකත් අතහැරුණා.
තණ්හක්ඛයො - තණ්හාව ක්‍ෂය උනා.
විරාගො - විරාග කියල කියන්නෙත් නිවනටමයි. ඒ විරක්ත වීම.
නිරොධො - නිරුද්ධ වීම.
නිබ්බානං - අන්තිමට නිවීම.

ලෝකයා ඉන්නෙ තැවීම තුළ නම් බුදුරජාණන් වහන්සේ පෙන්නුම් කරන්නේ අර දැවීම වෙනුවට නිවීම. ඔය ටික 'නිබ්බාන' කියන වචනය තුළ අඩංගු වෙනවා. නොයෙකුත් අර්ථ මේකට අඩංගු කළා පසුකාලීනව. ඇත්ත වශයෙන් මේ පාරායණ වග්ගයේ එක් එක් ගාථාවක් මහා පුදුමයි. ඒ ශිෂ්‍යයින් අර තරම් ධ්‍යාන වඩාගෙන ආකිඤ්චඤ්ඤ කියන කිසිවක් නැති බව සොයාගෙනයි අච්චර දුර ගියේ. ආකිඤ්චඤ්ඤ කියන කිසිවක් නැති බව කියන ඒ ප්‍රත්‍යක්‍ෂය සොයාගෙනයි අච්චර දුර ගියේ. නමුත් ආපහු ඇවිල්ල, බුදුරජාණන් වහන්සේ හමුවෙලා, ආකිඤ්චඤ්ඤ කියන එක ඉහළම අර්ථයෙන් ලබා ගත්ත. ආකිඤ්චඤ්ඤ කියන්නෙ ධ්‍යාන තත්ත්වයක්. මේක එහෙම එකක් නොවෙයි. 'අකිඤ්චනං අනාදනං - එතං දීපං අනාපරං' කියල කියනව. ඒක දිවයිනක් හැටියට බුදුරජාණන් වහන්සේ දක්වල තියෙනව. සියලුම උපාදන ක්‍ෂය වුණු අවස්ථාවේ තියෙන විමුක්ත සුවයයි ඒ දක්වල තියෙන්නෙ. අජිත මානවකයා ආදී ඒ හුඟක්

දෙනෙක් බුදුරජාණන් වහන්සේ දුන්න පිළිතුර අහල එතනම රහත් උනයි කියනව. මහා පුදුමයි. එයින් අපට පේනව මේ එක හතර පද ගාථාවක කොයි තරම් ගැඹුරු අර්ථයක් තියෙනවද කියල. අපි අපේ මට්ටමින් ටිකක් තේරුම් කරන්න උත්සාහ කළා. මේවා නිකම්ම උඩින් යන දේවල් හැටියට හිතන්න එපා. ධර්මය කියන්නෙ ගැඹුරු දෙයක්. ඒක තේරුම් ගන්න පුළුවන් සරල විදියට නොයෙකුත් උපමා ආශ්‍රයෙන්. වර්තමානයේ ධර්මයේ යෙදෙන කෙනාට ඒවා ගැඹුරු නැහැ. මේවා සරලයි. අන්න ඒ ටිකයි අපි කල්පනාවට ගන්න ඕනෙ.

අද දිනත් තමන්ගේ භාවනාවට උපකාර වන්නා වූ යම්කිසි විදර්ශනාත්මක දේශනාවකට මේ පින්වතුන්ට සවන් දෙන්න ලැබුණා. අපි බලාපොරොත්තු වෙනව මේ පින්වතුන් මේ සිල් වැඩ සටහන තුළින් පූර්ණ ප්‍රයෝජනය ගන්නව ඇති කියල. එහාට මෙහාට යමින්, වෙන දේවල් කථා කරමින්, කාලය ගත කළොත් මේ කියන ධර්මයවත් හරියට තේරුම් ගන්න බැරි වෙනවා. අන්න ඒ නිසා මේ පිරිස වඩාත් සැලකිලිමත් වෙන්න ඕනෙ. යම්කිසි සිල් කාල සටහනක් තුළ කටයුතු කෙරෙනව නම් ඒකට අනුගත වෙන්න ඕනෙ. එතකොට තමයි මේ විධියේ ධර්මයක් තේරුම් ගන්න පුළුවන් වෙන්නේ. නැත්නම් වෙන වල්පල් කථා කරමින් හිටියොත් තේරුම් ගන්න බැහැ මේ විධියේ ධර්මයක්. මේ පින්වතුන් අද යම්කිසි උසස් ශීලයක් සමාදන්වෙලා ධර්ම මාර්ගයේ යමින්, ඒවට හිත යොදල හිටි අයට මේ බලාපොරොත්තු වන උත්තමාර්ථයන් මේ ජීවිතයේදීම සාක්ෂාත් කර ගැනීමට ශක්තිය බලය ලැබේවා! කියා ප්‍රාර්ථනා කරනවා.

අවීචියේ සිට අකනිටා දක්වා යම් සත්ත්ව කෙනෙක් මේ ධර්ම දේශනාමය ධර්ම ශ්‍රවණමය කුශලය අනුමෝදන් වීමට කැමති නම් අනුමෝදන් වීම තුළින් ප්‍රාර්ථනීය බෝධියකින් උතුම් අමා මහ නිවනින් සැනසෙත්වා! කියල මේ ගාථා කියන්න.

'එත්තාවතා ච අම්හෙහි...'

# කතු හිමියන්ගේ සිංහල කෘති

<u>සැ.යු.</u>: මෙම කෘති ලේඛනය සරලත්වයට මුල් තැන දුන් අංක අනුපිළිවෙලක් සහිතව සකස්වී ඇති බවත්, ලේඛනයේ අගහරියේ එන කෘති බොහෝ දුරට ගැඹුරු විය හැකි බවත්, පාඨකයින් දැනුවත් කිරීම් වශයෙන් සඳහන් කරනු කැමැත්තෙමි.

- සම්පාදක

1. තිසරණ මහිම
2. හිතක මහිම – 1
3. හිතක මහිම – 2
4. හිතක මහිම – 3
5. දිවි කතරේ සැඳෑ අඳුර
6. කය අනුව ගිය සිහිය
7. හිත තැනීම
8. පින් රුකෙක මහිම
9. අබිනික්මන
10. පිළිවෙතින් පිළිවෙතට
11. කයේ කතාව
12. මා-පිය උවැටන
13. ප්‍රතිපත්ති පූජාව
14. පැවැත්ම හා නැවැත්ම
15. කර්ම චක්‍රයෙන් ධර්ම චක්‍රයට
16. මෙත් සිතේ විමුක්තිය
17. ඇති හැටි දැක්ම
18. තපෝ ගුණ මහිම
19. සක්මනේ නිවන
20. පහන් කණුව ධර්ම දේශනා – 1 වෙළුම
21. පහන් කණුව ධර්ම දේශනා – 2 වෙළුම
22. පහන් කණුව ධර්ම දේශනා – 3 වෙළුම
23. පහන් කණුව ධර්ම දේශනා – 4 වෙළුම
24. පහන් කණුව ධර්ම දේශනා – 5 වෙළුම
25. පහන් කණුව ධර්ම දේශනා – 6 වෙළුම
26. පහන් කණුව ධර්ම දේශනා – 7 වෙළුම
27. පහන් කණුව ධර්ම දේශනා – 8 වෙළුම
28. පහන් කණුව ධර්ම දේශනා – 9 වෙළුම

29. පහන් කණුව ධර්ම දේශනා – 10 වෙළුම
30. පහන් කණුව ධර්ම දේශනා – 11 වෙළුම
31. විදසුන් උපදෙස්
32. භාවනා මාර්ගය
33. උත්තරීතර හුදකලාව
34. සසුන් පිළිවෙත
35. චලන චිත්‍රය
36. දිය සුළිය
37. බුදු සමය පුද්ගලයා හා සමාජය
38. නිවනේ නිවීම – පළමු වෙළුම
39. නිවනේ නිවීම – දෙවන වෙළුම
40. නිවනේ නිවීම – තෙවන වෙළුම
41. නිවනේ නිවීම – සිවුවන වෙළුම
42. නිවනේ නිවීම – පස්වන වෙළුම
43. නිවනේ නිවීම – සයවන වෙළුම
44. නිවනේ නිවීම – සත්වන වෙළුම
45. නිවනේ නිවීම – අටවන වෙළුම
46. නිවනේ නිවීම – නවවන වෙළුම
47. නිවනේ නිවීම – දසවන වෙළුම
48. නිවනේ නිවීම – එකොළොස්වන වෙළුම
49. නිවනේ නිවීම – පුස්තකාල මුද්‍රණය (1-11 වෙළුම්)
50. පටිච්ච සමුප්පාද ධර්මය – 1 වෙළුම
51. පටිච්ච සමුප්පාද ධර්මය – 2 වෙළුම
52. පටිච්ච සමුප්පාද ධර්මය – 3 වෙළුම
53. පටිච්ච සමුප්පාද ධර්මය – 4 වෙළුම
54. පටිච්ච සමුප්පාද ධර්මය – පුස්තකාල මුද්‍රණය (1-4 වෙළුම්)
55. ස්පර්ශයේ ආශ්චර්යය
56. මනසේ මායාව
57. පැරණි බෞද්ධ චින්තාවේ සංකල්පය සහ යථාර්ථය

---

නැවත මුද්‍රණය කරවීම පිළිබඳ විමසීම්

කටුකුරුන්දේ ඤාණනන්ද සදහම් සෙනසුන
කිරිල්ලවලවත්ත, දම්මුල්ල, කරඳන

දුරකථනය: 0777127454

knssb@seeingthroughthenet.net

## By The Same Author

1. Concept and Reality in Early Buddhist Thought
2. Saṁyutta Nikāya – An Anthology
3. Ideal Solitude
4. The Magic of the Mind
5. Towards Calm and Insight
6. From Topsy-turvydom to Wisdom, Volume I
7. From Topsy-turvydom to Wisdom, Volume II
8. Seeing Through
9. Towards A Better World
10. Nibbāna – The Mind Stilled, Volume I
11. Nibbāna – The Mind Stilled, Volume II
12. Nibbāna – The Mind Stilled, Volume III
13. Nibbāna – The Mind Stilled, Volume IV
14. Nibbāna – The Mind Stilled, Volume V
15. Nibbāna – The Mind Stilled, Volume VI
16. Nibbāna – The Mind Stilled, Volume VII
17. Nibbāna – The Mind Stilled, Library Edition
18. Nibbāna and The Fire Simile
19. A Majestic Tree of Merit
20. The End of the World in Buddhist Perspective
21. The Law of Dependent Arising, Volume I
22. The Law of Dependent Arising, Volume II
23. The Law of Dependent Arising, Volume III
24. The Law of Dependent Arising, Volume IV
25. Walk to Nibbāna
26. Deliverance of the Heart through Universal Love
27. Questions and Answers on Dhamma
28. The Miracle of Contact
29. From The Wheel of Kamma To The Wheel of Dhamma

---


All enquiries should be addressed to:

Kaṭukurunde Ñāṇananda Sadaham Senasun Bhāraya
Kirillawala Watta, Dammulla, Karandana
Phone: 0777127454
knssb@seeingthroughthenet.net